**E-Repository of Humanities and Social Sciences**
Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

# Author Consent Form

Please provide the following information of your book/publication (please note that one consent form needs to be filled for each publication if you have more than one).

1. Title of the publication : "බෞද්ධ ආචාර විද්‍යාවේ මූලික ධර්ම"
2. Author/ ~~Authors~~ : ආචාර්ය ඊ. ඒ. ගාමිණී ෆොන්සේකා
3. Publisher : සරසවි ප්‍රකාශකයෝ, නො. 39/4, බොල්ලගල, [illegible] මාවත, නුගේගොඩ.
4. Year of Publication : 2020
5. ISBN (if applicable) : 978-955-8599-80-8
6. Access option : Open Access

**Author/copyright owner consent:**

I/~~we~~ ආචාර්ය, ඊ. ඒ. ගාමිණී ෆොන්සේකා (your name/names), as the author/s or copyright owner/s, would like to provide my/our consent for making available the above publication on the E-Repository of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura. I also would like to provide my consent to allow the E-Repository Management Committee to make the publication accessible to the students of University of Sri Jayewardenepura and public.

Signature of the Author/s or Copyright owner/~~s~~: [signature]

Date: 19/09/2023.

# බෞද්ධ ආචාරවිද්‍යාවේ පදනම

ආචාර්ය ගාමිණී රත්න ශ්‍රී

# බෞද්ධ ආචාරවිද්‍යාවේ මූලික පදනම

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ආචාර්ය, ජී. ඒ. ගාමිණී රත්න ශ්‍රී

**B.A.** (Hons - First Class), **MA** Kelaniya, **M.Phil** Ruhuna, **PhD.** BPU.
**Royal Pandith** (OSS), **Tripitakavedi,** BBU-A/pura

බෞද්ධ ආචාරවිද්‍යාව් මූලික පදනම

© ආචාර්ය ගාමිණී රත්න ශ්‍රී

පළමු මුද්‍රණය : 2020 අගෝස්තු

ISBN 978-955-8599-80-8

| | | |
|---|---|---|
| පරිගණක පිටු සැකැස්ම | : | **වාක්‍ය රූ**<br>අංක 42/8, මකුළුදූව, පිළියන්දල.<br>දුරඇමතුම : 0112 708377 |
| පිට කවර නිර්මාණය | : | සහාය කථිකාචාර්ය **දැල්තර ඥානානන්ද හිමි** |
| ප්‍රකාශනය | : | **සමන් ප්‍රකාශකයෝ**<br>නො. 39/4, වෙල පාර, ගංගොඩවිල, නුගේගොඩ<br>දුරඇමතුම : 0763235275 |
| මුද්‍රණය | : | **ෆයිබගේට් සර්විසස්**<br>සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ |

# පිදුම

කවදත් මගේ ජයග්‍රහණ දකින්නට
ඇස් අයා සිටින
ආදරණීය
අම්මාට
වියෝ වූ
තාත්තාට හා
ලොකු අයියාට මෙන් ම
අනිකුත් සොයුරු-සොයුරියන් සය දෙනාට
මහත් වූ භක්ත්‍යාදරයෙනි.

# කතුවදන

පින්-පව්, කුසල්-අකුසල් හොඳ-නරක මෞලික කොටගත් ද්වයනිශ්‍රිත භාවය පාදක කොටගත් ආර්ය අෂ්ටාංගික මාර්ගය බෞද්ධ ආචාර විද්‍යාවේ පදනමයි. බෞද්ධ පිළිවෙත් මාර්ග යෙහි නිර්වාණය හෙවත් පරම නිෂ්ඨාව (noble goal) සාක්ෂාත් කිරීමෙහිලා උපස්ථම්භක වූ සම්බුද්ධ දේශිත සකලවිධ ආචාර ධර්ම පද්ධතිය බෞද්ධ ආචාර විද්‍යාවෙහි ලා ගැනේ. මීට අදාළ වූ ත්‍රිපිටකාගත මූලාශ්‍ර හැකිතාක් උපයෝගී කොටගෙන ඉතා පරිශ්‍රමයෙන් නිපැයූ මෙම ග්‍රන්ථය අපගේ අභිමතය පරිදි විරචිත වූවක් බව නොපැකිළව පැවසිය යුතුය.

මෙහි දී නන් අයුරින් උපකාරී වූ සැමට අපගේ නොවක් කෘතඥතාව හා ප්‍රශංසාව හිමි වේ. ඒ අතර අගනා පෙරවදනකින් මේ ගතට ආලෝකය සැපයූ සම්මානිත මහාචාර්ය බී.ඒ. ටෙනිසන් පෙරේරා ඇදුරුතුමන්ට අපගේ අප්‍රමාණ භක්ත්‍යාදරය පළමුව හිමිවිය යුතු වේ. අගනා පසුවදනකින් මේ ගත රැසැයූ අප හිතාදර ගුරු දෙව් මහාචාර්ය කේ. ඒ. වීරසේන සූරීන්ට අත්‍යන්ත ගෞරවය පිරිනමනු කැමැත්තෙමි. මෙහි පරිගණක කටයුතුවලින් දායක වූ අප අධ්‍යයනාංශයේ සහය කථිකාචාරිණී ආලෝකා රශ්මි ලියනගේ මෙනවිය ද ස්තුති පූර්වකව සිහිගන්වමි. පිටු සැකැස්මාදියෙන් අපමණ ශක්තියක් වූ අප අධ්‍යයනාංශයේ හිටපු සහය කථිකාචාර්ය ආචාර්ය මැටිබැම්මියේ ධම්මසිරි පඬි හිමිපාණන්ට මෙන් ම අප වෙත නන් අයුරින් සමුපකාරී වූ අධ්‍යයනාංශාධිපති මහාචාර්ය දුනේෂ් ගුණතිලක සහෘදයාණනට

හා ගත සැරසීමෙහි දී සියලු කටයුතු සම්පාදනය කළ සේනාත් ඉන්ද්‍රජිත් මහතාට අපගේ ගෞරවාදරය හිමිවන අතර මුද්‍රණ කටයුතු මැනවින් සිදු කිරීමට මග පෑදූ ආචාර්ය පනහඩුවේ යසස්සි හිමිපාණනට ද මාගේ නොවක් භක්ත්‍යාදරය හිමි වේ.

**ආචාර්ය ජී.ඒ. ගාමිණී රත්න ශ්‍රී,**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

# පෙරවදන

ආචාර විද්‍යාව පිළිබඳ පොදුවේත්, බෞද්ධ ආචාර විද්‍යාව සම්බන්ධව විශේෂයෙනුත් ලියැවී ඇති ග්‍රන්ථ ප්‍රමාණය එතරම් විශාල නොවේ. හොඳ-නරක කවරාකාර ද යන්න වගේ ම හැසිරීමේ මාර්ග කියා දෙන ආචාර විද්‍යාව දර්ශනය නම් විෂය ක්ෂේත්‍රය තුළ බෙහෙවින් සාකච්ඡා වන බව ද පැහැදිලි කරුණකි. බටහිර හෝ පෙරදිග දර්ශනයේ ආචාර විද්‍යාව ප්‍රධාන මාතෘකාවක් වූ අතර, ඒ සම්බන්ධයෙන් කරන ලද විග්‍රහයන් එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමේ දී බෙහෙවින් උපකාර කරගත හැකි බව කිව මනා නොවේ. සෑම ආගමක ම ඊට අදාළ ආචාර ධර්ම පවතී. බුදුසමයේ ද ආචාර්‍ය ධර්ම රාශියක් දැකිය හැකි අතර අනෙකුත් ආගම්වල ආචාර ධර්මවලට වඩා සුවිශේෂීත්වයක් බෞද්ධ ආචාර ධර්මවල ගැබ්ව ඇතැයි යන්න අපට ප්‍රතික්ෂේප කළ නොහැකිය.

සූත්‍ර පිටකයේ එන ප්‍රධාන සූත්‍රවල බෞද්ධ ආචාර ධර්ම ගණනාවක් දැකිය හැකිය. එසේම තමන් වහන්සේගේ අභියසට පැමිණි විවිධ තරාතිරම්වල පුද්ගලයින්ට ආචාර ධර්ම පිළිබඳව නිදසුන් සහිතව කරුණු පහදා දුන් බව අමුතුවෙන් කිවයුතු නොවේ. මෙම බෞද්ධ ආචාර විද්‍යාවේ පදනම සම්බන්ධව බෞද්ධ ජනතාව දැනුවත් කිරීම කාලීන අවශ්‍යතාවක් වේ. මේ සම්බන්ධව මනා සංයමයකින් යුතුව ලියන ලද කෘතියක් ලෙස ''බෞද්ධ ආචාර විද්‍යාවේ පදනම'' හඳුන්වා දිය හැකිය. එම කෘතියේ කතුවරයා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බෞද්ධ

හා පාලි අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ගාමිණී රත්නශ්‍රී මහතාය.

මේ ග්‍රන්ථයේ පළමු පරිච්ඡේදයේ ආචාර්ය රත්න ශ්‍රී මහතා යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ සදාචාරාත්මක පැවැත්ම ගැන සිය විග්‍රහය ඉදිරිපත් කරන්නේ හුදෙක් තමන්ගේ පෞද්ගලික මතිමතාන්තරය අනුව නොව බුදුන්වහන්සේ සමීපයට පැමිණි අය විසින් අසන ලද ප්‍රශ්නවලට උන්වහන්සේ දුන් පිළිතුරු විශේෂ කොටගෙන විවිධ සූත්‍ර හා අනෙකුත් මූලාශ්‍ර ඇසුරෙන් තම විග්‍රහය ඉදිරිපත් කිරීමට අප කතුවරයා සමත් වී ඇතැයි සඳහන් කළ යුතුය.

සමාජ ව්‍යවහාරයෙන් ආර්ය ව්‍යවහාරයට පා නගන පුද්ගලයා තුළ ඇතිවන්නේ මානසික පරිවර්තනයකි. එක් අතකින් එය නොදැනීමෙන් දැනුම කරා ප්‍රවේශවීමක් විය හැකිය. ලෞකික ජීවිතයෙන් මිදී ලෝකෝත්තර දිවියකට යොමුවීම සඳහා තමන්ගේ ලෞකික වගකීම්වලින් නිදහස් විය යුතුය. මෙහි දී අප කතුවරයා පොතාලිය ගෘහපතියාගේ කතා ප්‍රවෘත්තිය අපට පෙන්වා දෙයි. තමන් මෙතෙක් කරගෙන ආ වගකීම් තම දරුවන්ට ලබා දීමෙන් ඔහු චිත්ත නිදහස ලබාගනී. එපමණක් නොව මේ පරිච්ඡේදයෙන් බුදුන් වහන්සේ සමග සාකච්ඡාවලට පැමිණි අයගේ දුර්මත ඉවත් කරනු සඳහා උන්වහන්සේ ගත් ක්‍රියා මාර්ග පැහැදිලි කර තිබෙනු පෙනේ. ධනඤ්ජානි බමුණාගේ කතාන්තරය මෙයට එක් නිදසුනකි. කුලය සම්බන්ධව පැවති බමුණු දහමට එරෙහිව බුදුන් වහන්සේ ක්‍රියා කළ ආකාරය අස්සලායන මානවකයාගේ කතාවෙන් අපට දැනගත හැකිය. අම්බට්ඨ සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍ර මගින්ද බ්‍රාහ්මණ ආචාර ධර්මවලට වඩා බෞද්ධ ආචාර ධර්මවල වැදගත්කම ස්ඵුට කරන බව පෙනේ. මෙපමණක් නොව බුදුදහමේ විවිධ ධර්ම කාණ්ඩ හා නූතන අධ්‍යාපන මනෝවිද්‍යාවේ කරුණු ද සැලකිල්ලට ගෙන අප කතුවරයා මේ පරිච්ඡේදයේ බෞද්ධ ආචාර ධර්මවල පදනම කුමක්ද යන්න පැහැදිලි කරයි. පුද්ගලයා හා සමාජය පිළිබඳ විවරණයක් ද මේ පරිච්ඡේදයෙන් ඉදිරිපත්

කර ඇත්තේ මූලික අරමුණට ගැළපෙන අයුරිනි. මෙහි එන දීඝායු කුමාරයාගේ කතාවෙන් කෙනකු අනාගතය උදෙසා හැසිරිය යුතු ආකාරය පෙන්වා දෙයි.

සත්‍ය වශයෙන් ම මේ පරිච්ඡේදයෙන් අප කතුවරයා බුදුසමයෙන් පමණක් නොව වෙනත් මූලාශ්‍ර ආශ්‍රයෙන් ද තොරතුරු ගෙන බෞද්ධ ආචාර ධර්ම කෙලෙස ගොඩනැගිනි ද යන්න පිළිබඳ විග්‍රහයක් කරන්නේ ඔහුට ම ආවේණික භාෂා රටාවකිනි. අස්වාභාවික බලවේගවලට වන්දනා කිරීමේ නිසරු බව පෙන්වා දෙන කතුවරයා පුද්ගලයා තමන් නිර්භය පුද්ගලයකු ලෙස කටයුතු කළ යුතු බවත් ඒ පිළිබඳ බුදුන් වහන්සේ ද දෙසා වදාළ බවත් සඳහන් කරයි. සිගාලෝවාද සූත්‍රය මගින් බෞද්ධ ආචාර ධර්ම ගණනාවක් අපට දැනගත හැකිය. ඒ සම්බන්ධව පුළුල් විග්‍රහයක් මෙම පරිච්ඡේදයෙන්ම ඉදිරිපත් කර ඇත. පවුල සම්බන්ධව විශේෂයෙන් විවාහය සම්බන්ධ නීති ක්‍රියාත්මක වීම හා එහි ආචාර විද්‍යාත්මක පදනම ද මෙහි විස්තර වන අතර අප කතුවරයා තමන්ට ලබාගත හැකි සෑම මූලාශ්‍රයකින් ම තොරතුරු ගෙන ඇති බව පෙනේ.

සමාජ විද්‍යාත්මක කරුණු ද අන්තර්ගත මේ පරිච්ඡේදයේ ආචාර ධර්ම ක්‍රියාත්මක විය යුතු ආකාරය නොයෙකුත් ක්ෂේත්‍ර ආශ්‍රයෙන් විවරණයක් කිරීමට ආචාර්ය රත්න ශ්‍රී මහතා මහත් උත්සාහයක් ගෙන ඇතැයි මට සිතේ. ළමා ගැටලු, ගණිකා වෘත්තිය, ස්ත්‍රී දූෂණය වැනි සමාජ විරෝධී ක්‍රියා අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අතර යුතුකම් හා වගකීම්වල වැදගත්කම ගැන ද මෙහි විස්තර වේ. පරමාදර්ශී පුද්ගලයකු ලෙස මිනිසා ඉටුකළ යුතු වගකීම් ගැන හා ඔහු තමා ම පාලනය කරගත යුතුය යන්න පිළිබඳ පැහැදිලි විග්‍රහයක් මෙහි දැකිය හැකිය. පුද්ගලයාට සිය දියුණුව ළඟා කර ගත හැකි මාර්ග පහක් ගැන සඳහන් කරන කතුවරයා ඒ මගින් ද විශේෂයෙන් බෞද්ධ ආචාර ධර්මවල සර්වකාලීන වැදගත්කම පෙන්වා දෙයි. ආදර්ශමත් සිත පාලනය කරගත් පුද්ගලයා සතුව ඇති ලක්ෂණ අටක් කරණීය

මෙත්ත සූත්‍ර ආශ්‍රයෙන් අප ලේඛකයා ඉදිරිපත් කර ඇත. මෙම පරිච්ඡේදයෙහි අවසන සඳහන් වන පහත සඳහන් ඡේදය මෙහි දැක්වීම උචිත යැයි සිතේ.

''මෙතෙක් අප සාකච්ඡා කළ කරුණු තුළින් ප්‍රකට කෙරෙනුයේ ඓහලෞකික යුතුකම් හා අයිතිවාසිකම් හා සබැඳි බෞද්ධ ආචාර විද්‍යාත්මක පදනම නිර්වාණගාමී ප්‍රතිපදාව නියෝජනය කෙරෙන පාරලෞකික තත්ත්වයන් ද ස්පර්ශ කරන බවයි.''

පෞද්ගලිකත්වය හා ස්වච්ඡන්දතාව පිළිබඳ ථෙරවාද න්‍යායාත්මක භාවිතය දෙවැනි පරිච්ඡේදයට මාතෘකාව වී තිබේ. මෙම සංකල්ප දෙක පිළිබඳ ඍජුව බුදුදහමේ දැක්වෙන කරුණුත්, ද්විතීය වශයෙන් සඳහන් කරුණුත් පැහැදිලිව විස්තර කිරීමට අප ලේඛකයා උත්සාහ කර ඇති බව පෙනේ. කෙටියෙන් සඳහන් කළහොත් සදාචාරමය වශයෙන් වගකීමක් ඉසිලිය හැකි ස්වභාවය ස්වච්ඡන්දතාව ලෙස හැඳින්වෙයි. සිත හෝ ආත්මය පාලනය කිරීමේ වැදගත්කම බුදුන් වහන්සේ පෝතාලිය තිස්ස තෙරුන් අරභයා ඉදිරිපත් කළ අදහස දුක හා සැප තීරණය කරන ආකාරයට හොඳ නිදසුනකි.

පින් පව් සම්බන්ධයෙන් හා කර්ම විපාක සම්බන්ධයෙන් පුද්ගලයන්ට සිදුවන යහපත සහ අයහපත බුදුන් වහන්සේ ජීවමානව සිටි කාලයේ ඇතැම් පුද්ගලයන් ආශ්‍රිතව මාහැඟි තොරතුරු රැසක් මෙම පරිච්ඡේදයෙන් පැහැදිලි කිරීමට ආචාර්ය ගාමිණී රත්නශ්‍රී මහතා තැත් දරයි. යුතුකම් හා වගකීම් ක්‍රියාත්මක විය යුතු ආකාරය බුදුන්වහන්සේ වරින් වර කරන ලද අනුශාසනා ගණනාවක් සඳහන් වන මේ පරිච්ඡේදය තුළින් බුදුදහමේ මූලික අරමුණු සම්බන්ධව කරුණු ද ඉදිරිපත් කර ඇත. පුද්ගලයා වගකීමෙන් යුක්තව නිදහසේ ක්‍රියා කිරීම අත්‍යාවශ්‍ය වේ. මීට අමතරව පංච ශීලීය පිළිබඳ වැදගත් කරුණු රැසක් පාඨක හමුවට ගෙන එන අප ලේඛකයා ඒ සම්බන්ධව මුල් බුදුසමයාගත අදාළ සූත්‍ර ආශ්‍රයෙන් නිදසුන් ද ඉදිරිපත් කර තිබෙනු දැකිය හැකිය. ඇත්තෙන් ම මෙහිදී පුද්ගලයකු පංචශීලය ආරක්ෂා කිරීමේ

වැදගත්කම ගැන ද ප්‍රයෝජනවත් කරුණු ගණනාවක් පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇත. ස්වඡන්දතා ගුණයේ වැදගත්කම බුදුන් වහන්සේගේ කාලයේ සිදු වූ සිද්ධීන් හා පුද්ගලයන් ආශ්‍රයෙන් කරුණු දක්වා ඇත්තේ සාමාන්‍ය පාඨකයාට ද අවබෝධ වන ආකාරයෙනි.

බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් නිදහස, සමානාත්මතාව සහ පරමාදර්ශී මනෝභාවයන්හි ප්‍රායෝගික හරය ඉතා ව්‍යක්ත ලෙස පැහැදිලි කර තිබෙන්නේ මේ කෘතියේ තුන්වැනි පරිච්ඡේදය මගිනි. මිනිසා මධ්‍යස්ථ ප්‍රතිපත්තිවලට යොමු කරන බුදුදහම අර්ථවත් ජීවිතයක් ගත කිරීමට ඉඩ සලසා ඇත්තේ පූර්ණ නිදහස ද අගය කරමිනි. ලොව විවිධ චින්තකයින් නිදහස සහ සමානාත්මතාව සම්බන්ධව පැවසූ විවිධ අදහස් ද අප කතුවරයා මෙහි දී පැහැදිලි කරයි. නූතන මනෝවිද්‍යාත්මක සාධක ද දක්වා තිබෙන මේ පරිච්ඡේදය තුළින් අදාළ මාතෘකාව සම්බන්ධ සංසන්දනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීමට ආචාර්ය රත්නශ්‍රී සමත් වී ඇත. විලියම් ජේම්ස්, සොක්‍රටීස්, ලොක් වැනි විද්වතුන්ගේ අදහස් සුදුසු පරිදි පෙන්වාදීම මගින් වඩා පුළුල්ව පාඨකයාට නිදහස හා සමානාත්මතාව පිළිබඳ තේරුම් කර ගැනීමට අවකාශ සැලසෙනු ඇත. නූතන දේශපාලන විද්‍යාත්මක කරුණු හා බුදුදහමේ දැක්වෙන ඊට අදාළ කරුණු ද ගෙන තුලනාත්මකව නිදහස හා සමානාත්මතාව ගැන සාරගර්භ තොරතුරු රැසක් අපට මේ පරිච්ඡේදයෙන් ම කියවා ගත හැකිය. ධනය හා දේපළ පරිහරණය ආශ්‍රිතව ආර්ථික විද්‍යාත්මක සාධක පිළිබඳ අප කතුවරයා විග්‍රහ කර ඇත්තේ බුදුදහමේ ඒ ගැන දක්වා ඇති විග්‍රහයන් ද සැලකිල්ලට ගනිමිනි. මේ සඳහා විවිධ සූත්‍රවලින් ගත් නිදසුන් ද මෙම පරිච්ඡේදයේ දැක්වේ. දසරාජ ධර්මය කුමක්ද යන්න කෙනකුට දැන ගැනීමට අවශ්‍ය නම් ඒ සම්බන්ධව අපූර්ව තොරතුරු රැසක් මෙහි ඇතුළත් වේ.

මෙම කෘතියේ අවසාන පරිච්ඡේදයේ මාතෘකාව 'බෞද්ධ ආචාර විද්‍යාවේ ආවසානික අධ්‍යාත්මික සමෘද්ධිය හෙවත් පරම

නිෂ්ටාව' වේ. පරිච්ඡේදයේ ආරම්භයේ පුද්ගල සංවර්ධනයේ අවශ්‍ය ම පියවර තුනක් ගැන සඳහන් කොට ඇත. එසේ ම බුදුන් වහන්සේගේ පර්යේෂණය වන ආර්ය පර්යේෂණය ගැන විග්‍රහ කරන අප කතුවරයා ඒ මගින් කාලීනව පැවති බොහෝ ගැටලුවලට පිළිතුරු සැපයූ බව පෙන්වා දෙයි. පුද්ගලයාගේ නිවන් මගට බාධා කරන නීවරණ ධර්ම ගැන ඉතා පැහැදිලි විග්‍රහයක් ද මෙහි දක්වේ.

වේදනා සංකල්පය ඊට අදාළ අනෙකුත් වර්ග කිරීම පැහැදිලි කරමින් ආචාර්ය ගාමිණී රත්න ශ්‍රී මහතා ආර්ය අෂ්ටාංගික මාර්ගය කුමක්ද යන්නත් විග්‍රහයට ලක් කරන්නේ එහි දර්ශනය ද විවරණය කරමිනි. බුදුදහමෙහි මූලික කරුණු රැසක් මේ පරිච්ඡේදයට අන්තර්ගත කොට අත. නිර්වාණගාමී පුද්ගලයා කෙසේ හැසිරිය යුතු ද හා වීර්ය හා අධිෂ්ඨානය ජනිත කරගත යුතු අයුරු බුදුන් වහන්සේගේ දේශනා ඇසුරෙන් අපට පැහැදිලි කරගත හැකිය.

සමස්තයක් වශයෙන් සලකන විට බෞද්ධ ආචාර විද්‍යාවේ පදනම ගැන පුළුල් එසේම ගතික විග්‍රහයක් කිරිමට ආචාර්ය ගාමිණී රත්නශ්‍රි මහතා සමත් වී ඇත. තමන්ට ලබාගත හැකි සෑම මූලාශ්‍රයක් ම උපයෝගී කරගෙන ක්‍රමානුකූලව අදාළ තොරතුරු පැහැදිලි කිරීම එතරම් සුළුපටු කාර්යයක් නොවේ. ඒ සඳහා මනා සංයමයක් ද අවශ්‍ය වේ. බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය හා දර්ශනය පොදුවේ හදාරණ අයට පමණක් නොව වෙනත් විෂයන්ගෙන් දැනුම ලත් අයට ද ඉතා ප්‍රයෝජනවත් අයුරින් මේ ග්‍රන්ථය ලියා තිබීම ගැන ආචාර්ය ගාමිණී රත්න ශ්‍රී මහතාට අපගේ කෘතඥතාව පළකළ යුතු වේ.

**බී.ඒ. ටෙනිසන් පෙරේරා**

සම්මානිත මහාචාර්ය,
සමාජවිද්‍යා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

# පටුන

**කතුවදන** 5

**පෙරවදන** 7

පළමුවන පරිච්ඡේදය
**යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ සදාචාරාත්මක පැවැත්ම** 15

දෙවන පරිච්ඡේදය
**පෞද්ගලිකත්වය හා ස්වච්ඡන්දතාව පිළිබඳ**
**ථෙරවාද න්‍යායාත්මක භාවිතය** 77

තෙවන පරිච්ඡේදය
**නිදහස, සමානාත්මතාව හා පරමාදර්ශී**
**මනෝභාවයන්හි ප්‍රායෝගික හරය** 119

සිව්වන පරිච්ඡේදය
**බෞද්ධ ආචාර විද්‍යාවේ ආවසානික ආධ්‍යාත්මික**
**සමෘද්ධිය හෙවත් පරම නිෂ්ඨාව** 173

**නිගමනය** 234

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 242

## පළමුවන පරිච්ඡේදය

# යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ සදාචාරාත්මක පැවැත්ම

සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක් පුද්ගලයෙක් නො වූවත් ව්‍යවහාර[1] ලෝකයේ සත්ත්වයන්, පුද්ගලයන් සිටිනා බවත්, ඒ සත්ත්ව පුද්ගල ලෝකයේ "සෑම දෙනා ම සුවපත් වේවා"!යි සියලු දෙනා විසින් ම ක්‍රියා කළ යුතු බවත්, තථාගතයන් වහන්සේ කරණීයමෙත්ත සූත්‍රයෙහි දී වදාළ හ. ව්‍යවහාර ලෝකයේ දී අප විසින් පිළිගනු ලැබූ දෙය හා සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් පිළිගත යුතු යයි සැලකෙන දේ අතර විශාල පරතරයක්[2] පවතී. ඒ අහසට පොළොව මෙනි.

"වහන්ස, මම සර්වාර්ථයෙන් ආර්ය විනයෙහි ව්‍යවහාර සමුච්ඡේදයෙන් (අහසට පොළොව මෙන්) දුරු වෙමි. අපි පෙර අන්තොට පිරිවැජියන් (ගිහි ව්‍යවහාර සමුච්ඡේදයට කාරණා) නොදන්නාවුන් දන්නාහයි සිතුවෙමු. නොදන්නා වුන්ට කරුණු දන්නවුන් විසින් වැළඳිය යුතු භෝජනය වැළඳවීමු. කරුණු නොදන්නවුන්, කරුණු දන්නාවුන්ගේ තන්හි තැබුවෙමු. භික්ෂූන් කරුණු (ව්‍යවහාර සමුච්ඡේද) දන්නේ වුව ද, නොදන්නේ යයි සිතුවෙමු. කාරණා දන්නවුන්ට, කාරණා නොදන්න වුන්ට නිසි භෝජනය පිළිගැන්වූයෙමු. කාරණා නොදන්නවුන්, අනජානීය (නොසුදුසු) ස්ථානයන්හි තැබුවෙමු...[3]

---

1 c.e. 20, p.242.

2 ම. නි. 2, පි.51; පොතලිය සූත්‍රය. ම. නි. 2, පි.41-45.

3 ථෙරී, පි.33, ගාථා අංක 107. ගාථා. පි.121; සුභද්‍රාලෝක සූත්‍රය.

දැන් අපි ඒ වැරදි සියල්ල වටහා ගෙන, නිවැරදි කරන්නෙමු. බුදුන් වහන්සේ ඒකාන්තයෙන් ම, යටිකුරු කරන ලද්ද, උඩුකරු කළහ. වසන ලද්ද විවෘත කළහ. මුළා වූවහුට මඟ කියන ලදහ. අඳුරෙහි යන්නහුට, මඟ පෙන්වාලීම සඳහා තෙල් පහනක් දැල්වූහ."

යනුවෙන් පොතලිය ගෘහපතියා තමන් තුළ වූ '**පිළිගැනීම් පිළිබඳ පරිවර්තනය**' පැහැදිලි කළේ ය. තථාගතයන් වහන්සේ, තමන්ට 'ගහපති' යනුවෙන් ඇමතීම පිළිබඳ ව ඔහු කිපී, නොසතුටු වී, "භවත් ගෞතමයෙනි, යම් හෙයකින් ඔබ මට 'ගහපති' යන බසින් ව්‍යවහාර කරහු ද, ඒ බස් නොනිසිය, ඒ බස නොසරුප් ය" යි තථාගතයන් වහන්සේ හා සාකච්ඡාවට වැටී, ඒ සාකච්ඡාව අවසානයේ දී ම ඔහු තුළ වූ පරිවර්තනය එසේ පැහැදිලි කළේ ය.[4]

සමාජ ව්‍යවහාරයෙන් ආර්ය ව්‍යවහාරය කරා යා යුතු, අහසට පොළොව මෙන් දුර වූ ගමන,[5] මානසික පරිවර්තනයකි. ඒ පර්වර්තනය සිදු වන්නේ, **නොදැනීමෙන් දැනුමට**[6] යාමෙනි. ඒ බව පොතලිය ගහපතියාගේ (ප්‍රකාශයෙන්) මානසික පරිවර්තන ස්වභාවයෙන් අපට පැහැදිලි ය.

ඒ මානසික පරිවර්තනය පිරිසිදු වීමකි. මිනිස් ඇස ඉක්මවා යන ආකාරයෙන් පෙනෙන දකින පිරිසිදු වීමකි.[7] ආස්‍රවයන් පිරිසිදු කළ, චිත්ත විමුක්තිය හා ප්‍රඥා විමුක්තිය නම් වූ ශ්‍රේෂ්ඨ විමුක්ත[8] ව්‍යාපාරයකි. ඒ විමුක්තිය; ඒ ඒ සත්ත්ව පුද්ගලයන් විසින් ප්‍රත්‍යක්ෂ කොට විසිය යුතු, ආර්ය විනයෙහි[9] එන ව්‍යවහාර

4 ස. නි. 4, පි.121; පලොකධම්ම සූත්‍රය. - එම- පි.121; සුඤ්ඤලොක සූත්‍රය. ස. නි. 4, පි.120.

5 ස. නි. 2, පි.14.

6 අ. නි. 1, පි.453-459. අ. නි. 1, පි.456; ම. නි. 2, පි.50.

7 අ. නි. 1, පි.456; ම. නි. 2, පි.50.

8 ම. නි. 2, පි.50.

9 අප පා, පි.73-87.

සමුච්ඡේදය යි. ආර්ය ශ්‍රාවකයා, අනුත්තර වූ උපේක්ෂා ස්මෘති පාරිශුද්ධියට පැමිණෙයි. එසේ පැමිණ, විශුද්ධ වූ මිනිසැස ඉක්මවූ දිවැසින්, පුබ්බේනිවාස හා චුතූපපාත ඤාණයන් ලබයි.[10]

එසේ ම ආසවක්ඛය ඤාණය ද ලබයි. මෙසේ ත්‍රිවිද්‍යාවෙන් යුක්ත වේ. ඒ වූ කලී, 'නොදැනීමෙන් දැනීමට' යන පුද්ගලයා ය. එහෙත් ඒ නොදැනීම හේතුවෙන් මව් කුසයෙන් තවත් මව් කුසයකට[11] යන, සත්ත්ව පුද්ගලයන් පිළිබඳ ව සමාජ සම්බන්ධයෙන් පිළිගත් උපත, ජීවිතය හා මරණය නම් වූ ස්වභාවික සිද්ධීන් පවතී. ඒ පරමාර්ථ නොවූ පුද්ගල ස්වභාවය, පණ ඇති ජීවීන් සියල්ලන් කෙරෙහි ම අවබෝධ කරවීම පහසු නොවීමේ හේතුවෙන් එවන් පුද්ගලයන්, ක්‍රමයෙන්, '**පවතින තත්ත්වයන්**'[12] මත, ඉහළට ගෙන යා යුතු ය. 'නොදැනීමෙන් දැනීම' කරා යන ඒ ගමන, '**පුද්ගලයා හා ප්‍රජාව**' නම් වූ සමාජය[13] පිළිබඳ ව අප ලබා ඇති දැනුමෙන් ආරම්භ කිරීම පහසු ය." පොතලිය ගෘහපතියා තමන්ට අයත් වූ සියලු ධනය, ධාන්‍ය, රන්රිදී ආදී සියල්ල ම තම දරුවන්ට පවරා, ඔවුන්ගේ කර්මාන්ත හා කටයුතු කෙරෙහි උපේක්ෂා වෙමින්, කෑම්, ඇඳීම් ආදී ජීවිතය පවත්වා ගැනීම සඳහා පමණක් දරුවන්ගෙන් අපේක්ෂා කරමින්, සියලු කටයුතු අත්හළේ, එකල සමාජය පිළිගත් ආකාරයේ පිරිසිදු ජීවිතයක් ගෙවීම සඳහා ය. ඔහු සියලු ව්‍යවහාර සමුච්ඡේද (ගනුදෙනු නතර කිරීම්) කරන ලද්දේ, ගිහි වගකීම් සියල්ල අන්‍යයන්ට පවරා තමා ඉන් නිදහස්වීමේ හේතුවෙනි.[14]

කාලීන ව, සමාජ සම්මතයෙහි ගෘහපති ව්‍යවහාරය පැවතියේ ගෙදර ප්‍රධානියා විසින් ඉටු කළ යුතු වූ කාර්ය භාරය පිළිබඳව

10 සු. නි., පි.183-185; සල්ල සූත්‍රය. ගාථා අංක 577 සිට 596.

11 සු. නි., පි.225-241; ද්වයතානුපස්සනා සූත්‍රය. සු. නි., පි.232, ගාථා අංක 745-746.

12 C.E. 20, p.242. .C.E. 20, p.242, C.E. 20, p.242.

13 ම. නි. 2, පි.39; පොතලිය සූත්‍රය.

14 ම. නි. 2, පි.683; ධනඤ්ජානි සූත්‍රය.

ය. එකී කාර්ය භාරයෙන් නිදහස් වී ඒ සියලු කටයුතු දරුවන්ට පැවරූ පොතලිය, 'ගෘහපති' තනතුරෙන් ඉවත් වූවකු ලෙස (පොතලිය විසින්) සලකන ලදි, එකල සමාජ සම්මතය ද එය විය.

ධනඤ්ජානි සූත්‍රයේ එන පරිදි, ධනඤ්ජානි බමුණා අප්‍රමාද වන්නේ දැයි සැරියුත් තෙරුන් වහන්සේ විමසූ කල, ඔහු තමා අප්‍රමාද වන ආකාරය පැහැදිලි කළේ තමනට පැවරී තිබූ යුතුකම් රාශිය කල්පනාවට ගනිමිනි.

''තවත් ශාරිපුත්‍රයෙනි, අප යම් කෙනකුන් විසින් දෙමාපියෝ පෝෂණ කළ යුතු වෙත් ද,

පුත්‍රදාරාවෝ පෝෂණය කළ යුතු වෙත් ද,

දැසි කම්කරු පිරිස් පෝෂණ කළ යුතු වේ ද,

මිත්‍රමාත්‍යයන්ගේ මිත්‍රමාත්‍යකරණී කළ යුතු වේද,

නෑ සාලේ නෑයන්ගේ නෑසාලේ නෑකරණී කළ යුතු වේ ද,

අතිථීන්ගේ අතිථීකරණී කළ යුතු වේ ද,

පූර්වප්‍රේතයන්ගේ පූර්වප්‍රේතකරණී කළ යුතු වේ ද,

දේවතාවන්ගේ දේවතාකරණී කළ යුතු වේ ද,

රජුගේ රජකරණී කළ යුතු වේ ද,

මේ කයත් පිනවිය යුතුත්, වැඩිය යුතුත් වේ ද,

ඒ අපට කොයින් නම් අප්‍රමාදයෙක් ඇද්ද?[15]

යනුවෙන් ඔහු දැක් වූ ස්වකීය කටයුතු සියල්ල, එකල ගෘහපතියකු වෙත පැවරී තිබූ යුතුකම් බව පෙනේ. ඒ සියල්ල ඉටු කිරීම සඳහා ඔහු බොහෝ වෙහෙස මහන්සි විය යුතු විය. බොහෝ කාලයක් යෙදිය යුතු විය. වෙනත් පුණ්‍ය ක්‍රියාවක් සඳහා ඔහුට අවසරයක් නොවීය.

15 ජා.පො, පි.250.

ධනඤ්ජානි බමුණා ඒ සියලු කටයුතු කළේ, 'ධර්මචාරී සමචාරී' නම් වූ ධර්මයට සහ සාධාරණත්වයට (යහපතට) එකඟව ද,[16] යන්න මෙහි දී සිතා බැලිය යුතු ය.

බොහෝ විට සොරකම් වැනි[17] සමාජ විරෝධී ක්‍රියාවන්හි යෙදෙන පුද්ගලයින් ඒවා කරනුයේ, 'ජීවත් වීමට අන් මගක් නොමැති හෙයිනැ'යි පවසන හෙයින් ගිහි යුතුකම් ඉටු කිරීම සඳහා සමාජ විරෝධී නොවී, 'ධර්මචාරී සමචාරී' ක්‍රමය අනුග මනය කළ නොහැකි දැයි විමතියක් ඇති විය හැකි ය. එයට පිළිතුරු ධනඤ්ජානි බමුණාහට සැරියුත් හිමියන් විසින් දෙනු ලැබිණ.

මව්පියන් නිසාවෙන් හෝ වේවා, පුත්‍රදාරාවන් නිසාවෙන් හෝ වේවා, දැසි කම්කරු පිරිස් ආදී අවශේෂයන් නිසාවෙන් හෝ වේවා, තමන් නිසාවෙන් හෝ වේවා, රජුන් නිසාවෙන් හෝ වේවා, දේවතාවන් නිසාවෙන් හෝ වේවා, අධර්මචාරී විෂමචාරී වීමෙන් මරණින් මතු පුද්ගලයාට නිරයට වැද ගන්නේ නම් තමන් එසේ අධර්මචාරී විෂමාචාරී වූයේ, 'ගිහි යුතුකම් ඉටු කිරීම සඳහාය'යි ස්වකීය නිදහසට කරුණු ඉදිරිපත් කළේ වී නමුත් ඒ පිළිනොග ැනේ. මව්පියන් හෝ පුත්‍රදාරාවන් විසින් හෝ තමන් නිසාවෙන් අධර්මචාරී විෂමචාරී වූ ස්වකීය නෑයාට අනුකම්පාව නොලැබේ.[18] අධර්මචාරී විෂමචාරී වීම හේතුවෙන් නිරයට යන බව තේරුම් ගන්නා පුද්ගලයා ස්වකීය යුතුකම් ඉටු කිරීම සඳහා ශ්‍රේෂ්ඨ වූ ධර්මචාරී සමචාරී ක්‍රමය ම තේරුම් ගනී.[19] එය ම පිළිපදී. එහෙයින් යම් යම් කර්මාන්ත තෝරා ගැනීමේ දී මව්පිය, පුත්‍රදාරාදීන් පෝෂණය කළහැකි වූත්, පව්කම් කිරීමට ඉඩ ඇහිරුණා වූත්, පුණ්‍ය කර්ම සඳහා ඉඩ ලබා දෙන්නා වූත් බොහෝ කර්මාන්ත

16 දී. නි. 3, පි.111 චක්කවත්තී සීහනාද සූත්‍රය. දී. නි. 3, පි.111.

17 දී. නි. 3, පි.113, රාජ සූත්‍රය - අ. නි. 3, පි.339-343.

18 ම.2, පි.683-691. ම. 2, පි.687.

19 සු.නි., පි.81, මහා මංගල සූත්‍රය. සු.නි., පි.80. සු.නි., පි.35, ගාථා අංක 110. සු.නි., පි.39, ගාථා අංක 124. 5-3; බාල වර්ගය.

අතුරෙන් නිරවද්‍ය කර්මාන්තයක් තෝරා ගනී.[20] ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයකින් කය පිනවන්නටත්, වඩවන්නටත්, පව්කම් නොකරන්නටත්, පුණ්‍ය ප්‍රතිපදා පිළිපදින්නටත් හැකි වේ ද එබඳු අන්‍ය වූ සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත,[21] යනුවෙන් සැරියුත් හිමියන් දක් වූ අදහස ධනඤ්ජානි ඉතා සතුටින් පිළිගත් බව පෙනේ. සමාජ සම්මතය අනුව ගෙදර ප්‍රධානියා විසින් ඉටු කළ යුතු යුතුකම් තථාගතයන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයෙන් දක් වූයේ සදිසා නමස්කාරයක් ලෙසය.[22] දේව විශ්වාසය තදින් මුල්බැසගත් කාලීන සමාජය සදිසා නමස්කාරයෙන් අදහස් කළේ ආරක්ෂාවය. නො පෙනෙන දෙවි දේවතාවුන් වෙනුවෙන් කෙරෙන නමස්කාරය තුළින් අපේක්ෂිත ආරක්ෂාව ලබා ගැනීම වෙනුවට, තමන්ට ඉතා කිට්ටු, සමීප පිරිසක් වෙනුවෙන් යුතුකම් ඉටුකොට එම ආරක්ෂාව ලබා ගත යුතු ආකාරය තථාගතයන් වහන්සේ පැහැදිලි කළහ. ඒ සදිසාවන් බුද්ධියට හා ආචාර විද්‍යාවට ගැළපෙන ආකාරයෙන් කාලීන සමාජයට ඉදිරිපත් කිරීම හේතුවෙන් මිථ්‍යාමය අදහස් ඉවත් කළ හැකි විය.

මිනිසුන් වර්ණ හා කුල වශයෙන් ප්‍රධාන කොටස් හතරකට බෙදා දක් වූ මෙම යුගයේ දී, ප්‍රධාන වර්ණය ලෙස කැපී පෙනුණ බ්‍රාහ්මණ පිරිස පූජකයන් ලෙස සංවිධානය වී සිටියහ.

ඔවුහු : "බ්‍රාහ්මණ වර්ණය ම ශ්‍රේෂ්ඨය, අන්‍ය වර්ණයෝ පහත්ය, බ්‍රාහ්මණ වංශය ම ශුක්ල වර්ණය, ඉතිරි තුන් වංශයෝ ම කෘෂ්ණ වර්ණය. බ්‍රාහ්මණයෝ ම ශුද්ධ වෙත්. බ්‍රාහ්මණ නොවූවෝ ශුද්ධ නොවෙත්. බ්‍රාහ්මණයෝ ම බඹහුගේ මුවින් බිහි වූ, බඹහුගෙන් උපන් ඔහුගේ ඖරස පුත්‍රයෝ ය." යනුවෙන් උදම් ඇනූහ.[23] බ්‍රාහ්මණයන් විසින් සතර කුලයන්ට සතර ධනයන් පැනවූ බව

20 අ. නි. 3, පි.339. ම. නි. 2, පි.415. පු.ප, පි.331-333.

21 දී. නි. 3, පි.303; සිගාලක සූත්‍රය, අ. නි. 3, පි.73; සප්පුරිස සූත්‍රය.- අ. නි. 3, පි.72.

22 දී. නි. 3, පි.139; අග්ගඤ්ඤ සූත්‍රය.

23 ම. නි. 2, පි.673; එසුකාරී සූත්‍රය.

මජ්ඣිම නිකායේ එසුකාරී සූත්‍රයේ දැක්වෙයි.[24] ඒ අනුව බමුණෝ, බමුණන්හට පනවන ලද්දේ භික්ෂාචර්යාවය. ක්ෂත්‍රියන්හට දුනු හී පවරන ලද අතර, වෛශ්‍යයනට කෘෂිකර්මය හා ගෝරක්ෂාව පනවන ලදහ. බ්‍රාහ්මණ නියමය අනුව ශූද්‍රයනට හිමිවූයේ දෑකැත්ත හා කදය. ඉහත පැන වූ ස්වකීය ධනය ඉක්මවා යාම නොකටයුත්තක් ලෙස සලකනු ලැබී ය.

බමුණන් විසින් පරිචර්යා (පැනවීම්) සතරක් කළ බව ද එම (එසුකාරී) සූත්‍රය[25] විස්තර කරයි. එකී පරිචර්යා සතර අනුව බමුණෙක්, ක්‍ෂත්‍රියයෙක්, වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් විසින් බමුණකු හට පරිචර්යා කළ යුතු ය. ක්‍ෂත්‍රියයෙක්, වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් විසින් ක්‍ෂත්‍රියකුහට පරිචර්යා කළ යුතු ය. එම පරිචර්යා නීතියට අනුව වෛශ්‍යයෙක්හට, පරිචර්යා කළ යුතු වූයේ ශූද්‍රයෙකු විසින් පමණකි. මෙසේ ස්වකීය උසස් බව ආරක්ෂා කර ගැනීමට බමුණන් දැරූ උත්සාහය නිසා ඉමහත් වෙහෙසට පත්වූවෝ ශූද්‍රයෝ ය.

පක්ෂග්‍රාහීව, සාධාරණත්වයෙන් තොර ව ඉදිරිපත් කොට, සමාජ සම්මතයෙන්[26] තොරව, බලහත්කාරයෙන් පැනවුණ මෙම අදහස් තථාගතයන් වහන්සේ ධර්මයටත්, නීතියටත්, සාධාරණත්වයට හා සමානත්වයටත් එකඟ වන පරිද්දෙන් බැහැර කළහ.

"බමුණ උසස් කුල ඇති බව ප්‍රශස්ත යයි නොකියමි. උසස් කුල ඇති බව ලාමක යයි ද නොකියමි. උදාර වර්ණ ඇති බව උතුම් යයි නොකියමි. උදාර වර්ණ ඇති බව පාපයකයි නොකියමි. උදාර භෝග ඇති බව උත්තම යයි නොකියමි. උදාර භෝග නැති බව පාපයකැයි නොකියමි." යනුවෙන් උන්වහන්සේ උසස් කුලය ප්‍රශස්ත හෝ ලාමක බව නොපවසා ඒ ප්‍රශස්ත හෝ ලාමක

24 ම. නි. 2, පි.669; එසුකාරී සූත්‍රය.

25 එම. පි.673.

26 ම. 2, පි.671. එසුකාරී සූත්‍රය. සු.නි., පි.42, වසල සූත්‍රය - ගාථා අංක 136.

විය හැකි ආකාරය ද දැක්වූහ.[27] දස කුසල හෝ දස අකුසල කර්මවල පුද්ගලයා යෙදෙන ආකාරය අනුව ඒ කුලයෙහි උසස්[28] බව හෝ ලාමක බව මැනෙන සැටි දැක්වූහ. බමුණන් පැනවූ පරිචර්යාවන් තථාගතයන් වහන්සේ අගය කළේ ඉන් ලැබෙන ප්‍රතිඵලය අනුවය.[29]

"බමුණ, මම හැම පරිචර්යා කටයුතු යයි නොකියමි. හැම පරිචර්යා නොකට යුතු යයි ද නොකියමි. පරිචර්යා කරන යම් කිසිවකුට පරිචර්යා හේතුවෙන් ශ්‍රද්ධාව වැඩේ ද, ශීලය වැඩේ ද, ශ්‍රැතය වැඩේ ද, ත්‍යාගය වැඩේ ද, ප්‍රඥාව වැඩේ ද, මම ඔහු පරිචර්යා කටයුතු යයි කියමි. පරිචර්යා හේතුවෙන් ශ්‍රද්ධාව නොවැඩේ ද, ප්‍රඥාව නොවැඩේ ද, මම ඔහු පරිචර්යා නොකටයුතු යයි කියමි," යන්නෙන් ඒ පැහැදිලිය. "බ්‍රාහ්මණයෝ මැ බ්‍රහ්මයාගේ පුත්හ, ඖරසයහ, මුඛයෙන් ජාතයහ, .... එයින් ම බ්‍රහ්ම දායාදයහ," යයි බමුණන් පැවසූ අදහස් සඳහා තථාගතයන් වහන්සේ කුමක් පවසන්නේ දැයි අස්සලායන මානවක බොහෝ බ්‍රාහ්මණ පිරිසක් ඉදිරියේ දී තථාගතයන් වහන්සේගෙන් විමසූහ.[30]

"අස්සලායනයෙනි, බමුණන්ගේ බැමිණියෝ ඍතිනී වූවාහු ද, ගැබිණි වූවාහු ද, වදන්නාහු ද, කිරි පොවන්නාහු ද පැනෙත්. ඒ බමුණෝ ද යෝනියෙන් උපන්නාහුය." යනුවෙන් එම කතාවේ මිථ්‍යා ස්වභාවය අස්සලායතන සූත්‍රයේ දී පැහැදිලි කළහ. දීඝනිකාය අග්ගඤ්ඤ සූත්‍රයේ දී[31] ඉහත අදහස වඩාත් තීව්‍ර ලෙස ඉදිරිපත් කරන ලද ආකාරය :

"ඒ බමුණෝ යෝනියෙන් උපන්නාහු වන්නාහු, බ්‍රාහ්මණ වර්ණය ම ශ්‍රේෂ්ඨය, ... බ්‍රහ්මයෝ ම බ්‍රහ්මයාගේ දායාද වූ බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝ යයි කියත්. එසේ කියන්නාහු

27 සු.නි., පි.89-55, අ. නි. 3, පි.363.

28 සු.නි., පි.89-95, අ. නි. 3, පි.363.

29 ම. නි. 2, පි.671; එසුකාරී සූත්‍රය.

30 ම. නි. 2, පි.613; අස්සලායන සූත්‍රය. ම. නි. 2, පි.613, අ. නි. 3, පි.369.

31 ම. නි. 2, පි.667.

බ්‍රහ්මයාට ම නින්දා කෙරෙත් මුසවා තෙපලත්, බොහෝ අකුසල් ද රැස් කෙරෙත්.” යනුවෙන් සඳහන් කෙරිණ.

පුද්ගලයගේ උසස්කම ඇති වන්නේ පිළිගැනීම අනුවය.[32] පිළිගැනීම සඳහා පරිවාර සම්පත්තිය ද බලවත් සාධකයකි. සෝණදණ්ඩ ප්‍රසිද්ධ වූයේ මහත් සම්පත් හා පිරිස් සහිත වූ බැවිනි.[33] තථාගතයන් වහන්සේ බැහැ දැකීමට යාමට ඔහු කැමැත්ත පළ කළේ කරුණු දෙකක් නිසා යයි ස්වකීය පිරිසට දන්වයි. ඉන් පළමුවැන්න වූයේ තථාගතයන් වහන්සේ තමන් වෙත පැමිණෙන්නවුන්, “එන්න, මෙහි ආයේ මැනව”යි කියා පිළිගන්නා ආචාරශීලී ස්වභාවය ය. තථාගතයන් වහන්සේ කනට සුව එළවන වචන කීමෙහිත් පිළිසඳර කථාවෙහිත් දක්ෂ වූහ. පැමිණියවුනට තමන් වහන්සේ ම, මුලින් ම කතා කළහ.

තථාගතයන් වහන්සේ ස්වකීය ප්‍රදේශයට අමුත්තකු වූ හෙයින් තමන් ම පළමුව ගොස් අමුත්තාට කතා කළ යුතු බව සෝණදණ්ඩ ස්වකීය පිරිසට දැන්වූ දෙවන කාරණය විය. කාලීන සමාජය එකී චාරිත්‍රය උසස් පිරිසට දැන්වූ දෙවන කාරණය විය. කාලීන සමාජය එකී චාරිත්‍රය උසස් කොට සැලකූ බව වඞ්කී සූත්‍රයේ එන එබඳු ම කොටසකින් පෙනේ. “යම්කිසි ශ්‍රමණ කෙනෙක් අපගේ ගම් කෙතට එන්නේ නම් ඔහු අපට ආගන්තුක වෙති. ආගන්තුකයෝ අප විසින් සත්කාර ගරුකාර මානන පූජා කළ යුත්තාහ,” යනුවෙන් එහි වැදගත්කම අවධාරණය කෙරිණ.

තථාගතයන් වහන්සේ වෙත පැවති, අපමණ ගුණ සමුදාය ද බොහෝ පිරිස් උන්වහන්සේ වෙතට පැමිණීමේ හේතුවක් විය.[34]

දකුණු පයින් ම ගමන් අරඹති. ඉතා නුදුරෙහි පිය නගති. ඉතා ළඟ පිය නොතබති.... උඩ නොබලති. යට නොබලති. අවට බලමින් ද නොයති. වියදඬු පමණ දුර බලති. ආදී ලෙසින් උත්තර

32 G.A. P.262.

33 දී. නි. 1, පි.235. දී. නි. 1, පි.247. ජා.පො., පි.460. ම. නි. 2, පි.655, වඩකී සූත්‍රය.

34 ම. නි. 2, පි.655; වඞ්කී සූත්‍රය.

මානවක අගය කළ ලක්ෂණ පසු ව එකින් එක ස්වකීය ගුරුවරයා වූ බ්‍රහ්මායු බ්‍රාහ්මණයාට ද දන්වීය. එය ඇසූ බ්‍රහ්මායු බ්‍රාහ්මණ හුනස්නෙන් නැගී උත්තරා සංඝය සකස් කොට භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි දිසාවට නමස්කාර කළේ ය. පොක්ඛරසාති බමුණාගේ අතවැසි අම්බට්ඨ මානවක තථාගතයන් වහන්සේ හමුවීමට පැමිණි විට භික්ෂූන් වහන්සේ ඔහුට ආචාර විධි ද පැහැදිලි කර දී,[35] අවසර දුන්නේ ඔහු ප්‍රසිද්ධ පොක්ඛරසාති බමුණාගේ අතවැසි ප්‍රසිද්ධ කුලවතෙකු වූ හෙයිනි.

අම්බට්ඨ සූත්‍රයේ එන පරිදි අම්බට්ඨ තරුණයා තථාගතයන් වහන්සේ ඉදිරිපිට දී ආචාරශීලී නොවීමේ හේතුවෙන්[36] ලැජ්ජාවට පත්වන අයුරුත්, ඔහු ස්වකීය ගුරුවරයාගේ ගෞරවයට පවා හානි කරන අයුරුත් පැහැදිලිය.

"භවත් ගෞතමයෙනි, අම්බට්ඨ මානවකයා ලාමකය," යනුවෙන් ඔහුගේ ආචාර්ය වූ පොක්ඛරසාති ස්වකීය ගෝලයා පිළිබඳ ව පැවසූයේ ඔහු කොතෙක් හොඳින් සිප් සතර දැන සිටියේ වී නමුත් ආචාරශීලී නොවීම හේතුවෙනි. අම්බට්ඨ තරුණයා ශාක්‍යයන් හා උරණ වීමත්, ස්වකීය කුලය උසස් ය යන හැඟීමත් නිසා එසේ හැසිරුණ බව එම සූත්‍රයේ එන කරුණුවලින් පෙනේ. අම්බට්ඨ මානවක, ශාක්‍යයන්ගේ සන්ථාගාරය වෙත ගිය විටෙක[37] බොහෝ ශාක්‍යයෝත්, ශාක්‍ය කුමාරයෝත් උනුනට ඇඟිලිවලින් කෙවිටි කරමින්, මහත් කොට සිනාසෙමින් ඇඟිලි එකට ගැටීම් ආදියෙන් කෙළි කවටකමින් හැසිරුණ ආකාරය ඔහුගේ සිත් නොගත් බව පෙනේ.

ශාක්‍ය පිරිස උස් අසුන් ගෙන සිටියේ වී නමුත් කිසිවෙකුත් ඔහු දැක ඔහුට අසුනක් පිළිගැන්වීමට පවා ආචාරශීලී නොවීම ගැන ඔහු උරණ වී සිටියේ ය. "ශාක්‍යයෝ බමුණන්ට දාසව

35 L.G.A., pp.252-282. එම පි.581-587; බ්‍රහ්මායු සූත්‍රය.

36 දී. නි. 1, පි.155; අම්බට්ඨ සූත්‍රය.

37 දී. නි. 1, පි.155; අම්බට්ඨ සූත්‍රය. අ. නි. 3, පි.393; පු.ප. පි.304-305., අ. නි. 1, පි.237. පු.පු.ස., පි.855.

සිටත් බමුණන්ට සත්කාර, ගරුකාර, බහුමාන පූජා අපචායන නොකරන්නාහ යන මේ නොසුදුසු ය," යනුවෙන් එම පුවත අම්බට්ඨ මානවකයා තථාගතයන් වහන්සේට පැවසූයේ ස්වකීය කුලය[38] පිළිබඳ ව පැවති ගෞරවය හේතුවෙනි.

ඊට පිළිතුරු වශයෙන්, ක්ෂත්‍රියන් අත වරදක් නොමැති බවත්, කැට කිරිල්ලී පවා ස්වකීය කූඩුව තුළ නිදහස්ව සිටීමට කැමති බවත්, තථාගතයන් වහන්සේ ඔහුට වදාළේ ශාක්‍යයන් සතු තමන්ගේ නගරයේ දී ඔවුන් නිදහස් ව හැසිරීම ගැන අම්බට්ඨ වෛර බැඳීම නුසුදුසු නිසාය.[39]

ශාක්‍යයෝ බමුණන්ගේ මෙහෙකරුවෝය, යනුවෙන් අම්බට්ඨ දූරූ අදහස වෙනස් කළ යුතු විය. එහෙයින් තථාගතයන් වහන්සේ, අම්බට්ඨය, තට පෙර වූවක් කියමි, යි ඉතිහාස කතාවක් ගෙන හැර දක්වා ඔහු ද සාක්ෂ්‍ය කොට ගෙන, අම්බට්ඨ මානවක පරපුර ශාක්‍යයන්ගේ දාසයන් වූ බව සනාථ කළහ.[40]

එහෙත්, වේද හැදෑරූ, උගත්, අම්බට්ඨ මානවකයා හට මේ කථාව හේතුවෙන් දාසි පුත්‍ර වාදයෙන් අන්‍යයන් ගරහනු නො ඉවසූ තථාගතයන් වහන්සේ, "අම්බට්ඨ මානවකයා හට දාසිපුත්‍ර වාදයෙන් නොගරහු. ඔහුගේ ආදි පුරුෂ වූ කාණර්ෂි තෙමේ මහානුභාව ඇත්තෙකු විය. පුරාණ කථාවක් දක්වා ඔහු අස්වසා ලීමට ක්‍රියා කළහ.[41] ගෝත්‍රය ඔස්සේ පෙරළා ගොස් විමසන ජනයා අතුරෙහි ක්ෂත්‍රියයා ශ්‍රේෂ්ඨය. විද්‍යා චරණ දෙකින් යුත් යමෙක් වේ නම් හේ දෙව් මිනිසුන් අතුරෙහි ශ්‍රේෂ්ඨය", යන්න තථාගතයන් වහන්සේ ඔහුට දක්වූයේ එක් කුලයකට වඩා අනෙක් කුලයක් උසස් යයි පැවසීම සඳහා නොව, එය ව්‍යවහාරයට හා ධර්මයට එකඟ සත්‍යයක් වූ බැවිනි.[42]

---

38 දී. නි. 1, පි.157; අම්බට්ඨ සූත්‍රය.

39 දී. නි. 1, පි.157; අම්බට්ඨ සූත්‍රය. බ.ද පි.862. ම. නි. 2, පි.704. අ. නි. 1, පි.235-237, පු.පු.ස, පි.863.

40 දී. නි. 1, පි.159; අම්බට්ඨ සූත්‍රය. E.S.D.S. p.19

41 දී.නි. 1, පි.159-163; අම්බට්ඨ සූත්‍රය.

42 -එම- පී.165.

අග්ගඤ්ඤ සූත්‍රයේ, ලෝක ව්‍යවහාරය අනුව යමින් පුරාණ වංශ කථාව දක්වා ඇති අවස්ථාවේ දී ක්ෂත්‍රීය යන්න ව්‍යවහාරයට පැමිණි අන්දම දක්වා තිබේ. "ලෝකය සර්ව බලධාරී දෙවි කෙනෙකුන්ගේ නිර්මාණයක්ය", යන අදහස ඉදිරිපත් කොට ප්‍රභූත්වය සඳහා බමුණන් විසින් ගෙන ගිය සංවිධානාත්මක ව්‍යාපාරය, අර්ථ රහිත වූවක් කළ හැකි වූයේ වඩාත් බුද්ධි ගෝචර වූත්, සදාචාරමය වූත් චින්තනයක් ඉදිරිපත් කිරීමෙනි. ලෝකයේ ආරම්භය ගැන කරුණු දැක්වීම සත්ත්වයාගේ වර්තමාන ගැටලුව වූ දුක හා දුකින් මිදීම සඳහා පිහිටක් නොවන හෙයින් ඒ පිළිබඳ ව තථාගතයන් වහන්සේ කරුණු නොදැක් වූ මුත්, නිර්මාණවාදී, ඊශ්වරවාදී අදහස්වලින් ලෝකයේ ආරම්භය දැක්වීම වෙනුවට, ස්වභාව ධර්මයට ගැළපෙන ආකාරයටත්, ධර්මයට ගැළපෙන ආකාරයටත් කරුණු පැවසීමට තථාගතයන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී[43] ව්‍යවහාරයේ පැවති කථාව ඉදිරිපත් කළ බව සැලකිය යුතු ය.

ලෝකය පාලනය කරන දේව බලයක් නැතත්, කලින් කල ලෝකය විනාශ වී යාමත්, ඊට පසු ව නැවත ක්‍රමයෙන් ලෝකය හට ගැනීමත් සිදුවන බවත්, එසේ ලෝක විනාශයක් සිදුවන විට සියලු ම සත්ත්වයෝ ආභස්සර දේව තත්ත්වයට පත්වන බවත් මෙම අග්ගඤ්ඤ සූත්‍රයෙන් පැවසේ.[44] ලෝකය නැවත හටගැනීමේ දී ආභස්සර දේව ලෝකයෙහි උපන් සත්ත්වයෝ ඉන් චුත ව මෙලොව උපදිත්. ආභස්සර දේව තත්ත්වයෙහි දී මෙන් ම මෙලොව දීත් ඔවුහු මනෝමය වූ ශරීරයකින් යුතු ව ප්‍රීතිය ම ආහාරකොට ගනිමින් තමන්ගේ ප්‍රභාවෙන් ම ආලෝකමත්ව අහසේ හැසිරෙමින් සුවසේ දීර්ඝ කාලයක් ගත කළ බව එකී සූත්‍රය පවසයි. එකල සැම තැන ම ජල කඳක් හා අඳුරක් පමණක් පැවති අතර 'සත්ත්වයෝ' යන නම පමණක් විය. ඉර හඳ හා රෑ දාවල් යන විශේෂයක් නොමැති ව කලක් ගත විය. කල්

43 අ. 3, පි.247; ඛත්තියරාජ සූත්‍රය. එම - පි.245 ධම්මරාජ සූත්‍රය. අ. නි. 1, පි.207-209. ම. නි. 2, පි.701-711.

44 දී. නි. 3, පි.145 අග්ගඤ්ඤ සූත්‍රය. මා.ද., පි.81-82. දී. නි. 3, පි.138.

ගතවීමේ දී දිය කඳ මතුයෙහි රස පොළොව යොදයක් මෙන් සකස් විය. වර්ණ සම්පන්න, සුවඳින් හා රසයෙන් යුත් යොදය දිව ගා බැලූ සත්ත්වයෙක් ඉන් හටගත් තෘෂ්ණාව හේතුවෙන් එම රස පොළොව වඩ වඩාත් අනුභව කළේ ය. ඔහු අනුගමනය කළ අන් බොහෝ දෙනාත්, රස තෘෂ්ණාව හේතුවෙන් රස පොළොව අනුභව කළහ. තෘෂ්ණා හේතුවෙන් ඔවුන් තුළ වූ ස්වයං ප්‍රභාව අතුරුදහන් විය. ඉර, හඳ, තාරකා හටගත්තේ ස්වයං ප්‍රභාව නැති වූ විටය. රස පොළොව කෑ සත්ත්වයන්ගේ වර්ණ වෙනස් වන්නට වීමේ හේතුවෙන් වඩාත් පැහැපත් වූ සත්ත්වයෝ අන්‍යයන් හෙළා දකින්නට වූහ. බිම්හතු, බදාලතා, ඇල් සහල් ආදී දෑ ක්‍රමයෙන් ආහාර කොට ගත් ඔවුන්ගේ වර්ණනයන් වඩාත් වෙනස් වී වර්ණ භේදය පැහැදිලි ව දක්නට හැකි විය.[45] මෙකල ස්ත්‍රී පුරුෂ ලක්ෂණ පහළ වීමේ හේතුවෙන් ඔවුනොවුන් දෙස බලා සිටීමටත්, සරාගී බවින් බැඳී, දාහය හේතුවෙන් මෛථුන සේවනයටත් ඔවුහු ක්‍රමයෙන් පුරුදු වූහ. මෛථුන සේවනය[46] අපවිත්‍ර දෙයක් හා අපරාධයක් කොට සැලකූ පුද්ගලයන්ගේ විරෝධයෙන් බේරී සිටීමට මෛථුන සේවනය කළ වුන් ගෙවල් තනා ගත්හ. අලස[47] මිනිසකු ඒ ඒ වේලාවට සරිලන ඇල් හාල් ගෙන යාමෙන් වෙහෙස වන්නේ යයි සිතා දෙවේලට ම සරිලන පරිදි ඇල් හාල් ගෙන යාමට උත්සාහ දැරී ය. **මෙම උත්සාහයේ අවසානය වූයේ එක එකා පරදවමින් රැස් කරන්නට මිනිසුන් පෙළඹීම ය.**[48] රැස් කිරීම නිසා කෙත්වල හටගත් ඇල්හාල්වල සුලබ බව ද අඩු විය.

ඇල්හාල් අඩුවීම නිසා එකිනෙකා 'තම තමන්ට යයි' අයත් කර ගනිමින් වැට කොටු ගසා 'ඉඩම්' වෙන්කර ගැනීමටත්, අයිතිය කියා පාන්නටත් විය. **ලෝභ සහගත පුද්ගලයෙක් තමන්ගේ කොටසට අමතර ව අන්‍යයන්ගේ කොටස් සොරකම් කර ගන්නට**

45 L.G.A. p.18

46 දී. නි. 1, පි.145; අග්ගඤ්ඤ සූත්‍රය. ජ.පො., පි.246-248. u.p.126.

47 දී. නි. 1, පි.1149-151; අග්ගඤ්ඤ සූත්‍රය.

48 දී. නි. 3, පි.151.

**පුරුදුවීම නිසා, සොරකම[49] පැතිරිණ. සොරුන්ට දඬුවම් පැමිණ වීමට යාම නිසා, ගැරහීම, මුසාව හා අවි ගැනීම සිදු විය.** මෙසේ එක් එක් අකුසල ධර්ම පහළවීම නිසා දොස් නැගීම, ගැරහීම, නෙරපීම ආදී ක්‍රියාවන් සඳහා සියලු දෙනා විසින් ම කාලය නොයොදා ඒ වෙනුවට එක් පුද්ගලයකු පමණක් සම්මුතියෙන් පත්කර ගත යුතු බවට අදහසක් ඇති විය. එහි ප්‍රතිඵලය ලෙස මිනිස්සු එක්රැස් වී කතිකා කොට ගෙන බොරුකීම, සොරකම ආදී වැරදි සඳහා දඬුවම් දීමට සුදුසු පුද්ගලයකු නම් කළේ ය.[50] ඔහුට ස්වකීය කෙත්වලින් ලැබෙන ධාන්‍ය කොටසක් ඔහුගේ ශ්‍රමය සඳහා දීමට ද පිරිස එකඟ විය. ඔවුන් අතරින් වඩාත් රූප සම්පන්න වූ, ගුණ නුවණින් යුත්, මහේශාක්‍ය පෙනුමක් සහිත පුද්ගලයා මේ සඳහා සම්මත කළ අතර, ඔහුට පොදු අනුමැතිය ලැබීම හේතුයෙන් මහා සම්මත යන නම ද ව්‍යවහාරයට පැමිණියේ ය.

සියලු කෙත්වලට අධිපති වූ ඔහු 'ඛත්තිය'[51] යන නමින් ද හැඳින්විණ. ධර්මයෙන් ජනයා පිනවයි යන අර්ථයෙන් ඔහුට 'රජ' යන නම ද භාවිතා විය. රාජ මණ්ඩල ව්‍යවහාරය ආරම්භ වූයේ එසේ ය. **රජ ධාර්මික පාලනයේ සංකේතය විය.**[52]

ඔවුන් අතර වූ සමහර කෙනෙක්; (මිනිසුන් අතරට) හොරකම, බොරුව, ගර්හාව, දඬුමුගුරු ගැනීම, දඬුවම් පැමිණවීම[53] වැනි අකුසල් සමාජ ජීවිතයට පිවිසීම ගැන දුක් වී එම අකුසල් දුරු කිරීම මැනවයි සිතා, කැලෑවල පන්සල් තනාගෙන ධ්‍යාන වැඩූහ. පව් දුරු කළ හෙවත් **'බාහිත පාප'** නම් වූ **ඔවුහු බ්‍රාහ්මණ**[54]

49 සු.නි., පි.33, ගාථා අංක 96. දී. නි. 3, පි.295, සිගාලක සූත්‍රය. ථෙර, පි.59, ගාථා අංක 147 හා 265.

50 E.S.D.S. p.18.

51 දී. නි. 3, පි.158 - එම- පි.111.

52 දී. නි. 3, පි.157; අග්ගඤ්ඤ සූත්‍රය. ජා.පො., පි.455.

53 අ. නි. 3, පි.249.

54 අ. නි. 3, පි.157-159 - ජා.පො., පි.500-510. දී. නි. 3, පි.100.

**නම් වූහ.** ධ්‍යාන වැඩීමට අපොහොසත් වූ ඇතැමුන් ගම්වලට පැමිණ ග්‍රන්ථ කිරීම ඇරඹූයෙන් ඔවුහු 'අධ්‍යායකයෝ' යයි නම් ලැබූහ.[55] "එකල අධ්‍යායකයින්, ධ්‍යාන කළවුන්ට වඩා පහත් යයි සම්මත වුව ද, මෙකල අධ්‍යායකයින් උසස් යයි පිළිගන්නේය යි ද සමාජයේ කාලීන වශයෙන් සිදුවන පෙරළීම් ස්වභාවය ද තථාගතයන් වහන්සේ එම සූත්‍රයෙන් දැක්වූහ.

මෛථුන සේවනය කරමින්, ගව පාලනාදී විවිධ කර්මාන්තයන්හි නියැළී පුද්ගලයන් වෛශ්‍යය නම් වූහ. පහත් වූත්, රෞද්‍රාචාර, ක්ෂුද්‍රාචාර ඇත්තාවූත් පිරිස ශූද්‍ර නම් විය. ඛත්තිය, බ්‍රාහ්මණ, වෛශ්‍යය සහ ශූද්‍ර යන කොටස් හතරේ වූ සමහරු අපි ශ්‍රමණ ජීවිතයට පිවිසෙන්නෙමු'යි සාති ගිහිගෙයින් නික්ම පැවිදිවීම නිසා ශ්‍රමණ[56] කොටසෙහි ආරම්භය විය. ගිහි ගෙයින් බැහැර වන්නවුන් එසේ කළේ ගිහිගෙයි[57] පවතින දෝෂය සැලකීමෙනි. ජාතක පොතේ එන බන්ධනාගාර ජාතකයට[58] අනුව, 'ගිහි ගෙයින් මිදීම නිරයෙන් මිදීමකි'යි දැක්වේ.

අග්ගඤ්ඤ සූත්‍රයෙන් හෙළිවන කරුණු අනුව මහජන අවශ්‍යතා පිරිමසා ගැනීමේ උපකරණයක් ලෙස හෝ උපක්‍රමයක් ලෙස හෝ ආරම්භ වූ සතරාකාර සමාජය, සම්මුතිය මත මුලින් පැවතී, පසු ව ස්ථාවරත්වයට පත්වීමෙන් නීතිමය ස්වභාවයකට පෙරළී ගිය බවක් පෙනේ. **බොහෝ විට යහපත් චේතනාවෙන් පටන් ගන්නා බොහෝ දෑ මිනිසුන් ගේ ආත්මාර්ථකාමී ස්වභාවය නිසා මුල් සිතුවිල්ලට හාත්පසින් ම වෙනස් වූ ආකාරයකින් පෙනී සිටින්නට පටන් ගන්නා නිසා සාධාරණ ධාර්මික අදහසක් වුව, අසාධාරණ, අධාර්මික නීතියක් බවට පත්විය හැකි ය.**[59]

55 ජා.පො., පි.485-487. අ. නි. 3, පි.339-341.

56 අ. නි. 3, පි.345. සු.නි., පි.103-199; ම. නි. 2, පි.705-709.

57 දී.3, පි.141. අ. නි. 3, පි.239. අ. නි. 3, පි.209. අ. නි. 3, පි.207.

58 ජා.පො., පි.449-451.

59 ජා.පො., පි.381.

සමාජයක් ගලාගෙන යන ගඟකට උපමා කරන්නේ නම් එහි ගලාගෙන යන ස්වභාවය එකවර නතර කිරීම පහසු නොවේ. එහෙත් මිනිස් නුවණ සියලු නිර්මාණයන් කෙරෙහි දක්වන සහජ දක්ෂතාවන් මත ඒ නොකළ හැක්ක'කැයි අත්හැර දැමීම ද ගැළපෙන්නක් නොවේ. **බාධක පැනවීමෙන් තම තමන් කැමති පරිදි ගංගා ජලය අවශ්‍ය තැන් කරා ගෙන යන ජල විද්‍යාඥයින්[60] මිනිස් යහපතට ඉටු කරන මෙහෙය ගැන සිතා බැලීමේ දී ගලාගෙන යන මිනිස් ගංගාව (සමාජය) ද අවස්ථානුකූල ව බාධක පැනවීමෙන් මිනිස් යහපත සඳහා යෙදවිය හැකි ය.** එහි ලා අවශ්‍ය වනුයේ තම තමා ම පාලනය කරගත් නුවණැති පුද්ගල පිරිසකි.

තමන් නො රැකී අනුන් රැකීමට යන පුද්ගලයා කිසි දිනෙක කළ නොහැකි කාර්යයක යෙදෙන්නෙකි. යමෙක් තමන් රකින්නේ නම් ඔහු අනුන් රැකීමට ද දක්ෂයෙකැයි අසංකිය ජාතිකය[61] සඳහන් කරයි. **"යමෙක් දකී ද, එය නොකමැතිය. යමක් නොදකී ද එය කැමති වන්නේ යයි සිතමි", යන්නෙන් අදහස් කරන ලද්දේ ආශාවේ සීමාවක් නොමැති බවය.** ආශාවන්ගෙන් අසීමිත වූ සමාජය තව තවත් නොලැබූ, නොදුටු දෑ ප්‍රාර්ථනා කරමින් ඉදිරියට ඇදෙයි. එකී ආශාවන්ට බාධක පැනවිය හැක්කේ තෘෂ්ණාව නැති කළ උතුමන්ට පමණි.[62]

ගංගාව යනු කුමක් දැයි බොහෝ දෙනා නොදනිති. එහෙයින් ගඟ යනු කුමක් දැයි විමසීමේදී වැල්ල, ජලය, එතෙර, මෙතෙර ආදී විවිධ වචන භාවිතයෙන් පිළිතුරු දීමට උත්සාහ කරති. **ගඟ යනු එක්තරා සම්මුතියක් හෙයින් එකී සම්මුතිය විසින් පිළිගනු ලැබූ විවිධ අංග උපාංග 'ගඟ' යන්නට අයත් විය යුතු ය.**

---

60 දී. නි. 3, පි.139-141; අග්ගඤ්ඤ සූත්‍රය. ජා.පො. පි.68. ජා.පො., පි.383-385.

61 ද.ප., 6-5 පණ්ඩිත වර්ගය., ම. නි. 2, පි.526.

62 ජා.පො., පි.140-143.

එහෙයින් විචිකිච්ඡා ජාතකයේ දී[63] එක්තරා පිරිවැජියෙක් වාදයෙන් ජය ගැනීමට සිතා බෝධිසත්ත්වයන්ගෙන් ගංගාව නම් කිම? වැලි ද ගඟ, එතෙර ද ගඟ, මෙතෙර ද, වැලිත්, ජලයත් නොමැති නම් ගංගාවක් කොයින් ද යන්නය. 'සමාජය' යනු කුමක් දැයි කෙනෙකු නගන පැනය ද මෙබඳු පිළිතුරකින් කෙළවර කළ යුත්තේ 'සමාජය' යන්න සම්මුතීන් රාශියක ගේ එකතුවක් බැවින්, එකක් ගෙන එකක් අත්හැරීම අපහසු වන්නේ 'එක' යනු කුමක් දැයි බොහෝ දෙනෙකු නොදන්නා බැවිනි. එය බුද්ධ ශ්‍රාවකයන්ට ඒ එතරම් ගැටලුවක් නොවූ බව පෙනේ. ('තණ්හා ජනෙති පූරිසං යන්නෙන්') සත්ත්වයා උපදවන්නේ තෘෂ්ණාව බව වටහා ගන්නා බුද්ධ ශ්‍රාවකයා ('සභූත පචිනං පචි නම් වූ') තෘෂ්ණාව නසයි. එකී ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කාලය කන භූතයා ('කාල සාසො භූතෙ') ලෙස හැඳින් වේ. එහෙයින් "ලෝම සහිත හිස් ගොඩක් මත කන් ඇත්තේ කිහිපයකි" යි කියති. මෙහි 'කන්' ලෙස දක්වන ලද්දේ ප්‍රඥාවය.[64] **පොදු යහපත හා සාධාරණත්වය ප්‍රඥාවේ ප්‍රතිඵලයකි.**

'සමාජ හරය' නම් වූ පොදු යහපත හා යුක්තිය පිළිබඳ ව, සමාජයේ සියලු දෙනාට ම පැහැදිලි අවබෝධයක් තිබිය යුතු බව කවුරුත් පවසති. පසු කාලයේ ද යහපත් පුරවැසියෙකු ලෙස සමාජයට මුහුණ දිය යුතු, කුඩා පුද්ගලයාට (ශිෂ්‍යයා) සමාජ හරයන්[65] නම් වූ අගයන් වටහා දිය හැක්කේ 'අධ්‍යාපනය'[66] නම් වූ අත්දැකීම් තුළිනි. **තමා අයත් සමාජය අවබෝධ කර ගැනීම, ඒ සමාජයේ සිතුම්, පැතුම් අනුව පුද්ගල චර්යාවන් හැඩගස්වා ගැනීම හා පවත්වා ගැනීම, සමාජයේ අයෙකු ලෙස ජීවත්වීම හා එසේ ජීවත් වීමේ දී මතුවන ගැටලු විසඳා ගැනීමට හැකියාවක් හා දක්ෂතා ලබා ගැනීම, පුද්ගලයා විසින් කළ යුතු ම ය.**[67] සමාජයේ

---

63 ජා.පො., පි.468. අශෝක ලිපි, පි.22.

64 ජා.පො., පි.466-469 විතිච්ච ජාතකය.

65 ජා.පො., පි.470. පුලපරියාය ජාතකය. P.I.P., pp.203-204'

66 OTTAWAY A.K.C.., E.S., p.41 ම. නි. 1, පි.493.

67 Benton Willam- C.E. 20, p.244.

සාමාජිකයෙකු ලෙස පුද්ගල යුතුකම් හා වගකීම් හඳුනා ගැනීම, යහපත් ජීවිතයක් සඳහා සුදුසු ජීවනෝපායක් තෝරා ගැනීම හා බුද්ධිමත් ලෙස ජීවිතය ගෙන යාමට මාර්ග සලසා ගැනීම ආදී විවිධ සමාජමය අරමුණු පුද්ගලයා කෙරෙහි අධ්‍යාපනයෙන් ආරෝපණය කෙරේ.[68]

අධ්‍යාපන මනෝ විද්‍යාව පුද්ගලයා මව් කුසයේ සිටිය දී පවා, අපේක්ෂිත චර්යා ධර්ම; වෛද්‍ය විද්‍යාව ආදී අනෙකුත් විද්‍යාවන් සමග ගලපා පැහැදිලි කරනු ලබයි. සමාජ විද්‍යාව ආදී අනෙකුත් විද්‍යාවන්ගේ ද සහායෙන් අධ්‍යාපනඥයන් දක්වන කරුණුවලට අනුව පුද්ගලයාගෙන් අපේක්ෂිත සියලු අරමුණු, මූලික වශයෙන් සංරක්ෂණ කාර්යය හා නිර්මාපණ කාර්යය වශයෙන් වර්ග කෙරේ. සංරක්ෂණ කාර්යය යනුවෙන් අදහස් කරනුයේ සමාජය (වර්තමානයේ දී) පවත්නා ලෙසින් ම ස්ථාවර ව පවත්වා ගෙන යාමේ කාර්යය යි.[69] එයින් පුද්ගලයාගෙන් බලාපොරොත්තු වන කාර්යය වනුයේ ඔහු දනට ජීවත්වන සමාජයේ, සමාජ අරමුණු දන හැඳින හුරුකර ගැනීමය. පිළිගත් අගයයන්, සදාචාර ධර්ම, නීතිරීති ආදී විවිධ සමාජ ආරක්ෂණ විධි මෙහි ලා පුද්ගලයා දත යුතු බව, පිළිපැදිය යුතු බව හඟියි. නිර්මාපණ කාර්යය වනුයේ, සමාජය වෙනස් කිරීමට ඉවහල් වන හා වෙනසකට අනුකූල වන නවතම අගයයන් ගොඩනැගීමත්, පැරණි අගයයන් ඉවත් කිරීමත් යන දෙ ආකාර කාර්යය. ඕනෑ ම සමාජයක ස්වභාව ලක්ෂණ පරීක්ෂා කිරීමෙන් එකී සමාජය ඉහතින් සඳහන් කළ සංරක්ෂණ හා නිර්මාපණ කාර්යයන්හි නියුක්ත වී ඇති බව වටහා ගත හැකි ය. එහෙත් එකී කාර්යයන් සිදුවන වේගය දෙස බලන සමාජ විද්‍යාඥයන්, ඇතැම් සමාජ ස්ථිතික (Static) සමාජ ලෙසත්, අනෙක් ඒවා ගතික (Dynamic) සමාජ ලෙසත් අර්ථ දක්වන්නට කැමතිය.

සංරක්ෂණ කාර්යයට ප්‍රධාන තැන ලැබෙන සුලු, ඉතා හෙමින් වෙනස්කම් සිදුවෙන, සිදු කෙරෙන සමාජ '**ස්ථිතික සමාජ**' ලෙස

68 Benton Willam- C.E. 20, p.244.

69 C.E. 20 p.242.

දක්වති.[70] නිර්මාපණ කාර්යයට ප්‍රධානත්වය දී ඉතා ඉක්මනින් සමාජයීය වෙනස්කම් සිදුවන, සිදු කෙරෙන සමාජ, ගතික යයි කියති. වෙනස් වන සමාජයක නවතම අගයයන් මඟින් පැරණි අගයයන් ඉවත් කිරීම නිසා සමාජයට ඔරොත්තු නොදෙන තත්ත්වයක් ඇති නොකළ යුතුයි. අධ්‍යාපනය සමාජයේ ක්‍රියාත්මක වන්නක් හෙයින් අධ්‍යාපනය ක්‍රියාත්මක වන සමාජයේ අරමුණු සමඟ අධ්‍යාපනය අරමුණු ද පෑහිය යුතු ය.

'සමාජය' යන වචනය විවිධ උගතුන් විග්‍රහ කරන ලද්දේ විවිධ කෝණවලිනි. අධ්‍යාපනඥයෙකු වන ඔටාවේගේ අර්ථ දැක්වීම අනුව සමාජයක් යනු, 'එකට ජීවත්වන මිනිසුන් සමූහයකි.' **ඒක රාශීව වෙසෙන මිනිසුන් සමූහයක් සමාජයක් හෝ ජන සමූහයක් ලෙස හැඳින් වේ. එකී ජන සමූහය යම්කිසි දේශ සීමාවක් තුළ ජීවත් වන එක් ජීවන ක්‍රමයකට හැඩගැසුන පිරිසකි.**[71] ඒ සමූහයා තුළ සමාජ අරමුණු හෝ සමාජ සංවිධානය පිළිබඳ ව හැඟීමක් ඇති හා නැති දෙපිරිස ම වේ. සමාජශීලී හා සමාජශීලී නොවන වැඩිහිටි හා වැඩිහිටියන් නොවන පිරිස් වේ. ජන සමූහයකත්, සමාජයකත් දැකිය හැකි වෙනස ලෙස ඇතැම්විට පොදු පරමාර්ථ පිළිබඳ හැඟීමක් නැති, ඇති ස්වභාවය අවධාරණය කරති. ජන සමූහය පිරිස අතරේ පොදු පරමාර්ථ හෝ අරමුණු නොදන්නා අය බෙහෙවින් සිටිය හැකි ය. **එහෙත් සමාජයක සිටින පිරිස පොදු පරමාර්ථ හා අරමුණු පිළිබඳ හැඟීමක් ඇත්තන් ලෙස සැලකේ.** පොදු අරමුණු, පරමාර්ථ, සාරධර්ම, සමාජ හර ආදිය ගැන සමාජයේ සාමාජිකයන්ට අවබෝධයක් පවතින විට, ඒවා සමාජ අභිමතාර්ථයන්ට ගැළපෙන පරිදි සමාජ දියුණුවට ගැළපෙන ලෙස වෙනස් කළ හැකි ආකාරය පිළිබඳව ද සාමාජිකයන්ට දැනුමක් ලැබෙනු ඇත. සමාජය වෙනස් වන හෙයින් එවන් දැනුමක් සමාජයේ සාමාජිකයන්ට තිබිය යුතු ය. විද්‍යාත්මක හා තාක්ෂණික ශිල්පීය ක්‍රමවල දියුණුවත් සමග, විප්ලවීය තත්ත්වයකින් ඒ ඒ සමාජය තුළ විපරිණාමයක් සිදු

70 C.E. 20, p.59.

71 OTTAWAY, A.K.C. - (Education and Society). E.S., pp. 2-7. E.S., pp.2-3.

වේ. එවිට සමාජයේ වෙනස් වීමේ වේගය ද ඉතා අධික වේ. සමාජ විපර්යාසයක දී[72] එම සමාජයට ආවේණිකව පැවති සිතුම් පැතුම් හා ජීවන රටාව ද වෙනස් වේ. ඒ වෙනස නිසා, කලින් පැවති පරමාර්ථ අලුත් මුහුණුවරක් ගත යුතු ය. ප්‍රාර්ථනා හා බලාපොරොත්තු ද වෙනස් වේ. පෙර පැවති ආර්ථික හා දේශපාලනමය ක්‍රම වෙනස්වීමක් සමග පාලන තන්ත්‍රය තුළ ද විවිධ වෙනස්කම් පැන නැගේ.

සමාජයේ විවිධ වෙනස්කම් සිදුවන විට, සමාජයේ සාමාජිකයින් වූ පිරිස් අතරේ ද නොරිස්සුම් ස්වභාවය මතු වී ගැටුම් ඇති විය හැකි ය.[73] එක් කොටසක් වෙනස්කම් අපේක්ෂා කරති. අනෙක් කොටස අලුත් අදහස් වැද්ද ගැනීම වෙනුවට පවතින සමාජය එසේ ම පවත්වා ගැනීමට උත්සුක වෙති. ඉහත දෙ පිරිස අතරේ පවතින ගැටුම් ස්වභාවය, සමාජ යහපතට හේතු වන්නේ, එකී ගැටුම් තුළින් ගතික හා ස්ථිතික සමාජමය තත්ත්වයන් සමතුලිත ස්වභාවයකින් පවත්වා ගැනීමට උපකාර වන හෙයිනි. වඩාත් ගැළපෙන අදහස පමණක් අලුතින් වැද්ද ගැනීමට සමාජයට බලපෑම් කිරීම, පවතින තත්ත්වය එසේ ම පවත්වා ගැනීමට කැමති පුද්ගලයන් නිසා සිදු වේ. එම ප්‍රතිරෝධය නොවන්නට, තත්ත්වය වඩාත් අයහපත් විය හැකි ය. සමාජයේ සිදුවන වෙනස්කම් සෑම විටක ම යහපත් ප්‍රතිඵල ගෙන නො දෙන බව ඒ ඒ රටවල සිදු වූ, සිදුවන වෙනස්කම්වලින් දැනගත හැකි ය.

1. නොදියුණු සමාජ,
2. දියුණු වන සමාජ,
3. දියුණු සමාජ,

නමින් ඒ ඒ සමාජ අතීතයේ පැවතිණ. වර්තමානයේ දී ද එසේ ම පවතී. අනාගතයේ දී ද එසේ වනු ඇත. යම්කිසි අවධියක පුද්ගල හැඩ ගැස්ම රඳා සිටුවීමට ඒ ඒ රටේ පවතින සංස්කෘතික

72 OTTAWAY, A.K.C. - (Education and Society), E.S. pp. 48-58. E.S., p.52.

73 E.S., p.58.

බලපෑම ප්‍රධාන වේ. එකී සංස්කෘතික බලපෑම කරුණු දෙකක් මත පවතී.

1. එළැඹී පවතින විද්‍යාත්මක නව සොයා ගැනීම් හා තාක්ෂණික ශිල්ප ක්‍රම ආදී නවතම අදහස්,

2. සමාජයේ වඩාත් ප්‍රබල ව පවතින අභිමතාර්ථ සහ සාරධර්ම,

එකී කරුණු දෙක ය.[74] අධ්‍යාපනඥයන් තමන් අයත් සමාජයේ දියුණුවට ඉටු කළ යුතු මෙහෙය වන්නේ, එකී සමාජය විවේචනාත්මක ඇසින් බලා ස්වකීය යෝජනා ඉදිරිපත් කිරීමය. සමාජයට ගැළපෙන පුද්ගලයන් රැසක් බිහිකර ලීමේ කාර්යය ඉටු කළ හැක්කේ ඒ අයුරිනි.

විද්‍යාත්මක හා තාක්ෂණික ශිල්ප ක්‍රම අවශ්‍ය වන්නේ මූලික මනුෂ්‍ය අවශ්‍යතා ඉටු කරවා ගැනීම සඳහා ය.[75] ආහාර, නිවාස, ඇඳුම්, පණිවුඩ හුවමාරුව, ප්‍රජනනය ආදී මූලික අවශ්‍යතා පුද්ගලයන් වෙනුවෙන් ඉටුවිය යුතු ය. පොදුවේ 'ප්‍රජාවක්' වශයෙන් ඉදිරියට යාම ද අපේක්ෂා කෙරේ. එක් එක් අවධියේ දී සොයා ගත් නව නිර්මාණයන් වන ගින්දර ප්‍රයෝජනයට ගැනීම, ආහාර පිසීම, කෘෂිකර්මය, සත්ත්ව පාලනය, රෝදය, ලෝහ භාවිතය, ගණිත ක්‍රම උපයෝගී කර ගැනීම හා යන්ත්‍ර සූත්‍ර වර්ධනය (බලය සඳහා සුළං, ජල වාෂ්ප, තෙල්, විදුලිය, පරමාණු හා න්‍යෂ්ටික බලය යොදා ගැනීම) නිසා ඒ ඒ අවධියේ දී, ශිල්පීය ධර්ම දියුණු විය.[76] සාමූහික ජීවිතය සඳහා වූ භාෂාව, පවුලේ ස්වභාවය, මුදල් භාවිතය, වෙළඳාම, පාලන ක්‍රම හා බාලයන්ට අත්දැකීම් ලබා දීම නම් වූ අධ්‍යාපනය ද අවශ්‍ය විය.

සමාජ සාරධර්ම හා ශිල්පී ධර්ම යන දෙකෙහි අන්තර් ක්‍රියාකාරීත්වය පුද්ගලයා ඉදිරියට ගෙන යන සංස්කෘතික හැඩ

74 OTTAWAY, A.K.C.-E.S., pp.41-48. E.S., p-41.

75 OTTAWAY, A.K.C.-E.S., p.41-43.

76 බ.ද., පි.536.

ගැස්ම වේ. සමාජ සාරධර්ම හා අභිමතාර්ථ රඳා පවතින්නේ ආගම, දර්ශනය[77], කලාව, විද්‍යාව ආදී කරුණු උඩය.

ශිල්ප ධර්ම

අභිමතාර්ථ හා සාරධර්ම

සංස්කෘතිය

(අන්තර් ක්‍රියාකාරීත්වය)

යම්කිසි සමාජයක, ක්‍රියාත්මක වන සමාජයීය බලවේග[78], සංස්කෘතිය විසින් තීරණය කරනු ලබන ඒවා වේ. සංවිධානය වූ හෝ නොවූ කණ්ඩායම් පමණක් නොව, ඇතැම්විට පුද්ගලයන්[79] පවා සමාජ බලවේගයන් බවට පත්වේ. සමාජයේ පවත්නා ශිල්පී හා සාරධර්ම වෙනස් කිරීමෙහි ලා ඔවුන්ට එක එල්ලේ ම බලපෑම් කළ හැකි ය.

සමාජයීය බලවේග ලෙස ඇතැම් විට යම්කිසි සමාජයක ඇතිවිය හැකි ආර්ථික, දේශපාලන, ආගමික හා සමාජමය වෙනස්වීම් ආදිය ද ඉදිරිපත් වෙයි. ඒකාධිපතිවාදය, පැසිස්ට්වාදය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය ආදී විවිධ දේශපාලන න්‍යායන් නිසාවෙන් ද කලින් කල සමාජයීය වෙනස්කම් සිදුවිය.[80] ඒ අනුව අධ්‍යාපනය පමණක් නොව, පුද්ගල චර්යාවන් ද වෙනස් විය. දේශපාලන දර්ශනය[81] අනුව සමාජ සංස්ථා ක්‍රියාත්මක වන හෙයින් එය පුද්ගලයා කෙරෙහි බලපෑම් ඇති කරයි.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ නිදහස හා සමානාත්මතාව පවතින හෙයින් අධ්‍යාපනය සැමට එක ලෙස ලැබිය යුතු පොදු අයිතියක් බවට පිළිගැනෙයි. නිදහස හා සමානාත්මතාව පූර්ණ හා සමාජ සංවර්ධනය සඳහා අවශ්‍යය.

77 OTTAWAY, A.K.C.-E.S., pp.48-51. E.S., p.49.

78 OTTAWAY, A.K.C.-E.S., p.50. E.S., p.51.

79 අ.1, පි.43-45. ම. නි. 1, පි.199.

80 C.E., 20, p.61h.

81 බ.ද., පි.606.

දඩයම් යුගයේ සිට කෘෂිකාර්මික ජීවිතයකට හැඩගැසීමේ දී පුද්ගලයා තුළ පැවති 'ව්‍යවහාර යුගය' හෙවත් 'දූරදර්ශීභාවය' ද වැඩී ගිය බව සමාජ විද්‍යාඥයන්ගේ අදහසය.[82] අනාගත සතුට හා ප්‍රීතිය උදෙසා එබඳු ප්‍රීතීන් දුරස්ථ වූව ද, වර්තමාන දුක් ඉවසා සිටීමට පුද්ගලයන් ක්‍රමයෙන් හුරු විය. මීමැස්සන් මී පැණි සෑදීම, ලේනුන් ඇට වර්ග වැළලීම වැනි ස්වභාව ධර්මයේ ද මිනිසාට දකින්නට ලැබුණ දෙයින් ඔහු පාඩම් ඉගෙන ගන්නට ඇත. පසු ව ප්‍රයෝජනයට ගත හැකි බව "එයින් ඔහු උගත් පාඩම හෝ නිරීක්ෂණය වන්නට ඇත." එය එක්තරා ආකාරයක ඍජු ආවේගයකි. එහි දූරදර්ශී බවක් තිබිණැයි එකහෙළා ම කිව හැකි නොවන්නේ දූරදර්ශීභාවය නම් වූ පදය, ආවේග යක බලකිරීමක් නොමැති ව අනාගතයේ කිසියම් දිනක එයින් තමාට සිදු විය හැකි යහපත ගැන කල්පනා කිරීමෙන් මිනිසා ඒ ක්‍රියාව සඳහා පෙළඹීම හඳුන්වන බැවිනි. දඩයම් කිරීම සතුට ගෙන දෙයි. එහෙයින් එහි ලා දූරදර්ශී බවක් අවශ්‍ය නොවේ. බිම් කෙටීම සඳහා ශ්‍රමය වැය වේ. වහාම ලැබෙන සතුටක් ද නැත. එහි ස්වඡන්ද ආවේගයක් ද නොවේ. අනාගතයේ දී සිදුවන යහපත ගැන සිතා කළ යුතු ය. එහෙයින් බිම් කෙටීම සඳහා දූරදර්ශී භාවය පිළිබඳ හැඟීම මිනිසාට අවශ්‍යය. කෘෂිකාර්මික ජීවිතයට හුරු වීමේ දී මිනිසා තුළ දූරදර්ශීභාවය වැඩී ගියේ යයි සලකන්නේ ඉහත හේතුවෙනි. දූරදර්ශීභාවය ආවේගයන් මැඩ පවත්වා ගත හැකි එක් ක්‍රමයකි.[83]

ආවේගයන් මැඩ පැවැත්විය හැකි දූරදර්ශීභාවය ස්වයං ව්‍යවස්ථික මර්දන ක්‍රමයකි. ආවේගයන් මැඩ පැවැත්විය හැකි, අනෙක් සමාජ සම්මත ක්‍රම වනුයේ ආගම, චාරිත්‍රය හා නීතියය. පුද්ගලයා තුළ පවතින සහජානුශතභාවය අඩු කරමින් ක්‍රම බද්ධතාව වැඩි කිරීම සඳහා එකී ක්‍රම ඇත අතීත යුගවල සිට මිනිසාට සැලසූ සෙත ඉමහත්ය. සමහර ක්‍රියා අපරාධයක්ය.[84]

82 රසල් බට්‍රන්ඩ් - බ.ද., පි.27.

83 E.S., p.51.

84 අශෝක ලිපි පි.7-15.

යන 'හන' තැබීමෙන් නීතිය මගින් දඬුවම් කෙරෙයි. ඇතැම් ඒවා නීතියෙන් දඬුවම් කරනු ලබන අපරාධ සංඛ්‍යාවට නොයතත්, 'දුෂ්ට යයි' සමාජය පිළිගෙන ඇති බැවින් එවැනි අය සමාජ පරිභාසයට ලක් වෙයි. දේපළ අයත් කර ගැනීමට පවතින තද ආශාව, ස්ත්‍රීන් යටත් කොට ගෙන තෘප්තිමත් වීමට දරන උත්සාහය ආදිය එසේ සමාජයේ පරිභාසයට ලක්වන ක්‍රියාවන්ට උදාහරණ වශයෙන් දැක්විය හැකි ය. **එක් අතකින් ප්‍රජාව නම් වූ සමාජයත්, අනෙක් අතින් පුද්ගලයා නම් වූ සමාජ ඒකකයත්, අන්‍යෝන්‍ය හැඟීමකින්** යුතුව ක්‍රියා කළ යුතු වේ. ඒ සඳහා ප්‍රජාවේ පරමාර්ථ පුද්ගලයා මත පැන වේ. පුද්ගලයා තමාගේ ජීවිතය සමස්තයක්[85] වශයෙන් බැලීමේ පුරුද්ද ඇති කොට ගැනීමෙන් සිය වර්තමානය, සිය අනාගතය සඳහා වැඩි වැඩියෙන් කැප කරයි.

මහාවග්ග කොසම්බකක්ඛන්ධකයේ දීඝායු කුමාරයා පිළිබඳ කථාව මේ සඳහා දිය හැකි හොඳ ම උදාහරණය ඉදිරිපත් කරයි. "පුත, දීඝායූ, ඔබ ඉක්මන් නොව, දුර බලව,[86] ළඟ නොබලව. පුත, දීඝායූ, වෛරයෙන් වෛරය නොසන්සිඳෙත්මය. පුත, දීඝායූ, අවෛරයෙන් ම වෛරයෝ සන්සිඳෙත්," යනුවෙන් මරණයට කැප වූ කොසොල් රජ වීදියේ වධ දිදී, මහජනයා මැදින් ගෙන යද්දී, සැඟ වී ඔහු දෙස බලා සිටි ඔහුගේ පුත්‍ර වූ, දීඝායූ කුමාරයාට කීවේ ය. වීදියේ සිටි අන් අය පිය පුතුන් දෙදෙනා නොහැඳින ඔහු මරු විකල්ව දොඩන්නේ යයි කීහ. එහෙත් දීඝායූ කුමාරයා පියාගේ අවවාදය හිස් මුදුනින් පිළිගත්තේ ය. පසු කාලයක දී දීඝායූ කුමාරයා රජතුමා හා මිතුරු වී (ඔවුන් දෙදෙනා) ස්වකීය ක්‍රියාවන් පිළිබඳ ව පැමිණි අවසාන නිගමනය මෙහි දී වැදගත් වේ. " දීඝං පස්ස මා රස්සං" යනුවෙන් පියා විසින් කී වචන දෙකෙහි තේරුම දීඝායු කුමාරයා රජතුමාට පැහැදිලි කර දෙනු ලැබී ය. "මා දීඝං" යන යමක් කීයේ ද, එයින් අදහස් කළේ, "බොහෝ

85 රසල් බට්‍රන්ඩ්; බ.ද., පි.27.

86 රසල් බට්‍රන්ඩ්; බ.ද. පි.28.

කල් වෛර නොකරව", යන්න ය. "මා රස්සං"[87] යන්නෙන් යමක් කීයේ ද, එයින් අදහස් කළේ, "වහා මිත්‍රයන් හා නොබිඳෙව," යන්නය. "දේවයන් වහන්සේ විසින් මාගේ මව්පියෝ නසන ලද්දාහ. මම දේවයන් වහන්සේ ජීවිතයෙන් තොර කරන්නෙම් නම්, දේවයන් වහන්සේට වැඩ කැමති යම් කෙනෙක් වෙත් නම්, ඔහු මා ජීවිතයෙන් තොර කරන්නාහු. මට, වැඩ කැමති වූ යම් කෙනෙක් වෙත් නම් ඔහු ඔවුන් ජීවිතයෙන් තොර කරන්නාහුය. මෙසේ ඒ වෛරය, වෛරයෙන් නොසන්සිඳෙන්නේය.[88] දැන් දේවයන් වහන්සේ විසින් මට දිවි දෙන ලද්දේ ය. මා විසිනුත් දේවයන් වහන්සේට දිවි දෙන ලද්දේ ය. මෙසේ ඒ වෛරය අවෛරයෙන් සන්සිඳුණේ ය." තථාගතයන් වහන්සේ කලහ විවාද කරනු ලැබූ භික්ෂූන්ට අවවාද වශයෙන් සඳහන් කරනු ලැබූ ඉහත කී කථා පුවතින් පුද්ගලයා තුළ පහළ වන ආවේගයන් මැඬ පවත්වා ගත යුත්තේ කෙසේ දැයි දක්වති.

**බොහෝ අවස්ථාවල දී ඒ ඒ පුද්ගලයන් හැසිරෙන, ක්‍රියා කරන ආකාරය අනුව බලන්නවුන් වැරදි ලෙස ඒ ඒ පුද්ගලයන් මනිනු ලබන බව අපට පෙනේ. එක් එක් පුද්ගලයාගේ ක්‍රියාකාරීත්වය ඒ ඒ පුද්ගලයාගේ චේතනාව අනුව පවතී. එකී චේතනාව කුමක් දැයි අන්‍යයන්ට හැඳින ගැනීම පහසු නොවේ.** ජීවක කොමාරභච්චයන් හා සිටු බිරිඳ ගැන විවරක්ඛන්ධකයේ එන කථා පුවතකින් එසේ වැරදි ලෙස මනිනු ලැබූ 'ලෝභය හා සකසුරුවම්කම' පිළිබඳ අදහස වටහා ගත හැකි ය. සමාජයීය හා පුද්ගල ජීවිතයේ දී ලෝභය හා සකසුරුවම්කම පිළිබඳ ව නිවැරදි අර්ථ වැටහීමකින් කටයුතු කිරීම දූරදර්ශී භාවය සඳහා අවශ්‍යය.[89] සකසුරුවම්කම, ආර්ථික සංරක්ෂණය සලසා ගැනීමේ දී ඉතා වැදගත් ලෙස සැලකෙන සාධකයකි. එහෙත් ඒ ලෝභය (මසුරුකම) යයි වැරදි ලෙස සැලකිය යුතු නොවේ.

87 ම.ව.2, පි.861 - කොසම්බක්ඛන්ධකය.

88 ධ.ප., යමක වර්ගය, 1-4.

89 ම.ව.2, පි.867; කොසම්බක්ඛන්ධකය. ම.ව.1, පි.866. ජා.පො., පි.240-242.

මෙම උපදේශය ජීවක වෛද්‍යවරයාට ඉතා පැහැදිලි ලෙස සිටු දේවිය වටහා දෙන්නේ, "ඇදුර, අපි ගිහි ගෙයි වසන්නමෝ සකසුරුවම්කමේ අනුසස් දනුම්හ. මේ ගිතෙල්, දාසයන්ගේ ද, කම්කරුවන්ගේ ද, පය ගැල්වීමට හෝ පහනක් දල්වීමේ දී හෝ පාවිච්චි කළ හැකි ය. ඇදුර, ඔබ නොසතුටු නොවන්න. ඔබට දිය යුතු දේ නො අඩුවන්නේය," යනුවෙන් සිටු බිරිඳ කී අයුරින් ම ජීවක වෛද්‍යවරයාට බොහෝ තෑගි භෝග දුන්නා ය. ජීවක වෛද්‍යවරයා ඇය ලෝභ තැනැත්තියකැයි මැන්නේ, පතක් පමණ ගිතෙල්වලට විවිධ වටිනා බෙහෙත් වර්ග මුසුකොට නහයට වත්කළ ගිතෙල් කටින් පිටවීමේ දී සිටු බිරිඳ,[90] "කෙල්ල, මේ ගිතෙල් පුළුන් රොදකින් ගනුව,"යි දාසියට අණ කළ නිසාය.

එහෙයින් ප්‍රජාව හා පුද්ගලයා චාරිත්‍ර හා පිළිගැනීම් සමුදායකින්[91] බැඳී සිටිති. අධික ලෝභය නම් වූ තමන්ට අයත් කර ගැනීමේ චේතනාව පමණට වඩා මඳ දුරක් ගෙන යා හැකි ය. එහෙත් ව්‍යවහාර ඥානය නිසා, එබඳු අන්තයන්ට නොයා යුතු බව පුද්ගලයා තේරුම් කර ගනියි.[92] ප්‍රජාවක් ලෙසින් ද එසේ ම ක්‍රියා කරති. මනුෂ්‍යයා පිළිබඳ විද්‍යාව එහි ලා අපට අවශ්‍ය දැනුම ලබා දෙයි.

බොහෝ විට ආගමිකයන් තුළ බලපවත්වන 'අභිනිවේසය' සඳහා දෙවියන් වහන්සේ හා එක්වීම බලපාන බව කියති.[93] මනුෂ්‍යයන් තුළ පැවති අසරණභාවය නමැති එක්තරා 'හීනමාන' ගතියක් සංසිඳුවා ගැනීමේ අභිලාෂයෙන් තමන්ට වඩා බලවත් වූ යම්කිසි, 'ආකස්මික අදිසි බලවේගයක්' කෙරෙහි විශ්වාසය තැබීමට මිනිසාට අවශ්‍ය විය. එකී විශ්වාසය නිසා සූර්යයා වැනි බලවතුන් නමස්කාර කරන ආගමිකයා ද සැනසීමක් ලබයි. තමාත්, බලවත් වූ සූර්යය දිව්‍ය රාජයාත් අතර යම්කිසි පෑහීමක්

90 -එම- පි.867. බ.ද., පි.626-628. ධ.ප., යමකවග්ග, 1-3; ම.ව.2, පි.871.

91 මූ.ව. 2, පි.681; අ.3, පි.435; මච්ඡරිය සූත්‍රය. C.E. 20, p.61 h.

92 ම.ව.2, පි.679; චීවරක්ඛන්ධකය.

93 C.E. 20, p.243.

හා සහභාවයක් ලැබීමෙන් ඔහු නිර්භය වීමට උත්සාහ දරයි.[94] තමන්ට වඩා බලවත් පුරුෂයෙකුගේ ආරක්ෂාව අවශ්‍ය වනුයේ දුබලයාට ය. ඔහු තුළ වන බිය සැක දුරු කරන්නේ එකී බලවත් පුරුෂයා ය. සත්‍ය වශයෙන් ම මිනිසා සූර්යයා ඒ බව නොදනියි.[95] හේතුව ඔහුට වඩා බලවත් අය තව කොතෙකුත් වන හෙයිනි.

සූර්යයා ද අනිත්‍ය වූවකි, නොපෙනෙන, බ්‍රහ්ම දේව වැනි බලවේග ප්‍රාර්ථනා කරමින් එකී බලවේග හා පෑගීමට දරන උත්සාහය සූර්යයා වැනි පෙනෙන දකින වස්තූන් කෙරෙහි තබන විශ්වාසය තරම්වත් අර්ථවත් නොවන බව තේවිජ්ජ සූත්‍රය[96] දක්වයි, එසේ නම් නොපෙනෙන, නොදකින දෙවි කෙනෙකුන් වෙනුවෙන් පුද පූජා පවත්වා දෙවියන් හා එක්ත්වයට පත්වී යයි සිතෙන භක්තිමත් මිනිසා එකී දෙවියන් තුළට පිවිසියේ එක්තරා ආකාරයක මත්වීමකිනි. බිය හා සැක දුරුකර ගැනීම සඳහා විවිධ මත්ද්‍රව්‍ය පාවිච්චි කරන මිනිසාත්, බිය සැක දුරු කර ගැනීම සඳහා විවිධ බලවතුන් කෙරෙහි අපේක්ෂා සහිත වන මිනිසාත්[97] යන දෙදෙනා ම ඒකාකාර පසුබෑමකට යටත් වේ. 'මත් බව' ඇති තෙක් බිය හා සැක නැතිවීම නම් අපේක්ෂාව පවතී. මත් බව දුරු වූ වහා ම එකී අපේක්ෂාව බිඳ වැටෙයි. එහෙයින් දෙවියන්ට හෝ වෙනත් බලවේගයන්ට යට නොවී අපේක්ෂා රහිතව ස්වකීය උත්සාහය හා ව්‍යායාමය කෙරෙහි[98] පමණක් අපේක්ෂා සහිතවීමට මිනිසාට සිදුවේ. එසේ කිරීමෙන් ඉතා බලවත් වන සූර්යයා සහ චන්ද්‍රයා පවා සියතින් ඇල්ලීමට තරම්[99] පුද්ගලයාට ශක්තියකුත්, නිර්භය බවකුත් ඇතිකර ගත හැකි බවට තථාගතයන් වහන්සේ මග කියා දෙති. මිනිසා තුළ අනාගතය සම්බන්ධයෙන්

94 රසල් බට්‍රන්ඩ් බ.ද., පි.28. C.E. 20, p.61g.h.

95 රසල් බට්‍රන්ඩ් බ.ද., පි.28.

96 දී. නි. 1, පි.603, බලන්න, P.I.P., p.16-32, 216.

97 P.I.P. p.16. ම.ද. පි.223. P.I.P., pp.32, 37-38.

98 දී. නි. 1, පි.605; තෙවිජ්ජ සූත්‍රය.

99 චූ.ව.2, පි.269 කියවන්න; අ. නි. 3, පි.205-207; මහාචොර සූත්‍රය. චූ.ව.2, පි.269.

පැවතිය යුතු දූර්දර්ශීභාවය සම්බන්ධ ඉතිහාසය දක්වනු ලබන අවසානය එසේ තථාගතයන් වහන්සේ විසින් කියා දෙනු ලැබූ 'අරහත්භාවය' ය. ඒ අරහත්භාවය කරා පුද්ගලයා තමා යොමුවිය යුත්තේ, රාගය[100] හා දූරදර්ශී බව යන අන්ත දෙක පිළිබඳව වන ගැටීම තුළිනි. දූරදර්ශී භාවයත්, රාගයත් අතර පවතින සටන ඒ ඒ පුද්ගලයාගේ සංසාර පුරුද්ද[101] නම් වූ සම්පූර්ණ පුද්ගල ඉතිහාසය පුරා දිවෙන්නකි. එය වූ කලී අප කිසිවකු විසින් වත් මුළුමනින් ම පැත්තක් නොගත යුතු ආකාරයේ සටනකි. රාගය හා දූරදර්ශීභාවය අතර සටනේ දී අප කුමන පැත්තක් ගනු ලැබුවේ වුව ද, ඒ පුද්ගලයාගේ අභිමතය අනුව, 'අප විසින් ඔහුට සාධාරණය ඉටු නොකළේය', යන චෝදනාවට ලක්විය හැකි නිසාය. පුද්ගලයා කර තබාගෙන රාගය හෝ දූරදර්ශී බව කරා හෝ අපට ගෙන යා නොහැකි ය.[102] එහෙත් ඔහුට යා යුතු මඟ කියා දිය හැකි ය[103], ධර්මය බෙහෙතකි. රෝගියාට බෙහෙත කිව හැකි ය. රෝගියා බෙහෙත් පාවිච්චි කළ යුතු ය. අපථ්‍ය ආහාර නොගත යුතු ය. බෙහෙත් ගන්නා අපථ්‍ය ආහාර ද ගන්නේ නම් රෝගියාට බෙහෙතින් කවර ප්‍රයෝජනයක් ද? බෙහෙත් කියා දුන් පුද්ගලයා දෝෂාරෝපණයට ලක්වීම හා බෙහෙත ප්‍රතික්ෂේපවීම සිදුවන ප්‍රතිඵලයය. එයට මූලික වූයේ රෝගියාය.[104] අපථ්‍ය ආහාර ගැනීම හේතුවය. එහෙයින් රාගය හා දූරදර්ශී භාවය අතර සටනේ දී පුද්ගලයා තමා ම එකී සටන කළ යුතු ය. අප පැත්තක් නොගත යුතු ය. අප විසින් කළ යුතු එකම උපකාරය විය යුත්තේ මග නොමඟ, හරි වැරදි, යහපත අයහපත කියා දීමය.

යහපත කියා දෙන අය දුර්ලභය. යහපත අසන අය වඩාත් දුර්ලභය. එකී යහපත් මාර්ග අසා ඒ අනුව ක්‍රියා කරන්නේ, ඒ

100 ථෙරී, පි.25; විමලා ථෙරි ගාථා. ජා.පො., පි.585.

101 අ. නි. 1, පි.427, 431.

102 අ. නි. 1, පි.455.

103 අ. නි. 1, පි.383-389; ස. නි. 4, පි.317-323, 609. අ. නි. 1, පි.356, අ. නි. 1, පි.636.

104 ම.1, පි.409; කථා, පි.88; මා.ද., පි.326.

මගෙහි යන්නෝ ඉතාමත් ම දුර්ලභ ය.[105] එසේ නම් ධර්මය කියා දීම අර්ථවත් වන්නේ දැයි සැක ඇති විය හැකි ය. තමන් ධර්මය ප්‍රකාශ කිරීමත්, අන්‍යයන් එකී ධර්මය අවබෝධ කොට එයින් ප්‍රයෝජන නොගැනීමත් යන කරුණ නිසා දෙපසට ම අර්ථවත් නොවන කාර්යයක නියැලෙන්නේ යයි සැක නොසිතිය යුතු ය.[106] ධර්මය කියා නොදීමෙන්[107] බහුතර පිරිස වනව ඒ පිරිසට අයහපතක් ම වේ. ඔවුන් විසින් ලැබිය යුතු වූ ධර්ම ලාභයට හානි කිරීම ද අසාධාරණය. කෙනෙකුට ලැබිය යුතු ලාභයක් සඳහා අන්තරාය කරන කිසිවකුත් යහපත් පුද්ගලයෙකු ලෙස සමාජය නොපිළිගන්නා බැවිනි. එවන් පුද්ගලයා සමාජය විසින් ගරහනු ලැබේ. එහෙයින් ධර්මය ප්‍රකාශ කළ යුතු ය. ධර්මය වැඩි දෙනෙකුට විවෘත කළ යුතු ය.[108] 'ලාභ ලබන්නෝ ලාභ ලබත්වා' යි යන යහපත් චේතනාව තුළ පිහිටා යහපත් දෑ කියා දිය යුතු ය. එහෙත් කිසි විටෙකත් එකී ලාභය සඳහා පුද්ගලයා කරා තබා ගෙන ගොස් ලාභ ලබා දිය යුතු නොවේ. ඒ කළ නොහැක්කෙකි. ධර්ම ලාභය ලබන පුද්ගලයා ද ධර්මය කර තබාගෙන යා යුතු නොවේ. පහුර අවශ්‍ය වනුයේ යම් කාර්යයක් සඳහා ද, ඒ කාර්ය සංසිද්ධිය ඉටුවීමෙන් පසු එය කර තබා ගැනීම අවශ්‍ය නොවේ.[109] එය විනාශ කළහොත් පසු ව එන කිසිවෙකුටවත් අනාගතය දූරදර්ශී කරගත හැකි නොවේ. එහෙයින් රාගය හා දූර්දර්ශී භාවය අතර වන සටනේ දී ධර්මය දන්නා, නොදන්නා කවුරුන් විසිනුත් කළ යුත්තේ අභිනිවේශය නම් වූ මත් බව හේතුවෙන්, 'ශ්‍රේෂ්ඨ වූ විජයග්‍රහණයන්' කරන්නේ යයි සිතා ඊට සහභාගි නොවීමය. ධර්මය කවදත් ලෝකයේ පවතී. එය මතුකර ගත හැක්කේ බුද්ධියෙනි.[110] ධර්මය මතු කරන බුද්ධිමත් බව

105 මා.ද., පි.379.

106 ථෙර, පි.143.

107 පු.ප., පි.301.

108 මා.ද., පි.838; අ.3, පි.387; පිඩ්ගියානි සූත්‍රය. අ. නි. 3, පි.387.

109 ධර්මය.

110 මා. නි. 1, පි.336-337; පිඩ්ගියානි සූත්‍රය.

රැකීම සඳහාත් ඊට විරුද්ධ බලවේග හඳුනා ගැනීම සඳහාත් මග පාදා ගත යුතු වේ.

මිනිසා දේවත්වය හා බැඳීමට පවතින කැමැත්ත හේතුවෙන් ඉතා බලවත් වූ පුද්ගලයෙකු වන 'ඩයනීසස්' දෙවියන් පිදුවේ වනචාරී ස්වරූපයෙනි. එකී වනචාරී පිදවිල්ල පිළිකුල් සහගත ද විය. එය දාර්ශනිකයින් විසින් වෙනත් ආකාරයකින් හැඩගස්වා ගෙන තාපස ධර්මයක් ලෙස ක්‍රියාත්මක කරවූ බවට බට්‍රන්ඩ් රසල් මහතා දක්වයි.[111] දාර්ශනිකයෝ වනචාරී පුද පූජා ක්‍රමය ආධ්‍යාත්මික ස්වරූපයෙන් ඉදිරිපත් කළහ. ශාරීරික මත්වීම වෙනුවට ඔවුහු මානසික මත්වීමක් වූ තපස් ක්‍රම හැඳින්වූහ. 'ඩයනීසස්' කැබලිවලට ඉරා 'හෘදය' පමණක් ඉතුරු වෙද්දී, මස්, ටයිටන්වරුන් විසින් කන ලද බව කියැවේ. හදවත 'සියුස්' නම් පුද්ගලයා විසින් ගිලින ලද අතර, ඔහු තුළින් 'ඩයනීසස්' නැවත (දෙවන උපත) උපන්නේ යයි ද කියති. ටයිටන්වරු එකී මස් කෑවේ දේවත්වය ලැබීම සඳහාය. පසුකාලීනව මෙකී සිද්ධිය සිහිපත් කළේ යම්කිසි සතෙකු ගෙන, එකී සතා මරා සතාගේ අමු මස් අනුභව කිරීමෙනි. සතා දෙවියන්ගේ අවතාරයක් බව ඔවුහු විශ්වාස කළහ. මෙයින් මිනිස් ලොව ජීවත් වූ ඔවුහු දේවත්වය ලැබූහ.[112] දෙවියන් හා එක්වීම සඳහා පැවති මෙකී වනචාරී යුගයේ විශ්වාස අද දක්වාත් විවිධ ස්වරූපයෙන් ඉදිරිපත් වෙයි. එය ආගමික ජීවිතයෙන් ඉවත් කිරීම අපහසුය. ඉවත් කිරීමට උත්සාහ කිරීමෙන් විය හැකි අයහපත, යහපතට වඩා වැඩි වනු මිස අඩු නොවනු ඇත. එය රාගය හා දූරදර්ශී භාවය පිළිබඳ ව පුද්ගල සන්තානය තුළ විය යුතු සටනක් හෙයිනි.[113]

මානව සමාජයේ ආරම්භක දිනය කවරෙක් ද, එදින ඇති වූ මුල් ම ආයතනය සාමාජික මධ්‍යස්ථානය පවුල නම් වූ ඒකකයය.

---

111 ම. නි. 1, පි.339; අලගද්දූපම සූත්‍රය. ම. නි. 1, පි.353.

112 ස. නි. 2, පි.163-167 නගර සූත්‍රය. ම. නි. 1,පි.353.

113 ම. නි. 1, පි.341-345; අලගද්දූපම සූත්‍රය. ම. නි. 1, පි. 341. ම. නි. 1, පි.425.

පවුල පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනකින් සෑදී ඇත්තේ පුද්ගල අවශ්‍යතා[114] ඉටු කෙරෙන පරිද්දෙනි. එහෙයින් විවිධ ආර්ථික හා සාමාජික සහ ආගමික තත්ත්වයන් යටතේ පවුල නමැති ආයතනය සමාජ ඒකකයක් ලෙස දරූ සම්භාවනීයත්වය, සමාජය විසින් පිළිගෙන ඇත. සමාජයක පවුල ස්ථිරසාර වූත්, නිවැරදි වූත් පදනමක් මත සංවිධානය වී[115] ගොඩ නැගී ඇතොත් ඒ සමාජය බොහෝ දුරට නිරවුල්ය, ස්ථිරසාරය. එහෙයින් ව්‍යවහාරික ලෝකයේ පවුල හා එහි සංවිධානය, සමාජය කෙරෙහි එල්ල කරනු ලබන බලපෑම් ආගමික වශයෙන් හෝ ආධ්‍යාත්මික වශයෙන් හෝ පමණක් නොව සාමාජික, අධ්‍යාපනික, නීති, ආර්ථික හා දේශපාලනික ආදී විවිධ අංශ තුළින් බැලිය යුතු වේ. එවිට ව්‍යවහාරික ලෝකයෙන්, සංවර්ධනය කරා යා යුතු පුද්ගලයන් හඳුනා ගැනීම පහසු වනු ඇත.[116]

සිගාලෝවාද සූත්‍රයට අනුව ආර්ය විනයෙහි සදිසාව වූ කලී, පුද්ගලයා වට කොට ගෙන, බැඳීම් වලින් ජීවිතයට ඉතා සමීප වූ යුතුකම් හා අයිතිවාසිකම් නම් වූ වගකීම හා වරප්‍රසාද ලබන පවුල නමැති සමාජයීය ආයතනයයි. මේ මූලික ඒකකයේ බලවේග සයකි.[117]

| | | |
|---|---|---|
| (i) | නැගෙනහිර දිසාව | මව්පියෝ |
| (ii) | දකුණු දිසාව | ගුරුවරයෝ |
| (iii) | බටහිර දිසාව | අඹු දරුවෝ |
| (iv) | උතුරු දිසාව | යහළු මිත්‍රයෝ |
| (v) | යට දිසාව | සේවකයෝ |
| (vi) | උඩ දිසාව | ශ්‍රමණ බ්‍රාහ්මණයෝ |

114 රසල් බට්‍රන්ඩ්-බ.ද. පි.28.

115 රසල් බට්‍රන්ඩ්, බ.ද. පි.29.

116 පි.151-224. C.E. 20 p. 242.

117 සු.නි., පි. 180. සු.නි., පි.35.

දවස උදාවන්නේ නැගෙනහිරෙනි, දරුවන් ලොවට උදා කරන්නෝ මව්පියෝය. ප්‍රාණියෙකු ලෙස බිහි කිරීම, සාමාජිකයෙකු ලෙස හැඩ ගැස්වීම යන දෙයාකාර ක්‍රියාකාරකම් මව්පියන් නිසා සිදුවන හෙයින් මව්පියෝ නැගෙනහිර දිසාව ලෙස සලකති.[118]

**දරුවන් මව්පියන් සඳහා කළ යුතු යුතුකම්**

(i) මවුපියන් පෝෂණය කළ යුතු ය.

(ii) මවුපියන්ගේ කටයුතු කිරීම

(iii) කුල පරපුර රැකිය යුතු ය.

(iv) මවුපියන් සතු දේපල ආරක්ෂා කිරීම

(v) මිය පරලොව පින් දහම් කළ යුතුය.

**මව්පියන් දරුවන් සඳහා කළ යුතු යුතුකම්**

(i) පවින් වළක්වයි

(ii) යහපතෙහි යොදවයි

(iii) ශිල්ප උගන්වයි

(iv) සුදුසු ලෙස ආවාහ විවාහ කරදෙයි

(v) සුදුසු කාලයේ ධනය හා දේපළ පවරා දෙයි.

'පිදිය යුතු' යන අර්ථයෙන් දකුණු දිසාව ගුරුවරයා ලෙස දක්වේ. ජීවන වෘත්තියක් ගෙන යාමට අවශ්‍ය දැනීම හා සාමාජිකයෙකු ලෙස සමාජයේ කැපී පෙනී සිටීමට අවශ්‍ය චරිත ශක්තිය හැඩගස්වනුයේ ගුරුවරයාය.[119]

**ශිෂ්‍යයා විසින් ගුරුවරයාට කළ යුතු යුතුකම්**

(i) ගුරුවරයා දැක අසුනෙන් නැගිටීම

(ii) ගුරුවරයාට උවටැන් කිරීම

118 ම.ද., පි. 120-131 හා 565-566.

119 ථෙර, පි.21. ථෙරි., පි.33, 35.

(iii) ගුරුවරයාගේ වචනයට කන්දීම

(iv) ගුරුවරයාට වත් පිළිවෙත් කිරීම

(v) මනාකොට ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීම

**ගුරුවරයා විසින් ශිෂ්‍යයාට කළ යුතු යුතුකම්**

(i) මනාව හික්මීම

(ii) හොඳින් ඉගැන්වීම

(iii) දත් සියල්ල මනාව කියාදීම

(iv) මිත්‍රයන් හඳුන්වා දීම

(v) ශිෂ්‍යයාට ආරක්ෂා සලසා දීම

පුද්ගලයා නැගෙනහිරට මුහුණ ලා සිටගෙන, ඉදිරියෙන් මව්පියන් ද, දකුණින් ගුරුවරුන් ද සිටින සේ සලකන්නේ නම් පුද්ගලයාගේ පවුල් ජීවිතයට සෙවණැල්ල බඳු වූ භාර්යාව බස්නාහිර දිසාව විය යුතු ය. ආවාහ විවාහ වීමේ චාරිත්‍ර විධි හා ප්‍රතිඥාව දෙස සිත යොමු කරන්නේ නම් ස්වාමි පුරුෂයා හා භාර්යාව ජීවිතයේ දී තමන් හා එක් වූ අනෙක් පුද්ගලයා මැරෙන තුරු දුක හා සැප සමව බෙදා ගැනීමටත්, අත් නොහැරීමටත් පොරොන්දු වන බව සැලකිය යුතු ය. කුල පරපුර රැකීම සඳහා පුද්ගලයාට බෙහෙවින් සහාය වනුයේ භාර්යාවය. ඒ අන්‍යෝන්‍ය විශ්වාසය තදින් පවත්වා ගන්නා හෙයිනි. මානසික බැඳීමක් ජනිත කරවන හෙයිනි.[120]

**ස්වාමි පුරුෂයා විසින් භාර්යාවට කළ යුතු යුතුකම්**

(i) ගෞරව කිරීම

(ii) අවමන් නොකිරීම

(iii) අන් ස්ත්‍රීන් කරා නොයාම

(iv) වස්තුව හා ධනය පවරා දීම

(v) අලංකාර ඇඳුම් පැළඳුම් ලබාදීම

120 දී. නි. 3, පි.303, සිගාලක සූත්‍රය.

**භාර්යාව විසින් ස්වාමි පුරුෂයාට කළ යුතු යුතුකම්**

(i) ගෙදර කටයුතු මැනවින් කිරීම

(ii) පිරිවර ජනයාට හොඳින් සංග්‍රහ කිරීම

(iii) අන් පුරුෂයන් ප්‍රාර්ථනා නොකිරීම

(iv) වස්තුව හා ධනය රැක ගැනීම

(v) සියලු කටයුතු අනලස්ව කිරීම

ස්වාමි භාර්යා යන දෙපක්ෂයෙන් යුතුකම් ඉටු වී ඔවුනොවුන් සෑහීමකට පත්වන විට බස්නාහිර දිසාව ආරක්ෂා සහිත වූවක් වේ. "යම්කිසි පුද්ගලයෙකුගේ නැගීම හෝ බැසීම, ඔහු ඇසුරු කරන පුද්ගලයන් අනුව කෙනෙකුට නිගමනය කළ හැකි බව", ලෝකයා පිළිගත් සත්‍යයකි. පුද්ගලයාගේ ඇසුරට තදින් ම බලපාන මිතුරන් නිසා පවින් වෙන්වීම හෝ පවෙහි ගැලීම හෝ සිදුවන බැවින් උතුරු දිශාව මනාව ආරක්ෂා විය යුතු ය.

**ගෘහපතියාගෙන් මිතුරන්ට ඉටුවිය යුතු යුතු කම්**

(i) අවශ්‍ය දේ මිතුරන්ට දීම

(ii) ප්‍රිය වචනයෙන් කතා කිරීම

(iii) මිතුරන්ගේ හිත සුව සැලසීම

(iv) සමානාත්මතාවයෙන් සංග්‍රහ කිරීම

(v) මිතුරන් නොරැවටීම

**මිතුරන්ගෙන් ගෘහපතියාට ඉටුවිය යුතු යුතුකම්**

(i) ප්‍රමාද වූ ගෘහපතියා මිතුරා රකී

(ii) ප්‍රමාද වූ මිතුරාගේ ධනය රකී

(iii) භයක් පැමිණි විට පිහිට වේ

(iv) විපතේදී අත් නොහරී

(v) මිතුරාගේ පිරිසට සැලකිලි කරයි

ව්‍යවහාර ලෝකයේ සමාජය පිළිගත් ආකාරයට ස්වාමියාගේ තත්ත්වය උසස් යයි ද, සේවකයා ඔහුට අවනත විය යුතු යයි ද පිළිගැනීමක් වේ. මහජන ඡන්දයෙන් ජනාධිපති තත්ත්වය ලබන පුද්ගලයා තමා ජනාධිපති තත්ත්වයට561 පත් කළ මහජනතාව පාලනය කිරීමට බලාධිකාරය පවත්වා ගනුයේ ද ඉහළ සිට පහළට යන නිලධාරීන් පැළැන්තියක් අනුවය. ඒ අනුව යට දිසාව සේවක පක්ෂය ලෙස සලකා ඉහළින් (ස්වාමි පක්ෂයෙන්) පහළටත් (සේවක පක්ෂයෙන්) පහළින් ඉහළටත් ඉටුවිය යුතු යුතුකම් මොනවාදැයි පුද්ගලයා දැන සිටිය යුතුය.

තමන් හා තමන්ගේ ව්‍යාපාර මැනවින් පවත්වා ගැනීමට තෘප්තිමත් සේවක පිරිසකගේ සහයෝගය අවශ්‍යය. මැනවින් පාලනයක් නොවන තැනක සේවක අයිතිවාසිකම් අපේක්ෂා කළ නොහැකිය.[121]

**ස්වාමියාගෙන් සේවකයාට ඉටුවිය යුතු යුතුකම්**

(i) ශක්තිය අනුව කටයුතු නියම කිරීම

(ii) වැටුප් නියමාකාර ලෙස ගෙවීම

(iii) ගිලන් වූ සේවකයා ගැන සොයා බැලීම

(iv) රසවත් ආහාරපාන සේවකයන්ට දන්දීම

(v) දිය යුතු දේ යථා කාලයෙහි දීම හෝ

**සේවකයාගෙන් ස්වාමියාට ඉටුවිය යුතු යුතුකම්**

(i) පළමුව අවදි වී සේවය කරයි

(ii) සියලු කටයුතු සොයා බලා පසු ව නින්දට යයි.

(iii) තමන්ට දුන් දේ පමණක් ගනී

(iv) හොඳින් කර්මාන්ත ඉටු කරයි

(v) ස්වාමියාගේ ගුණය හා කීර්තිය ප්‍රකාශ කරයි.

121 දී. නි. 3, පි.305; සිගාලක සූත්‍රය; පු.පු.සං. පි. 435.

පූජනීයත්වයෙන් සැලකිය යුතු නිසා ශ්‍රමණ බ්‍රාහ්මණයන් උඩ දිසාව වශයෙන් හඳුන්වා දී ඇති බව පෙනේ. ආධ්‍යාත්මික සංවර්ධනය හේතුවෙන් ඔවුන් තුළ වගා වූ උසස් ගුණය මාර්ගෙ ෝපදේශකත්වයෙහි බෙහෙවින් ප්‍රයෝජනවත් වන හෙයින් පාලන පක්ෂය ශ්‍රමණ බ්‍රාහ්මණයන් පූජ්‍යත්වයෙන් සැලකීම චාරිත්‍රයක් ව පවතී.[122]

**ගෘහපතියාගෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් වෙත ඉටුවිය යුතු යුතුකම්**

(i) මෛත්‍රී සහගත කායික පැවැත්මෙන්

(i) මෛත්‍රී සහගත වචනයෙන්

(ii) මෛත්‍රී සහගත සිතින්

(iii) ගෙදර දොරටු විවෘතව තැබීමෙන්

(iv) දාන මානාදී සංග්‍රහයන් කිරීමෙන්

**ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් ගෘහපතියා වෙත**

(i) පව්කමින් වළක්වති.

(ii) යහපතෙහි පිහිටුවති.

(iii) යහපත් සිතින් අනුකම්පා කරයි.

(iv) නොඇසූ දහම් කියා දෙති.

(v) ඇසූ ධර්මය පැහැදිලි කර දෙති.

බෞද්ධ ජීවිතයක් සාර්ථක වන්නේ ආර්ථික හා සාමාජික කරුණු මත ම නොවේ. බෞද්ධ දර්ශනය එහි ලා කරුණු දෙකක් සාර්ථක ජීවිතයක් සඳහා දක්වයි. මෙලොව ප්‍රීතිමත් ජීවිතය හා පරලොවට යන නිවැරදි ධාර්මික ජීවිතය ඒ කරුණු දෙකය.

ඒ ඒ පුද්ගලයා හා සමාජ සම්මුතීන් අනුව පිළිගත් යුතුකම් හා අයිතිවාසිකම් නීත්‍යනුකූල අයිතිවාසිකම් හා යුතුකම් බවට නීති විද්‍යාව කරුණු දක්වනු ඇත.

122 එම.

පුද්ගලයා යන්නෙහි නීති ඉතිහාසය විග්‍රහ කරන මහාචාර්ය ලී, එහි අඩංගු වී පවතින චින්තාව දක්වන්නේ ජීවිතයේ ඒ ඒ අවස්ථාවල ඇතිවන 'ඇබැද්දි' හැටියට දැක්වෙන මාතෘකා සමූහය වන උපත, බාල වයස, විවාහය, උම්මත්තක බව ආදී ස්ථිතයන් රැසක ඇතිවීම හා නැතිවීම පුද්ගලයා බවය.[123] එහෙයින් නීති විෂයය පුද්ගලයා උපතේ සිට මරණය දක්වා වූ 'තත්ත්ව' රාශියක් ලෙස පිළිගනියි.

ස්වභාව ධර්මය විසින් සෑදූ හා සාදනු ලබන ස්වාභාවික පුද්ගලයා මිනිසා වුවත්, මිනිසා විසින් සාදන ලබන නීතිය ස්වභාවික මිනිසාට අමතර වශයෙන් 'කෘත්‍රිම පුද්ගලයන්' රැසක් ද හඳුනා ගනු ලබයි.[124]

(i) ඔටුන්න නොහොත් රජය,

(ii) සංස්ථා

(iii) කොම්පැනි නම් වූ සමාගම්

(iv) පළාත් පාලන ආයතන

ඒ කෘත්‍රිම පුද්ගලයන් අතරට ගැනේ.

ස්වභාවික පුද්ගලයන් මෙන් ම කෘත්‍රිම පුද්ගලයන් ද නීත්‍යානුකූල ව ඉටු කළ යුතු හෝ ඉටු කළ හැකි යුතුකම්, බැඳී සිටින හා බැඳී සිටිය යුතු වගකීම්, ක්‍රියා කිරීමේ හැකියාවන් හා ක්‍රියා නොකිරීමේ හැකියාවන් ආදී 'තත්ත්ව' රාශියකින් යුක්තය. පුද්ගලයකුට විරුද්ධව නඩු පවරන පැවරෙන අයුරින් සමාගමේ නමින් නඩු පැවරිය හැකිවීම, සමාගමට පැවරෙන නඩු භාර ගැනීමේ හැකියාව පුද්ගල භාවයේ එක් ලක්ෂණයකි.

සියලු ම මනුෂ්‍යයන් උපතේ සිට ම නිදහස් අයවලුන් ලෙස සැලකීම නීතිය පිළිගත් වැදගත් ධර්මතාවකි. එහෙයින් නීතිය පුද්ගල භේදයෙන් තොර ව සර්ව සාධාරණ වූවක් ලෙස සැලකේ.

123 දී. නි. 3, පි.307, සිගාලක සූත්‍රය.

124 දී. නි. 3,1 පි.307. සිගාලක සූත්‍රය.

මිනිසකුට අනර්ථයකින් ආරක්ෂාවීම සඳහා නීතියෙහි පිහිට සොයා යාමට හැකිවීම ඔහුගේ නීත්‍යානුකූල අයිතිවාසිකමක් බව පිළිගැනේ. පුද්ගලයාට ස්වකීය දේපළ පිළිබඳ නීත්‍යානුකූල හිමිකමක් හෝ අයිතිවාසිකමක් ඇතැයි නීතිය පිළිගන්නේ වී නමුත් නීත්‍යානුකූල අයිතිවාසිකම් යනුවෙන් නීතිය පිළිග න්නේ ස්වභාවික අයිතිවාසිකම් පමණකි.[125] සාහසික ප්‍රහාරයක දී ආත්මාරක්ෂාව සඳහා සාහසිකයාට විරුද්ධ ව ක්‍රියා කිරීමේ සම්පූර්ණ අයිතිය පුද්ගලයාට හිමි වේ. පුද්ගලයාගේ අඹු දරුවන්, නෑයන් හෝ පොදු ජනයා අතරින් ඕනෑම අයෙකුන් ආරක්ෂා කිරීමේ අයිතිය ද පුද්ගලයාට හිමිය.[126] පුද්ගල අයිතිවාසිකම් රජය විසින් ආරක්ෂා කළ යුතු ය යන සම්මුතිය පවත්නා හෙයින් ආත්මාරක්ෂාව සඳහා හෝ වෙනත් අයකු මැරුවේ නම් එකී මැරීමට හේතුව ආත්මාරක්ෂාව ලෙස උසාවියක් ඉදිරියේ ඔප්පු කිරීම අත්‍යවශ්‍ය ය.

ඉහතින් දැක් වූ කරුණු සැලකිල්ලට ගැනීමේ දී නීතිය; පුද්ගලයන්, දේපළ හා ක්‍රියාවන් සම්බන්ධයෙන් යෙදුණක් බව පෙනේ. උපතේ සිට ම නිදහස් ලෙස සැලකෙන පුද්ගලයා සතු සිතීමේ නිදහස, කැමැති ආගමක් හෝ භාෂාවක් පිළිගැනීමේ නිදහස[127] ආදී මූලික අයිතිවාසිකම් ඒ ඒ රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් පිළිගෙන තිබේ.

පුද්ගලයා පිළිබඳ නෛතික පැවැත්ම සාමාන්‍යයෙන් ඇරඹෙන්නේ ඔහුගේ උපත සමඟ ය. මවගේ ශරීරයෙන් නියත වශයෙන් ම වෙන්වීමත්, එසේ වෙන් වීමෙන් පසු ව ජීවත්වන බවට ඇතිවන ලකුණු ඇතිවීමත් 'උපත' ලෙස නීතිය දක්වයි.[128] උපත පණ ඇති ව ඉපදීම, පණ නැති ව ඉපදීම ලෙස වර්ග කර දක්වයි. උපත සිවිල් නීතියට සම්බන්ධ වන්නේ දේපළ උරුමකර

125 දී. නි. 3, පි.309; සිගාලක සූත්‍රය.

126 දී. නි. 3, පි.309; සිගාලක සූත්‍රය.

127 පූ,නී., පි.16.

128 පූ.නී., පි.2.

ගැනීම හා අයිතිවාසිකම් ලැබීම යන හේතුවෙනි. මේ කාරණය වෛද්‍ය හා නීති යන ඒකාබද්ධ විෂයය යටතේ දක්වෙයි.

පුද්ගලයා නීතිය අයිතිවාසිකම් ලැබීමට හිමිකම් ලබන්නේ මවගේ සිරුරෙන් වෙන් වී වැදෑහැමහ ඉවත් කළ මොහොතේ සිට පණ ඇති බවට කෙරෙන ආශ්වාස, ප්‍රාශ්වාස කිරීම්, හැඬීම්, නාඩි වැටීම් ආදී ජීවී ලක්ෂණ පහළ කිරීමෙන් අනතුරුවය. පණ නැතිව උපදින අජීවී උපතට නීතික අයිතිවාසිකම් නොලැබේ. එසේ ම අජීව උපතේ උරුමක්කාරයන් වීමට ද අන් අයට (ඉන්) ඉඩක් නොලැබේ. **උපත සහතික කිරීම සඳහා උපන් දිනය, වේලාව, ගැහැනු පිරිමි බව, උපන් ස්ථානය ආදිය සටහන් කිරීම 'තිඹිරිගෙයි' වෛද්‍යවරුන්ගේ හා වින්නඹු මාතාවන්ගේ වගකීමය.** මෙහි ලා අදාළ අවශ්‍යතාවන් ඉස්මතු කර දක්වනු නඩු තීන්දු ද තිබේ. එවැනි නඩු තීන්දුවල දී කුසෙහි සිටි කාලය ද, පුද්ගලයාගේ අයිතිවාසිකම්[129] ලැබීම සඳහා සුදුස්සකු කිරීමට යොදාගෙන ඇත.

නියම ලෙස ආවාහ වූ දෙමාපියන්ට දාව උපදින සුජාත දරුවා මව්පියන්ගේ සියලු දේපළවල උරුමය හිමිකර ගන්නා අතර, දෙමව්පියන්ගෙන් නඩත්තු වීමේ අයිතිය ද ලබයි. එහෙත් නීත්‍යානුකූල ලෙස පිළිනොගත් විවාහයකින් බිහිවන **අවජාත** දරුවාට දේපළ උරුමකම් ලබාගත හැක්කේ මවගෙන් පමණි. පියාගෙන් ලැබිය හැක්කේ නඩත්තුව පමණි. එහෙයින් 'සුජාත', 'අවජාත' යන 'තත්ත්වය' වර්ග දෙකක් ලෙස සැලකිය යුතු ය. **'විවාහක', 'අවිවාහක'** යන 'තත්ත්වයන්' (දෙක) ඊට හේතු වූ බව ද මෙහි දී සැලකිල්ලට ගත යුතු ය.[130]

පුද්ගලයෙකුගේ උපතෙහි ම[131] දෙමව්පිය භාවය ගැන පැන නැගෙන හෙයින් දෙමව්පියන් හා දරුවන් අතර දෙපක්ෂයේ

129 පු.නී., පි.11, බ.ද., පි.684-686.

130 ජා.ස., පි.21.

131 පු.නි., පි.17.

අන්‍යෝන්‍ය යුතුකම් රැසක් පැවැත්වීමට තිබේ. එහි දී ඉතා වැදගත් ලෙස සැලකිය හැක්කේ:

1. දෙමව්පියන්ගේ බලතල හා ඒවායෙහි ප්‍රතිඵල,
2. දෙපක්ෂය විසින් එකිනෙකා කෙරෙහි දරන වගකීම්

යන කරුණු දෙකය.

මව්පිය බලය ඇතිවීම සඳහා කරුණු තුනක් සම්පූර්ණ විය යුතු බවට නීතිය පිළිගනී. නීත්‍යනුකූල විවාහයකින් උපත ලැබීම[132], උපතින් පසු කලෙක දෙමව්පියන් විවාහ වීමෙන් ඊට ඉහතින් ලැබූ දරුවන් සුජාතක බවට පත්වීම හා නීත්‍යනුකූල ව අරන් හදා ගැනීම යන කරුණු තුනය.

මව්පිය බලයට යටත්ව පවතින කරුණු ලෙස :

1. භාරකාරීත්වය, පාලනය හා අධ්‍යාපනය
2. දරුවන්ගේ දේපළ පාලනය
3. බාල දරුවන්ගේ විවාහයට කැමැත්ත දීම
4. දෙමව්පිය කැමැත්තෙන් බාරකරුවන් පත්කිරීම.
5. බාල දරුවන්ගේ දේපළ පිළිබඳ අයිතිවාසිකම්
6. අන්‍යෝන්‍ය පරිපෝෂණ අයිතිය

යන ඒවා නීතිය හඳුනා ගෙන තිබේ. ඒ එක් එක් කාර්යයන්හි දී නීතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව දැන ගැනීම පුද්ගලයාට වැදගත් වේ. දෙමාපියන් අසමඟිවීම, අන්තරාවීම, නීත්‍යනුකූල ව වෙන්වීම, මානසික රෝගීන් වීම, බන්ධනාගාර ගතවීම ආදී පුද්ගලික ජීවිතයේ දී පැන නැගෙන අවස්ථාවන්ට මුහුණ දීමේ දී එම දැනුම අවශ්‍ය හෙයිනි. ජාතක දරුවාගේ අයිතිය ප්‍රථමයෙන් ම හිමි වන්නේ පියාටය. දරුවන් අනුජාතක හෝ අවජාතක වන විට ප්‍රථමයෙන් හා සම්පූර්ණයෙන් අයත් වන්නේ මවටය. දරුවකුගේ භාරකාරය පිළිබඳ තරගයක දී අධිකරණය නිතර ම සලකන්නේ දරුවාගේ යහපතය.[133] නීතිය අයිතිය හෝ පවතින

132 පු.නි. පි.18. පු.නි., පි.20-45.

133 පු.නි., පි.30-32.

භාරය වෙනස් කිරීම සඳහා පවතින හේතූන් හෝ වලංගු වන්නේ ඒවා දරුවාගේ භාරකාරයා ගැන ස්වභාවික අයිතියක් ඇතයි ද, එම අයිතිය පරම එකක් වෙතැයි ද පිළිගන්නා නීතිය, උරගල ලෙස පාවිච්චි කරන්නේ ළමයාගේ උපරිම යහපතය යන්න බව මින් අවධාරණය විය යුතු ය. දරුවන් නීතියෙන් පාලනය කිරීමේ අයිතිය දෙමාපියන් වෙත පැවරෙන්නේ ඔවුන් නීතියේ පූර්ණ වයසට පැමිණෙන තෙක්ය.[134] නීතියෙහි පූර්ණ වයස ලෙස සැලකෙන්නේඃ

1. ගැහැනු පිරිමි දෙපිරිස ම වයස විසි එක සම්පූර්ණ කිරීමේදී,
2. විවාහක බවට පත්වීමේ දී,
3. ජනාධිපතිවරයා විසින් පූර්ණ වයස පිළිබඳ සහතිකයක් දීමේ දී, යන කරුණු උඩය.

දරුවනට අයිති දේපළ මව හෝ පියා විසින් පාලනය කළ යුත්තේ දරුවන්ගේ උපරිම යහපත සඳහාය.[135] දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මවට හෝ පියාට ගිවිසුම්වලට ඇතුළත් විය හැකි නමුත් ඒවායේ සීමාවන් පවතී. බාල වයසේ සිටින දරුවා වෙනුවෙන් නඩු පැවරීම, නඩුවලට පෙනී සිටීම හෝ දරුවා නියෝජනය කිරීමට දෙමාපියන්ට බලය ඇත.

දරුවන්ගේ විවාහයට දෙමව්පියන්ගේ කැමැත්ත අවශ්‍ය විය.[136] ඒ පිළිබඳව එකඟත්වයක් නොවූ විටක දී පියාගේ කැමැත්ත බලපැවැත්වුණි. 1907 අංක 19 නමින් බලයට පත් වූ පොදු විවාහ පනතේ 22 වැනි වගන්තිය, එහි ලා පැවතිය යුතු අවශ්‍යතා විස්තර කර ඇත.[137]

දරුවන්ගේ පරිපෝෂණය සඳහා කටයුතු කිරීම දෙමාපියන් වෙත පැවරී ඇත්තේ ස්වාභාවික ආදරය හා කරුණාව නිසාය.

---

134 පු.නි., පි.62-63 පු.නි., පි.61.

135 ඛගඨග්ග චග 140ග

136 පු.නී., පි.69.

137 පු.නි. පි.74-96.

පෝෂණය සපයන්නාගේ ශක්ති ප්‍රමාණය හා ආදායම් අනුව ආහාරපාන, නිවාස, බෙහෙත්, උපදෙස්, මඟපෙන්වීම් හා අධ්‍යාපනය ද ලබාදිය යුතු ය.[138]

රෝම ලන්දේසි නීතිය අනුව විවාහයකට දෙදෙනෙකු ඇතුළත් වූ කෙනෙහි ම බිරිඳගේ හා සැමියාගේ දේපළ සියල්ල පවුලේ පොදු දේපළ බවට පත්විය. එය 'සමවාය' යයි කියනු ලැබී ය.[139] එහෙත් :

1. 1876 අංක 15 දරන විවාහක අයිතිවාසිකම් පනත,

2. 1911 අංක 11 දරන යාපනයින්ගේ අයිතිවාසිකම් පනත,

3. 1923 අංක 18 දරන විවාහක ස්ත්‍රීන්ගේ දේපළ පනත,

යන පනත් මගින් රෝම ලන්දේසි නීතියෙහි පැවති 'සමවාය' නැති කරනු ලැබීය. විවාහ බැම්මෙන් බැඳී සිටිය ද ඇයගේ දේපළ හා මිල මුදල් ගැන නිදහස් ව ක්‍රියා කිරීමේ නෛතික අයිතිවාසිකම් බිරිඳට හිමි විය. අන්‍යෝන්‍ය පරිපෝෂණය විවාහ ජීවිතයේ හරය විය යුතු බැවින්, ස්ත්‍රිය විවාහ බැම්මෙන් බැඳී සිටිනතාක් අසරණ බවට පත්වන ස්වකීය සැමියා නඩත්තු කිරීමේ නීති බැරකම 1924 (විවාහක ස්ත්‍රීන්ගේ දේපළ පනත) ජූලි මස සිට ක්‍රියාත්මක විය. සැමියාගේ මරණයේ දී වැන්දඹුව විසින් දරුවන් නඩත්තු කළ යුතු බව ද මෙම පනතින් නීති ගතවුණි.

1889 යේ අංක 19 දරන ආඥා පනතින් ඇති වූ ව්‍යවස්ථාපිත නීතිය වූ නඩත්තු පනත (2 වන වගන්තිය) හා 1923 අංක 18 දරන විවාහක ස්ත්‍රීන්ගේ දේපළ පනත (26 වැනි වගන්තිය) යන පනත් දෙක නිසා අන්‍යෝන්‍ය පරිපෝෂණය[140] පිළිබඳ තත්ත්වය පැහැදිලි කළ හැකි ය. නඩත්තු පනත යටතේ බිරිඳ සැමියාගෙන් නඩත්තුව ඉල්ලා සිටින විට, ඇයට වෙන ම දේපළ හෝ ආදායම හෝ තිබුණත් සැමියා විසින් ඇයට නඩත්තු ගෙවිය යුතු

138 පු.නි., පි.97-146.

139 පු.නි., පි. 145.

140 L.G.A. pp.139-177.

වූ නමුත් විවාහක ස්ත්‍රීන්ගේ දේපළ පනත යටතේ සැමියකු විසින් බිරිඳකගෙන් නඩත්තුව ඉල්ලා සිටින විට ඔහුට ම අයිති දේපළ හෝ ආදායම් ලැබෙන මාර්ග නැති බවත්, ලෙඩදුක් හෝ වෙනත් කාරණා නිසා ඔහුට, ඔහුගේ නඩත්තුව දරා ගත නොහැකි බවත් ඔප්පු කළ යුතු විය.

අනියම් බිරිඳ හා අවජාතක ළමයින්ගේ නඩත්තු මුදල් ගෙවීම සම්බන්ධ ගැටලු විවාහය නමැති 'තත්ත්වය' යටතේ ම සලකා බැලිය යුතු ය. කසාදය බල පවත්වද්දී, බිරිඳට උපදින සෑම ළමයෙක් ම, කසාද සැමියාට දාව උපදින බව නීතියේ මූලික පිළිගැනීමකි. එපමණක් ද නොව, "බිරිඳ දික්කසාද වූ දිනයේ සිට දින 280 ඇතුළත උපදින ළමයකු සාක්ෂි පනතේ[141] වගන්තිය යටතේ කසාද පුරුෂයාට දාව උපන්නේය, යන නීතියේ මූලික පිළිගැනීම නිසා විවාහක බිරිඳට ඉපදී ඇති ළමයින්ගේ පියා ඔහු නොවේ, යයි ඔප්පු කිරීමේ වගකීම පැවරෙන්නේ පුරුෂයාටය.[142] එහෙත් අවජාතක ළමයින්ගේ, "පියා ඔහු" යයි ඔප්පු කිරීමේ වගකීම අනියම් බිරිඳට පැවරේ. එහි ලා බල පැවැත්වෙන කොන්දේසි තිබේ. එසේ ඔප්පු කළ විට අවජාතක වුව ද, ළමයින්ගේ නඩත්තුව ඔහු විසින් ගෙවිය යුතු අතර, ළමයින්ගේ භාරකාරත්වය ඉල්ලා සිටීමේ නීත්‍යානුකූල අයිතිය ඔහුට නොවේ. අනියම් බිරිඳට නඩත්තු ලබන්නට නීතියෙන් ඉඩ නැත. පහතරට සිංහල ජනයාට, උඩරට සිංහල ජනයාට, ද්‍රවිඩයනට, මරක්කල ජාතිකයන්ට බලපාන වෙනස් වූ පුද්ගල නීති ඇතත් නඩත්තු සඳහා බලපාන්නේ මේ නීති බව සැලකිය යුතු ය. පරිපෝෂණය පිළිබඳ නීතිය මුස්ලිම් ජනයාට බලපාන්නේ 1951 අංක 13 දරන විවාහ දික්කසාද (මුස්ලිම්වරුන්) පනතිනි. ඉහත පනත්වලින් පරිපෝෂණය පිළිබඳව පැවති ඌනතා බොහොමයක් 1973 අංක 19 දරන නඩත්තු ආඥා පනතින් මග හරවන[143] ලදි. දරුවා අවුරුදු 21 දක්වා නඩත්තු ලැබීමට අයිතිවාසිකම් ලැබීම, නඩුව පැවරූ

141 පු.නි., පි.186-189.

142 සු.නි., පි.190-200; 204-217.

143 සු.නි., පි.164.

දින සිට හිඟ මුදල් ලබා ගැනීමට හැකිවීම, වගඋත්තරකරුගේ වැටුපෙන් නඩත්තු මුදල් අයකර ගත හැකිවීම ආදී සහන රැසක් සැලසිණ.

ආගම ධර්මවල ඉගැන් වූ ඇතැම් ශික්ෂණයන්[144] නීතිය බවට පත්වීම පිළිබඳව දැක්විය හැකි හොඳ ම උදාහරණය මේ පරිපෝෂණ නීතියය. පුද්ගලයා පිළිබඳ නීතියෙහි බාල්‍යය නොහොත් වයෝ බාල්‍යය පිළිබඳ අතුරු විෂය ය.[145] බාල වයසේ සිටින පුද්ගලයන්ගේ නීතිමය තත්ත්වය, නෛතික වශයෙන් ක්‍රියා කළ හැකි ආකාරය, ක්‍රියා කළ හැකි කාරණා හා අවස්ථා මොනවා ද යන්න දක්වයි. බාල වියෙහි සිටින උඩරට, පහතරට, ද්‍රවිඩ හා මුස්ලිම් යන සියලු ම ආකාරයේ බාල පුද්ගලයන් පිළිබඳ ව දෙමාපියන්ගේ වගකීම්, සමාජයේ අනෙකුත් අය සමඟ නීත්‍යනුකූල ව බාලයාට කළ හැකි කටයුතු මෙහි දී සලකා බැලිය යුතු වේ. 1965 'පිරිපුන් වයස' ආඥා පනතින් වයස 21 පිරීමෙන් පුද්ගලයකු පිරිපුන් බවට පත් වන්නේ යයි නෛතික වශයෙන් පිළිගැනෙන හෙයින් පොදුවේ සියලු ම ජාතීන්ට එක ම රීතියක් අනුගමනය කිරීමේ හැකියාව ලැබේ. විවාහක බව හා ජනාධිපති තුමාගේ සහතිකය හේතුවෙන් ද පිරිපුන් බවට පත්වන බව ඉහතින් සඳහන් විය. එහෙත් මෙහි ලා පවතින විවිධ වෙනස්කම් පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය.[146] 1975 ජනවාරි දක්වා බල පැවැති සිවිල් නීති විධි විධාන සංග්‍රහයේ 35 පරිච්ඡේදයේ එන වගන්තිවලින් පූර්ණ වයස පිළිබඳ පිළිගැනීමේ වගන්ති පැහැදිලි කෙරිණි. අවසාන වශයෙන් කිව යුත්තේ පූර්ණ වයස, වයස 21 වීම, විවාහය හා ජනාධිපති තුමාගේ සහතිකය යන කරුණු මත බාලයා වැඩිහිටියකු වන බවය.

බාල වයසේ සිටින පුද්ගලයින් අපරාධ නීතිය යටතේ චෝදනා ලබන විට, ඔවුනට බලපාන නඩු විධිය කෙසේ ද යන්න 1939

144 එම. පි.204-205.

145 එම. පි.213-215.

146 එම. පි.223-226.

අංක 48 දරන ළමයින් හා බාල පුද්ගලයින් පිළිබඳ පනතේ දැක්වේ. එම පනතේ 38 වැනි වගන්තියේ එන පරිදි :

1. ළමයා යනුවෙන් අදහස් කරන්නේ වයස අවුරුදු 14ට අඩු පුද්ගලයන්ය.
2. 'බාල පුද්ගලයා' යනුවෙන් අදහස් කරන්නේ වයස අවුරුදු 14 පිරුණු වයස අවුරුදු 16ට අඩු අය ය.

මිනීමැරීම, අනියම් මිනීමැරීම, මිනීමැරීමට හා අනියම් මිනීමැරීමට තැත් කිරීම ආදී විවිධ අවස්ථාවන්හි දී ළමා උසාවිවලට ද බලය පවරා තිබේ.[147]

ළමා උසාවිය හා ළමා උසාවියේ බලතල පිළිබඳව විශේෂ පැනවීම් තිබේ. ළමයින් හා බාල පුද්ගලයින්ට අපරාධ නීතිය යටතේ වරප්‍රසාද රාශියක් බුක්ති විඳීමට නීතිය විසින් ඉඩ දී ඇත්තේ ඔවුන්ගේ බාල වයස නිසාය. එහි දී සැලකිල්ලට ගනු ලබනුයේ නොදැනුවත්කම හා නොපැසුණු බුද්ධිය නිසා එසේ වැරදි කරනු ලැබූ බවය. වැඩිහිටි පුද්ගලයෙකු කරන වරදක් හේතුවෙන් ඔහුගේ නම රජයේ ලියාපදිංචි වීම, දඩයකට යටත් වීම, සිර දඬුවම් ලැබීම, රැකියාව අහිමි වීම වැනි නුසුදුසුකම්වලට පත්වන නමුත් බාල පුද්ගලයාට එබඳු නුසුදුසුකම් නොපැනවේ. එම පුද්ගලයා පාලනය කළ නොහැකි තත්ත්වයක පසුවන්නේ නම් පමණක් රිමාන්ඩ් නිවසක හෝ අනුමත කළ පාසලක රඳවා ගැනීම වෙනුවට බන්ධනාගාර ගත කෙරේ. දණ්ඩ නීති සංග්‍රහයේ 53 වැනි වගන්තිය අනුව වයස අවුරුදු 16ට පහළ කිසි ම පුද්ගලයකු මරණ දඬුවමට යටත් නොකෙරේ.[148] ඒ වෙනුවට ජනාධිපති තුමාගේ අනුකම්පාව ඇති තෙක් බන්ධනාගාරයක හෝ රිමාන්ඩ් නිවසක හෝ තැබිය හැකි ය.

පුද්ගලයෙකු විසින් කරන ක්‍රියා, නොකර පැහැර හරින ක්‍රියා හෝ අපරාධ නීතියෙහි මෙන් ම සිවිල් නීතියෙහි ද 'වැරදි' හැටියට

147 එම. පි.227-237.

148 සු.නි., පි.238-246; 253-256.

සැලකේ. අපරාධ නීතිය අනුව දඬුවම් පමුණුවන ලබන අතර, සිවිල් නීතිය අනුව අලාභ ගෙවීම්වලට යටත් වන්නට සිදුවේ. රජයට විරුද්ධව අවි ගැනීම, තුවාල සිදුකිරීම, හොරකම් කිරීම, මිනීමැරීම, ස්ත්‍රී දූෂණ, වංචා කිරීම් දණ්ඩ නීති සංග්‍රහය යටතේ වැරදි ලෙස සැලකේ. එහි 75 වැනි හා 76 වැනි වගන්තිවලින් දැක්වෙන පරිදි[149]:

1. වයස අවුරුදු 8ට අඩු ළමයෙකු විසින් කරන කිසි ම ක්‍රියාවක් වරදක් නොවන බව.

2. පැසුණු බුද්ධියක් නොමැති වයස අවුරුදු 8 - 12 අතර ළමයකු විසින් කරන කිසි ම ක්‍රියාවක් වරදක් නොවන බව, දැක්වේ.

සෑම පුද්ගලයෙකුට ම නීතියේ ආරක්ෂාව අවශ්‍ය යයි පිළිගත් මූලික ප්‍රතිපත්තියක් ඇත. හිංසා කිරීම්වලින් ආරක්ෂාව ලැබීම මූලික මිනිස් අයිතියකි. මෙම ආරක්ෂාව පිළිබඳ නීතිය බාලයා වෙනුවෙන් ක්‍රියාත්මක වනුයේ උපතට පෙර සිටම ය. පිළිසිඳ ගත් දරුවකු නැති කිරීමට ක්‍රියා කිරීම වැඩිහිටි අය කරන වැරදි ක්‍රියාවක් බවට දණ්ඩ නීති සංග්‍රහයේ 306 හා 307 වගන්තිවලින් කියැවේ.[150] පුද්ගලයන් අයුතු ලෙස හා බලයෙන් පැහැර ගෙන යාම දණ්ඩ නීතියට අනුව අපරාධයකි. මෙහි දී විශේෂයෙන් ම බාල ගැහැනු පුද්ගලයාට ආරක්ෂාව සැලසෙන වගන්ති තිබේ. ලිංගික සංසර්ගය, ගණිකා වෘත්තිය, ස්ත්‍රී දූෂණය වැනි මාතෘකා යටතේ පැනවුණ නීති හා වගන්ති ඇත. දණ්ඩ නීති සංග්‍රහයේ 363 හා 364 වගන්තිවලින් ස්ත්‍රී දූෂණය පිළිබඳ කරුණු දක්වයි.[151]

දරුවකු ලොවට බිහි කරන දෙමව්පියන්ගේ මූලික යුතුකම්වලින් එකක් වන දරුවා නීතිය ඉදිරියේ 'සුජාතයකු' කිරීම පැහැර හැරීමෙන් විය හැකි පාඩුවෙන් ආරක්ෂා වීම සඳහා ද නීතිය ඉදිරිපත් වන ආකාරය සාක්ෂි පනතේ 112 වැනි වගන්තියෙන්

149 සු.නි., පි.258-265.

150 සු.නි., පි. 259-279.

151 සු.නි., පි.281.

පිරිමැසෙයි. ඉහතින් ද ඒ බව උපත යටතේ සඳහන් විය. එම පනතේ 118 වන වගන්තියේ එන පරිදි උසාවිවල සාක්ෂි දීම සඳහා බලකර සිටින අවස්ථාවල දී ප්‍රශ්න අවබෝධ කර ගැනීම හා කල්පනාවෙන් පිළිතුරු සැපයීම අපහසු බව උසාවියට ඒත්තු ගැනේ නම් බාලයාට ඒ සඳහා බලකිරීමෙන් වැළකිය යුතු බව පැවසේ.

1. 1939 සේ ළමයින් හා බාල පුද්ගලයින් පිළිබඳ ආඥා පනත,

2. 1944 වැරදිකරුවන් පරිවාසයට පත් කිරීමේ ආඥා පනත,

යන ඒවායින් ළමයින් රැකියාවල යෙදවීම හා වධ හිංසා කිරීම යන ඒවායින් ආරක්ෂාව සලසා දී තිබේ.

එක් එක් පුද්ගලයා ස්වකීය නීතිමය බැඳීම් හා වගකීම් ගැන දැනගත් විට එය සමාජ සම්මුති හා එකඟ වන, නොවන ආකාරයත්, යුතුකම් හා අයිතිවාසිකම් ලැබෙන නොලැබෙන, ආකාරයත් අවබෝධ කරගනු ඇත.

සත්‍ය ගවේෂක ලෝකයක, සර්ව බලධාරී දෙවි කෙනෙකුන්ගේ නිර්මාණයන් කෙරෙහි විශ්වාසය තැබීමකට වඩා පුද්ගලයාට තමා පිළිබඳ විශ්වසනීයත්වයක් ඇති කරලීම වඩා වැදගත් ය. එවිට තමා උපමාවට ගෙන හොඳ, නරක පිළිබඳ නිගමනයකට පැමිණීමට පුද්ගලයාට ශක්තියක් ඇති වේ. මේ ශක්තිය ලෝකයා විසින් මිනුම් දඬු ලෙස භාවිත කරන වර්ණ, වර්ග, ලබ්ධි ආදී සියලු භේදයන් ඉක්මවා යාමට පුද්ගලයා මෙහෙයවනු ඇත. මාතාංග[152] නම් සැඩොල් කුලයේ උපන් පුද්ගලයෙකුට ස්වකීය පෞරුෂය හා ශක්තිය හේතුවෙන් කාලීන සමාජයේ පැවති සියලු නීතිරීති හා සම්මතයන් අබිබවා යාමට හැකි වූයේ තමාගේ නිවැරදි සිතිවිල්ල හා අධිෂ්ඨානය හේතුවෙනි. ඔහු රාගය නිසා බඹලොව උපන්නේ කාලීනව සැඩොලුන් සතු අයිතිවාසිකම්, සමාජ සම්මත නීති රීතීන් විසින් පැහැර ගෙන තිබිය දී ය. ඔහුගේ ආත්ම ශක්තිය හෝ පෞරුෂය සීමා කොට රඳවා ගැනීමට

152 සු.නි., පි.283-284.

සැඩොල් බවට නොහැකි විය. ජන සම්මත ව්‍යවහාරයන් නිසා කෙනෙක් උසස් හෝ පහත් හෝ කළ නොහැකිය.[153] ඒ උසස් හෝ පහත් හෝ බව ඒ පුද්ගලයා වෙත ම රැඳී පවතී.

'ද්විජංචාපි' යන අදහස සමාජයේ තහවුරු කළ බමුණෝ අන් සියලු දෙනා ම 'එකජංචා' යි හැඳින්වූහ. මව් කුසින් උපදින බමුණා උපනයන කර්මය හේතු කොට ගෙන දෙවන උපත ද ලබන හෙයින් දෙවරක් උපදින යන අර්ථයෙන් 'ද්විජංචාපි' යයි දැක්වූයේ සමාජයේ අන්‍යයන්ට නොලැබෙන වරප්‍රසාද ලබා ගැනීම සඳහාය. මේ වරප්‍රසාදය නිසා 'එකජංචා' නම් වූ එක් වරක් පමණක් උපදින්නන්ගේ අයිතිවාසිකම් කොටසක් අහිමි වන බව ඔවුන් නොදන සිටියේ යයි කිව නොහැකි ය. සමානව උපදින මිනිසුන්ගේ සාධාරණ අයිතීන් සමානත්වයෙන් නොලැබෙන්නේ ලෝකයා ආත්මාර්ථකාමී අදහස්වලින් බැඳී විවිධ දර්ශන, චින්තන, මති මතාන්තර ආදීන් මගින් අන් අය පාලනය කිරීමට උත්සාහ දරන විටය. තමාත් ආරක්ෂා වී, ලෝකයාත් ආරක්ෂා කරගත හැකි සිතුවිලි හා එවන් සිතුවිලි නිර්මාණය වීමට සුදුසු සිත්, පුද්ගලයන් තුළ ජනිත කරවීමට හැකි වන්නේ නම් සාධාරණ යුක්ති සහගත ලෝකයක් ප්‍රාර්ථනා කළ හැකි ය.[154] සමාජයේ පවතින නීති රීති, සම්මත හෝ ව්‍යවහාර වෙනුවට ඒ ඒ පුද්ගල ක්‍රියා කලාපය උසස් පහත් බව මනින කෝදුව විය යුතු ය. ලෝකය ඉදිරියට ගෙන යන්නේ සිත විසින් යයි තේරුම් ගත් කල, සිත ඍජු කරගත් පුද්ගලයා දක්ෂයෙකි. ඔහු ප්‍රාඥයෙකි. කෙලෙස් නැති කිරීමෙන් යහපත මතු කරන ඒ පුද්ගලයා ශ්‍රේෂ්ඨයෙකි.[155] පුථුජ්ජන පුද්ගලයෙකි.

පුද්ගලයන් කෙලෙස්වලට නතුවීමේ හේතුවෙන් ධර්මයට සිත නොනමන බව සිතතත්, විදුරට බඳු සිත් ඇත්තෝ ද වෙති. ගල් ඔප මට්ටම් කරනුයේ විදුරය. විදුරට බඳු සිත් ඇත්තන්

153 සු.නි., පි. 235-236.

154 සු.නි., පි.43; වසල සූත්‍රය, ගාථා අංක 137 හා 138. ජා.පො., පි.529.

155 සු.නි. පි.199; වාසෙට්ඨ සූත්‍රය. පු.නි., පි.198, ගාථා අංක 651.

නිසා කෙලෙස් නසා දමා යහපත් ගති මතුකර ගත හැකි ය. අත්ථ කුසලට[156] නැඹුරු වූ පුද්ගලයා ද කෙලෙස් යටපත් කිරීමේ ශක්තිය ඇත්තෙකි. බාහිර ලෝකයා ගෙන් ලැබෙන පැසසුම් හා සැලකිලිවලින් ඔහු සෙලවිය නොහැකි ය. ඔහුගේ සැනසිල්ල මතුකර ගැනීමට හුරු වී පවතී. ඔහුගේ සැනසිල්ල, ඔහු තුළ ම ය.[157] ඔහුගේ ගති පැවතුම් සියල්ල ද ඔහු වටා සිටින සියල්ලන්ගේ ම සිත් සතන් ප්‍රමුදිත කරන ඒවා ය. නුවණැත්තන් ඔහුට දෝෂාරෝපණය නොකරන්නේ ඔහුගේ ක්‍රියා පිළිවෙත බැඳීම්වලින් තොර ව අගය කළ හැකි නිසා ය.[158] එහි දී නුවණැත්තන් පමණක් වෙන්කර දක්වන ලද්දේ මන් දැයි සිතා බැලිය යුතු ය. නුවණින් හීන වූ පුද්ගලයින් තමාගේ කැමැත්තට පිටින් කෙරෙන, සිදුවන යුක්තියට වුව[159] දොස් කියන, දොස් පවරන, විවේචනය කරන ගතියක් (කෙලෙස්වලින් ආවරණය වීමේ හේතුවෙන්) පවතින හෙයිනි. නූගත්කම ද එහි ලා බලපානු ඇත. නුවණින් යුත් තැනැත්තා එවන් අවස්ථාවක දී කල්පනා කරන්නේ තමන්ට හෝ අනුන්ට හෝ සිදුවන පාඩුව හෝ ලාභය ගැන හෝ නොව යුක්තිය පිළිගෙන, පුද්ගලයා විසින් කරනු ලැබූ ක්‍රියාවේ ගෞරවය ආරක්ෂා කිරීමට ය. අත්ථ කුසල නම් වූ අර්ථවත් යමක් කිරීමට පෙළඹෙන පුද්ගලයාට[160] කිසි කලෙකත් නුවණැත්තවුන් ගෙන් වරදක් නොපැමිණේ. ඔහුට නුවණැත්තවුන් ගෙන් ලැබෙන්නේ විශේෂ ගෞරවයකි.

පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු එක ම කරුණක් දෙස එක ම අරමුණක් හෝ නිමිත්තක් දෙස බලන්නේ විවිධව ය. විවිධ අදහස් මතුවන්නේ එහෙයිනි.

ඒ ඒ පුද්ගලයන්ගේ සිතුම් ස්වරූප සමාන නොවීම ඊට හේතුව ය. එසේ වන්නේ පුද්ගලයන් තුළ පවතින කෙලෙස්

156 බ.ද., පි.689.

157 සු.නි., පි.55-57; ආලවක සූත්‍රය. පු.ප., පි.311. සු.නි., පි.57.

158 සු.නි, පි.45-47; මෙත්ත සූත්‍රය. පු.ප., පි.258. ම.2, පි.133.

159 බ.ද., පි.198.

160 සු.නි., පි.45; මෙත්ත සූත්‍රය.

වේගවල අසමානත්වය[161] හේතුවෙනි. යමකු තුළ ද්වේෂය නැඟී, ඔහු ගන්නා තීරණ රෞද්‍ර ස්වභාවයකින් යුක්ත වනු ඇත.[162] එකී තීරණය ක්‍රියාත්මක වීමේ දී සියල්ලන්ට ම සිදුවන්නේ අනර්ථයකි. ලෝභ චේතනා හෝ මෝහ චේතනා බලපැවැත්වීමේ දී ද අනර්ථකාරී ප්‍රතිඵල ම ලැබෙන බැව් පෙනේ. සිතක ක්‍රියාකාරී ස්වරූපය දෙස නුවණ යොදා බලන්නේ නම් ඒ බව පෙනේ. සමාජයේ ඒ ඒ පුද්ගලයන් වෙත පැවතිය යුතු සැනසිල්ල ලබා ගැනීමට නොහැකි වන්නේ මේ ලෝභ, ද්වේෂ, මෝහ සිතුවිලිවල බලපෑම් නිසාය. එසේ ලෝභ, ද්වේෂ, මෝහ සිතුවිලි බෙහෙවින් බලපවත්වන සමාජයක, පොදු යහපත සලසන තීරණයන් පිළිබඳ අනුමැතිය බලාපොරොත්තු වීම කළ නොහැකි ය.[163] ආධ්‍යාත්මික ගුණ වගාවෙන් පොහොසත් තත්ත්වයක් මතුවන තුරු පොදු යහපත සලසන මත පිළිබඳ ව ඔවුන්ගේ ඡන්දය විමසීමෙන් ප්‍රයෝජනවත් නොවේ.[164] ඒ අමතක කළ යුත්තකි. ආධ්‍යාත්මික ගුණ වගාව වැඩීමත් සමඟ පොදු යහපත සලසන වැඩ පිළිබඳ ව පුද්ගලයන්ගේ සිතුවිලි සමාන වනු ඇත. ඒ සඳහා පුද්ගලයන් තුළ පැවතිය යුතු සිතුවිල්ල, "සුඛිනො වා ඛෙමිනො හෝන්තු" නම් වූ "සියල්ලෝ සැප ඇත්තෝ වෙත්වා! එම සැප උසුලා සිටින්නෝ වෙත්වා,"[165] යන අදහස ය. අර්ථ කුසලය සකස් වූ සිතකින් මතුවන අදහස, පුහුදුන් සිතක මතුවන අදහසට සම්පූර්ණයෙන් ම වෙනස් වන්නේ කෙලෙස් මතුවීම වළක්වා ඇති හෙයිනි. එම සිතෙහි නිවී සැනසුන ස්වරූපයක් පවතී.[166] එහෙයින් අන්‍යයන් සැනසිල්ලට පත් කරන සිතුවිලි පහසුවෙන් මතුකර ගත හැකි ය. අත්ථ කුසල වූ මානසික ස්වරූපය සකස් කර ගැනීමට උපකාරී

161 සු.නි., පි.24. බ.ද., පි.135-137. බ.ද., පි.135.

162 සු.නි., පි.44, මෙත්ත සූත්‍රය.

163 ම.ව.2, පි.871-ගාථා අංක 9-11.

164 ම.නි. 3, පි.33; චූලකම්ම විභංග සූත්‍රය. සු.නි. පි.282.

165 සු.නි., පි.263; පසුර සූත්‍රය. ම.ව.2, පි.871. ගාථා අංක 1-7. සු.නි., පි.46. ම.ව., 2, පි.853. ජා.ස., පි.01.

166 ම.ව.1, පි.289-297; චෝදනාවස්තු බණවර.

වන දහම් කොටස් වෙන්කර 'කරණීයමෙත්ත' සූත්‍රයෙහි දක්වා තිබේ. ඒ පිළිපැදීමෙන් පුද්ගලයාට දියුණුව සලසා ගත හැකි ය. ඉන් :

**"සක්කො උජූච, සූජූච - සුවචෝ චස්ස මුදු අනතිමානි,"**

යන ගාථා දෙ පදයෙන් දක්ෂයකු වීම සඳහා ඍජුකම, සුජුකම, සුවචකම, මුදුකම හා නිහතමානීකම නම් වූ ගුණ පහක් දක්වා ඇත. දක්ෂ භාවය උපතින් ම හෝ උත්සාහයෙන්[167] යුක්තව ක්‍රියා කිරීමේ හේතුවෙන් ළඟාකර ගත හැකි ය.

යම්කිසි පුද්ගලයෙකුගේ දක්ෂ භාවයේ ප්‍රමාණය මැන ගත හැකි වන්නේ ඔහු යම්කිසි ක්‍රියාවක නියැලී සිටින අවස්ථාවේ දී ය.[168] තම තමන්ගේ දක්ෂකම් අන්‍යයන් ඉදිරියේ ප්‍රකාශ කරන ඇතැම් පුද්ගලයන් පිළිබඳව වුව, සත්‍ය අසත්‍ය බව දැකිය හැක්කේ ක්‍රියාව අනුව ම ය. ලෞකික සැප සම්පත් ලබා ගැනීම සඳහා පුද්ගලයන් විසින් දක්වනු ලබන දක්ෂකම් බොහෝ විට තාවකාලික[169] අගයකින් යුක්ත ය. එහෙත් ජීවිතයක සැනසිල්ල ළඟා කර ගැනීමේ ස්ථිරසාර භාවය සඳහා දැක්විය යුතු දක්ෂකම වඩාත් ගැඹුරු ස්ථිර බවක් දැක්විය යුතු ය.[170] නුවණින් කල්පනා කර බැලීමෙන් එය තෝරා බේරා ගැනීම ද අපහසු නොවේ.

සිතක පැවතිය යුතු ඍජුකම ක්‍රියා ආරම්භයේ සිට ම පැවතිය යුත්තකි. අවංකකම යනුවෙන් හැඳින්වෙන ගුණය ද, මීට බෙහෙවින් සමාන යයි සිතිය හැකි ය. ආරම්භයේ දී පටන් ගත් ඍජු බව කාර්ය සාඵල්‍යය නම් වූ ප්‍රතිඵල ලැබීම දක්වා නො නවත්වා පවත්වා ගත යුතු වේ.[171] යම්කිසි කාර්යයක ප්‍රතිඵල සඳහා බාහිර බල වේගයන්ගේ බලපෑම් පවත්නා බව අමතක

167 බ.ද., පි.134.

168 චූ.ව. 2, පි.255-257; සංඝභේදකඛන්ධකය. ථෙරී, පි.11, ගාථා 24. චූ.ව.2, පි.257.

169 ම.ව. 2, පි.689-693.

170 ථෙරී, පි.55, ගාථා 231-232.

171 චූ.ව. 2, පි.259-269; සංඝභේදඛන්ධකය. ම.ව. 2, පි.733.

නොකළ හැකි නමුත් ඍජු පුද්ගලයෝ බොහෝ විට තමන් අපේක්ෂා කළ ජයග්‍රහණය කරා පැමිණෙති. ඍජු පුද්ගලයන්ට බාහිර බලවේග[172] පවා යටපත් කළ හැකි බව ඉන් පැහැදිලි වෙයි.

'උජුකම' බාහිර ව පැමිණෙන බාධක මග හරවාලීම් වස් පවතින දැඩි අධිෂ්ඨාන ශක්තියයි පැහැදිලි කරන බව ඉහතින් දැක්විණ. 'ඍජුකම' ඇති වන්නේ අභ්‍යන්තරයෙන් මතුවන කෙලෙස් සංසිඳුවා ගැනීම සඳහා පවතින දැඩි අධිෂ්ඨාන ශක්තිය සමඟ පවතින පුද්ගල අවංකභාවය නිසා ය.[173] **රාග, ද්වේෂ, මෝහ, විතක, ශ්‍රද්ධා, බුද්ධි වශයෙන් එක් එක් පුද්ගල චරිත වෙන්කර හඳුනා ගැනීමට හැකි වන්නේ ද,** පුද්ගල අභ්‍යන්තරය තුළ පවතින ස්වභාවයන් අනුව ය. අතෘප්තිකර අපේක්ෂාවන් හේතු කොට ගෙන සිතෙහි 'සූජුව' නම් වූ සැනසිල්ල පවත්වා ගැනීම අපහසු වේ. පවුලේ එකට ජීවත් වන දෙමාපිය, දූදරු ආදීන්ගේ ගති පැවතුම් ඒ ඒ අයට නුරුස්සන ගතියට හේතු වන්නේ 'සූජුව' බව නොමැති හෙයිනි. අන්‍යයන් පිළිබඳ ව තම තමන් අපේක්ෂා කරන මට්ටම් හා මිමි කරා ඒ ඒ පුද්ගලයන් නොපැමිණීමේ හේතුවෙන්[174] බොහෝ විට 'සූජුව' බව පුද්ගලයන්ගෙන් තුරන් වේ. දක්ෂ පුද්ගලයා එය පාලනය කොට අපේක්ෂිත ජයග්‍රහණ කරා යොමු කර වන්නේ සංවරය නම් වූ හික්මීමේ යහපත් බව හේතුවෙනි.

ක්‍රියාවන් හා වචනයන් අසංවර වීමේ හේතුවෙන් බොහෝ විට පවුල් හා ප්‍රජාවන් අවුලින් අවුලට පත් කෙරෙන බවට[175] ඕනෑ තරම් උදාහරණ සපයා ගත හැකි ය. දෙමාපියන් දරුවන්ගෙන් ද,[176] දරුවන් දෙමාපියන්ගෙන් ද, දෙමාපියන්ගෙන් හා දරුවන්ගෙ න් ජන සමාජය ද අපේක්ෂා කරන්නේ සංවර බව නමුත් ඒ බොහෝ විට පවත්වා ගැනීම පහසු නොවේ.

172 ථෙර, පි.155-157. ථෙර, පි.157, ගාථා අංක 552. ථෙර, පි.157-159.

173 ම.නි. 1, පි. 401, 599.

174 ම.2, පි.423-429; රට්ඨපාල සූත්‍ර. ථෙර, පි.197, ගාථා 774-779.

175 අ.2, පි.80. අ.නි. 2, පි. 80

176 බ.2, පි.136-137. බ.ද., පි.136.

ස්වාමි භාර්යා[177], ස්වාමි සේවක ආදීන් අතර පවතින සුහද බව සංවර නොවීම නිසා පළුදු වී බිඳී යයි. ගුරු ගෝලයන් අතර පවතින මත ගැටුම්[178] නිසා ඒ ඒ පක්ෂ ඔවු නොවුන්ට චෝදනා ප්‍රතිචෝදනා කරති. මේ පිළිබඳ ව නුවණින් සලකා බලන විට පෙනී යන කරුණක් වන්නේ අප අපේක්ෂා කරන පරිදි සියල්ල අපේ පරිහරණයට සුදුසු පරිදි, අපේ සතුටට ගැළපෙන පරිදි සකස් නොවූ බව ය. එහෙයින් තමන්ට ගැළපෙන පරිදි අවශ්‍ය කරුණු නම් වූ ප්‍රත්‍යයන් සකස් කර ගැනීමට පුද්ගලයාට හැකි වන්නේ ඇසුරු කරන නිමිත්ත ගළපා ගන්නා ආකාරය පිළිබඳ වගකීම පුද්ගලයාට පැවරෙන[179] හෙයිනි.

යම්කිසි රසවත් කෑමක් තමන් වෙත කිසිවකු විසින් පිළිග න්වන විට ඒ පුද්ගලයා ඒ තමන්ට හැකි උපරි ම ශක්තිය යොදවා එකී කෑම සකස් කරන ලද බව වටහා ගත යුතු ය. එහෙත් තමන් බලාපොරොත්තු වන රසය හෝ මිහිර එහි නොතිබෙන්නට පුළුවන. එහෙයින් පිළිගන්වනු ලැබූ ආහාරය, රසවත් කර ගැනීමට යෙදිය යුතු උපක්‍රම පිළිබඳ ව පුද්ගලයා කල්පනා කළ යුතු වේ.[180] තමන් හා ආශ්‍රයට වැටෙන පුද්ගලයන්ගෙන් අපේක්ෂිත සුවච බව ලබා ගැනීම සඳහා පුද්ගලයා විසින් උපක්‍රම යෙදිය යුතු ය. දෙමාපිය ගුරුවරු[181] වැඩිහිටි කවුරුන් විසිනුත් නුවණින් සැලකීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගත හැකි ය. තමා සුවච වීමෙන් තමා හා ඇසුරට පත්වන්නවුන් සුවච වන බව සැලකිල්ලට ගන්නා දක්ෂයාට අවශ්‍ය සුවච බව ලැබිය හැකි ය. ප්‍රිය ඵලවන වචන, ක්‍රියා සිතුවිලි[182] ඉතා දරුණු පුද්ගලයන් පවා සුවච කරවීමට හේතු වේ.

177 දි.නි. 1, පි.155-157 අම්බට්ඨ සූත්‍රය. දී.නි. 1, පි.157. L.G.A. pp.49-82.

178 ම.1, පි.205; මහා දුක්ඛක්ඛන්ධක සූත්‍රය. ල.ම.අ., පි.10.

179 දී.නි. 1, පි.149 දී.1, පි.89; සාමඤ්ඤඵල සූත්‍රය.

180 අ.නි. 2, පි.111-119; අ.2, පි.119.

181 දී.නි. 1, පි.217; අම්බට්ඨ සූත්‍රය. ම.නි. 2, පි.335-339.

182 දී.නි. 1, පි.247; සොණ දණ්ඩ සූත්‍රය.

දැඩිව ගැනීමෙන් සිතෙහි සැනසිල්ල නැතිවන බව තේරුම් ගන්නා පුද්ගලයා ලෝභ, ද්වේෂාදී සිතින් නිමිති දැඩි කොට[183] නොගනිති. සාමාන්‍ය පුහුදුන් (පෘථග්ජනයා) මිනිසා මෙන් ලාභ ලැබුණු විට ලෝභයෙන් උදම් වීම හෝ අලාභ ලැබුණු විට ද්වේෂයෙන් පෙළීම හෝ මුදු ගුණ සිතක පැවතිය නොහැකි ය.[184] මධ්‍යස්ථ ලීලාවෙන් මුදු ගතිය සිත තුළ මතු කොට නිහඬවීම එහි ලක්ෂණය ය. ස්වාමි පුරුෂයා හා ස්ත්‍රිය වසන නිවසක් දේවතාවියක් හා දේවතාවෙක් වාසය කරන නිවසක් බවට පත් කර ගත හැක්කේ සිදුවන වැරදි එබඳු ගුණයෙන් ඉවසීමෙන් ය.[185] ඒ දරුවන්ගේ වැඩීම කෙරෙහි ද, මුදු ගුණය වගා කරවා සැනසිල්ල ළඟා කරවිය හැකි ශක්තිය පුද්ගලයා තුළ ම පවතී. සිත තුළ පවතින දොස් ඉවත් කර, නිදොස් අදහස් වගා කරන බෞද්ධ ශ්‍රද්ධා චෛතසිකයට මෘදු බව බෙහෙවින් අවශ්‍යය.[186] සිත පරීක්ෂාවෙන් බලා, සිහිය එලවා ගැනීම සති[187] චෛතසිකයි. එහි ලා කෙරෙන උත්සාහවත් වීම වීරිය චෛතසිකය යි. කෙලෙස් යටපත් කිරීම සඳහා පවත්වා ගත හැකි සමාධිය සඳහා පුද්ගලයෙකු තුළ ඉහත ලක්ෂණ අවශ්‍ය ය. ලෝකය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් බැලිය හැක්කේ පුහුණු කළ මුදු සිතකිනි.

'මාන', 'අනතිමාන', 'අතිමාන' ලෙස දක්වන මැනීමේ ගති පහළ වන්නේ හික්මීමක් අවශ්‍ය වූ විට ය.[188] තමන් පිළිබඳ ව ක්‍රම තුනකින් මනිනු ලබන ස්වභාවය නිසා පුද්ගලයාගේ සිත අවුලට පත්වේ.

183 ම.නි. 2, පි.431-435.

184 දී.නි. 2, පි.55; සන්තුට්ඨ සූත්‍රය. අ.නි. 2, පි.57-59; අරියවංශ සූත්‍රය.

185 ම.නි. 2, පි.519, 523; අංගුලිමාල සූත්‍රය. අ.නි. 2, පි.67.

186 ම.නි. 2, පි.303-305; මාගන්ධියා සූත්‍රය. සු.නි. පි.265-269. සු.නි., පි.271, ගාථා 861-862. ථෙර, පි.177, ගාථා අංක 659-672. L.G.A. p.11.

187 සු.නි., පි.89-95; බ්‍රාහ්මණ සූත්‍රය. සු.නි., පි.89 සු.නි., පි.115. අ.නි. 2, පි.111-119.

188 ස.සො.3, පි.980; ඕවාද සූත්‍රය.

තමා අනෙක් අයට වඩා පහළින් සිතා මිම්ම ගැනීමේ දී **හීනමානය** පහළ වේ. තමා අනෙක් අය හා සමාන යයි (සදෘශ්‍යමාන) සිතන්නට යාමෙන් ද සිතේ නොසන්සුන් ස්වභාවය පහළ වේ. අනෙක් අයට වඩා උසස් යයි සිතන්නට යාමෙන් ද **උච්චමාන** හෙවත් සෙය්‍යමාන (උඩඟු බව) සිත පහළ වේ. එය **අතිමාන** ලෙස ද සැලකිය හැකි ය. බාහිර වස්තූන් හා පුද්ගලයන් සමඟ තමා (සාපේක්ෂිතව) මැනීමට යාමෙන් සිතේ පහළ වන නොසන්සුන් ගතිය මැඩ පැවැත්විය හැක්කේ එසේ මිමි ගැන නොසිතීමෙන් ය. වස්තු හා පුද්ගලයන් පිළිබඳ මිමි ගැන සුපරීක්ෂාකාරීවීමට වර්ණ, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ආදී ලක්ෂණ මතුකර ගත යුතු වේ. එහි ලා අපේක්ෂිත සැපය ලබා ගැනීමට මිම්ම මගින් බාධකයන් වේ. සිතේ පවතින කෙලෙස් ගතිය ඉවත් කර ගැනීම නිසා කිසිවක් සෙවීම සඳහා උත්සාහ නො වේ. කිසිවක් සෙවීමට යාමෙන් ඇතිවන දුක් පීඩා ද නොවේ.[189] **අනතිමානී විය හැක්කේ මිමි ගැන නොසිතීමෙනි.**

උසස් අර්ථයක් සඳහා සිත සකස් කර ගත් පුද්ගල ජීවිතයේ[190] දැකිය හැකි ලක්ෂණ කිහිපයක් මෙත්ත සූත්‍රය පැහැදිලි කරයි.

1. සතුට ඇති බව (සන්තුස්සකෝ ච)
2. පහසුවෙන් පෝෂණය කළ හැකි බව (සුභරො ච)
3. කෘත්‍ය බහුල නොවන බව (අප්පකිච්චෝ ච)
4. සැහැල්ලු පැවතුම් ඇති බව (සල්ලහුකවුත්ති)
5. ඉන්ද්‍රියයන්ගේ ශාන්ත බව (සන්තින්‍ද්‍රියෝ ච)
6. ස්ථානෝචිත ප්‍රඥාව ඇති බව (නිපකෝ ච)
7. සංවර වූ ඉන්ද්‍රියයන් පවතින බව (අප්පගබ්භෝ)
8. කුලයන්හි නොඇලෙන බව (කුලෙසු අනනුගිද්ධො)

189 ස.නි. 4, පි.399-403; ගෙලඤ්ඤ සූත්‍රය.

190 ඛ.1., පි.169. අ.නි. 2, පි.319. අ.නි. 2, පි.345. ඛ.ද., පි.172-179.

පෘථග්ජන මිනිසා සතුට පවත්වා ගැනීම සඳහා දරන උත්සාහය, කරන වියදම හා ලබන පීඩනය සීමාරහිත ය. දිවා රෑ වෙහෙස මහන්සියෙන් ඒ සියල්ල ලබා ගැනීම සඳහා කරනු ලබන උපක්‍රම හා ඒවා රැක ගැනීමට දරන උත්සාහය අපමණ ය.[191] එක් ආහාර වේලක් සඳහා කොපමණ වෙහෙසක් දරන්නේ දැයි සලකා බලන විට, ඒ ආහාර වේල ලැබීමෙන් වුව ද සතුට පවත්වන්නේ තාවකාලිකව බව වැටහේ. බාහිර වස්තූන් කෙරෙන් ලබන සතුට එසේ ය. එක් සතුටක් ලබා මොහොතක් ගතවීමෙන් පසු නැවතත් සතුටක් ලබා ගැනීමට උපක්‍රම යෙදීමට සිදුවීම ඊට හේතුව ය. සෝද සෝදා උපක්‍රම කොතෙක් යෙදුවේ නමුත් කිලුටු වීම ම එහි ස්වභාවය ය. සතුටු විය යුත්තේ මානසික සුවය ය.[192] මානසික සුවය සඳහා බාහිර වස්තූන් සෙවීම සුදුසු පිළියමක් නොවන්නේ බාහිර වස්තූන් තම පාලනයෙන් තොර ව පැවතීම ය. එහෙත් ස්වකීය පාලනයට යටත්ව පවත්වා ගත හැකි සිත ලෝභ, ද්වේෂ, මෝහ සිතුවිලිවලින් කිලුටු නොවී පවත්වා ගත හැකි වෙතොත් ඒ මානසික සුවය නම් වූ සතුටට හේතු වේ.

පහසුවෙන් පෝෂණය කළ හැකි බව 'සුභර' නම් වේ.[193] පුද්ගලයා සිත හා කය නම් වූ කොටස් දෙකක් පෝෂණය කළ යුතු වේ. සා ගින්න නිවාගෙන කය පවත්වා ගැනීමට දිරවා ගත හැකි අපථ්‍ය නොවන ආහාර ගත යුතු වේ. එමගින් ජීවිතය පවත්වා ගත හැකි ය. කය පෝෂණය කිරීමටත් වඩා අපහසුව පවතින්නේ සිත පෝෂණය කර ගැනීමෙහි ය. කය පෝෂණය සඳහා අවශ්‍ය ආහාර පිළිබඳ ව රසය, ගුණය, තත්ත්වය ආදී නොයෙකුත් අවශ්‍යතා පහළ වන්නේ[194] සිතෙහි ය. තමන්ගේ

191 ථෙර., පි.175-177; බදිරවතිය රේවත ස්ථවිර ගාථා. ථෙර, පි.175, ගාථා අංක 654. ථෙර. පි.177-179 ගාථා අංක 659-672.

192 සු.නි., පි.44; මෙත්ත සූත්‍රය.

193 අ.නි. 2, පි.125-129; පත්තකම්ම සූත්‍රය. අ.නි. 2, පි.131-133. ථෙර., පි.189-193; පාරාසරිය ස්ථවිර ගාථා, ථෙර, පි.219-2223. ථෙර., පි.221-223, ගාථා 934-945. අ.නි. 2, පි. 139; දේවදත්ත සූත්‍රය.

194 ථෙර., පි.229-235; සාරිපුත්ත ස්ථවිර ගාථා. ථෙර, පි.229 ගාථා අංක 981-985. ථෙර., පි.233 ගාථා අංක 1014 ම.1, පි.233-237.

තත්ත්වයට ගැළපෙන ආහාර, ඇඳුම් පැළඳුම් ගැන සිතා කය පෝෂණය සඳහා උත්සාහ කරන පුද්ගලයාගේ සිත පෝෂණය කිරීම අපහසු ය. අපේක්ෂාව පරිදි සියල්ල ඉටුකර ගැනීමට නොහැකි වීම ඊට හේතුව ය. සිත පෝෂණය වූ පසු කය පෝෂණය ඉතා පහසු වන්නේ ඒ බලන ආකාරයේ වෙනසක් සිදුවන නිසා ය.[195] ඒ ඒ පුද්ගලයන්ගේ කය පෝෂණයෙහි ලා පැවතිය යුතු ගුණය 'සුභර' වන්නේ නම් සිව්පසය සැපයීම අපහසු නොවේ. පැවිද්දා ජීවත් කරන දායකයාත්, දරුවන් රැක බලා ගන්නා දෙමාපියවරුත්, රටවැසියාගේ අවශ්‍යතා සපයන පාලකයනුත් ඒ ඒ පුද්ගලයාගේ 'සුභර' බව වටහා ගන්නේ නම් සියලු තන්හි ජීවිතය ගැටලු වලින් තොර වනු ඇත. එහෙයින් කය පෝෂණය නම් වූ ජීවිත රැක ගැනීමේ වටිනාකම සිත පෝෂණය[196] කිරීමේ ප්‍රමාණය අනුව පවතී. රාගයෙන් දූරදර්ශී බව කරා යන පුද්ගල හෝ ප්‍රජා ජීවිතයක හෝ සහජීවනයට 'සුභර' බව අද ඉතා ම අවශ්‍ය වන්නේ ඇතැමුන් සාගින්නෙන් මිය යද්දී, ඇතැමුන් ආහාර නැති නාස්ති කරන හෙයිනි. එය මිනිස් කමට නො ගැළපේ.

කටයුතු බහුල නොවීම පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අංගයකි. දූ දරුවන් හා පවුල් නඩත්තු කිරීමේ පටන් ප්‍රජා කටයුතු ආදී දහසකුත් කටයුතු පටලවා ගැනීමෙන් ජීවිතය පිළිබඳ සැනසිලිදායක ගතිය ලැබිය නොහැකි ය. ධනය නිසි මාර්ගවලින් හා නොනිසි මාර්ග වලින් ද ලබා ගැනීමට දිවා රෑ වෙහෙසෙමින් කටයුතු බහුල කර ගන්නා පුද්ගලයා ඉන් තෘප්තිමත් නො වේ. විශාල රාජ්‍යයන් සතු රජවරු පවා තව තවත් රටවල් අල්ලා ගැනීමට උත්සාහ දරමින් තෘෂ්ණාවට දාස කම් කරති.[197] මහන්සියෙන් ධනය ඉපයීම කටයුතු බහුල

195 ස.නි. 2, පි.299 සන්තුට්ඨ සූත්‍රය. ස.නි. 2, පි.299. අ.නි. 2, පි.55; සන්තුට්ඨ සූත්‍රය. ස.නි. 4, පි.349 තුම්මෝප සූත්‍රය. ස.නි. 4, පි.339.

196 අ.නි. 2, පි.344; බහුස්සුත සූත්‍රය. සාසනරතන හිමි, මොරටුවේ, සුභෘලේඛ පරිවර්තන ගාථා 116-117 මා.ද., පි.405. ගාථා අංක 116.

197 සාසනරතන හිමි, මොරටුවේ, සුභෘලේඛා පරිවර්තන, මා.ද., පි.373. ගාථා අංක 34.

ක්‍රියාවකැයි සලකන ඇතැමුන් මංකොල්ලකෑම්, සොරකම්, සූදුව, නුසුදුසු වෙළෙඳාම් ආදී වැරදිවලට පෙළඹෙති. 'සැනසිල්ල සඳහා යයි' වැඩ අඩුකර ගැනීමට සිතමින් යොදා ගත් වැඩ පිළිවෙළ මහත් පීඩාදායක තත්ත්වයට පත්වන විට වැඩ වැඩි වේ. කෘත්‍ය බහුල නොවූ වැඩ සඳහා අවශ්‍ය වන්නේ පහසුවෙන් පෝෂණය කළ හැකි ගතක් හා සිතක් පමණකි.[198] සිතෙන් මතුවන සතුට භුක්ති විඳිමින් ජීවිතයේ පැවැත්මට යමක් සපයා ගැනීම, 'වැඩි වැඩක් නොවීමකි.' සැහැල්ලු පැවතුම් ඇති බව යනු ජීවත්වීම සඳහා අමුතු බරක් නොමැති වීම ය. ජීවිතය බර වන්නේ ශරීරයේ ප්‍රමාණය අනුව නොවේ. සිත කෙලෙස් වලින් බර වීමෙන් ශරීරය ද බර වේ.[199] ඇඳුමක් ඇඳීමේ දී, ආහාරයක් ගැනීමේ දී, සිත බර වන ප්‍රමාණය අනුව ශරීරයට ද බර දැනේ. මිල මුදල්, වතුපිටි, ගේ දොර, තනතුරු, ගෞරව සැලකිලි ආදිය ලබා ගැනීම, රැක ගැනීම හා පවත්වා ගෙන යාම සඳහා යෙදිය යුතු උපක්‍රමවල පමණට වඩා සිතුවිලි බර ය. ඒ සිතුම් පැතුම්වල බර උසුලා ගැනීමේ අපහසු ව නිසා පීඩා විඳිතත්, ඒවා සැනසිල්ල සඳහා ගොනු කර ගත් ඒවා බැවින් සමාජයෙන් ඉවත් කිරීම ද අපහසු ය. නිදහස් සැහැල්ලු සිතක් සඳහා අපේක්ෂාවෙන් තොර ව, බැඳීමක් නොමැති ව වස්තු පරිහරණය කිරීම, සැහැල්ලු පැවතුම් ඇති බව සඳහා අවශ්‍ය ය.

සන්සුන් ඉන්ද්‍රියයන් පැවැත්ම, පුද්ගල දියුණුව සඳහා ඉතා අවශ්‍ය ය.[200] ඉහතින් දක්වන ලද ගුණයන්ගෙන් යුක්ත වන පුද්ගලයාගේ ඉන්ද්‍රිය සන්සුන් බව අපේක්ෂා කළ හැකි වන්නේ ඒ එක් එක් ලක්ෂණය එකට බැඳී ඇති බැවිනි. ඉහත ලක්ෂණය නොමැති පුද්ගලයන්ගෙන් ඉන්ද්‍රිය සන්සුන් බව අපේක්ෂා කළ නොහැකි ය. සිතේ පවතින සන්සුන්කම හෝ නොසන්සුන්කම

198 සාසනරතන හිමි, මොරටුවේ සුභෘලේඛා පරිවර්තන මා.ද. පි.367.

199 ම.නි. 2, පි.445; රට්ඨපාල සූත්‍රය බලන්න, ථෙර., පි.197-199. ථෙර., පි.1197. මා.ද., පි.365. සුභෘලේඛා පරිවර්තන ගාථා අංක 16.

200 සාසනරතන හිමි, මොරටුවේ, රත්නාවලී පරිවර්තන, මා.ද., පි.328. ස.නි. 4, පි.595-605.

හෝ ඉන්ද්‍රියයන් ගෙන් ප්‍රකාශ වේ.[201] කථාව හා ක්‍රියාවන් සිතුවිලි අනුව හැඩ ගැසෙන බැවිනි. ද්වේශ සිතුවිලි, බල පවත්වන කල්හි පුද්ගලයාගෙන් බලාපොරොත්තු විය යුත්තේ ඊට අනුරූප වන කථාව හා ක්‍රියාව ය. අසල් වැසියන් සමඟ පවත්නා ඉතා සුළු සුළු දේවල් වෙනුවෙන් ද අමනාප වන ඔහුට පවුලේ සාමාජිකයන් ද රිස්සුම් නොදේ. ඒ ඒ ඉන්ද්‍රියයන්ගේ බලපෑම්වලට යටත් වී, ආවේගවලින් යුතුව ක්‍රියා කරන පුද්ගලයා ඉමක් කොනක් නැති පීඩාවන් ළඟා කර ගනී.[202]

'**සිගාලෝවාදයෙහි**' දක්වන ලද කරුණු එක එකක් පාසා ගෙන බලතහොත් ඉන්ද්‍රිය සංවරවීම හා නොවීම කෙරෙහි ඒ එකිනෙක කොතෙක් දුරට බලපාන්නේ දැයි නුවණින් සිතා බැලිය හැකි ය. ලෝකයා අතර (ප්‍රජාව හා පවුල) සන්සුන් බව පවත්වා ගත හැක්කේ සන්සුන් ඉඳුරන් සහිත[203] පුද්ගලයන් බිහි කිරීමෙනි.

පුද්ගලයා ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කළ යුතු බව '**කරණීය මෙත්ත**' සූත්‍රයේ එන 'නිපකො' ගුණයෙන් පැහැදිලි කරයි. විවිධ පුද්ගල ඇසුරට පත්වන පුද්ගලයා ඒ ඒ තන්හි දී ස්ථානෝචිත ප්‍රඥාව[204] නම් වූ ඒ ඒ තැනට සුදුසු පරිදි ක්‍රියා කළ හැකි ගුණයෙන් හා නුවණින් යුක්ත වීම සාමාජික ජීවිතයට ඉතා වැදගත් වේ. '**මිනිසා සමාජමය සත්ත්වයෙක් බව සමාජ විද්‍යාඥයන්ගේ පිළිගැනීම ය.**' එහෙයින් සමාජමය අනෙකුත් පුද්ගලයන් හා ජීවත් වීමට සුදුසු අවබෝධයක් තිබිය යුතු ය. සත්‍යය තේරුම් ගෙන, වහා සුදුසු තීරණ ලබා දීමේ හැකියාව තැනට සුදුසු නුවණ ය. නිරවුල් ව පවතින සිතකින්[205] වඩාත් සුදුසු තීරණ ඉක්මනින් ගත හැකි බව පෙනේ. ඒ 'නිපක' ගුණය

201 අ.නි. 2., පි.279 අ.2, පි.279.

202 ථෙර, පි.189-193; පාරාසරිය ස්ථවිර ගාථා.

203 ථෙර, පි.213; අංගුලිමාල ස්ථවිර ගාථා.

204 ථෙර, පි.85-95; ඉසිදාසි ථෙරී ගාථා. මා.ද., පි.371 සුභාෂලේඛා පරිවර්තන - ගාථා අංක 31. මා.ද., පි.369 සුභාෂලේඛ පරිවර්තන-ගාථා අංක 24.

205 දී.නි. 1, පි.297; කූටදත්ත සූත්‍රය; ආර්ය වූ ඉන්ද්‍රිය සංවරය බලන්න.

ය. ක්‍රියාවන් හා වචනයන්ගේ නොදැමුණු ස්වරූපය යටපත් කිරීමෙන් 'අප්පගබ්බ' ගුණය මතුකර ගත හැකි ය. හැඩි දැඩි ස්වරූපය දැමුණු සිතක නො වේ.[206] සියල්ලෝ ම ඔහුට හිතවත් ය. ඔහු සියල්ලන්ට හිතවත් ය. විවිධත්වය නම් වූ හැඟීම් බර පුද්ගලයෙකු නො වේ. 'සික්ඛා' නම් වූ ඒකත්වයට[207] පත් වූවකු වීමට මේ ගුණය උපකාරී වේ.

කුලයන්හි ඇලීමෙන් විවිධත්වය හා එක් වීමට පවතින ඉඩකඩ හා අවස්ථාව වැඩි වේ. මෙහි දී කුලයන් යයි අදහස් කරන ලද්දේ විවිධ පුද්ගල සමාජයන් ය. ඒ පවුල් හෝ කුඩා සමාජ සංස්ථා වුව ද, නිතර ඇසුරට යාමෙන් අනවශ්‍ය පීඩාවන්ට පුද්ගලයා[208] ගොදුරු වේ. සිත යම් කිසිවක ඇලෙන ප්‍රමාණය අනුව බැඳීම ද පවතී. කුලයන්හි ඇලීම නිසා ද ඒ පුද්ගලයා ඒ ඒ කුලයන්ට බැඳේ. බැඳීම් නිසා ගැටීම්, වාද විවාද, කල කෝලාහල හා ජීවිත විනාශවලට ලක් වේ.[209] භාණ්ඩයකට පවතින ඇලීම අනුව ඒ තබන තැන, සලසන ආරක්ෂාව, පිරිසිදුව තබා ගැනීම, අන්‍යයන්ගේ පරිහරණයෙන් වළක්වා ගැනීම ආදිය අපේක්ෂිත ය. දූ - දරු භාර්යාවන් කෙරෙහි පවතින සුළු ඉරියව් පවා පාලනය කිරීමට සිදුවෙන්නේ ඒ කෙරෙහි පවතින ඇලීම්, බැඳීම් හේතුවෙනි. වගකීම වැඩි හෙයිනි.[210] අන් අයෙකු සතු වස්තුවක් කෙරෙහි පවතින ඇලීම නිසා එය අයත් කර ගැනීමට උත්සාහ දරයි. එය අපහසු විටෙක, ඒවා ආරක්ෂා කළ යුතු බවට උපදෙස් ද දෙනු ලබයි. කරුණා, මෛත්‍රී සහගත ඇලීම්, බැඳීම්වලින් යුක්තව දෙනු ලබන උපදෙස් මින් අදහස් නොවේ. තමන්ට අයත් කර ගැනීමේ චේතනාවෙන් තොර ව බාහිර වස්තු පරිහරණය කිරීමේ දී 'ගේධය' නම් වූ කුලයන්හි ඇලීම සිදු නොවේ. අත්‍ථ කුසල

206 ථෙර, පි.135; සුන්දර සමුද්ද ස්ථවිර ගාථා. ථෙර, පි.135. ථෙර, පි.121.

207 අ.නි. 3, පි.233; සමන්ත පාසාදික පුද්ගල ලක්ෂණ බලන්න, අ.නි. 3, පි.309.

208 අ.නි. 3, පි.263-267; සොතාර සූත්‍රය.

209 ම.නි. 2, පි.569; කණ්ණකත්‍ථල සූත්‍රය.

210 ම.නි. 2, පි.215; අ.නි. 1, පි.233, 415, පූ.ප., පි.319-321. ශිලා ලේඛ-1, අශෝක ලිපි, පි.1.

සිතක බාහිර ලෝකය පිළිබඳ ව පවතින්නේ 'අනනුගිද්ධො' නම් වූ ලක්ෂණය යි. මිනිසා ඇලිය යුත්තේ ප්‍රඥාවෙහි ය.[211]

ප්‍රඥාව ශීලයෙන් පිරිසිදු වෙයි. ශීලය ප්‍රඥාවෙන් පිරිසිදු වේ. යම් තැනෙක ශීලය වේ නම් එහි ප්‍රඥාව වේ. යම් තැනක ප්‍රඥාව වේ නම් එහි ශීලය වේ. සිල්වත් හට නුවණ වේ. නුවණැත්තාට සිල් ඇති වේ. ශීල, ප්‍රඥා දෙක වූ කලී ලොව අග්‍ර යයි කියති.[212]

සත්පුරුෂ සංසේවනය, සද්ධර්ම ශ්‍රවණය, යොනිසො මනසිකාරය හා ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යන සතර ධර්ම පදය වැඩීමෙන් හා නැවත නැවතත් පිරීමෙන් ප්‍රඥා ප්‍රතිලාභය, ප්‍රඥා වෘද්ධිය හා නිවේධික ප්‍රඥාව ලැබිය හැකි ය.[213]

යොනිසො මනසිකාරය උපදවා ගත් නාගසමාල හා භගු ස්ථවිරයන් වහන්සේලා දෙනම නිබ්බිදාඤාණය ලැබූ ආකාරය ථේර ගාථාවන්හි එයි.

අබරණින් සැදුණු, මනා වස්ත්‍ර හැඳි, මල්දම් පැළඳි, සඳුන් ආලේපයෙන් සැරසී, පාර මැද තූර්ය වාදනයට අනුව නැටූ නළඟනක්; පිඬු පිණිස හැසිරුණ නාගසමාල ස්ථවිරයන් දුටුවේ, මාරපාශයක් ලෙසිනි.

උන්වහන්සේට එහි දී යොනිසො මනසිකාරය උපන, ආදීනව පහළ විය. නිබ්බිදාඤාණය එළඹ සිටියේ ය. සිත කෙලෙසුන්ගෙන් මිදී, ත්‍රිවිද්‍යා ලැබූ උන්වහන්සේ 'ධර්මයාගේ සුධර්මත්වය බලව'යි[214] පවසති.

මෙතෙක් අප විසින් සාකච්ඡා කළ කරුණු තුළින් ප්‍රකට කෙරෙනුයේ ඓහලෞකික යුතුකම් හා අයිතිවාසිකම් හා සබැඳි බෞද්ධ ආචාර විද්‍යාත්මක පදනම නිර්වාණගාමී ප්‍රතිපදාව නියෝජනය කෙරෙන පාරලෞකික තත්ත්වයන් ද ස්පර්ශ කෙරෙන බවයි.

211 ම.නි. 2, පි.531-539 පිය ජාතික සූත්‍රය. ස.1, පි.69.

212 P.I.P. pp.161-162. ස.නි. 1, පි.69 වත්‍ථු සූත්‍රය.

213 ම.නි. පි.247 සු.නි., පි.245. P.I.P. p.163'

214 දී.නි. 1, පි.242; සොණදණ්ඩ සූත්‍රය.

දෙවන පරිච්ඡේදය

# පෞද්ගලිකත්වය හා ස්වච්ඡන්දතාව පිළිබඳ ථෙරවාද න්‍යායාත්මක භාවිතය

ක්‍රියාමාර්ග දෙකක් අතුරින් තමන් කැමති ක්‍රියා මාර්ගය තෝරා ගැනීමට නිදහස (ස්වච්ඡන්දතාව) ඇති, සදාචාරමය වශයෙන් ස්වාධීන වූ පුද්ගලයා මිනිසාය. කැමැත්තෙහි නම් කිරීමත්, අකමැත්තෙහි නම් නොකිරීමත් යන ක්‍රියා මාර්ග දෙක ඔහුට විවෘත ව පවතී.[1] සිය සිත තුළින් කෙරෙන බලපෑම් නිසාවෙන් වැදගත්කම්, නො වැදගත්කම් ආදී ලක්ෂණ කල්පනා කර බලා තීරණ ගැනීමේ හැකියාව පුද්ගලයා වෙත පවතී. මෙහෙයවීමකින් තොරව ස්වාධ්‍යාසයෙන් ක්ෂණිකව ගනු ලබන තීරණ අසංඛාරික නම් වේ. තමාගේ ම හෝ බාහිර බලපෑමකින් හෝ ගනු ලබන තීරණ සසංකාරික නම් වේ. අසංඛාරික හෝ වේවා, සසංඛාරික හෝ වේවා පුද්ගලයා විසින් ගනු ලබන තීරණය[2] පිළිබඳ වගකීම පුද්ගලයා වෙත පැවරේ. සදාචාරමය වශයෙන් වගකීමක් ඉසිලිය හැකි ස්වභාවය, ස්වච්ඡන්දතාව[3] ලෙස හැඳින්වෙයි. එහි ලා දක්වෙන වචනය (Free will) වශයෙන් බොහෝ බටහිර පඬිවරුන් විසින් සම්භාවිතය. අධිෂ්ඨානය සඳහා ඔවුන් විසින් යොදනු ලබනුයේ (will) යන්න බව ඔවුන්ගේ කෘතිවල එන යෙදුම්වලින්

---

1 පටි.ම, පි.155-181; ප්‍රඥා කථා.

2 එම, පි 182

3 ම.නි. 2, පි.119; අපණ්ණක සූත්‍රය, සු.නි., පි.225 - 241. බ.ද.පි. 656 බ.ද., පි.656 - 659.

පෙනේ. ථෙර ගාථාවල එන මුදිත ස්ථවිර ගාථා ආදී ප්‍රකාශවලින් බුදුදහම, තෘෂ්ණා හුල උදුරා දැමීම පිණිස කෙනෙකු තුළ වන සිතුවිල්ල හා වීර්යය, අධිෂ්ඨානය ලෙස සැලකී ය.[4]

"තමා විසින් ම, තමා කෙරෙන් ම, තමාගෙන් ම හටගත් පව, (**අත්තනාව කතං පාපං - අත්තජං අත්ත සම්භවං**) අඥානයා මඩී." යන්නෙන් පුද්ගල වගකීම තහවුරු වේ. එසේ ම ධම්මපදයේ ආත්ම වර්ගය[5] අත්තාහි (තෙමේ ම) අත්තනෝ (තමාහට) නාථො (පිහිටය) වැනි පාඨවලින් 'අත්තානං' යන පදයේ 'තමා ම' යන අදහස තහවුරු කරයි. තමාහට හිත පිණිස පිළිපන්, මෙරමාහට හිත පිණිස නොපිළිපන් (**අත්තහිතාය පටිපනෙනා නොපරහිතාය**) යනුවෙන් අත්තහිත සූත්‍රය[6] පුද්ගලයන් සතර දෙනෙකු තමා හා මෙරමා ගැන ක්‍රියා කරන ආකාරය දක්වයි.

"මම අද සිට බුදුන් හා මහා සංඝයා හැර වෙන ම පොහොය කරමි" යි සංඝ භේදය කිරීම පිළිබඳ අදහස දෙව්දත් හිමි පැවසූ බව තථාගතයන් වහන්සේට දැන් වූ කල, පුද්ගලයා හට හිතවත් ද, නිවැරදි දෑ දැකීම අපහසුය, යන ධර්ම නිර්දේශය තථාගතයන් වහන්සේ දක්වූහ. එම ගාථාවේ[7] එන 'පරම දුක්කරං' යන වචනය අර්ථ දැක්වීම සඳහා කිව යුත්තේ පුද්ගලයාට හිතකර වූත්, නිවැරදි වූත් දෑ කිරීම ඉතා අපහසුය, යන්න වුවත්, එහි එන පුළුල් අර්ථය වන්නේ, පුද්ගලයාට ඒ ඒ පුද්ගලයන්[8] තමන්ට ගැළපෙන පරිදි ස්වකීය හැසිරීම් රටාව සකසා ගත යුතු වන්නේ 'සැපත' සියල්ලන්ගේ ම අපේක්ෂාව හෙයිනි.

---

4 ම.නි. 2, පි.121 - 123; -එම- පි.683 - 693. ථෙර. පි.91; හාරිත ස්ථවිර ගාථා අංක 261. B.A.S., P.14.

5 බ.ද., පි.275. ම.2, පි.451. බ.ද., පි.104 බ.ද., පි.109 පි.101 - 110.

6 බ.ද., පි.275.

7 බ.ද. පි.200 ථෙර., පි.103 සු.නි., පි.98 සු.නි., පි.109 - 113; ම.නි. 2, පි.425 - 451. ජා.පො., පි.529 - 531 අප.පා., පි.99.

8 ධ.ප., 12 - 5;12 - 4 ගාථා.

බෝධිරාජ කුමාරයා ඉතා අලංකාර මාලිගාවක් කරවා ගෙවදින උත්සවයට තථාගතයන් වහන්සේට ආරාධනා කළේ ය. උත්සව දින එළිපත පියවිල්ලක් අතුරුවා තමන්ට දරුවන් නොවූ හෙයින් 'දරුවකු ලැබේ නම් බුදුහු පියවිලි මත වඩිනා සේක', යි සිතුවේ ය. තථාගතයන් වහන්සේ පියවිල්ල උඩින් නොවැඩියේ ය. ඒ කුමාරයා හට දරුවන් නොලැබීමේ අතීත කථාව දැක්වූ තථාගතයන් වහන්සේ 'මම' යයි සම්මත ආත්මය ප්‍රිය ද, මනාප ද, නුවණැත්තා විසින් තුන් වයසින් එක් වයසක දී හෝ එය රැකිය යුතු යි වදාළ හ.[9]

පළමුවෙන් තමා සුදුසු ගුණයෙහි පිහිටා අන්‍යයන්ට අවවාද කළ යුතු ය. (**අත්තාන මෙව පඨමං - පතිරූපෙ නිවෙසයෙ**) - නුවණැත්තා එයින් නොකෙළෙසෙයි. යන ධම්මපද උපදේශය උපනන්ද[10] හිමියෝ වෙනුවෙන් තථාගතයන් වහන්සේ දේශනා කරනු ලැබූවකි. උපනන්ද හිමියෝ ධර්ම දේශනා කිරීමෙහි දක්ෂ ය. එහෙත් ප්‍රතිපත්ති පිරීමෙහි දුර්වල විය.[11] තමන්ගේ අවාවදයෙහි තමන් ම නො පිහිටුවන බවට ඔහු විරුද්ධව ඉදිරිපත් කෙරුණ චෝදනාව විය. කළ යුතු දෑ, නොකළ යුතු දෑ, මේ මේ යයි අනුන්ට දැක්වීම පහසු වුවත්, ඒ අවවාදයන්හි පිහිටා තමන් දමනය කර ගැනීම පහසු නො වේ. 'නොදැමුණු ආත්මය දුක පිණිසත්, දැමුණු ආත්මය සැප පිණිසත්' හේතුවේ යයි පධානික තිස්ස තෙරුන්[12] අරහයා තථාගතයන් වහන්සේ වදාළ හ. කමටහන් ගෙන ආරණ්‍යයකට පැමිණි පධානික තිස්ස භික්ෂුව, අන්‍ය භික්ෂූන්ට, **"නොපමාව මහණ දම් කර වූ. ආරණ්‍යයට පැමිණියේ නිදන්නට**

9 අ.නි. 2, පි.189 අත්තහිත සූත්‍රය හා සික්ඛාපද සූත්‍රය. අ.නි. 3, පි.21 - 25. බ.දැ., පි.196 - 205 බ.දැ., පි.847 ම.නි. 2, පි.707 - 711. P.I.P., P.255. P.I.P., p.228.

10 ධ.ප., 12 - 7 (ආත්ම වර්ගය). ස.4, පි.487.

11 ම.නි. 3, පි.69 - 793; සුනඛත්ත සූත්‍රය. ශ්‍රී.දැ; පි.206 - 211. ධ.ප., 12 - 1 (ආත්ම වර්ගය).

12 ධ.ප., 12 - 2 (ආත්ම වර්ගය) අ.නි. 3, පි.317. අ.නි. 3, පි.319. ස.නි. 2, පි.317.

ද? **මහණකම සෙල්ලමක් කොට සිතවු ද?"** යනාදී වශයෙන් අණකොට තමන් හොඳ හැටි නිදන සේක. මේ තෙරුන් "තමා පළමු හික්මී, අන්‍යයන් හික්මවීම සුදුසුය" යි තථාගතයන් වහන්සේ අකාලරාවි කුක්කුට ජාතකය ද උපමා කොට වදාළ හ.

කුමාර කාශ්‍යප මාතාව දෙව්දත් හිමි ගත් තීරණයන් නිසා අනාථ ව සිවුරු හළ යුතු විය. එහෙත් විශාඛා, කොසොල් රජ ආදී පිරිසක් විසින් කරුණු විමසා, ගිහි වූ කල ඇගේ දරු ගැබ, සිය සැමියා නිසා වූවක් බවට දෙනු ලැබූ තීරණය අනුව පැවිදිව සිටිය දී ම පුත් රුවනක් වැදූවා ය.[13] **මේ පුත්‍රයා ටික කලකින්, කුමාර කාශ්‍යප නමින් පැවිදි ව රහත් වූහ'**[14] දොළොස් වසරකට පසු වීදියේ දී පුතා දුටු කුමාර කාශ්‍යප මාතාව, කුමාර කාශ්‍යප රහතන් වහන්සේ පසුපස, 'පුතා' යයි අමතමින් දිව්වා ය. සිවුර පැටලී වැටුණා ය. පසු ව තෙරුන් වහන්සේ අල්ලා ගත් ඇයට තෙරුන් වහන්සේ, **ස්නේහයවත් නැති කර ගත නොහැකි ව කුමක් කරන්නී ද"** යි තදින් කථා කළ හ.

කුමාර කාශ්‍යප මාතාව, "මොහුගේ ළය ඉතා තද ය. මොහුගෙ න් මට ඇති ප්‍රයෝජනය කිම් ද" යි පුත්‍ර ස්නේහය නැති කොට, එදින ම සියලු කෙලෙසුන් නසා රහත් වූවා ය. එහි දී, "තමාහට පිහිට තමා ම ය. අන් කවරෙක් තමාහට පිහිට වේ ද? චක්ෂුරාදී ඉඳුරන් දමනය කිරීම් වශයෙන් මනා සේ තමා (ආත්මය) දමනය කළ පුද්ගලයා දුක සේ ලැබිය යුතු අර්හත් ඵලය ලබයි," යනුවෙන් තථාගතයන් වහන්සේ භික්ෂූන් මහණ දම් පිරීමෙහි දිරි ගැන්වූ හ.[15]

මහාකාල සෝවාන් වූ උපාසකයෙකි. පෙහෙවස් සමාදන් ව විහාරයේ නැවතී, මුළු රැය ම ධර්ම ශ්‍රවණය කළේ, පහන් වන අවස්ථාවේ මුහුණ කට සෝදා ගැනීම සඳහා වෙහෙර අසල

13 ම.ව.2, පි.733; චීවරක්ඛන්ධකය, ජා.පො., පි.214 - 317.

14 ධ.පි., 12 - 3 (ආත්ම වර්ගය). ජා.පො., පි.220.

15 ධ.ප., 12 -4 (ආත්ම වර්ගය) බ.ද., පි.105. වු.ව.2, පී.533 පු.පූ.සං, පි.433 - 435, 438 - 439, 576. ථෙර.,, පි.77.

පොකුණට ගියේ ය. ගෙ හිමියාගෙන් බේරීම සඳහා අත තිබූ බඩු පොකුණ අසලට දමූ සොරු අල්ලා ගත් ගෙහිමියෝ මහාකාල උපාසක තැනට ගුටිබැට දී මරා දැමූහ.[16] කිසිවෙකුටත් හිංසාවක් නැති මහාකාල උපාසකගේ මරණය සිදු වූ අයුරු නපුරු යැයි කථා කළ පිරිසට මහාකාල උපාසකගේ පෙර කර්මය තථාගතයන් වහන්සේ වදාළ හ. අනුන්ගේ රූපත් ස්ත්‍රියක් කෙරෙහි ලෝභයෙන් ස්වාමියා මැර වූ පාප කර්මය හේතුවෙන් ඔහු බොහෝ කාලයක් අවීචියේ පැසී මේ ආත්මයේ දීත් ඒ කර්මය ම විපාක දුන් අයුරු පැහැදිලි කොට "තමාගේ පව්කම් තමා ලුහුබඳින්නේ ය" යි දක් වූහ.

යමෙකුගේ දුශ්ශීල බව ඔහුගේ අනර්ථයට හේතු වෙයි. ඒ දුශ්ශීල බව සල් ගස වටා සිටින මාළුවා වැලක් මෙනි.[17] ඒ දුශ්ශීල බව තමාගේ සතුරෙකු විසින් කරනු ලබන සතුරුකමකට වඩා බලවත් ය.

අජාසත් කුමාරයන් ලවා ඔහුගේ පිය රජු මැර වූ දෙව්දත් හිමි[235] බොහෝ ලාභ සත්කාර ලැබූ හ. බුද්ධත්වය අපේක්ෂා කරමින් තථාගතයන් වහන්සේ නැසීමට ද උපක්‍රම යෙදූ හ. දෙව්දත්ගේ පෙර කථාව **කුරුඬගමිග ජාතකයෙන්**[18] දක් වූ තථාගතයන් වහන්සේ, **තෘෂ්ණාව (විෂම ලෝභය) පුද්ගලයා නසන මාළුවා වැල බව වදාළ හ.**

තමන්ට ලැබෙන ලාභ සත්කාර නැතිවේ දෝ යන භයින්, ළාමක අදහස් ඇති පුද්ගලයෝ තථාගතයන් වහන්සේගේ දේශනාව පවා වළකන්නට උත්සාහ කරති. ඒ දෘෂ්ටිය ඔහුගේ විනාශය කැඳවයි. උණ ගසේ විනාශයට ඵල හටගන්නාක් මෙනි.[19]

---

16 ජ.පො., පි.25 - 27. අ.ලි., පි.20, ස්තම්භ ලිපි 1 සහ 2. මා.2., පි.425 - 409.

17 ධ.ප., 12 - 5; ආත්ම වර්ගය. අ.2, පි.135.

18 අ.නි. 1, පි.359 - 365. අ.නි. 1, පි.249 - 251, අ.නි. 3, පි.407 - 408.

19 ධ.ඵ., 12 - 6; ආත්ම වර්ගය. වු.ව., 259 - 317. ස.නි. 2, පි.369 - 370 අ.නි. 2, පි.137 - 139.

චූලකාල උපාසක සොරෙකැයි සිතා මරා දැමීමට උත්සාහ කරද්දී, දිය ගෙන යාමට ආ දාසියක් විසින් කරුණු තේරුම් කර දී මරණයෙන් මුදා ගන්නා ලදි. ඒ බව තථාගතයන් වහන්සේට දැන් වූ පසු උන්වහන්සේ මේ ධර්ම උපදේශය වදාළ හ.

තමා පව් කළහොත්, තෙමේ කෙලෙසෙන්නේ ය. තමා පව් නොකළහොත් තෙමේ ම පිරිසිදු වන්නේ ය. පිරිසිදු බව තම තමා පිළිබඳ ව ය. අනෙකෙක් අනෙකකු පිරිසිදු නොකෙරෙයි.[20]

මෙම කොටසින් මෙතෙක් අවධාරණය කළ නිදහස හා වගකීම පැහැදිලි කිරීමට අත්තදත්ථ තෙරුන් පිළිබඳ කථාව ඉතා සුදුසු ය. "මහණෙනි, මම තව සාර මසකින් පිරිනිවන් පාන්නෙමි"යි තථාගතයන් වහන්සේ වදාළ හෙයින් අත්තදත්ථ හිමි ඊට පෙර රහත් වීමට උත්සාහ කළේ ය. අන් අය පරිනිර්වාණය පිළිබඳ කථාවෙන් පසු වෙද්දී, අත්තදත්ථ හිමි තනි ව ම විසීම පිළිබඳ ව තථාගතයන් වහන්සේට දැන් වූ අන්‍යයන්ගේ චෝදනාව විමසා බැලූ තථාගතයන් වහන්සේ "බොහෝ වූ පරාර්ථයන් නිසා ආත්මාර්ථය නොපිරිහෙලන්නේ ය. ආත්මාර්ථය මේ යයි දැන ස්වාර්ථයෙහි යුක්ත වන්නේ ය.,[21] යන්න වදාළ හ.

ඉහත කී ගාථාවේ දැක් වූ පරාර්ථය[22] අන්‍යයන් සඳහා කළ යුතු වූ යුතුකම් ය. ආත්මාර්ථය[23] යනුවෙන් දක්වන ලද්දේ ආචාර්ය උපාධ්‍යායවත් නම් වූ යහපත් හැසිරීම සඳහා පනවන ලද ශික්ෂා පදය ස්වාර්ථය[24] යනුවෙන් දක්වන ලද්දේ අර්හත් ඵලය ය. ස්වාර්ථය නම් වූ නාමරූප ධර්මයන් අනිත්‍ය දුක්ඛ, අනාත්ම වශයෙන් බැලීමේ හේතුවෙන් ආත්මාර්ථය නම් වූ තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් (පෞද්ගලික වගකීම්) අතපසු

---

20 ජා.පො., පි.42.

21 ධ.ප., 12 - 8; ආත්ම වර්ගය, ස.නි. 2, පි.369. ස.නි. 2, පි.345 - 573. ස.නි. 2, පි.345.

22 ධ.ප., 12 - 9; ආත්ම වර්ගය.

23 ධ.ප., 12 - 9; ආත්ම වර්ගය. ජා.පො. පි.156 - 158.

24 බ.ද., පි.294 - 295 අ.නි. 3, පි.429.

කිරීම සුදුසු නොවේ. පරාර්ථය ස්වාර්ථය නිසාවත්, ආත්මාර්ථය නොපිරිහෙලන්නේ නම් පරාර්ථය නිසා ස්වාර්ථය අත්හළ යුතු නොවේ. ආත්මාර්ථය ස්වකීය වගකීම් හා බැඳීම් නිසා ඒවා ඉටු කිරීම සඳහා පුද්ගලයා බැඳී සිටියි. අන්‍යයන් පිළිබඳව වූ වගකීම් (සමාජ සේවය) නිසාවෙන් තමන්ගෙන් ඉටුවිය යුතු පෞද්ගලික වගකීම් පැහැර හැරිය නොහැකි ය.

වගකීම් තහවුරු වන්නේ කිරීමේ හා නොකිරීමේ නිදහස පවත්නා හේතුවෙනි. කිරීම හා නොකිරීම, ක්‍රියා විෂයයෙහි ලා පවත්නා ධර්මතාවකි.[25] මානසික ගුණයකි. සිතක් උපදින විට එක්වන නාම ධර්මයන් අතරට වීර්යය ද, චේතනාව ද, පුරුෂකාරය ද ඇතුළත් වන බැවින් සිතට එම ක්‍රියා ශක්තිය ලැබේ.[26]

අත්තකාර, පුරිසකාර, ආරම්භක ධාතු, පරක්කම ධාතු ආදී වාග් ප්‍රයෝගවලින් ඒ ක්‍රියා ශක්තිය[27] හඳුන්වා තිබේ. කිරීම හා නොකිරීම ක්‍රියා විෂයයෙහි පවතින ධර්මතා නිත්‍ය වූවක් නොවේ. එහෙයින් **වගකීම ක්‍රියාත්මක වන්නේ මේ නිත්‍ය නොවන** ස්වභාවය[28] තුළ ය. **නිත්‍ය ධර්මතාවක් වන්නේ නම් වගකීමකින් යුතු ව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව නො නගී.** අනිත්‍ය නම් වූ වෙනස් වන ක්‍රියා සන්නතිය තුළ සචේතනික ශක්තියක් වශයෙන් 'ආරභථ', 'නික්ඛමථ' පවතින නිසා සදාචාරය පිළිබඳ ව පුද්ගලයා වගකිව යුතු වේ.[29]

"මහණෙනි, යමෙක් මාගේ අවවාදය කරන්නේ නම් හෙතෙම ගිලනුන්හට උපස්ථාන කරන්නේය,"[30] යි තථාගතයන් වහන්සේගේ පැනවීමක් ඇත. මේ පැනවීම ක්‍රියාත්මක වීම සඳහා පුද්ගලයන් දෙදෙනෙකු ස්වකීය සදාචාරාත්මක වගකීම තහවුරු වන සේ

---

25 චූ.ව., පි.395 - 411.

26 අ.නි. 3, පි.101 - 103. අ.නි. 3, පි.102.

27 අ.නි. 1, පි.123.

28 ථෙර., පි.103.

29 මා.ද., පි.223 - 224. ථෙර., පි.101.

30 ඉ.ද.1, පි.311 - 317.

ක්‍රියා කළ යුත්තා හ.[31] පළමු වැන්නා ගිලනා නම් වූ රෝගියා ය.[32] දෙවැන්නා ගිලන් උපස්ථායක නම් වූ (ගිලානුපට්ඨාන) රෝගියා බලා ගන්නා ය. දෙදෙනාගෙන් ම ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් පවතී. මහාවග්ගපාලි චිවරක්ඛන්ධකය දක්වන ආකාරයට කරුණු පහකින් ගිලනාට උවටැන් කළ හැකි, නොහැකි බව වේ. එසේ ම ගිලනුහට උපස්ථාන කරන්නා කරුණු පහකින් සුදුස්සකු හෝ නුසුදුස්සකු හෝ වන බව දක්වේ.

උවටැන් නොකළ හැකි වන්නේ ගිලනා විසින්[33] ස්වකීය යුතුකම් හා වගකීම් පැහැර හරින හේතුවෙනි.

1. අහිත දෙය කරයි.
2. හිත දෙයෙහි පමණ නොදකියි.
3. බෙහෙත් නැවත නැවතත් පාවිච්චි නොකරයි.
4. වැඩෙන්නා වූ රෝගය වැඩෙන්නාහ යි ද,

   දුරුවෙන්නා වූ රෝගය දුරුවන්නේ යයි ද,

   පවත්නා වූ රෝගය පවතින්නේ යයි ද,
5. උපන්නා වූ සිරුරෙහි වූ, දුක් වූ තියුණු වූ, රළු වූ, කටුක වූ, අමිහිරි වූ, මන නොවඩන්නා වූ, දිවි හැර ගන්නා වූ වේදනාවන් ඉවසා දරා සිටීමට නොහැකි ස්වභාවයක් දරයි.

ස්වකීය වගකීම් පැහැර නොහරින ගිලනාට උපස්ථාන කිරීම පහසු ය. ගිලනාහට උපස්ථානයට එළඹෙන්නට සුදුසු උපස්ථායකුගේ යුතුකම් පහ[34] මොනවා දැයි සොයමු.

1. බෙහෙත් යොදන්නට සමර්ථ වෙයි.
2. හිත අහිත දේ දනියි.
3. හිත දෙය ළං කරයි. අහිත දෙය බැහැර කරයි.

---

31 පී.518, ථෙර., 91 - අභිභූත ස්ථවිර ගාථා.

32 ම.ව.2, පි.735 චීවරක්ඛන්ධකය.

33 ම.ව., 2, පි.735.

34 පු.ප., පි.301 අ.නි. 1, පි.227. සු.නි., පි.30 -31 අ.නි. 3, පි.399.

4. 'ආමිෂයක්' නම් වූ ලාභ නොකැමැති ව උවටැන් කරයි. මෙත් සිතින් උවටැන් කරයි.මල මූ, කෙළ, වමනය හෝ බැහැර කරන්නේ පිළිකුල් නොකරයි.
5. කලින් කල දැහැමි කතාවෙන් ගිලනුහට කරුණු දක්වන්නට, සමාදන් කරවන්නට,තියුණු කරවන්නට සමර්ථ වෙයි.

ඉහත දෙදෙනාගේ ම බැඳීමක් පවතින විට වගකීමක්, යුතුකමක් ඉටු වේ. මෙහි දී යුතුකම හා වගකීම යන වචන දෙක විශේෂයක් නොකොට යෙදිණ. එහෙත් ඒ වචන දෙක විශේෂ තේරුම් ඇති ව යෙදිය යුතු ය. ගිලනාගේ යුතුකම උපස්ථායකයාගේ අයිතිවාසිකම ය. නැතහොත් ගිලනාගේ අයිතිවාසිකම උපස්ථායකයාගේ යුතුකම ය. **යුතුකම් ඉටුකිරීමෙන් අයිතිවාසිකම් ලබා ගත හැකි ය. යුතුකම් නොමැති තැන අයිතිවාසිකම් බලාපොරොත්තු විය යුතු නොවේ.**

යුතුකම් හා අයිතිවාසිකම් 'කළ යුතු', 'නොකළ යුතු' දෑ වශයෙන් දැන්වීමේ දී අනවශ්‍ය බලකිරීම් ස්වභාවයක් පහළ කරයි. නීතිමය වශයෙන් ඒ දැක්වීමේ දී එහි ස්වඡන්දතාවට ඉඩක් ඇත්තේ ම නැති ස්වභාවයක් පහළ කරයි. කලින් සඳහන් කළ පරිදි දෙමව්පියන් විසින් දරුවන් නඩත්තු කිරීම හා දරුවන් විසින් දෙමව්පියන් නඩත්තු කිරීමට මව්පිය බලයට අඩංගු වන අන්‍යෝන්‍ය පරිපෝෂණය ලෙස පුද්ගල නීතිය[35] විසින් පිළිගෙන ඇති බැවින් එහි බලකිරීම් ස්වභාවය පවතී. එහෙත් එකී නීතිය බලකිරීම් ස්වභාවයකට පත්වන්නේ, ස්වඡන්දතාව පසුබසින අවස්ථාවන්හි දී බව සාමාන්‍ය දෛනික සිදුවීම්වලින් පැහැදිලි ය.

**"බ්‍රහ්මාති මාතා පිතරො - පුබ්බාචරියාති වුච්චරෙ"** යන තන්හි මව්පිය දෙදෙනා බ්‍රහ්මයා හා සමාන වන්නේ ස්වභාවික වශයෙන් ම ඔවුන් තුළ ඇතිවන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන උත්තරීතර ගුණ සමුදාය හේතුවෙනි. දරුවන්ට මග නොමග පෙන්වා, රැකවරණය සලසන හෙයින් මව්පිය

35 අ.නි. 3, පි.235; ගිලානුපට්ඨාන සූත්‍රය. ම.ව., 2, පි.737.

දෙදෙනා පූර්වාචාර්ය වේ.[36] එහෙයින් පුද්ගලයන් විසින් වරදවා නොපිළිපැදිය යුතු තැන් සතරෙන් දෙකක්[37] දෙමාපියන් ලෙස දක්වා තිබේ. වරදවා නොපිළිපැදිය යුතු තුන්වන තැන තථාගතයන් වහන්සේ ලෙස දක්වන ලද හේතුවෙන් ම දෙමාපියන් කොතරම් උසස් කොට තථාගතයන් වහන්සේ සැලකුවේ දැයි වටහා ගත හැකි ය. ඉහතින් සඳහන් කළ දෙතැන මනාව පිහිටි පණ්ඩිතයා, නුවණැත්තන්ගෙන් උපවාද නොලබයි. කුසල් රැස් කරයි. මනාව පිහිටීම ලෙස තථාගතයන් වහන්සේ අදහස් කරන ලද්දේ, මව්පියන්ට අධික ලෙස උපකාර කිරීම ය. අංගුත්තර නිකායේ එන පාඨවලින්, දරුවන් රැක බලා ගත් දෙමාපියන් මහලු වී, දිරා ගිය අවස්ථාවේ දී උපකාර කළ යුතු ආකාරය වටහා ගත හැකි ය.[38] සුත්ත නිපාතයේ එන වසල සූත්‍රය හා පරාභව සූත්‍රය මාපියන් නොසැලකීම වසල ගතියකැයි ද, පිරිහීමේ ලකුණ කැයි ද විස්තර කරයි.[39] මව්පියන් රැක බලා ගැනීම හා වැදගත් තවත් වගකීමක් ද වේ. භාර්යාවන් හා දරුවන්, (සැමියා හා පියා විසින්) නඩත්තු කිරීමේ අවශ්‍යතාව සමාජය විසින් පිළිගනු ලැබූ සම්මුතියක් හෙයින් පුද්ගලයා එකී වගකීමෙන් බැඳෙයි.[40] එය ස්වච්ඡන්දයෙන් ඉටුවන තාක් මංගල[41] කරුණක් ලෙස පිළිග ැනේ.

ස්වකීය භාර්යාවගෙන් සතුටු නො වී වෙනත් ස්ත්‍රියක් කරා යාම[42] පිරිහීමට හේතුවන කරුණක් ලෙස දක්වන ලද අතර, එසේ කිරීම වසල ගතියක් බව ද දක්වා තිබේ. ස්වඡන්දතා ගුණය මතු කරගත හැක්කේ එය වගකීමකින් යුක්ත ව නිදහසේ ඉටු කිරීම

36 අ.නි. 3, පි. 235 - 237; ගිලානුපට්ඨාන සූත්‍රය. ම.ව., 2, පි.737.

37 පු.නි., පි.181 - 185. සු.නි., පි.185.

38 අ.නි. 1, පි.244, ගාථා අංකය 16, 17, 18.

39 අ.නි. 2, පි.9 - 11 දුතිය බත සූත්‍රය. අ.නි. 1, පි.174 බ්‍රහ්මගිරි ශිලා ලේඛ- 2, අශෝක ලිපි, පි.16.

40 අ.නි. 1, පි.123.

41 සු.නි., පි.38, ගාථා අංක 124 හා -එම- පි.32, ගාථා අංක 98.

42 පු.නි., පි.63 - 64. -එම- පි.64 - 73. -එම- පි.181. -එම- පි.181.

හේතුවෙනි. එයින් පුද්ගලයා ලබනුයේ අපමණ සතුටකි. සුත්ත නිපාතයේ එන ධනිය ගෝපාල සිය භාර්යාව හා දරුවන් සඳහා යුතුකම් ඉටු කළේ මැයි සතුටු වෙයි.[43] ඔහුගේ සතුට පිළිබඳ ව තථාගතයන් වහන්සේගේ උපදේශය වූයේ, පුතුන් ඇතියේ පුතුන් හේතු කොට ගෙන සතුටු වෙයි.... මිනිසාට උපධීහු ම නන්දන වෙති, යනුවෙනි. මෙහි තථාගතයන් වහන්සේ දක්වූ නන්දනය විටෙක සොවන නම් වූ ශෝකයටත් හේතුවන හෙයින් ඒ උපධි ලෙස දක්වන ලදි. උපධි රහිතවීමෙන් නන්දනය හා හෝ නම් වූ දෙක ම නොවන්නේ යයි උන්වහන්සේ දක් වූ මග ඔස්සේ ස්වඡන්දතා ගුණය මෙහෙය වූ බොහෝ දෙනා පුත්‍රයින්ගෙන්, නෑයින්ගෙන් හා ධනයෙන් ඈත් වී ගිහි බැඳුම් සිඳ පැවිදි වූහ.[44] නුවණැති පුද්ගලයා තමන් නිසාවත්, අනුන් නිසාවත් පව්කම් නොකරයි. පුත්‍රයෙක් හෝ ධනයක් හෝ රටක් නිසාවත් පව්කම් නොකරයි. අධර්මයෙන් ලද සමෘද්ධියට ද නො කැමැති වන්නේ ය. එබඳු තැනැත්තේ සිල්වතෙකි, නැණවතෙකි, දැහැමියෙකි,[45] යනුවෙන් ස්වඡන්දතා ගුණය ධම්ම පද පණ්ඩිත වර්ගයේ දී තථාගතයන් වහන්සේ මතු කරන ලද හ.

එක්තරා උපාසකයෙකු ගිහි ගේ හැර පියා පැවිදි වන බව සිය බිරියට දැන්වී ය. ඕ කුස ඔත් දරුවා දැක යන සේ ඇවිටිලි කළෙන් ඉවසුවේ ය. පසු කලෙකත් සිය අදහස් දැක් වූයෙන් බිරිඳගේ කැමැත්ත නො ලැබිණි. මෙසේ කල් ගතවීම් හේතුවෙන් කලකිරීමට පත් ඔහු "මගේ දුක් නැති කර ගැනීම මා විසින් කළ යුතු ය." යි සිතා ගොස් පැවිදි විය.

රහත් වූ මේ පැවිද්දා (උපාසක) ධම්මික නමින් ප්‍රකට විය. පසු ව දිනෙක ගිහි කල තම පුතු බලන්නට ගොස් ඔහුට ද බණ කියා පැවිදි කරවූහ. ටික කලකින් ඔහු ද රහත් විය. සිය සැමියා හා එක ම පුතු ගිය මග මම ද යම් යි සිතූ පුරාණ භාර්යාව

43 සු.නි., පී.88; ගාථා අංක 264.

44 සු.නි., පි.34, ගාථා අංක 1.

45 සු.නි., පි.9 - 11; ධනිය සූත්‍රය.

මෙහෙණි සසුනට ඇතුළත් ව රහත් වූවා ය. නුවණැත්තා ධර්මය පිහිට කොට ගත් අයුරු තථාගතයන් වහන්සේ භික්ෂූන්ට දැන්වූහ. දූරදර්ශීභාවය[46] එසේ ය.

සුත්ත නිපාතයේ ධම්මික සූත්‍රය[47] ගිහි වත දක් වූ තැන නිත්‍ය පඤ්ච ශීලය හා අෂ්ටාංගික උපෝසථ ශීලය අවධාරණය කළේ ගිහියා විසින් මහණ දම් පිරීම අපහසු බැවිනි. ධාර්මික ව උපයා ගනු ලබන වස්තුව දෙමාපියන්, අඹු දරුවන්, දැසිදස්, කම්කරු ආදීන් සැපවත් කිරීමටත්, දැහැමි වූ කර්මාන්තවල යෙදවීමටත් අප්‍රමාද වන ගිහියා, ස්වඡන්දතා ගුණය හේතුවෙන් පස්පව්වලින් වැළකී, සදෙව්ලොව නම් වූ දිව්‍ය ලෝකයන්හි උපත ලබයි.[48] කම්සැප විඳින අය, දැහැමින් හා නොදැහැමින් ද, සැහැසිකමින් හා නොසැහැසි කමින් ද, භෝග සොයන ආකාරයත්, එසේ සොයා ගත් භෝග තමා සැපවත් කිරීමට හෝ නොකිරීමටත්, පිනට දහමට යෙදවීමට හෝ නොයෙදීමටත් කටයුතු කරන ආකාරය රාසිය සූත්‍රය[49] දක්වයි. ඒ ඒ අවස්ථානුකූල ව, පුද්ගලයා ස්වකීය කැමැත්ත මත හැසිරෙන ආකාරය අනුව ගැරහුම් හෝ පැසසුම් ලබයි. දැහැමින් හා නොසැහැසි කමින් භෝග සෙවීම පැසසුමට ලක්වීම පළමුවන කරුණ ය. තමා සැපවත් කිරීම නිසා දෙවන වරට පැසසුමට ලක්වන ඉහත පුද්ගලයා, "බෙදයි, පින් කරයි", යන කරුණින් තෙවන වරට ද පැසසුම් ලබයි. උපයා ගත් භෝග නොඇලී, නොගැලී දොස් දක්නාසුලු ව, නුවණ ඇති ව වැළඳීම නිසා, සතරවන වරට ද ඔහු පැසසුමට ලක් වන්නේ ය.

නිත්‍ය පඤ්ච ශීලය හේතුවෙන් දිව්‍ය ලෝකවල උපත ලැබිය හැකි බව සිහි කරන ඔහු වඩාත් උසස්, සිල්ප ද කරා යොමු වෙයි.[50] පොහෝදා අටසිල් රැකීම හා වෙනත් අතිරේක අංග

46 ථෙරී., පි.69; ගාථා අංක 301.

47 ධ.ප., 6 - 9; පණ්ඩිත වර්ගය.

48 සොණ, ථෙරි ගාථා., සිත 31.

49 සු.නි., පි.119 ධම්මික සූත්‍රය.

50 අ.නි. 3, පි.347, ගිහි සූත්‍රය. සු.නි., පි.128, ගාථා අංක 496.

කෙරෙහි ස්වඡන්දතාවෙන් ම යොමුවන ඔහු එහි ලා අන්‍යයන් ද දිරි ගන්වයි.

අංගුත්තර නිකායේ එන ගවෙසි සූත්‍රය[51] දක්වන පරිදි, පන්සියයක් උපාසකයන් හා උසස් සිල් සඳහා යොමු වූ ගවෙසි උපාසක, එසේ උසස් සිල්පද රැකීමෙන් පසු කලෙක විමුක්ති සුවය ලැබූ හ. එහි දක් වූ කරුණු පහ එම සූත්‍රයෙහි දක්වා ඇත්තේ; '**පාණාතිපාතී හොති, අදින්නා දායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, සුරාමේරය මජ්ජපමාදට්ඨායී හොති**' යනුවෙනි.[52]

යම්කිසි පුද්ගලයෙකු විශාරද වන්නේත්, සුගතිගාමී වන්නේත්, භය හා වෛර රහිත වූ සිල්වත් පුද්ගලයෙකු වන්නේත් ඉහතින් දක් වූ පාණාතිපාතාදී කරුණුවලට විරුද්ධ වූ කරුණු පහක් නිසා ය. **පාණාතිපාතා පටිවිරතොහොති, අදින්නාදානා පටිවිරතොහොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතොහොති, මුසාවාදා පටිවිරතොහොති, සුරාමේරය මජ්ජපමාදට්ඨානා පටිවිරතොහොති,**[53] නම් වේ.

පරපණ නැසීම නොකරමි ආදී ලෙසින් පුද්ගලයා විසින් ගනු ලබන ප්‍රතිඥාව තමා රැකෙන, තමාට හිතවත් වූ ප්‍රතිපත්තියක පිහිටීමකි. ප්‍රතිඥාව ගනු ලැබුවේ, ස්වකීය වගකීම පිට, නිදහස් සිතුවිල්ලක ප්‍රතිඵලය ලෙසය. ප්‍රතිඥාව දෙන්නේ තමා හැර සෙසු සියලු ලෝකයා නම් වූ අන්‍යයන්ගේ ආරක්ෂාව වෙනුවෙනි. තමන් හා අනුන් නම් වූ දෙපසට ම හිරිහැරයක් නොවන ආකාරයේ ප්‍රතිපත්තියක පිහිටීම, නිවැරදි නිදහස් වගකීමක් දරා සිටීමක් ලෙස පැහැදිලි කළ යුතු ය.[54] ඒ වගකීම රැකෙන තාක් පුද්ගලයා උසස් ජීවිතයක් ගත කරන්නෙක් වී රහතන් වහන්සේලාගේ ජීවිතය අනුකරණය කරයි.[55]

---

51 මා.ද., පි.387.

52 ස.නි. 4, පි.595 - 605; රාසිය සූත්‍රය.

53 සු.නි., පි.120, ගාථා අංක 402 හා 403. ස.නි. 4, පි.465 අ.නි. 3, පි.331. ස.නි. 4, පි.457 හා - එම- පි.463. ඛ.ද., පි.906.

54 අ.නි. 3, පි.349 -355; ගවෙසි සූත්‍රය.

55 අ.නි. 3, පි.331; සාරජ්ජ සූත්‍රය.

පාණාතිපාතා සිල්පදය රැකීම නිසා ලබන සොම්නස, 'ඉධ නන්දති පෙච්ච නන්දති' යයි ධම්මපදයේ එන පරිදි මෙලොවත්, පරලොවත්, දෙලොවමත් සතුටු විය හැකි සොම්නසකි.[56]

පරලොව පිළිබඳ විශ්වාසයක් නැති වුවත් ඉන් අවැඩක් සිදුවිය නොහැකි ය. පරලොවක් නොමැති වුවහොත් පාඩු සිදුවන්නේ නොවේ. පරපණ නොනසන පුද්ගලයා මුළු ලෝකයට ම අභය දානය දෙන්නේ ය.

"ඔහු ජීවත් විය යුතු ය." ජීවත් කළ යුතු ය, යන ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාව පිළිගනියි. හිතූ පරිදි, කැමති කැමති ආකාරයෙන් ජීවිත වනසා දැමීමට එක් එක් පුද්ගලයා ක්‍රියා කරන්නේ නම්, "එතැන බලවතා විසින් දුබලයා පිටු දක්නා" (Survival of the Fittest) නම් වූ වනාන්තර නීතියට සමාජය යොමු කරවයි. එහි කිසිවකුගේ ජීවිතය පිළිබඳ ස්ථිරත්වය හෝ නිදහස පවත්වා ගැනීම ද ඉතා අපහසු වේ. එකෙක් අනිකා පිළිබඳ විශ්වාසයක් නොමැති සමාජයක සහනශීලී බව ද තුරන් වෙයි. සියලු ම සත්ත්වයෝ දඬුවමින් තැති ගනිති. සියලු දෙනා ම මරණයට බිය වෙති.[57] තමා උපමාවට ගෙන හිංසාව හෝ ඝාතනය හෝ නොකළ යුතු ය. සියල්ලන්ට ම ජීවිතය ප්‍රිය ය. එහෙයින් නොමැරිය යුතු ය. නොමැර විය යුතු ය.

බමුණන් විසින් පවත්වනු ලැබූ යාගවල දී, "මෙතෙක් තණ කපත්වා, මෙතෙක් සතුන් මරත්වා" යි මරණ නියෝග නිකුත් කෙරේ. එවැනි යාගයන්ට පැමිණෙන බමුණන් හැසිරවීමට ද, 'පෙළට සිටිනු', ආදී වශයෙන් දඬු ගත් පුරුෂයෝ විධාන කරති. 'බිලි' වශයෙන් මරණයට කැප වූ සත්ත්වයන්ගේ, (මරණ භයින්) කෑගසන හඬ හා හිස් සිඳිනු ලැබූ සත්ත්වයන්ගේ වේදනා හඬ හා දැගලීම් මැද, ඉතා තියුණු ආයුධ ගෙන, දුක්මුසු මුහුණුවලින් යුතු ව අන්‍යයන්ගේ නියෝග පිළිපදිමින් සත්ත්ව ඝාතනය කරන්නෝ ද වෙති.[58]

56 අ.නි. 3, පි.331 - 335; විසාරද සූත්‍රය, නිරය සූත්‍රය හා වෙර සූත්‍රය.

57 අ.නි. 3, පි.21 - 25; අත්තහිත සූත්‍රය.

58 අ.නි. 1, පි.377 - 379. අ.1, පි.379.

මේ තත්ත්වය වැළැක්වීම සඳහා සත්ත්ව හිංසාවෙන් තොර වූත්, අල්ප කටයුතු ඇත්තා වූත්, අල්ප වීර්යය යෙද විය යුතු වූත්, මහත් අනුසස් සහිත වූත්, 'දානය' නම් වූ යාගය තථාගතයන් වහන්සේ ඒ පිළිබඳ ව තමන්ගෙන් විමසූවන්ට පැහැදිලි කළ හ.[59]

දානයටත් වඩා පහසුවෙන් පින් රැස් කළ හැකි වූ අන්‍ය ක්‍රියාවන් ද අනුපිළිවෙළින් දැක් වූ තථාගතයන් වහන්සේ තෙරුවන් සරණ යාම, පන්සිල් රැකීම හා පැවිදි ජීවිතය වඩාත් පහසු ඒවා බව දැක්වූහ.[60]

එහෙයින් පුද්ගලයාගේ නිවැරදි හැඩ ගැසීම සඳහා **පරපණ නැසීම නොකරමි යන ශික්ෂාපදය රැකිය යුතු වේ.** අංගුත්තර නිකායේ කම්මපථ පෙය්‍යාලයේ දැක්වෙන පරිදි, දහම් තුනකින් යුක්තවීම නිසා නිරයේ සිටී. ඒ කරුණු තුන ප්‍රාණඝාතය සම්බන්ධයෙනි. තෙමේ පණිවා කරන්නේ වෙයි. මෙරමා ද පණිවායෙහි සමාදන් කරවයි. පණිවායෙහි අනු දන්නේ ද වේ, යනුවෙන් දැක් වූ ස්වභාවයෙන් පුද්ගලයන්ට ඉවත් විය හැකි ය. එසේ ඉවත් වීමෙන් ස්වර්ගයෙහි පිහිටිය හැකි බව එම සූත්‍රයෙහි ම සඳහන් වේ.[61] සත්ත්ව හිංසාවෙන් හා ප්‍රාණඝාතයෙන් කිසියම් පුද්ගලයෙකු ඉවත් වී, ඉවත ලූ දඬු හා ආයුධ ඇත්තකු වන්නේ, ලැජ්ජාව හේතුවෙනි. මෙත් සිත් නිසා සියලු සතුන් කෙරෙහි පුද්ගලයා ඉත සිතැති වේ.[62] එවැනි අයකු කිසි විටෙකත් සත්ත්ව හිංසාව පිණිස ම වූ ශස්ත්‍ර වාණිජ්‍යය නම් වූ අවි ආයුධ වෙළෙඳාම නොකරයි. සත්ත්ව වාණිජ්‍යය නම් වූ වහල් වෙළෙඳාම ආදී ක්‍රියාවන්හි නොයෙදෙති. මාංශ වාණිජ්‍යය නම් වූ මස් පිණිස සතුන් වෙළෙඳාමත්, මද්‍ය වාණිජ්‍යය නම් වූ සත්ත්වයන්ගේ සිහිය විකල් කරවන මත්පැන් හා මෝදක ද්‍රව්‍ය වෙළෙඳාමත්,

---

59 අ.නි. 3, පි.339 - 343. ධ.ප. 1-13; යමක වග්ග.

60 ධ.ප., 10 - 2 දණ්ඩ වග්ග. ජා.පො., පි.37 - 38; ජා.පො., පි. 38 - 40. පු.නි., පි. 80, ගාථා අංක 262; මහා මංගල සූත්‍රය.

61 දී.නි. 1, පි.279 කූටදන්ත සූත්‍රය. ම.නි. 2, පි.637. සු.නි., පි.93. ජා.පො., පි.91.

62 අ.නි. 1, පි.291 - 293 අ.නි. 1, පි.291.

විෂ වාණිජ්‍ය නම් වූ වස වෙළෙඳාමත් කිදි දිනෙක නොකරයි. එකී වෙළෙඳාම්[63] කිරීමේ දී ඒවා සත්ත්වයන්ගේ හිත සුව පිණිස නොව, විනය පිණිස ම පවතින බව තේරුම් ගන්නා ලැජ්ජා භය නම් වූ දේවධර්ම[64] ගරු කරන පුද්ගලයා ඒවා දුරින් දුරු කරයි. වරද වරද වශයෙන් දැකීමත්, වරද දැක ඉන් ඉවත් වීමත්, එම වරදෙහි යෙදෙන අන්‍යයන් ද එකී වරදින් මුදවා ගැනීමත්, වරද වරද වශයෙන් නිග්‍රහයට භාජන කිරීම හා කරවීමත්, මානව හිතවාදීන් විසින් කළ යුතු වේ. සුදුවත් හඳිනා ගිහියන් (පඤ්ච ශික්ෂා පදයන්හි) විසින් රැකිය යුතු සිල් ලෙස ගිහි සූත්‍රය[65] දැක් වූ කරුණු ම භික්ඛු සූත්‍රය හා භික්ඛුනි සූත්‍ර, ආජීවක හා නිගණ්ඨ සූත්‍ර ද අවධාරණය කරනුයේ, එකී වැරදිවලින් යුක්ත වන ගිහිගෙ යින් ඈත් වූවන් පවා ඒ වැරදි හේතුවෙන් නිරයට යා හැකි බැවිනි. ඒ වැරදිවලින් ඉවත් වූයේ නම් වෙනත් උසස් අධිගමයක් නොලැබුණත් ස්වර්ගයට යා හැකි ය. ඒ ජාති, ආගම්, වර්ණ භේදාදියෙන් තොර ස්වභාවයකි.[66]

පඤ්ච සීලයෙහි එන දෙවැන්න සොරකම් කිරීමෙන් වැළකීම ය. එම ප්‍රතිඥාවෙන් පුද්ගලයා විසින් පිළිගනු ලබන්නේ 'පුද්ගල දේපළ අයිතිය' ය. ජීවත්වීමට නිදහසක් හා අයිතියක් ඇති හෙයින් එකී ජීවිතය යහතින් ද, පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ඉඩකඩ, ධන, ධාන්‍ය, යාන - වාහන ආදී සියලු නිශ්චල, චංචල දේපළ අයිතිය පුද්ගල නිදහස හා වගකීම ගරු කරන සියල්ලන් විසින් පිළිගැනේ.[67] පුද්ගල දේපළ අයිතිය පිළිබඳ ව නීතිය ක්‍රියාත්මක වන්නේ පාර්ශ්වකරුවන් අතරේ ඇති කරගත්

63 දී.නි. 1, පි.281 - 285.

64 අ.නි. 1, පි.539; කම්මපථ පෙය්‍යාලය. අ.නි. 1, පි.541 - 545. අ.නි. 2, පි.487.

65 දී.නි. 1, පි.285; කූටදන්ත සූත්‍රය.

66 අ.නි. 3, පි.339; වණිජ්ජා සූත්‍රය.

67 සු.නි., පි.235 - 237. ජා.පො., පි.16 - 17. අ.නි. 3, පි.113 - 116. මා.ද., පි.347.

ගිවිසුමක් නිසා නොවේ. පුද්ගලයා හා දේපළ පිළිබඳ ව අලංග නීයත්වයෙහි අයිතියක් සෑම පුද්ගලයාට ම ඇතැයි නීතිය කියා සිටින හෙයිනි.[68] පුද්ගලයා සතු දේපළ අන් අය විසින් අන්තරාවට භාජනය කිරීම හෝ කෙලෙසීම හෝ නොකළ යුතු බවට පුද්ගලයාට අයිතියක් පවතී. එසේ කළහොත් ඒ නිසා සිදුවන අලාභයට වන්දි ලබා ගැනීමට පුද්ගලයන්ගේ අයිතිවාසිකම් රජය විසින් ආරක්ෂා කළ යුතු යයි යන සිද්ධාන්තය මත, සොරෙකුට වුව ද, එකී වරදට ප්‍රතිහිංසාව නම් වූ දඬුවම[69] පැනවිය යුත්තේ රජය මගිනි. සොරෙකු සොරකමෙහි යෙදෙන අවස්ථාවේ දී ඔහු පාලනය කර ගැනීම සඳහා දේපළ අයිතිකරුට යම් කිසි සීමාසහිත යුක්තිසහගත බලයක් යෙදවිය හැකි යයි පිළිගැනීම ඇතත්, එහි සාධාරණ බව, උසාවියක් ඉදිරිපිට සනාථ කළ හැකි විය යුතු ය. විවිධ රටවල දේපළ නීතිය යටතේ අයත් කර ගැනීම, භුක්තිය පැවරීම, විකිණීම, උකස් කිරීම ආදී සෑම ක්‍රියාවක් ම ඇතුළත් කර ඇත.

තමාගේ නොවන වස්තුවක්, වස්තු හිමියාගේ අවසරයක් නොමැති ව අයත් කර ගැනීම, සොරකම ලෙස විග්‍රහ කළ හැකි ය.[70] සොර සිතින් වස්තුව සෙලවීම පවා සොරකම ලෙස සැලකේ.[71] සොරකම කිරීමෙන් ම සම්පූර්ණ වන්නේ නමුත් ඒ සඳහා පූර්ව ප්‍රයෝග නම් වූ යාම් ඊම්, ඔත්තු බැලීම්, ස්පර්ශ කිරීම් ආදී දෑ ද එහි ලා ගැනේ. 'සොරකම' සඳහා පුද්ගලයා පෙළඹෙන්නේ වස්තුව පිළිබඳ ව පවතින තෘෂ්ණාව හේතු කොට ගෙන ය. ඒ මුලාවක් වුව ද, සොර සිත් ඇත්තාට තමා වැටී සිටින මුලාව නොදනේ. 'අත්තන ඇට කෑ අය' මැණික් යයි සිතා වීදුරු කැබලි, ගල් කැබලි ඔඩොක්කුවට දමා ගන්නේ මනස

68 අ.නි. 3, පි.343 - 349 ගිහි සූත්‍රය. අ.නි. 2, පි.159. අ.නි. 3, පි.349. අ.නි. 3, පි.461 - 465.

69 බ.ද., පි.688 - 689.

70 අ.නි. 1, පි.97; වජ්ජ සූත්‍රය. පූ.නි., පි.290 -301.

71 දී.නි. 1, පි.111 - 107.

විකෘතිවීමෙන් වන මුලාව හේතුවෙනි. මේ මුලාව දුරු කිරීම සඳහා දඬුවම් පැමිණවීම පමණක් ප්‍රමාණවත් නොවේ.[72]

ආචාර විද්‍යාත්මක ව, පුද්ගල සංවර්ධනයක් සඳහා දැනුම ලබාදීම එහි ලා වැදගත් ය.[73] මිල මුදල්වල පවතින නොවැදගත් බව නුවණින් යුතු පුද්ගලයාට වටහා දිය හැකි ය. තමාට අවශ්‍ය වන උපභෝග, පරිභෝග ද්‍රව්‍යවල[74] ප්‍රමාණය සීමාකර ගැනීම පුරුදු පුහුණුවීම නම් අල්පේච්ඡ ජීවිතය ද මෙහි ලා සුදුසු ය. අද අප රටේ පවතින නීතිය අනුව මුදල් වංචාවක් සඳහා සතයක වටිනාකම වුව, ප්‍රමාණවත් ලෙස සැලකේ. ඇතැම් නඩු තීන්දු මෙහි ලා සාක්ෂ්‍ය ලෙස ඉදිරිපත් කළ හැකි ය. මුදල් භාවිතය වන්නේ බඩුවේ වටිනාකම දැක්වීමට ය. එහෙයින් මුදල් සඳහා අනවශ්‍ය වැදගත්කමක් පැවරීම මුලාවකි. මේ මුලාව නිසා බොහෝ විට සත්ත්ව හිංසාවත්, ප්‍රාණඝාතයත්, සොරකමත් කරති.[75]

මුදල් කොළයක වටිනාකම ඇත්තේ ඉන් ලබාගත හැකි බඩු ප්‍රමාණය අනුව බැවින් අන්‍යෝන්‍ය භාණ්ඩ හුවමාරුව[76] සඳහා පවතින ලියවිල්ලක් සඳහා ජීවිත තොර කිරීම මිනිස්කමට නොතරම් ය. මුදල් රැස් කිරීමෙන් සන්තාපය වැඩි කර ගන්නා මිනිස්සු, මෝහයෙන් මුලාවී කාම සම්පත් වැඩි වැඩියෙන් පාරිභෝජනය කිරීමේ මඟක් කර ගනිති. ඇතැමුන් ස්වකීය ජීවිතය හෝ ස්වකීය ජීවිතයට සමීපවූවන් බේරා ගැනීම සඳහා සියලු ම වස්තුව හෝ රාජ්‍ය හෝ පරිත්‍යාග කිරීමට කැමති වන්නේ ද, මුදලේ සාපේක්ෂිත වටිනාකමක් නොමැති හෙයිනි.

72 පා.දි., පි.107.

73 දී.නි. 3, පි.111. දී.නි. 3, පි.113. දී.නි. 1, පි.263 අ.නි. 2, පි.465.

74 ස.නි. 5 - 2, ම. 185; මහානාම සූත්‍රය.

75 ම.නි. 2, පී.639. සු.නි., පි.

76 ම.නි. 2, පි.639. සු.නි., පි.219 - 233. එම සාරිපුත්ත සූත්‍රයේ එන 974 හා 975 ගාථා (සු.නි., පි.305)

පැරණි සිරිත් විරිත් අනුව සොරා ගන්නා ලද බඩුවක් විනිශ්චය කිරීමේ දී ඒ බඩුව සස්වාමික ද, අස්වාමික ද, යනුවෙන් වස්තුව විනිශ්චය කළ යුතු ය. බඩුවේ වටිනාකම ගණන් ගැනෙන්නේ සොරකම් කරනු ලැබූ දින පැවති වටිනාකම[77] අනුව ය. එය කාලය ලෙස හඳුන්වයි. දේශය අනුව ද වටිනාකම වෙනස් වේ. ඒ ඒ ප්‍රදේශය අනුව බඩුවේ වටිනාකම සැලකිල්ලට ගත යුතු ය. අග්‍රි (අගසං) යනුවෙන් සඳහන් වන්නේ එහි අගය ය. අලුත් බඩුව වටී. පරණ බඩුවල අගය බහී. පරිභෝග යන්නෙන් අදහස් කරන්නේ පාවිච්චිය ය. වරක් හෝ අඳින ලද ඇඳුම පරිභෝග කළ ගණයට වැටේ. වර්තමාන අපරාධ නීති සංග්‍රහයට අනුව ද මේ කරුණු බොහෝ දුරට සමීප සම්බන්ධතාවක් පෙන්නුම් කරයි.[78] තමන් ම සියතින් (සාහර්ථක) ගැනීම, 'අසුවල් බඩුව ගනුව'යි දෙන ලද අණින් (ආණතික) ගැනීම, බදු නොගෙවා (නිස්සග්ගිය) පැහැර ගැනීම, ආදීන් ද සොරකමට ම අයත් වේ. **'කිරීම ම මෙහි දී වැදගත් වේ.'** සොරකම් කිරීමේ විවිධ ක්‍රම හා නියම කිරීමේ විවිධ ආකාර ද ඒ සොරකම නම් වූ වරදට හසුවන, නොහසුවන ආකාරය ද, සොරකම යටතේ සඳහන් කර තිබේ. ඒ අනුව **'ආපසු දෙන්නෙමි'** යන චේතනාවෙන් බඩුවක් ගැනීමෙන් වරදක් නොවේ.[79] **'ඔබ ම ගන්නැ'යි** හිමියා නොකියූ විටෙක නම් ආපසු දිය යුතු ය. සියතින් ම සොරකම් කරන විට එය කයින් කෙරෙන වරදක් ලෙසත්, අනුන් ලවා ගන්නා කල එය වචනයෙන් කෙරෙන වරදක් ලෙසත් දෙ ආකාර ය. **'මේ ඉතා බරය, ඔබත් කොණක් ගන්න'**, යයි සොරකම් කරන විටක දී කය වචනය දෙකෙන් ම කරන වරදක් බවට ද සොරකම පත් වේ. **ඉහත සියලු ම අවස්ථාවන්හි දී චේතනාව වැදගත් සාධකයක් බව කිවමනා ය.**[80]

77 දී.නි. 3, පි.119 - 123.

78 ජා.පො., පි.13 - 14.

79 පා.දී., පි.113.

80 P.C.L. - P.456. P.C.L. - P.475.

සිගාලෝවාද සූත්‍රයෙහි අඹුසැමි යුතුකම් අවධාරණය කිරීමේ දී පර ස්ත්‍රී, පර පුරුෂ සේවනයෙන්[81] ඉවත් විය යුතු බව දැක්විණ. විවාහය නම් වූ බැම්මෙන් බැඳී, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ස්වාමි භාර්යා බවට පත් වෙන්නේ දරුවන් ලැබීම නම් වූ ප්‍රජාව පවත්වා ගැනීම සඳහා ය.[82] ඒ ප්‍රජාව පවත්වා ගැනීමේ අරමුණින් නොවන්නේ නම් ගැමි දහමක් වූ මෛථුන සේවනයෙන් ඉවත් විය යුතු බව තථාගතයන් වහන්සේගේ උපදේශය ය.

මෛථුන සේවනයෙන් ඉවත්වීම අපහසු නම්, කාම ආශ්වාදය ලැබිය යුත්තේ සමාජ සම්මත චාරිත්‍රයන්ට අනුව යමින්, යම්කිසි සංවර ආචාරශීලී පදනමක පිහිටීමෙනි. එක් එක් පුද්ගලයාට හිතෙන හිතෙන ආකාරයට, දකින දකින, ස්ත්‍රී පුරුෂයන් සමඟ කාම සේවනයෙහි යෙදීම සුනඛයන් අතර වුව ද නො පවතින චාරිත්‍රයක් බව සෝණ සූත්‍රය අවධාරණය කරන්නේ ඒ ඉතා පහත් ක්‍රියාවක් බව දැක්වීමට ය.

ස්වකීය කාමාශාවන් මුදුන්පත් කර ගැනීමේ කැමැත්ත නිසා ගැළපෙන, නොගැළපෙන ස්ත්‍රී පුරුෂයන් කවුරුන් හෝ සමඟ වුවද අනාචාරයේ හැසිරීම සමාජ දූෂණයක් ලෙස සලකන ලද බැවින් විවිධ නීති රීති පනවන ලද බව සැලකිය යුතු ය.[83]

සමාජ සංස්ථාව බැඳ තබන මූලික ඒකකය 'පවුල' ලෙස ඉහතින් දැක් වූ අතර, විවාහය අන්‍යෝන්‍ය ගරුත්වයකින් හා විශ්වාසයකින් පවත්වා ගත යුතු බන්ධනයක් ලෙස ද කරුණු දැක්වීමු. මෙම බන්ධනය භෞතික වූත්, ශාරීරික වූත් එකක් නොව, ඊට වඩා ගැඹුරු ලෙස වටහා ගත යුතු මානසික බන්ධනයකි. එම මානසික බන්ධනය තහවුරු වී සුරක්ෂිත වන්නේ ස්ත්‍රී පුරුෂ දෙදෙනා අතර ඇතිවන අවංක බව, සුහදතාව හා විශ්වාසය නම් වූ යහපත් ගුණාංග පවතින ආකාරය අනුව ය.[84] එකී ගුණාංග

81 පා.දී., පි.106 - 115.

82 ස.නි. 5 - 2, පි.339

83 අ.නි. 3, පි.363. I.G.A., p.139.

84 පු.නි., පි. 284 - 288. P.L.C., P.454.

මත, 'කාමයෙහි වරදවා නොහැසිරෙමි', යන ශික්ෂාපදය ආරක්ෂා වී තහවුරු වේ. 'කුල වංශය ආරක්ෂා කර ගැනීම' යනුවෙන් පැරණියන් අදහස් කළේ යහපත් පැවැත්මක් වුව ද, පසු කාලයේ දී ඒ වෙනත් වෙනත් ස්වරූප ගනු ලැබූ බව ත්‍රිපිටකයේ එන විස්තරවලට අනුව සැලකීමට සිදු වේ.

තථාගතයන් වහන්සේට 'කුල නාශකයෙකැ'යි[85] චෝදනා එල්ල කළ අය, බොහෝ කුල කුමරුවන් පැවිදි කිරීම නිසා පරපුර පවත්වා ගැනීම අපහසු බව දක්වූ නමුත් නොගැළපෙන ස්ත්‍රී පුරුෂයන් කරා යාමෙන් ඔවුනොවුන් විසින් කරන්නට යෙදුණ සමාජ දූෂණයේ බරපතළකම වටහා නොගත් හ.

බ්‍රාහ්මණයෝ ම ශුද්ධ වෙති. අබ්‍රාහ්මණයෝ ශුද්ධ නොවෙති, යනුවෙන් ස්වකීය කුල පරපුරරෙහි පිරිසිදු බව ප්‍රකාශ කළ බමුණන්ට පවා පිළිතුරු දී ගත නොහැකි වූ ප්‍රශ්න කීපයක් අස්සලායන සූත්‍රය[86] මතුකර දක්වා ඇත.

"තොප වැදූ මවක් බ්‍රාහ්මණයෙකු ම වෙත ගියා ය. අබ්‍රාහ්මණයකු කරා නො ගියා ය. තොපගේ ජනක පියෙක් වී නම් ඔහු බ්‍රාහ්මණියක ම වෙත ම ගියේ ය. අබ්‍රාහ්මණියක වෙත නො ගියේ ය, යනුවෙන් පැවසිය හැකි කෙනෙක් ඇත්ද"යි ඇසූ පැනයට පිළිතුරු දීමට නොහැකි වූයේ කාමයෙහි වරදවා හැසිරීම[87] ඉතා බැරෑරුම් ලෙස සමාජයේ පැතිර පැවති නිසා යයි සාධාරණ සැකයක් මතු වේ. සත් පරපුර දක්වා වුව, පිරිසිදු බව ප්‍රකාශ කළ නොහැකි වූ බව එහි එන ප්‍රවෘත්තියෙන් තහවුරු කළ හැකි ය. බහු භාර්යා, බහු පුරුෂ සේවනය පිළිගන්නා සමාජ තුළ වුව ද කාමයෙහි වරදවා හැසිරීම පිළිබඳ ව පැවතියේ පිළිකුළකි.[88]

---

85 ම.නි. 1, පි.665, 667. සු.නි., පි.91, ගාථා අංක 293 - 295. Vol. II, Part 5, P.140.

86 ස.නි. 4, පි.587.

87 ම.නි. 2, පි.625 අස්සලායන සූත්‍රය. සු.නි., පි.88. ගාථා අංක 292. L.G.A., P.139.

88 අ.නි. 1, පි.541 අ.නි. 2, පි.489, ස.නි. 5 - 2. පි.157 - අ.නි. 2, පි.117.

පෙර මව්පියවරු පති කුලයට යැවෙන[89] ස්වකීය දූවරුන් පිළිබඳ ව ඉතා සැලකිලිමත් වූහ. විවාහ වීමට සූදානම් ව සිටි ස්වකීය දියණියට තථාගතයන් වහන්සේ ලවා අවවාද කරවීමට උග්ගහ සිටුතුමා පෙළඹ වූයේ දෙමාපියන් සතු යුතුකමක් ඉටු කිරීමක් ලෙසිනි. පඤ්ච ධර්මයක් එකී කුමරියට දේශනා කළ තථාගතයන් වහන්සේ එසේ හික්මීමෙන් යුක්ත ව ස්වාමියාට මන වඩන ලෙසින් හැසිරෙන මාගම, මතු මනාපකායික දෙවියන්ගේ සහභාවයට පත්වන බව ද වදාළ හ.[90] ස්වාමියා උපයන ධනය ආරක්ෂා කිරීමට අමතර වශයෙන් ධූර්තී නොවී, සෙර නොවී, විනාශිකාවක් නොවී ජීවත් වන බවට, හික්මිය යුතු බව තථාගතයන් වහන්සේ වදාළේ ඒ ඉතා වැදගත් හෙයිනි. 'අධුත්ති, අථෙනී, අසෝණ්ඩි, අවිනාසිකායොති,' යනුවෙන් ඒ ගුණාංග දක්වන ලද තන්හි 'අධුත්ති' යන්න ඉතා වැදගත් වේ. පුරුෂ ධූර්ති, සුරා ධූර්ති[91] වන ස්ත්‍රිය ස්වාමියාට සෙරක වී, ඔහුගේ විනාශය කැඳවන හෙයින් ඒ ඉතා බැරෑරුම් කරුණක් ලෙස අවධාරණය විය යුතු ය. විවාහ ජීවිතයේ 'සියල්ල' පර පුරුෂ සේවනය නිසා අවුල් විය හැකි බව දක්නා මාගම ස්වකීය සැමියා කෙරෙහි ම විශ්වාසය තබන්නී ය. දිව්‍ය ලෝකයේ සැප විඳීමට කැමති මාගමකට ස්වකීය සැමියාට හිතවත් ව විසීම[92] පමණක් වුව, ප්‍රමාණවත් බව ඉහත සඳහන් කළ උග්ගහ සූත්‍රයේ දක් වූ කරුණු තුළින් පැහැදිලි ය. යම්කිසි දුකක් උපදී නම් ඒ සියල්ල ආසාව මුල්කොට ඇත්තේ යයි දතයුතු බව භද්‍රක සූත්‍රය[93] සඳහන් කරයි. පස්කම් ගුණ සොයන්නවුන් විසින් රන් රිදී සෙවිය යුතු ය. ස්ත්‍රී පුරුෂයන් සෙවිය යුතු ය. ඒ සෙවීම්, බැලීම් නිසා ඔවුහු ඒවා ලබති.[94] ඒවායෙහි නැවත

89 සු.නි., පි.34, ගාථා අංක 108. සු.නි., පි.34, ගාථා අංක 110.

90 සු.නි., පි.38, ගාථා අංක 123. ජා.පො., පි.412 - 413; සෙග්ගු ජාතකය.

91 අ.නි. 3, පි. 57 - 59; උග්ගහ සූත්‍රය. අ.නි. 3, පි.58, ගාථා අංක 12.

92 මා.ද., පි.373, ගාථා අංක 35 හා 36. සු.නි., පි.34, ගාථා අංක 106.

93 අ.නි. 2, පි.119 (දුතිය) සූත්‍රය, 1.2, පි.119.

94 ස.නි. 4, පි.591 - 595; භද්‍රක සූත්‍රය.

නැවතත් ඇලෙති. බැඳෙති. රාගික සිතුවිලි වැඩි වැඩියෙන් වගා කර ගනිති. රාගයෙහි ඇලුණු, රාගයෙන් බැඳුණු පුද්ගලයා තමාට පීඩා පිණිස සිතයි. මෙරමා හට ද පීඩා පිණිස සිතයි. දෙපසට ම පීඩා පිණිස ද සිතයි. චෛතසික දුක් දොම්නස් ද විඳියි.[95] කාම රාගයෙන් මඩිනු ලැබූ, කාම රාගය අනුව ගිය සිතින් වසන අයෙක්, කාම රාගය දුරු කරන්නේ කෙසේ දැයි නොදන්නේ නම් එම පුද්ගලයා ආත්මාර්ථය තතු සේ නොදනී. පරාර්ථයන් තතු සේ නො දකී, යන්න සඞ්ගාරව සූත්‍රය[96] පැහැදිලි කරයි. එවන් පුද්ගලයා හට දිගු කලක් හදාළ මන්ත්‍ර පවා වටහා ගැනීම අපහසු ය. හදාළ මන්ත්‍ර පවා වටහා ගැනීම පහසු නොවන කල, නොහදාළ මන්ත්‍ර වටහා ගැනීම කිසිසේත් ම පහසු විය නොහැකි ය. පිරිසිදු ජලය සහිත දිය බඳුනකින් ස්වකීය මුහුණේ ඡායාව දැකිය හැකි නමුදු, යම් යම් පාට වර්ග යොදා වර්ණවත් කරනු ලැබූ දිය බඳුනකින් ඒ කළ නොහැකි වන්නා සේ ම, කාම රාගයෙන් යුක්ත වූවන්ට ආත්මාර්ථය, පරාර්ථය හෝ උභයාර්ථය නොවැටහේ. කාමච්ඡන්දය සිත අවුරණ, කෙළෙසන, නුවණ දුබල කරන පස්දෙනා අතුරින් එක් කරුණක් බව ආවරණ සූත්‍රය[97] සඳහන් කරන අතර, නූපන් කාමච්ඡන්දය උපදින්නේත්, විපුල බවට පත්වන්නේත් නුවණින් මෙනෙහි කිරීම නිසා යයි ද, ඒ නුවණින් මෙනෙහි කොට කාමච්ඡන්දයෙන් ඉවත් විය යුතු යයි ද යෝනිසො සූත්‍රය[98] දක්වයි. මෙරමා සතු විෂය නම් වූ පස්කම් ගුණයෙහි ඇලීමෙන්, සත්ත්වයන් සියලු විපත්වලට ගොදුරු වන්නේ යයි දක්වන මක්කට සූත්‍රය,[99] වැද්දා විසින් තබන ලද ලහටුවල ඇලුණු වඳුරන්, වැද්දා විසින් කැමති කැමති අන්දමින් වධහිංසා පැමිණවීමට ගොදුරු වන බව සඳහන් කරයි. තමා

95 ස.නි. 4, පි.591; මණිචූළක සූත්‍රය.

96 ස.නි. 4, පි.609; රාසිය සූත්‍රය.

97 අ.නි. 3, පි.375 සඞ්ගාරව සූත්‍රය.

98 ස.නි. 5-1, පි.191; ආවරණ සූත්‍රය.

99 -එම- පි.189; යොනිසො සූත්‍රය. -එම- පි.189. -එම- පි.73. ඒ එක ම දහමය. -එම- පි.61.

විසින් මෙහෙය විය හැකි පිය සතු උරුමය වන්නේ පස්කම් ගුණයට ප්‍රතිවිරුද්ධ වූ සතර සතිපට්ඨානයන් බව එම සූත්‍රය සඳහන් කරයි.

කාමය, පුද්ගලයන් කා දමන ගින්නකි. ගින්නට තැන, නොතැන, උස් පහත්, පවිත්‍ර අපවිත්‍ර ආදී භේදයන් හසු නොවේ. සියල්ල සාධාරණ ලෙස සලකන ගින්න පවිත්‍ර අපවිත්‍ර, ලොකු කුඩා ඕනෑ ම දෙයක් ගිල දමයි. ඇසට අහිතය, දුර්වර්ණය, දුර්වලය යනුවෙන් අග්නි ආදීනව දක්වන අග්ගි සූත්‍රය[100] පිරිස් එක් කිරීම හා තිරශ්චීන කතාවන්ට අග්නි සුදුසු බව දක්වයි. එක් සිතක ඇවිළෙන කාම ගින්න ඒ සිතට අහිතවත් ව පුද්ගලයා දුර්වල, දුර්වර්ණ ස්වභාවයට පත් කරවයි. කාම ගින්න අන් ස්ත්‍රී පුරුෂයන්ට ද පවරා දීමේ හේතුවෙන් ඔවුන් ද එක් කර තිරශ්චීන ගතිවලට පොළඹවති. එම ගින්න නිවා දැමිය හැක්කේ, නුවණින් සිතා බැලීමෙනි. දඬු දෙකක ගැටීමෙන් හා එක්වීමෙන් උණුසුම හටගන්නා බව සලකා ඒවා වෙන් කොට තැබීමෙන් ගින්න පැතිර යාම වැළැක්විය හැකි ය.[101] ඒ ඒ තන්හි දී ලබන වේදනා ඒ ඒ තන්හි දී ම නිරුද්ධ කිරීමෙන් එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකු වෙත කාම ගින්න ගලායාමට ඇති ඉඩකඩ වැළැක්විය හැකි ය.

ස්ත්‍රී රූපය, ස්ත්‍රී ශබ්දය, ස්ත්‍රී ගන්ධය, ස්ත්‍රී රසය, ස්ත්‍රී ස්පර්ශය පුරුෂයාට ආශ්වාදජනක වන අයුරින්ම පුරුෂ රූප, පුරුෂ ශබ්ද, පුරුෂ ගන්ධ, පුරුෂ රස, පුරුෂ ස්පර්ශ ස්ත්‍රියට ද ආශ්වාදජක අරමුණු බව[102] මීට ඉහතින් සාකච්ඡා කළෙමු. ඒවා නුනුවණින් සලකා බලන ස්ත්‍රී පුරුෂයෝ වරෙදහි බැඳෙති. කුල සිරිත් ඉක්මවති. සංවාස ආචාර ධර්ම පද්ධතිය කෙලෙසති. "ඔසප් නොවූ බැමිණිය කාමය සඳහා නොවෙයි. රතිය පිණිස

100 ස.නි. 5-1, පි.271 - 273 මක්කට සූත්‍රය.

101 අ.නි. 3, පි.414 අග්ගි සූත්‍රය. ජා.පො., පි.115 අසාත මන්ත ජාතකය.

102 ස.නි. 5-1, පි.377; කටෙඨාපම සූත්‍රය.

නොවෙයි." යනුවෙන් දෝණ සූත්‍රය[103] දක්වන්නේ දරුවකු පිළිසිඳ ගැනීම සඳහා ඔසප් වූ ස්ත්‍රියක වීම, සංවාසය හා ගන්ධබ්බයාගේ පැමිණීම යන කරුණු අවශ්‍ය හෙයිනි. සංවාසයෙහි මූලික අරමුණ දරුවකු ලැබීම නම් හා ඒ හා කිසිත් සම්බන්ධයක් නැති පිටස්තර ස්ත්‍රී පුරුෂයන් හා කාමමිච්ඡාචාරයෙහි යෙදීම කුල සිරිත් ඉක්මවීමකි. ඊට ප්‍රධාන හේතුවක් ලෙස සැලකිය හැක්කේ දුර්වල සිත විසින් ඉදිරියට ගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂයන්ගේ විවිධ හැසිරීම් ය. ස්ත්‍රියක් තුළ පිහිටිය යුතු ගුණාංග බොහෝ ය. රූපය, සිල්වත් බව, නුවණ හා ක්ෂමාව එහි ලා ප්‍රධානත්වයක් ගත යුතු ය.[104]

අන් බිරිඳක දෙස ගිජුකමින් බලාගෙන නොසිටින්න. ස්ත්‍රියක් දුටුවොත් ඇගේ වයස අනුව සලකන්න. ඔබගේ මෑණියන් හෝ සොහොයුරිය හෝ දියණිය හෝ මෙන් කල්පනා කරන්න. කුණු කය අප්‍රිය බැවින් රාගය හට ගැන්මට ඉඩ නොදෙන්න. එහි ම එන තවත් වැදගත් උපදේශයක, ස්ත්‍රී ශරීරය පිළිබඳ ව පිළිකුල් සංඥාවක් ඇති කරවීමට, ගැහැනිය කෙරෙහි රාගය නො කරන්න. නියම විධියෙන් දක්නේ නම් ඇයගේ ශරීරය හමෙන් වැසුණු දුගඳ මල්ලකි. කුණපයන් වැගිරෙන නව දොරක් එහි ඇත. පිරවීමට අපහසු අසුචි භාජනයකි. හම ඉවත් කළොත්, ආභරණ ගලවතොත් රාගයට අරමුණක් එහි ඇත්තේ ද? යනුවෙන් සඳහන් කරන ආචාර්ය නාගර්ජුන පාදයන්ගේ 'සුහෘලේඛ'[105] (සුහද හස්න) කාමයෙහි ආදීනව හා එහි බැඳෙන්න වුන්ගේ ස්වභාවය ද සලකා ඉන් පුද්ගලයන් මුදවා ගැනීම සඳහා කරුණු ඉදිරිපත් කරයි. රාගී පුද්ගලයෝ කාමාස්වාදය කොතෙක් ලදු වත් ඉන් සෑහීමකට පත් නොවෙති.

ගිනි තපින කුෂ්ට රෝගීන් මෙන් තාවකාලික තෘප්තියක් සඳහා ස්වකීය සැපත නම් වූ මිදීම අමතක කරති. ඔවුන්ට අවශ්‍ය වනුයේ

103 අ.නි. 1, පි.-3-5. පු.පු.සං -පි.203. අ.නි. 3, 369; දෝණ සූත්‍රය.

104 ජා.පො. පි.363 - 365.

105 මා.ද., පි.367 - 369, ගාථා අංක 21, 25 හා 26.

යහපත් උපදේශන්ය. ස්ත්‍රී ශරීරය පිළිබඳව නුවණින් මෙනෙහි කරමින් ඒ අගය කරන කාමරාගී පුද්ගලයාට එහි අයහපත් පැත්තක් ද පවතින බව පෙන්වා දිය යුතු වේ. ධම්මපදයේ ජරා වර්ගයේ[106] එන ඇතැම් කරුණු රාගී පුද්ගලයාට ස්ත්‍රී ශරීරයේ පිළිකුල් ස්වභාවය පැහැදිලි කරවයි. ස්ත්‍රී ශරීරය නව දොරින් කුණු වැගිරෙන නිසා බිඳෙයි. (**භිජ්ජති පූති සන්දෙහො** - ධ.ප. - 11-3) වන රැසකින් නගා සිටවූ (**අරුකායං සමුස්සිතං** - ධ.ප.. 11-2) දුගඳ හමන නවදොර හා ඇට දැක කුමන රතියෙක් ද? (**තානි දිස්වාන කාරති** - ධ.ප. - 11-4) ස්ත්‍රී සිරුර ඇටවලින් කරන ලද නුවරකි. (**අට්ඨීනං නගරං කතං** - ධ.ප. 11.5) ආදී වශයෙන් ස්ත්‍රී සිරුර පිළිකුළට භාජනය කරවීමට විවිධ උපක්‍රම යොදා තිබේ. ස්ත්‍රිය මරු විසින් වටාලූ මලෙකැයි සඳහන් කරන පුත්තාමත්ත සූත්‍රය[107] එම ස්ත්‍රිය නමැති මලෙහි පුද්ගලයන් ඇලෙන බැඳෙන ආකාරය සඳහන් කරයි.

සංයුත්ත නිකායේ මාතුගාම සංයුත්තය ස්ත්‍රිය පිළිබඳ ව දක්වන කරුණු මෙතැන දී මඳක් සලකා බැලීම සුදුසු ය. එහි එන මුල් සූත්‍රය වන මාතුගාම[108] සූත්‍රය පුරුෂයාගේ සිත් බඳින, නොබඳින ස්ත්‍රිය කවුරු දැයි දක්වයි. පුරුෂයාට මනාප වන ස්ත්‍රිය රූමත් ය. ධනවත් ය, සිල්වත් ය, අනලස් ව දක්ෂ ද වෙයි. ඔහුට දාව ප්‍රජාව ද ලබයි. ස්ත්‍රිය මනාපවන පුරුෂයා තුළ ද ඉහත අංග පහ තිබිය යුතු බව එහි එන පුරිස[109] සූත්‍රය සඳහන් කරයි. ඒ ඒ පුරුෂයා හා ස්ත්‍රිය සමාන ලක්ෂණවලින් යුක්තවීම අනුව, සහවාසය සාර්ථක වන ආකාරය අංගුත්තර නිකායේ පඨම හා දුතිය සංවාස[110] සූත්‍රවලින් පැහැදිලි කරයි. එම සූත්‍රවල සතර සහවාසය කෙනෙක් සඳහන් කර ඇත. ඉන් වඩාත් සුදුසු සහවාසය දෙවි වූයේ දෙව් දුවක හා සහවාසය කිරීම ය. ස්වාමි

106 අ.නි. 3, පි.109; පුත්තාමත්ත සූත්‍රය. අ.නි. 3, පි.109.

107 ථෙර, පි.133 සබ්බකාමී ස්ථවිර ගාථා.

108 ස.නි. 4, පි.451; මාතුගාම සූත්‍රය.

109 ස.නි. 4, පි.451; පුරිස සූත්‍රය.

110 අ.නි. 2, පි.111 - 119; පඨම, දුතිය සංවාස සූත්‍රය.

පුරුෂයා හා භාර්යාව යන දෙදෙනා ම පස් පව්න් වැළකී මසුරු මලින් හා ආක්‍රෝෂ නින්දා බස්වලින් මිදෙත් නම් ඒ අනුව දිව්‍ය සහවාසයකි. අංගුත්තර නිකායේ කාම්භෝජ සූත්‍රය,[111] මාගම කිපෙනසුලු ය, ඊර්ෂ්‍යා ඇත්තියක, මසුරු ඇත්තියක, නුවණ නැත්තියක යනුවෙන් දක්වන කරුණු පුරුෂයාට ස්ත්‍රියක් ඇසුරු කිරීමේ දී බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. එහි ලා අතිරේක විස්තර මල්ලිකා[112] සූත්‍රයෙන් හෙළිකර ගත හැකි ය. මාගම අතෘප්ත ව, නොපසුබට ව සිට, කළුරිය කරන කරුණු දෙක මෙවුන්දම් සෙවීම හා ප්‍රසූතිය[113] බව දක්වේ. මාගම පෙරවරුයෙහි මසුරු මලින් ද, මධ්‍යාහ්න වේලාවෙහි ඊර්ෂ්‍යායෙන් ද, සවස් වේලෙහි කාම රාගයෙන් ද යුක්ත වන්නී ය.[114] "මාගම විවෘත ව නොවහයි. පිළිසන් ව වහයි", යන්න[115] අංගුත්තර නිකාය අවධාරණය කරන්නේ ස්වභාවයෙන් ම ස්ත්‍රිය කරුණු සැඟවීමට දක්ෂ බැවිනි. ස්ත්‍රියට පමණක් උරුම වූ, ස්ත්‍රිය විසින් ම විඳ දරා ගත යුතු දුක් පහක් සංයුත්ත නිකායේ, මාතුගාම සංයුත්තයේ දක්වේ. තරුණ ස්ත්‍රිය නෑයන්ගෙන් වෙන්ව සැමි කුලයට යාම, ඔසප්වීම, ගැබිණිවීම, දරුවන් වැදීම, පුරුෂ පරචරියාවට එළඹීම ඒ දුක් පහ වුව ද[116] ඉන් තෘප්තිමත් වන මාගම ඒ නැවත නැවත අපේක්ෂා කරයි.

සැදැහැ නැති, ලැජ්ජා නැති, බිය නැති, සැමියා ඉක්මවා යන නුවණ නැති ස්ත්‍රිය අපාය දුග්ගති විනීපාත නිරයට යන බවත් සැදැහැ ඇති, ලැජ්ජාව ඇති, බිය ඇති සැමියා නො ඉක්මවන නුවණැති ස්ත්‍රිය ස්වර්ගගාමී වන බවත්, මාතුගාම සංයුත්තයේ

111 අ.නි. 2; පි.157; කාම්භොජ සූත්‍රය.

112 -එම- පි.389 - 393; මල්ලිකා සූත්‍රය.

113 අ.නි. 1, පි.151.

114 -එම- පි.509, ස.නි. 4, පි.453, තිහිධම්ම සූත්‍රය.

115 අ.නි. 1 - පි.511.

116 ස.නි. 4, පි.451; ආවෙණික දුක්ඛ සූත්‍රය. ථෙරි, පි.52, ගාථා අංක 216 කිසාගෝතමී ථෙරි ගාථා.

සූත්‍රවලින්[117] දක්වේ. මාතුගාම සංයුත්ත බලවර්ගයේ සඳහන් සූත්‍රවලින් මාගමක් සතු බල පහක් අවධාරණය කෙරේ. එකී පඤ්ච බලය නිසා මාගම, පුරුෂයා මැඩගෙන සිටින හෙයින් ඉන් එකක් හෝ අඩුවීමෙන් (මාගම) ස්ත්‍රිය පිරිපුන් නොවන බව ද දක්වේ. එකී පඤ්ච බලය වුව ද, පුරුෂයාගේ ඉසුරු බලයෙන් යටපත් කළ හැකි ආකාරය අභිගුය්‍ය සූත්‍රය සඳහන් කරයි.[118] නාසිතබ්බ සූත්‍රයට[119] අනුව කුලයෙහි වසන, කුලය නොනසන ස්ත්‍රිය සතු විය යුතු ප්‍රධාන ම ගුණය ශීලය වේ. ශීල බලය නොමැති විට රූප බලය, භෝග බලය, ඥාති බලය හා පුත්‍ර බලය යන අනෙකුත් බල සතර වුව ද ගිලිහීමෙන් මාගම කුලය නසන බව එහි දක්වේ. සුදුසු කුලයක ඉපිද, සුදුසු කුලයකට ගොස් සපත්තියක නැති ගෙයි වසමින් දරුවන් ඇති ව සැමියා මැඩගෙන සිටිය හැක්කේ කළ පින් ඇති මාගමක විසින් බව ඨාන සූත්‍රය සඳහන් කරයි. පඤ්ච ශීලය රකින මාගම විශාරද වන බවත්, ශ්‍රද්ධා දී පඤ්ච වෘද්ධීන් ලබන බවත් එම සූත්‍රවලින් හෙළි වේ. මෙලොව උපදින ස්ත්‍රීන් පිළිබඳ ව වන රූපා දී ගුණයන්ගේ වෙනස්කම් පූර්ව කර්මයන්ගේ විපාක ලෙස මල්ලිකා සූත්‍රය දක්වයි.

වර්ණයෙන්, රූපයෙන්, සෞභාග්‍යයෙන් හා යසසින් ද මත් වූ විමලා, යෞවන මදය හේතුවෙන් අන්‍ය ස්ත්‍රීන් ඉක්මවා සිතුවා ය. ස්වකීය ශරීරය විසිතුරු ලෙස සරසා ගත් ඕ තොමෝ මල පුඩුවක් තැබූ වැද්දකු ලෙස ස්වකීය ගණිකා නිවස ඉදිරිපස සිට මිනිසුන් පෙළඹවීමට, උස් හඬින් සිනාසෙමින් විවිධ මායම් ද දක්වූවා ය. පසු කලෙක තථාගත උපදෙස් පිළිගෙන මුඩු කළ හිස සහිත වූ විමලාවෝ සඟල සිවුර පොරවා, පිඬු සිඟා යමින් රුක්මුල් සෙනස්නෙහි හිඳ අග්‍ර ඵලය ලැබූ ආකාරය පැහැදිලි කළ හ.[120] මේස සිටු දියණිය, නොපමා වර්ණයෙන් හා රූපයෙන්

---

117 ස.නි. 4, පි.453 - 439, 461 - 465.

118 -එම- පි. 467 - 473, බාල වර්ගයේ එන සූත්‍ර දහය.

119 ස.4; පි.469; නාසිතබ්බ සූත්‍රය. ථෙරි, පි.55. ගාථා අංක 224 -236, උප්පලවණ්ණා ථෙරි ගාථා.

120 ථෙරි, පි.25, විමලා ථෙරි ගාථා.

යුක්ත වූවා. රජ දරුවන් විසින් පතනා ලද්දී ය. "තොපගේ දූ අනොපමා යම් පමණ වටී යයි තුලනා කෙරේ ද, එමෙන් අට ගුණයක් දෙමි"යි කියද්දීත් නොගොස් බුදුහිමිගේ දහම් අසා අනාගාමී වූ ඕ, දින සතකින් රහත් වූවා ය.[121] "ඛේමාවෙනි, ඔබ යොවුන්පත් රූපවන්තියකි. මම ද යොවුන්පත් තරුණයෙක්මි. එව, පසඟතුරුයෙන් රමණය කරම්හ," යනුවෙන් කරනු ලැබූ ආරාධනය ඛේමා තෙරණිය ප්‍රතික්ෂේප කළේ, "ආතුර වූ, බිඳෙන සුලු මේ කුණු කය පිළිකුල් කරමි. තොපට යම් කාම රතියෙක් කීයෙහි ද, එය මට අරතියෙකි," යන වචනවලිනි.[122]

සුත්ත නිපාත, තිස්ස මෙත්තෙය්‍ය සූත්‍රය,[123] මෛථුන්දම් උවදුරු පැහැදිලි කරයි. කීර්තිය, යසස් ආදී යහ ගුණ පිරිහී දිළින්දකු හා මෝඩයකු ලෙස (පුරුෂයා) කෙලෙසීමට පත්වන බව ඉන් දක්වේ. ජාතක කතාවල එන විවිධ චරිත තුළින් ස්ත්‍රී දුර්ගුණ දැක්වීමට උත්සාහ කරන ලද අතර, එකී දුර්ගුණ නො හැඳින ස්ත්‍රීන්ට මුලාවන පුරුෂයින් කෙරෙහි සානුකම්පික හැඟීමක් ඉන් ඇති කරවයි. ස්ත්‍රිය විශ්වාස නොකටයුතු අයකු බව දැක්වෙන ජාතක කතා අතරට අසාත මන්ත ජාතකය, අන්ධභූත ජාතකය, තක්ක ජාතකය ප්‍රධානත්වයක් උසුලයි.[124] අනාචාරයේ යෙදුණ[125] ස්ත්‍රිය දාසියක මෙන් බැගෑපත් වන බවත්, එසේ නොමැති විට ස්වාමි දුවක් මෙන් තද බවත් දක්වන දුරාජාන ජාතකය[126] ස්ත්‍රී භාවය ජලයේ මසුන්ගේ ගමන මෙන් නොදත හැකි යයි පවසයි. ගංගාව ද, මාර්ගය ද, සුරා ගෘහය ද, අම්බලම ද, පැන් මඩුව ද සැමට සාධාරණ වන්නා සේ ස්ත්‍රීහු ද සැමට සාධාරණ හෙයින් නුවණ ඇති උදවිය ඔවුන් කෙරෙහි කෝප නොවිය යුතු

121 -එම- පි.41; අනොපමා ථෙරී ගාථා.

122 -එම- පි.39; ගාථා අංක 139 - 141; ඛේමා ථෙරී ගාථා.

123 සු.නි., පි.259 - 261; තිස්ස මෙත්තෙය්‍ය සූත්‍රය.

124 ජා.පො., පි.113 - 119 අ.2, පි.423 - 425; කණ්හසප්ප සූත්‍රය.

125 ථෙරී, පී.87 - 95. ගාථා අංක 434 - 437; ගාථා අංක 354, 357, 487 -490. අ.නි. 3, පි.109, මාතා පුත්ත සූත්‍රය.

126 ජා.පො., පි.120 - 121; දුරාජාන ජාතකය.

බව අනභිරති ජාතකය[127] දක්වයි. ගැහැනිය නිසා පුරුෂයාගේ විවිධ ආශාවන් වැඩෙති, යන්න මුදු ලක්ඛණ ජාතකයේ[128] දැක්විණ. ඉහත ස්ත්‍රී බල හා දුර්ගුණ ආදී ස්ත්‍රීන් පිළිබඳ කරුණු දැන ගන්නා නුවණැති පුරුෂයෝ ස්ත්‍රීන් කෙරෙහි පැවතිය යුතු ආකාරය වටහා ගෙන කාමේසුමිච්ඡාචාරය හේතුවෙන් රජුන්ගේ වධ බන්ධනවලට ලක්වෙති. ඇතැමෙක් රජුන්ගේ සතුරන්ට අයත් ස්ත්‍රීන් හා කාමයෙහි වරදවා හැසිරීමෙන් තාන්න මාන්න ලබති, යනුවෙන් පාටලීය සූත්‍රය[129] දක්වන කරුණින් වටහා ගත යුතු වන්නේ ඒකාන්ත ලෙස, නියත ස්වභාවයන් දැක්වීම් වෙනුවට, පුද්ගලයන් වැටී සිටින මුලාවෙන් බේරා ගැනීමට කරුණු වටහා දීම ඉතා වැදගත් බව ය. කාමේසුමිච්ඡාචාර නම් වූ වරදින් පුද්ගලයා මුදවා ගත හැක්කේ, ඒකාන්ත ලෙස නිරයට යන බව ප්‍රකාශ කිරීමෙන් නො ව, ස්වච්ඡන්දතා ගුණය මත නිදහස හා වගකීමෙන් යුක්තව කුමන අවස්ථාවක දී හෝ ඉඩ ලැබෙන පරිද්දෙන් ඔවුන් එම වරදෙන් මුදවා ගැනීමෙන් බව සඞ්ඛධම සූත්‍රය[130] සඳහන් කරයි. මුසාවාදයෙන් වැළකීම නම් වූ බොරු කීමෙන් වැළකීම ඉතා උසස් සිල් පදයකි. ගිහියකු විසින් පිළිපැදිය යුතු සතරවන සිල් පදය ලෙස මෙය දක්වන ලදි. බොරු කියන්නා විසින්, නොකළ හැකි කිසිත් අපරාධයක් නොමැති බව චිංචිමානවිකාවගේ අසත්‍ය චෝදනා[131] හේතුවෙන් තථාගතයන් වහන්සේ වදාරන ලදි. යමෙක් බ්‍රාහ්මණයකු හෝ ශ්‍රමණයකු හෝ කිසිවක් බලාපොරොත්තු වන්නකු හෝ බොරුවෙන් රවටන්නේ නම් ඒ පිරිහීම් දොරටුවක් බව පරාභව සූත්‍රයෙහි දී[132] දේශනා කරන ලද්දේ, එයින් පුද්ගලයාහට සිදුවන පාඩුව සලකා ගෙන ය. අසත්‍යයෙන් ඉවත් ව, සත්‍යගරුක වන

127 -එම- පි.122 - 123; අනභිරති ජාතකය.

128 -එම- පි.123 - 124; මුදු ලක්ඛණ ජාතකය.

129 ස.නි. 4, පි.617; පාචලිය සූත්‍රය.

130 -එම- පි.579 - 584; සක්ඛධම සූත්‍රය.

131 ධ.ප. 13 -9, ලෝකවග්ග මහා පදුම ජාතකය. 2, පි.131; අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය.

132 සු.නි., පි.32 (ගාථා අංක 100) පරාභව සූත්‍රය.

පුද්ගලයා ප්‍රාර්ථනා කරනුයේ සමාජයේ විශ්වාසය තමා කෙරෙහි පවත්වා ගැනීමට ය.[133]

වචනයෙන් නො කීවත්, හිස සැලීම් ආදී අංග චලන හේතුවෙන් ද බොරුව ඇඟවිය හැකි ය.[134] බොරු සාක්ෂි දීම, හිමියන් අහිමියන් කිරීම ආදී රැවටීමේ තරාතිරම අනුව බොරු කීමේ විපාකය අල්ප සාවද්‍යය, මහා සාවද්‍ය වේ.

ශ්‍රී ලංකාවේ සාක්ෂි පනත අනුව බොරු සාක්ෂි දීම සඳහා දඬුවම් පැමිණ විය හැකි ය. ඒ වර්තමාන නඩු තීන්දුවලින් ද ඔප්පු වේ. මෙහි ලා සාක්ෂි දීම සඳහා පැමිණෙන පුද්ගලයන් සත්‍යය ම ප්‍රකාශ කරන බවට උසාවිය ඉදිරියේ දී දිවුරුම් දිය යුතු බව අද උසාවිය විසින් පිළිපදිනු ලබන්නකි.[135]

සමාජය ඉදිරියේ 'බොරුකාරයෙක්' යන අපවාදයට ලක් නොවීමට පුද්ගලයන් විසින් වග බලා ගත යුත්තා හ. සත්‍ය වූ දූය අවඥා සහගත ව ඉවත් කරන, ප්‍රතිඥා නොකරන, අභූත වූ අසත්‍යය දෑ අවුල් හරවා නො දක්වන පුද්ගල, අකාලවාදි, අභූතවාදී, අනර්ථවාදී, අධර්මවාදී, අවිනයවාදී පුද්ගල ලෙස සැලකේ. 'විස්සාසා පරමා ඤාති"[136] යනුවෙන් තථාගතයන් වහන්සේ දක්වනු ලැබූ විශ්වාසය තරම් පුද්ගලයා හට පිහිට වන වෙනත් නෑයෙක් නැත යන ප්‍රකාශය අද මනෝ විද්‍යාඥයන් විසින් වෙන ම විද්‍යාවක් ලෙස හැඳින්වීමට 'සයන්ස් ඔෆ් බිලීෆ්' (Science of Belief) යන්න යොදා තිබේ.

විශ්වාසය යනුවෙන් අදහස් කරනුයේ, මිනිස් සන්තානය තුළ තදින් ලැගුම් ගන්නා සිතුවිලි ස්වභාවයකි.[137] සත්‍ය වශයෙන් ම අප සැබෑ විශ්වාසය ලෙස පිළිගන්නා බොහෝ දෑ මිථ්‍යා විශ්වාස හෙවත් අන්ධ විශ්වාස ලෙස සැබෑ තත්ත්වයක නො

133 අ.නි. 2, පි.489; මුසාවාද සූත්‍රය.

134 ස.නි. 4, පි.561; තාලපුට සූත්‍රය.

135 සු.නි., පි.39 (ගාථා අංක 122) වසල සූත්‍රය.

136 ධ.ප. 15 - 6; සුඛවග්ග.

137 අ.නි. 3, පි.107 - 109; මාතා පුත්ත සූත්‍රය.

පවතින බව තේරුම් ගත හැක්කේ අපට එහි ලා අවබෝධය හා නිරවුල් දැනුම ලැබීමත් සමඟ ය. එසේ නිරවුල් දැනුම ලබන තුරු සමාජය පිළිගත් සම්මුතීන්හි පිහිටා ක්‍රියා කිරීමට සිදු වේ. පිළිගත් සම්මුතීන් ව්‍යවහාර වශයෙන් හෝ පැවතීම පුද්ගලයාට හිතවත් ය.

පර පණ නැසීම නොකරමි.

සොරකම් නොකරමි.

කාමයෙහි වරදවා නොහැසිරෙමි.

මුසාවාදයෙන් වැළකෙමි.

යන උසස් වාසය කිරීම් හේතුවෙන් එකිනෙකා ඔවු නොවුන් විශ්වාසයට ගනිති.[138] එකට එක ම ගෘහයක් තුළ වාසය කරති. සඟවා නො තබති. සත්‍යය ම පවසති. විශ්වාසය තහවුරු කරති. මානසික බැඳුමෙන් තර වෙති. තමාට, තමා කෙරෙහිත් විශ්වාසය ඇති වේ. අන්‍යයන් ද තමාගේ ම ශරීරයේ කොටසක් ලෙස ම[139] අගය කරති. ඒ අන්‍යයයෝ ද එසේ ම සිතති. එහෙයින් පුද්ගල ඒකක වශයෙන් වෙන්වීමක් වෙනුවට, පුද්ගල පිරිසිදු පොදි ලෙස ඒකරාශී කළ හැකි ය. (භික්ෂු ආරාමික ජීවිතය මේ පොදු බවෙන් යුක්ත ය.)

ඉහත කී චතුර්විධ[140] කර්ම ක්ලේශවලින් ඈත් වූ පුද්ගලයා තුළ පුදුම චෛතසික බලයක් ඇති වේ. ඔහු කිසිවෙකුට හෝ කිසිවකට හෝ බිය නො වේ. ස්වකීය ජීවිත කාලය තුළ දැන දැන කිසිම ප්‍රාණියෙකුගේ දිවි තොර නොකළ, මෙත් සිත වැඩූ කෙනකු තුළ ඇති වන්නේ පුදුම බලයකි. "අන් සතුන්ගේ දිවි තොර නොකළෙමි. මට විපතක් නොවේවා", යි තම අත තිබූ ආයුධය පවා විසි කළ, පිඹුරෙකු විසින් වෙලාගනු ලැබූ පුද්ගලයා තුළ ඇති වූයේ ද එවන් පුදුම සහගත ආත්ම විශ්වාසයකි. ඔහුට එවන් විශ්වාසයක් නොතිබුණේ නම් ඔහු තමා අත තිබූ

138 ජා.පො. පි.175 - 176. පු.නි., පි.110 - 111.

139 ම.නි. 3, පි.351; උපක්කිලෙස සූත්‍රය.

140 ම.නි. 3, පි. 349.

කැත්තෙන් දර කපන්නාක් සේ පිඹුරා කැලිවලට කපා දමනු ඇත. තමා උපමාවට ගෙන වැරදි සතකින් ඉවත් විය හැකි ආකාරය වේළුද්වාර බමුණු ගමේ බමුණන්ට, තථාගතයන් වහන්සේ දේශනා[141] කළ හ. සුගතිගාමී වීමට ඒ මගක් විය.

පුද්ගලයා හා ස්වච්ඡන්දතාව පිළිබඳ ව ලියවෙන මෙම පරිච්ඡේදයේ දී මෙරමා සතු විෂය නම් වූ බාහිර සාධක කෙරෙහි පවතින අවිනිශ්චිතතාව හේතුවෙන් පුද්ගලයා පැමිණෙන අපහසුකම් අවබෝධ කරවීමට උත්සාහ කළෙමු.

පියසතු විෂය නම් වූ පුද්ගල ශරීරය පිළිබඳ ව කල්පනා කොට තමාට ම පාලනය කරගත හැකි ස්වභාවයක් ඇතැයි සලකන පුද්ගලයා ඒවා හඳුනා ගැනීමෙන් ස්වඡන්දතාව මත ස්වකීය වගකීම් හා නිදහස හසුරුවා ගැනීමෙහි දක්ෂයකු වේ. වර්තමානයේ දී පවතින දුක් කම්කටොලුවලින් නිදහස් විය හැක්කේ කෙසේ දැයි කල්පනා කිරීමෙන් පුද්ගලයා අනාගත බිය[142] දුරු කළ හැකි ආකාරය වටහා ගනියි. ඔහු අතීතයේ දී කරන ලද වැරදිවලින් මිදීම් වශයෙන් කුසල් දහම් පුරමින් අකුසල් යටපත් කිරීමට උත්සුක වෙයි. අත්තූපනායික ධර්මය හැඳින තමා නොකැමැති දෑ අන්‍යයන් ද නොකැමැති බව වටහා ගෙන තමා ලද සුවය අන්‍යයන්ට ද බෙදා දීමට උත්සාහ දරයි.

බොහෝ විට ගිහියන් හා පැවිද්දන් අන්‍යයන්ට හිංසක ලෙස හැසිරෙනුයේ පුග්ගලප්පසාද[143] බැවිනි. ඒ ඒ පුද්ගලයන් කෙරෙහි පවතින බැඳීම් හා ඇලීම් නිසා අන්‍යයන් කෙරෙහි අගතිග ාමීත්වයෙන් කටයුතු කරති. ‘මම’, ‘මගේ’ කම සිතට නැඟුන කල, ජාති, ආගම්, කුල, ගෝත්‍ර, පක්ෂ වශයෙන් එක්වන පුද්ගලයන් අධර්මචාරී, විෂමචාරී ක්‍රියාවන්හි[144] නිරත වන්නේ ඒ ස්වකීය

141 දී.නි. 3, පි.290; සිගාලක සූත්‍රය. දී.නි. 3, පි. පි.81.

142 ස.නි. 5 - 2, පි.155 - 161; වෙළුද්වාරෙය්‍ය සූත්‍රය.

143 අ.නි. 3, පි.163 - 175; මෙහි අනාගත සූත්‍ර. මා.ද., පි.375.

144 අ.නි. 3, පි. 143; පුග්ගලප්පසාද සූත්‍රය. ම.පි, 677, වෙරඤ්ජක සූත්‍රය. ම.නි. 1, පි.681 - 685.

පක්ෂයේ හෝ වර්ගයාගේ දියුණුව ලෙස වරදවා ගැනීමෙනි. අගතිගාමීත්වයෙන් යුක්තව ඒ කළ යුත්තක් ම ලෙස කල්පනා කිරීමේ දී ඒ සාධාරණ වූත්, නිවැරදි වූත් ක්‍රියාවක් ලෙස සිය අනුමැතිය ද ලබා දෙන්නේ 'යහපත්' යන ලාංඡනය යටතේ ය. එහෙත් මධ්‍යස්ථ ව ජාති, කුල, ආගම් වැනි බැඳීම්වලින් මධ්‍යස්ථ වී පුද්ගල බැඳීම්වලින් ඈත් වී, ස්වඡන්දතා ගුණය මතුකර ගත හැකි වුවහොත් ඒ සෑම අවස්ථාවක දී ම වරද වරද ලෙස දැකීමටත්, සත්‍යය කුමක් දැයි වටහා ගැනීමටත් පුද්ගලයාට හැකි වනු ඇත.

අංගුත්තර නිකායේ ආරඤ්ඤක වර්ගයේ[145] දැක්වෙන බොහෝ සූත්‍රවලින් ඒ ඒ පුද්ගලයන් එක ම අදහස පවා ක්‍රියාවට නැගීමේ දී විවිධ චේතනා වන්ගෙන් යුක්ත ව ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරයි. උදාහරණයක් ලෙස ආරණ්‍ය වාසී ව ක්‍රියා කිරීමට කැමති පුද්ගලයන් පස් දෙනෙකු ගතහොත්, **ඔවුන් අතරින් මෝඩකම නිසාත්, පාප අදහස් නිසාත්, සිහි මදකම නම් වූ උන්මාදය නිසාත් ආරණ්‍ය වාසය තෝරා ගන්නවුන් ස්වඡන්දතා ගුණය ප්‍රකට කරන්නෝ නොවෙති.** ආරණ්‍ය වාසය නිදහස් වූත්, වගකීමකින් යුක්ත වූත්, එකක් විය හැක්කේ බුදු, පසේ බුදුමහරහත් උතුමන් විසින් මැනවැයි පසස්නා ලද හේතුවෙන් ද නො වේ. **අල්පේච්ඡ බව, සතුට, කෙලෙස් නසාලීම, උතුම් විවේකය හා උතුම් ප්‍රතිපත්තිය ගැන සලකා ධූතාංගයක් ලෙස ඒ සමාදන්ව විසීමෙන් ම අග්‍ර වූත්, උතුම් වූත් පිහිට ලැබිය හැකි ය.**

ආමිෂයට නොව ධර්මයට දායාද විය යුතු යයි තථාගතයන් වහන්සේ දක්වන ලද හ.[146] **කෙලෙස් ප්‍රහීණ නොකළ, අගතිග ාමී විය හැකි පුද්ගලයන් සතර දෙනෙකි. ඔවුන් සරාග, සදොස, සමොහ, සමාන පුද්ගලයන් ලෙස හඳුන්වන පුග්ගල පඤ්ඤත්තිය සමානී පුද්ගල ලෙස දැක්වූයේ මානය ප්‍රහීණ නොකළ පුද්ගලයා ය. කෙලෙස් බර ගතිය පුද්ගලයා අගතීන්ට පොළඹවයි.** සිගාලෝවාද සූත්‍රයට අනුව

145 ම.නි. 1, පි.31 - 35; ධම්මදායාද සූත්‍රය. ථෙර, පි.155.

146 ම.නි. 1, පි.31 - 35 ධම්මදායාද සූත්‍රය.

ඡන්දයෙන් අගතියට යාම,

ද්වේෂයෙන් අගතියට යාම,

මෝහයෙන් අගතියට යාම,

භයින් අගතියට යාම,

යනුවෙන් අගති සතරකි.

සතර අගතීන්ට පුද්ගලයා යොමු වන්නේ වරද, නිවරද හඳුනා ගැනීමේ අපහසුතාව නිසා ය. දුප්පටි විනෝද සූත්‍රය[147] ඉතා දුක සේ දුරලිය යුතු යයි දක්වන කරුණු පහකි. ඒ පහ සිතෙහි ඇති වූ කල ඉවත් කිරීම ඉතා දුකින් ම කළ යුත්තේ ය. රාගය නිසා කැමැත්තෙන් ම තමාට අහිතවත් දෑ කිරීමට පුද්ගලයා පෙළඹේ. වස්තු තණ්හාව මිනිසා කැමැත්තෙන් විවිධ දුශ්චරිතයන් කරා යොමු කරවයි. පුග්ගලප්පසාදය ද ඒ ඒ පුද්ගලයන් කැමැත්තෙන් වරදට යොමු කරවති. ස්වකීය පක්ෂයට ජයග්‍රහණය ලබාදීම සඳහා ඕනෑ ම වරදක් කිරීමට පුද්ගලයන් පෙළඹෙන්නේ එහෙයිනි. ද්වේෂය ඇති වූ කල්හි[148] පළිගැනීම කළ යුත්තක් ලෙස පෙනෙන්නට පටන් ගනී. ඒ සඳහා විවිධ උපක්‍රම ද භාවිත කෙරේ.

අසුවලා මට සතුරුකම් කළේ ය.

අසුවලා මගේ හිතවතාට සතුරුකම් කළේ ය.

අසුවලා මගේ සතුරාට උදව් කළේ ය.

යනුවෙන් සිතන්නට පෙළඹීමත් සමඟ ඡන්දය, ද්වේෂය, මෝහය හා භය පුද්ගලයා දවටා ගනී. පුද්ගලයා වෙලා ගනු ලබන ඒ ගිනි දැල් අතීතය ගැන පමණක් නො ව, වර්තමානය හා අනාගතය පිළිබඳ ව ද නැවත නැවත මතු වී පෙනෙන්නට පටන් ගැනීමෙන් නව ආකාර ආඝාතයන් පුද්ගලයා කෙරෙහි පහළ

147 අ.නි. පි., පි.357 - 361; ආරක්ෂක සූත්‍රය. අ.නි. 3, පි.357.

148 අ.නි. 3, පි.301; දුප්පටිවිනොදය සූත්‍රය.

වේ. වෛරය බුර බුරා නැගීමෙන් මැරෙන බව නොදන්නවුන්[149] සේ කටයුතු කරන මිනිසුන් අධර්මචාරී විෂමාචාරවල යෙදෙත්. පුද්ගලයාගේ නිදහස හා වගකීම තහවුරු කර ගැනීම සඳහා පවත්නා ජාති, කුල, ගෝත්‍ර, ආගම් වැනි සංස්ථා පුද්ගල විනාශයන් කරා යොමු කරවන්නේ නම් එවැනි සංස්ථාවන් ගේ මූලික ප්‍රතිපත්තීන්හි දෝෂ පවතින බව සලකා ඒවා දුරින් දුරු කළ යුතු වේ.[150]

තනතුරු සඳහා පත්වන්නන් තුළ තිබිය යුතු ලක්ෂණ පහක් දේශනා කළ තථාගතයන් වහන්සේ ඉන් මුල් ලක්ෂණ හතර ඡන්ද, ද්වේෂ, භය, මෝහ නම් වූ සතරින් වෙන්වීම බවත්, පස්වැන්න කාරණා කාරණා දැන ගැනීමෙහි ලා පවතින දක්ෂතාව බවත් පැවසූහ. මෙම ලක්ෂණය නො අඩුව ඒ ඒ තනතුරු පිළිගත් භික්ෂූන් කෙරෙහි පැවතියේ දැයි සලකා බලා භික්ෂු සම්මතයෙන් ම තනතුරු සඳහා පුද්ගලයන් පත් කරනු ලැබිණ.[151]

සෙනසුන් පැනවීම හා බත් උදෙසීම සඳහා භික්ෂු සම්මතයෙන් පත් වූ දබ්බමල්ල තෙරුන් රහත් වූයේ උපතින් සත්වැනි වියෙහි දී ය. උන්වහන්සේ සතර අගතියෙන් තොර ව ස්වකීය කාර්යය ඉටු කළේ වී නමුත්, මෙත්තියභූම්මජක නම් දුශ්ශීල භික්ෂුවට මගේ ගෙයි දානය නොසුදුසු යයි සැලකූ කල්‍යාණ භත්තික නම් දායකයාගේ නියමය නිසා උන්වහන්සේ කෙරෙහි සැකයක් හා වෛරයක් මෙත්තියභූම්මජක භික්ෂුව තුළ හට ගැනිණ. මෙත්තියභූම්මජකගේ මෙහෙයවීමෙන් මෙත්තියා මෙහෙණ, දබ්බමල්ල තෙරුන් තමා දූෂණය කළ බව තථාගතයන් වහන්සේට සැල කළා ය.

එවැන්නක් තමන් උපන් දා සිට සිදුවූයේ යයි සිහිනෙන්වත් සිහි නොකළ හැකි බව පැවසූ දබ්බමල්ල තෙරුණුවන්ට සති

149 අ.නි. 3. බි. 303 - 390. ජා.පො., පි.313 - 314.

150 ජා.පො., පි.315. ධ.ප, 1 - 5, යමක වග්ග. ථෙර., පි.143, මහා කච්චායන ගාථා අංක 498.

151 අ.නි. 3, පි.447; පඨමජඣාන සූත්‍රය. අ.නි. 3, පි.449 -453; අ.නි. 3, පි.419.

විනය සම්මත කළ භික්ෂූහු, මෙත්තියා මෙහෙණ සිවුරු හැර වූහ.[152] පසු ව මෙත්තිය භූම්මජක ඒ තමාගේ මෙහෙයවීමෙන් සිදුවූවක් බව පැවසූයේ නමුත් මෙත්තිය මෙහෙණියට ඉන් පිළිසරණක් නොලැබිණ. නිදොස් පුද්ගලයන් වෙත අගතිගාමී ව එල්ල කරන චෝදනාවලට වගකීම තමා වෙත පැවරෙන බව චෝදනා එල්ල කරන පිරිස විසින් කල් තබා දැනගත යුතු ය. පරහට චෝදනා කරනු කැමැති, චෝදක භික්ෂුව ධර්ම පසක් තමා වෙත එලවා ගැනීමෙන් අනතුරු ව ම එසේ කළ යුතු බව චෝදනා සූත්‍රය,[153] දක්වයි. **නිසි කාලය, සත්‍යය, මොළොක් බස, අර්ථ සහිත බව හා ද්වේෂයෙන් තොර වූ මෙත් සිත යන ගුණ තමන් වෙත පවතින කල අගතිගාමී නොවේ.**

සිගාලෝවාද සූත්‍රයේ දැක් වූ භෝග විනාශ මුඛ මෙතැන් සිට සලකා බැලීම සුදුසු වන්නේ පුද්ගලයා විසින් බාහු බලයෙන් හා උට්ඨාන වීර්යයෙන් උපයා ගනු ලබන ධනය විනාශය කරා යොමුවන, යොමු කරවනු ලබන විවර සයක් ඇතැයි තථාගතයන් වහන්සේ දක්වන ලද බැවිනි. මහානාම ලිච්ඡවි රජ, ලිච්ඡවි කුමාරවරුන්ට[154] අවවාද දෙන්නැයි තථාගතයන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ ලිච්ඡවි කුමාරවරු චණ්ඩ ලෙස හැසිරෙමින්, යුතුකම් පැහැර හරිමින් ක්‍රියා කළ නිසා ය. 'වජ්ජීන් වැඩෙති', 'ලිච්ඡවීන් පිරිහෙති'යි ඔහු කීය. භෝග සූත්‍රයට අනුව අග්නි, උදක, රාජ, චෝර හා අප්‍රියයනට සාධාරණ වූ භෝගයන් කෙරෙන් යම් කිසිවකු ප්‍රයෝජනයක් ගන්නේ නම් ඒ තමාත් සුවපත් වී අන්‍යයන් ද සුවපත් කරවීම සඳහා ය. මස්, මාංශ කෑම බීම සඳහා පමණ ඉක්මවා වියදම් කරන, අරපරෙස්සම් නැති පුරුෂ ලෝල, ස්ත්‍රී ලෝල, සුරා සූදු ලෝලයන් ප්‍රධානත්වයෙහි තැබීම නිසා ලැබෙන ලැබෙන ධනය විනාශයට[155] පත්වන බව

152 චූ.ව. 2, පි.227 - 237;

153 චූ.ව. 1, පි.341 - 349; දැහැමි සති විනය සඳහා -එම- පි.351. චූ.ව., 2, පි.469 - 537.

154 අ.නි. 3, පි.319 - 324; චොදනා සූත්‍රය.

155 -එම- පි.120 - 124; ලිච්ඡවී කුමාර සූත්‍රය හා -එම- පි.421; භෝග සූත්‍රය.

සලකන නුවණැති පුද්ගලයා, නම් වූ මත්පැන් පානය, නොකල්හි වීථි සංචාරය, නෘත්‍ය ගීතාදිය නිතර නිතර බැලීමට යාම, සූදුව, පාපමිත්‍ර සේවනය හා අලසකම නම් වූ භෝග විනාශ මුඛ[156] දොරටු වසා අර්ථ සංරක්ෂණය සඳහා සුදුසු ක්‍රියාමාර්ග කෙරෙහි සිත යොමු කරවයි. මහා මංගල සූත්‍රයේ 'අනාකුලාච කම්මන්තා' යනුවෙන් දෙශනා කළ නිරවුල් කර්මාන්තයෙහි නිරතවීමෙන් නියත ආදායමක් ලැබීමත්, සිතෙහි සැනසීම පවත්වා ගැනීමත් පහසු කරයි. ගිහියන් ගේ මෙලොව ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා කරුණු විමසුවන්ට එහි ලා විවිධ උපදෙස් දුන් තථාගතයන් වහන්සේ ව්‍යග්ගපජ්ජ හා සිගාලෝවාද සූත්‍රවල දී කරුණු සතරක් අවධාරණය කළ හ.[157] උට්ඨාන සම්පත්තිය, ආරක්ඛ සම්පත්තිය, කල්‍යාණ මිත්තතා හා සමජීවිකතා එකී කරුණු සතර ය. අර්ථ සංරක්ෂණය අර්ථයෙන් එකී කරුණු සතර බලන්නේ නම්, උත්සාහයෙන් ධනය ඉපැයීම, උපදවා ගත් ධනය ආරක්ෂා කර ගැනීම, කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීම හා අය වැය සමව පවත්වා ගැනීම යනුවෙන් විග්‍රහ කළ හැකි ය. අලසකම නිසා දැන් ඉතා සීතලයි, ඉතා උෂ්ණයි, ඉතා උදයය, ඉතා සවස් විය. බඩගිනිය, බඩ පිරුණේය ආදී වශයෙන් කර්මාන්තයන්හි යෙදීම පැහැර හරින මිනිසුන්ට අර්ථ සම්පත්තිය ළඟා නොවේ. කුමන සේවාවක යෙදෙන්නකු වුව එහි දියුණුව අපේක්ෂා කළ යුත්තේ ක්‍රියාශීලී වීමෙනි. අර්ථ සංරක්ෂණය සඳහා ප්‍රඥා ගෝචර ලෙස ධනය වියදම් කිරීම හා තැන්පත් මුදලක් පවත්වා ගැනීම සහ ආදායම් මාර්ග යොදා ගැනීම අවශ්‍ය ය. කෙනෙකුට හැමදා ම ධනය ඉපැයිය නොහැකි ය. දිගට ම අය මාර්ග ඒකාකාර අන්දමින් පවත්වා ගැනීම ද අපහසු ය. ලැබෙන ලැබෙන ආදායම් වියදම් කරමින් ඒකාකාර තත්ත්වයන් අපේක්ෂා කරන්නහුට බලාපොරොත්තු රහිත මොහොතක පැමිණෙන හදිසි ආපදාවකට මුහුණදීම ඔරොත්තු නොදෙනු ඇත. ආදායමෙන් හතරෙන් එක්

---

156 සු.නි. පි.35 - 36 (ගාථා අංක 106, 112), පරාභව සූත්‍රය.

157 දී.නි. 3, පි.296 දී.නි. 3, පි.293, ජා.පො. පි.151 - 152, දී.නි. 3, පි.295.

කොටසක් පමණක්[158] පෞද්ගලික විය පැහැදම් සඳහා යොදා ගන්නා ලෙස තථාගතයන් වහන්සේ දක්වූ උපදේශය මෙහි දී වැදගත් ය. ඒ ඒ කර්මාන්ත දියුණු කිරීම සඳහා කොටස් දෙකක් ද, එක් කොටසක් ආපදාවක දී යොදා ගැනීමට ආරක්ෂා කළ යුතු බව ද උන්වහන්සේගේ මඟපෙන්වීම විය. කෙනෙකුගේ අර්ථ සංරක්ෂණය සඳහා මිත්‍රයා කොතරම් වැදගත් ද යන්න[159] මිත්‍රයන් හා මිත්‍ර ප්‍රතිරූපකයන් පිළිබඳ ව විස්තර කළ තැන්වල දී පැහැදිලි කළ හ. අංක තුනකින් යුක්ත මිත්‍රයා සේවනය කළ යුතු බව තථාගතයන් වහන්සේ දක්වූහ. දිය නොහැකි දේ දෙන්නා වූත්, කළ නොහැකි දේ කරන්නා වූත්, සමාව දිය නොහැකි දෙයට සමාව දෙන්නා වූත් මිත්‍රයා[160] ආශ්‍රයට සුදුසු උතුම් මිත්‍රයා බව ඉන් පැහැදිලි කරන ලදි. මිත්‍රයන් ලෙස පෙනී සිටින මිත්‍ර ප්‍රතිරූපකයන්[161] සතර දෙනකු වන බවත්, ඔවුන් හඳුනා ගත හැක්කේ කුමන ගති ලක්ෂණ අනුව ද යන්නත් සිගාලෝවාද සූත්‍රය පැහැදිලි කර තිබේ.

අඤ්ඤදත්‍ථුහර කෙසේ හෝ යමක් පැහැර ගැනීමට ම පැමිණෙන්නෙකි. නැතහොත් මද දෙයක් දී විශාල ලෙස යමක් බලාපොරොත්තු වන්නෙකි. තමන්ගේ විපතේ දී මිතුරා ඇසුරු කරන ඔහු, තමන්ගේ ම ප්‍රයෝජනය සඳහා පමණක් මිතුරුකම පවත්වා ගනී. හිරි සූත්‍රය[162] මෙම කරුණු අවධාරණය කරයි. වචීපරම මිත්‍රයා සියලු උදව් කරනුයේ වචනයෙනි. තමන්ට අවස්ථාව ලැබුණේ නම් කරන දේ කියා පාමින් වචනයෙන් ම සංග්‍රහ කරයි. ඉදිරි කාලයේ දී කරන උපකාරය ද දන්වයි. හිස් කතාවෙන් ම සංග්‍රහ කරන ඔහු කටයුත්තක් පැමිණි කල්හි බිය පෙන්වා මග හරී. නරක දේත්, හොඳ දේත් නියත ලෙස ම

158 දී.නි. 3, පි.297, ජා.පො., පි.131 - 133, දී.නි. 3, පි.311.

159 දී.නි. 3, පි. 302. ථෙර, පි.143, ගාථා අංක 499.

160 දී.නි. 3. පි.303 දී.නි. 3, පි.301.

161 ජා.පො., පි.154 - 156, කාලකණ්ණි ජාතකය. ජා.පො. පි.388. ජා.පො., පි.374.

162 දී.නි. 3, පි.299; සිගාලක සූත්‍රය.

අනුමත අනුපියභාණී මිතුරා ඉදිරියට ගුණ කියතත් නැති තැන, මිතුරාගේ දොස් කියන්නෙකු බව වටහා ගත යුතු ය. අපාය සහාය මිතුරා මත්පැන් බීම, නොකල්හි වීථි සංචාරය, නෘත්‍ය දර්ශන බැලීම හා සූදුව යන ධන විනාශ වන අපායගාමී කටයුතුවලට ම හවුල් වන්නෙකි. උපකාර, සමාන සුඛ දුක්ඛ, අත්‍ථක්ඛායි සහ අනුකම්පක නම් වූ ඇසුරු කළ යුතු වූ මිත්‍රයන් සිව්දෙනා කල්‍යාණ මිත්‍රයන්[163] සේ සැලකිය යුත්තා හ. මිත්‍රයාගේ දියුණුව සලසන, විපතේ දී අත් නොහැර ඔහු රකින මිතුරෝ ඔවුහු ය.

ස්වඡන්දතා ගුණය ඒ ඒ පුද්ගලයන්ගේ ජීවිතාන්තය දක්වා පවත්වා ගත හැකි වන්නේ ප්‍රකෘති ගුණය වනසන කරුණු තුනකින් ඉවත් වීමට පුද්ගලයාට ශක්තිය ඇති වුවහොත් පමණකැයි යන්න, උගුලට අසුවූ වාතමෘග[164] පිළිබඳ කතාවෙන් පැහැදිලි වේ. **පවනට බඳු වේග ඇති වාතමෘග නම් මුවා මිනිසෙකු දුටුවහොත් ඒ අසලට සත් දිනක් නො එන බව කියති. එහෙත් මීපැණි මිශ්‍ර තණ වැළඳූ මුවා රස තෘෂ්ණාව හේතුවෙන් තමා නොදැනුවත් ව ම මිනිසාගේ බන්ධනයට හසුවිය. උපාය සම්පන්න මිනිසුන්ට කළ නොහැකි අපරාධයක් නොමැති හෙයින් පුද්ගලයා ස්වකීය ආරක්ෂාව සලසා ගැනීම සඳහා රසය, නිබඳ වාසය හා මිත්‍ර භාවය යන කරුණු කෙරෙහි ඉතාමත් සැලකිලිමත් විය යුතු ය.** අවවාදයෙහි පිහිටීම නිසා විපත්වලින් මිදීමට අවශ්‍ය නුවණ, ගුරු උපදේශයෙන් ලැබිය හැකි බව බරාදිය, තිපල්ලත්‍ථ මිග ආදී ජාතක කතාවලින්[165] පුද්ගලයාට අවධාරණය කෙරේ. විපතින් මිදීම සඳහා අත්දැකීමත්, නුවණත්, උත්සාහයත් පුද්ගලයාට අවශ්‍ය ය. එහි දී අවශ්‍ය විශේෂ බුද්ධිය ගුරු උපදේශයෙන් හා කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් හෝ ලැබිය හැකි ය.[166] ජීවිත පරිත්‍යාග යෙන් කටයුතු කරන්නෙකුට ශූර කෘත්‍යයක් කළ හැකි ය. ඔහුගේ බලය ඉතා උසස් ය. ජීවිතාශාව ඇත්නම් එබඳු උදාර

163 පු.නි., පි.79; හිරි සූත්‍රය, පු.ප., පි.291.

164 දී.නි. 3, පි.301; සිගාලක සූත්‍රය. පු.ප., පි.291. අ.නි. 2, පි.425 - 429.

165 ජා.පො., පි.29 - 30, වාතමිග ජාතකය.

166 ජා.පො. පි.30 - 35.

කටයුත්තකට සිත නොනැමේ. 'නහි ජීවිතෙ ආලයං තුබ්බමානො - සුරො කයිරා සර කිච්චං කදාමි,' යනුවෙන් බරප්ප ජාතකය[167] දෙන උපදේශ ස්වඡන්දතා ගුණය වඩව යි. සංයුත්ත නිකායේ සකුනගඝි සූත්‍රය,[168] අගෝචර වූ මෙරමා විෂයයෙහි නොහැසිරිය යුතු බවට අනතුරු හැඟවීමක් කරයි. පඤ්චකාම ගුණයෙහි හැසිරීමෙන් මරුගේ අරමුණට ළංවෙන බව, මෙරමා විෂයයෙහි හැසිරීම නම් වන හෙයින් පුද්ගලයා; රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නම් වූ කාම වස්තූන් කෙරෙහි නුවණින් ක්‍රියා කළ යුතු වේ. පිය සතු විෂය නම් වූ සතර සතිපට්ඨානයන්හි ඇලීමෙන් සිහිය පවත්වා ගත හැකි ය. කැටකුරුල්ලා ස්වකීය විෂයයෙහි දී බලවත් ගිජුළිහිණියාට පවා අභියෝග කිරීමටත්, බලවත් වූ ගිජුළිහිණියා විනාශ කිරීමටත් අවකාශ ලද බව, නිදහස හා වගකීම අගය කරන සැමට වැඩදායි වේ. තමා පිහිට කොට, මෙරමා පිහිට නොකොට, තමා සරණ කොට, සදහම් සරණ කොට, අනෙකෙක්ගේ පිහිට නොපතන අයට සතර සතිපට්ඨානය අනුව යාමෙන් ශික්ෂාකාමී විය හැකි බව චුන්ද සූත්‍රය[169] සඳහන් කරයි. කඩු ගත් පුරුෂයෙක් හිස පළන්නෙමැයි කඩුව අමෝරා ගෙන පිටුපසින් එද්දී, මුව දක්වා පිරුණ තෙල් බඳුන, මහජනයා අතරින් ගෙන යා හැක්කේ සිහිය පිහිටුවා ගත් අයකුට පමණි.[170] ස්වඡන්දතාව අවශ්‍ය වනුයේ තමා හා මෙරමා යන දෙපස ම රැකීමට ය. සෙදක සූත්‍රයේ[171] එන පරිදි, අතවැසියා අමතා, "තෙපි මා රකිවු, මා තෙපි රකිමි", යි ප්‍රති උත්තර දුන් අතවැසියාත් යන දෙදෙනා ම එක් අතකින් නිවැරදි වෙති. අනෙක් අතින් එවුන් දෙදෙනා ම වැරදිකරුවෝ වෙති. ඒ දෙදෙනා ගේ ම අදහස් කැටි කොට ගන්නා බුද්ධිමත් පුද්ගලයෙකුට තථාගතයන් වහන්සේගේ උපදේශය ඉතා අගනේ ය. **"තමා රකින්නෙමි"යි සිහිය පිහිටුවා ගැනීමත්, "මෙරමා රක්නෙමි"යි සිහිය පිහිටුවා** ගැනීමත්, යන

167 ජා.පො., පි.38 - 45.

168 ජා.පො., පි. 529 - 531.

169 ස.5-1; පි.269. ජා.පො., පි.461 - 418.

170 ස.5-1, පි.293 - 295; චුන්ද සූත්‍රය.

171 ස.5-1, පි.305; ජනපද කල්‍යාණි සූත්‍රය.

දෙක ම ස්වඡන්දතාව මත ක්‍රියාකාරී වන පුද්ගලයාට අවශ්‍ය ය. **තමා රැකිය යුත්තේ කමටහන් වැඩීමෙනි. බහුල කිරීමෙනි. අනුන් රැකිය යුත්තේ ඉවසීම, කරුණාව, මෙත් සිත හා මුදු බැවිනි. "තමා රක්නේ මෙරමා රකී, මෙරමා රක්නේ තමා රකී,"** යන්න නිදහස හා වගකීම වටහා ගත් පුද්ගලයන් ගේ තේමා පාඨය විය යුතු ය.

**"චක්ඛුමාස්ස යථා අනෙධා - සොත වා බධිරො යථා,**

**පඤ්ඤවාස්ස යථා මූගො - බලවුදුබ්බලොරිව,**

**අත අත්‍ථෙ සමුප්පන්නේන - සයෙථ මතසායිකන්ති."**[172]

යනුවෙන් කීවේ එයයි. ජනපදකල්‍යාණී සූත්‍රයට අනුව මෙම ඉගැන්වීම ස්වච්ඡන්දතාව පිළිබඳ ථෙරවාද න්‍යායාත්මක භාවිතය කුමක් ද යන්න මනාව පැහැදිලි කර ඇත.

172 එම - 5-1 පි 355.

තෙවන පරිච්ඡේදය

# නිදහස, සමානාත්මතාව හා පරමාදර්ශී මනෝභාවයන්හි ප්‍රායෝගික හරය

මිනිසාගේ විමුක්තිය අවුරනු ලැබූ නිර්මාණවාදී සංකල්පය[1] බැහැර කිරීමත්, මිනිස් සමානාත්මතාව යටපත් කළ කුලවාදී සම්මුතීන් බිඳ දැමීමත්, බුදුදහම නිදහස හා සමානාත්මතාව සඳහා මිනිස් ඉතිහාසයේ තැබූ ශ්‍රේෂ්ඨතම පියවර විය. ඒ ක්‍රිස්තු පූර්ව සවන ශත වර්ෂයේ දී ය. හේතු ප්‍රත්‍ය සම්බන්ධතාව පදනම් කොට ගෙන බුදුදහම ඉදිරිපත් කළ 'මිනිසාගේ මැවුම්කරු මිනිසා ම ය', යන මතය කාලීන පිළිගැනීම් සියල්ල කෙරෙහි මිනිසාගේ සිත පුබුදුවාලීමට මෙහි දී සමත් විය.

නිත්‍ය නොවන සම්මුති සත්ත්වයකු කෙරෙහි එතෙක් පනවනු ලැබූ, 'පරමාර්ථ' තත්ත්වය මිථ්‍යාවක් බවත්; හටගැනීම, පැවැත්ම හා විනාශවීම යන ධර්මතාවන්ට යටත්වන මිනිසා නිදහස හා සමානත්වය ගරු කරමින් සියලු ප්‍රාණීන් කෙරෙහි සමානාත්මතාව නම් වූ මෙත් සිත පැතිර විය යුතු බවත් අවධාරණය කළ බුදුදහම, කාමසුඛල්ලකානුයෝගී ජීවිතය[2] වෙනුවට ස්වාර්ථය සලසා ගැනීමෙන් අගතිගාමී නොවන ආකාරය පැහැදිලි කළේ ය.

පුද්ගල නිදහස හා පුද්ගල සමානාත්මතාව කැපී පෙනෙන්නේ සමස්ත සමාජය ම පුද්ගලයා කේන්ද්‍ර කොට ගත් සමාජ සම්මුතියක් බව පිළිගත් හෙයිනි.[3]

---

1 එම - 5-1 පි 355.

2 එම - 5-1 පි 356.

3 එම - 5-1 පි 358.

සමාජය සතු නිෂ්පාදන ක්‍රියාවලිය හා නිෂ්පාදනය සැමට සමාන ව බෙදී යා යුතු බව පිළිගැනීම එහි සූරා කෑමට හෝ බලයට (හා බලවතාට) හෝ තැනක් නොලැබේ.

පාලනය පුද්ගලයා සතු වූවක් නොව ධර්මය (ප්‍රතිපත්තිය) විසින් ක්‍රියාත්මක කරවනු ලබන්නක් විය යුතු බව බුදුදහම අවධාරණය කරයි.[394]

**දසරාජ ධර්මය නම් වූ පාලන ධර්ම, චක්‍රවර්තී රාජ්‍ය සංකල්පය නම් වූ රජකු සතු විය යුතු දැහැමින් අණසක පැවැත්වීම බුදුදහම පිළිගනී.**[4] භෞතික අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සලසා, ඉන් අනතුරු ව මානසික නිදහස හා තෘප්තිය ලබා දීමට මිනිසා මධ්‍යස්ථ ප්‍රතිපත්තීන් ඔස්සේ හැඩගසන බුදුදහම, විනීත සංවර සමාජයක් අපේක්ෂා කරයි.

දස කුසල් හා දස පින්කිරියවත් මගින් අර්ථවත් සමාජ ජීවිතයක් ඔස්සේ හැඩ ගැසෙමින් ලබන මානසික ශික්ෂණය තුළින් ආධ්‍යාත්මික විමුක්තිය නම් වූ පූර්ණ නිදහස ලබාදීම **බුදුදහම දක්වන සමාජයීය හා දේශපාලන දර්ශනය වේ.** විරාගය එකී මාර්ගයේ අවසානය බැවින් තෘෂ්ණාවට ගිජු වූ සමාජයක් හෝ පන්ති භේදයක් බුදුදහම අනුමත නොකරයි.

බෞද්ධ සංඝ සමාජය සංස්ථාවක් ලෙස හැඩගැස්වීමෙහි ලා බලපෑ සාධකය වූයේ පොදු අයිතිය හා පොදු යහපත සඳහා පුද්ගලයා ස්වකීය යුතුකම් කොටස ඉටු කළ යුතු ආකාරය පිළිබඳ ආකල්පයන් වගා කරවීම ය. එහි දී නූතන චින්තකයන් හඳුන්වන 'පුද්ගලාර්ථවාදී' අදහස වෙනුවට සාමූහික බව, නිදහස හා සමානත්වය අගය කිරීමට සුදුසු චින්තන පරිසරය ගොඩනග නු ලැබී ය.

සාමාන්‍ය ව්‍යවහාරයේ දී ස්වාධීනත්වය පිළිබඳ ව දී ඇති අර්ථකථනයන්ට අනුව;

4 ඉ.දා.2, පි.298 - 303. ඉ.දා.1, පි.302 දී.නි. 3, පි.203 - 205. අ.නි. 3, පි.249.

(අ) පුද්ගලයා තමන්ගේ සිතුවිලි, වචන, ක්‍රියාකාරකම් සඳහා, රජය බාහිර පුද්ගලයන් හා ආයතනයන්ගේ බාධා කිරීමකින් තොරව,[5] පෞද්ගලික ආශාවන් පරිදි ක්‍රියාකිරීමේ හැකියාව ලබාදීම;

(ආ) සාමාන්‍ය අපරාධ නීති, අපහාස කිරීම් පිළිබඳ නීති රීති මගින් පුද්ගල සමතාවක් බිහි කිරීම;[6] අනිවාර්ය අධ්‍යාපනය,[7] කර්මාන්තශාලා නීති ආදී පෞද්ගලික දියුණුවට අදාළ දෑ මගින් පුද්ගල අවස්ථා බිහි කිරීම සඳහා සුදුසු නිර්ණයන් කිරීම;

යන අංශ දෙක කෙරෙහි පුද්ගලයාගේ අවධානය යොමු කරවනු ලැබේ.

එහෙත් පුද්ගලයාගේ නිදහස හා සමානත්වය කෙරෙහි සිත මෙහෙයවා අදහස් දක් වූ විවිධ චින්තකයන්ගේ කල්පනා ඒකාකාරී නොවී ය. ඔවුන් විසින් ඉදිරිපත් කළ සංකල්ප විවිධ විය.[8] සමාජයේ යහපත හා ශුභ සිද්ධිය සඳහා වන සාමාජික අවශ්‍යතාවනට බාධා එල්ල නොවීම 'ස්වාධීනත්වය' ලෙස අර්ථ දක්වීමට ඇතැම් චින්තකයන් කැමති වූ අතර, 'ස්වාධීනත්වය' යනු අධිපාලනයේ විරුද්ධ පැත්ත බවට අන් අය අදහස් දක්වූහ.

පෞද්ගලිකත්වය ආරක්ෂා වන ලෙසින් කටයුතු කිරීම සඳහා, පරිසරයේ ආරක්ෂා සහිත බව ඇති කිරීමේ වැදගත්කම කෙනෙක් අවධාරණය කළහ.[9] සියලු ආකාර පාලනයන්ගෙන් ඉවත්වීම වෙනුවට යුක්තියට නොගැළපෙන්නන් මර්දනය කොට, යුක්තියට ගැළපෙන්නන් පත්කිරීම සඳහා පුද්ගලයාට හිමි අයිතිය, 'ස්වාධීනත්වය' ලෙස කෙනෙක් කරුණු ඉදිරිපත් කළහ.

5 දී.3, පි.217 - 221; පාසාදික සූත්‍රය.

6 දී.3, පි.157 - 161; අග්ගඤ්ඤ සූත්‍රය.

7 ම.නි. 3, පි.103 - 107 ගොපක මොග්ගල්ලාන සූත්‍රය. ම.නි. 3, පි.105.

8 අ.නි. 3, පි.243 - 245. බ.ද., පි.656

9 -එම- පි.654 - 655 -එම- පි.111 -එම- පි.111 - 121 -එම- පි.120 ප්‍රජාතන්ත්‍රවාදය -එම- පි.67, 89, 213.

මේ සියලු චින්තකයන් ම ස්වකීය අත්දැකීම් නම් වූ (කාලීන ව තම තමන්ගේ රටවල සිදු වූ දෙයින්) දැනීමෙන් හා දැකීමෙන් කරුණු ඉදිරිපත් කළ බවට විශ්වාස කළ හැකි කරුණු එමට ය.[10]

ඇතැම් චින්තකයන් විසින් 'නිදහස හා සමානත්වය' පිළිබඳ ව පැවසූ අදහස් ඒ ඒ රටවල පැවති නිදහස් ව්‍යාපාරයකට මුල් වූ බව ද මෙහි දී සිහිපත් කළ යුතු ය. 1668 දී සිදු වූ එංගලන්ත විප්ලවය, 1776 දී අමෙරිකාව බ්‍රිතාන්‍යය පාලනයෙන් නිදහස්වීම, 1789 දී සිදු වූ ප්‍රංශ විප්ලවය මෙහි ලා දැක්විය හැකි වැදගත් සන්ධිස්ථානයෝ වෙති.[11]

"ද්‍රව්‍යමය තාක්ෂණික තීරණය වන දේවල් නමැති ගැඹුරු ජලයේ මතුපිට පෙනෙන පෙනකැටි; සංකල්ප වන්නේ ය." යනුවෙන් සංකල්ප පිළිබඳ ව බර්ට්‍රන්ඩ් රසල් දක්වන අදහස මඳක් විමසා බැලීම වටී.[12] යම් යම් දෑ පුද්ගලයාට දැනෙන්නේ පුද්ගලයා තුළ පහළ වන සංකල්ප නම් වූ මනෝ විඥ්ඥාණයෙනි. එහෙයින් සංකල්පයන්ගේ එක් රැස්වීම දැනීම යයි කියති.

දැනීම සඳහා තර්කනය, විචාරය, ජීවන අත්දැකීම, චිත්තෝත්පාදනය ආදී විවිධ ක්‍රියාමාර්ග පවතින හෙයින් ඒ නිරතුරුව ම සත්‍යය හා අසත්‍යය යන සීමා දෙක අතරතුර පවතින්නකි. සංකල්ප,[13] සත්‍යය හා එකතු වන්නේ නම් එහි අගයක් පවතී. අසත්‍යයට බර වූ සංකල්පයක පැවති තාවකාලික අගය සත්‍යය නමැති උර ගලෙහි ගා ගැනීමේ දී, හරයක් නොමැති, නොවටිනා පුස්සක් බවට පත්වෙයි. සාවද්‍ය හෝ මිථ්‍යාමය කරුණකින් පටන් ගත් සංකල්පයක්, ප්‍රතික්ෂේප වීම හෝ හුදු විශ්වාසයක් බවට පත්වීම හෝ නොවැළැක්විය හැකි ය.

---

10 බ.ද., පි.683 - 690.

11 පු.නී., පි.319. බ.ද., පි.159 - 160.

12 ජ.ස., පි.6. බ.ද., පි.767 - 769 බ.ද., පි.826 - 828 -එම- පි.767 -එම- පි.828. බ.ද., පි.632.

13 බ.ද., පි. 603 - 608. -එම- පි.606 -එම- පි. 608. සු.නි., පි.80, ගාථා අංක 262.

විලියම් ජේම්ස්[14] දක්වා ඇති අන්දමට, 'සැබෑ අදහස් අප විසින් ම ජීර්ණය කර ගත හැකි, සැබෑ කළ හැකි, සැබෑ බව ඔප්පු කළ හැකි, ස්ථිර කළ හැකි ඒවාය.' හේතුන් හා ඵලයන් අතර පවතින සැබෑ බන්ධනය හරි හැටි වටහා ගැනීමෙන් යථා තත්ත්වය ග්‍රහණය කළ හැකි ය. ඇත්ත ඇති සැටියෙන් අවබෝධ කර ගැනීම සඳහා ලෝකයේ සියලු ම චින්තකයන් දැරූ උත්සාහය නිවැරදි දැනීම නම් වූ සත්‍යය සඳහා ම වූ බව ඉහතින් දැක් වූ කරුණු අනුව පෙනේ. එහෙත් බොහෝ චින්තකයන්ට ඒවායේ සැබෑ වැදගත්කම් හසු නොවූ ආකාරය, ඔවුන් සංකල්පනික ව සිතා පිළිගත් දේවල් ගැන සැලකීමේ දී තේරුම් ගත හැකි ය. සංකල්පය, සංකල්පය විසින් ම විනශ්චය කිරීම ඊට හේතු වන්නට ඇත.

"ස්වභාව ධර්මයා විසින් පරම හා ශික්ෂණය කළ නොහැකි අවශ්‍යතාවක අනුසාරයෙන් අපට හුස්ම ගැනීමට, හැඟීමට මෙන් ම විනිශ්චය කිරීමට ද නියම කරනු ලැබ තිබේ," යයි පවසන හියුම්, අප අවදිව සිටින තාක් කල් චින්තනය කිරීමෙන් වැළකිය නොහැකි බවත්, තර්කනය චිරාගත සම්ප්‍රදායක් හා බැඳී පවතින අතර, වඩාත් බලවත් වූත්, තර්කනය වූත් ආලෝකයක් ලබාදීමට ඉවහල් වන බවත් සඳහන් කරයි.[15] මෙම අදහස රාධක්‍රිෂ්ණන් මහතා ඉදිරිපත් කරන්නේ, 'සෑම චින්තන ක්‍රමයක ම කාලීන ලක්ෂණ පිළිබිඹු වන හෙයින් යම්කිසි චින්තන ක්‍රමයක් ලෝකය දෙස බැලූ දෘෂ්ටි කෝණය තේරුම් ගැනීමට, එකී චින්තන ක්‍රමයට පසුබිම් වූ චින්තන රටාවන් ද තේරුම් ගත යුතු වේ." යන වචනවලිනි.[16] "මනුෂ්‍ය වර්ගයා වෙත සහජයෙන් හා ස්වභාවයෙන් සියලු යටත් භාවයන්ගෙන් නිදහසක් හිමිවන්නේ ය" යන සංකල්පයෙහි පිහිටා, තමන්ට අභිමත කවර ආණ්ඩු ක්‍රමයක් හෝ තෝරා ගැනීමට පුද්ගලයාට නිදහස තිබීමත්, යම්කිසි තනි පුද්ගලයෙකු වෙත සෙස්සන් කෙරෙහි බලය

14 බ.ද., පි.657.

15 බ.ද., පි.663 බ.ද., පි.867, -එම-පි.387 බ.ද.,

16 බ.ද., පි.654 - 655.

පැවැත්වීම ඔහුට පළමුවෙන් ම පවරන ලද්දේ මහජනයාගේ අභිමතය පරිදිය යන්නත්, එතෙක් පිළිගෙන තිබූ මතය වුව ද, එය සකොලස්ටික්වාදීන් විසින් වෙනස් කරන ලදි.

ආදම් වෙත දෙවියන් වහන්සේ පවරා දුන් බලය, ඔහුගේ හිමිකරුවන්ට උරුම වී නූතන කාලයේ දී රජවරුන්ට හිමි වූ බව ඔවුහු දැක්වූහ. මේ නිසා රජය හා දේවධර්මාචාරීන් අතර හටගත් මතභේදය, රාජකීය බලය පාප්තුමා ගේ බලයට යටත් වන බව ඇඟවීමට තරම් ප්‍රබල ලෙස අවසන් විය. රාජකීය අධිකාරියෙහි ප්‍රභවය දෙමව්පියන්ට දරුවන් යටත් වීම මත එන්නක් බව මෙයින් අදහස් කෙරිණ.[17]

දෙවියන්ගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ ව මිනිසා පිළිගෙන තිබූ අදහස්වලට මුල, මිනිසාගේ ඉතිහාසය තරම් ඈතට දිවෙන්නක් බව කලින් ද සඳහන් විය. දෙවිවරුන් මැවීමටත්, ඔවුන් ශ්‍රේෂ්ඨත්වයෙන් පිදීමටත් මිනිසාට තිබූ නිදහස මෙන් ම, මිනිසාට හානි පැමිණ වීමට හා ආශිර්වාද කිරීමට දෙවියන්ට නිදහස ඇතැයි ද විශ්වාස කෙරිණ.

මේ නිසා මිනිසා මැවූ දෙවියා, මිනිසා පාලනය කිරීමෙහි ලා බලය හසුරුවන්නෙකු විය. ඒ ඒ දෙවියාට ආවේණික වූ ලක්ෂණ ලෙස දෙවියන්ගේ සිතැඟි අනුව කටයුතු කරන්නන්ට කරුණා භරිතවීම, දෙවියන්ට විරුද්ධ වන්නවුන්ට දඬුවම් පැමිණවීම,[18] දෙවියාගේ කෝපය සන්සිඳුණ පසු වරද කළ වුන්ට සමාව දීම ආදී දෑ ප්‍රකට විය.

කළ පව් සමා කරවීම් වස් විවිධ යාග හෝම පැවැත්වීම, භාර භාරවීම හා වරදට පසුතැවිලි වීම, දෙවියා වෙනුවෙන් මිනිසා විසින් කළ යුතු කාර්යයන් විය.

17 බු.ආ.වි.ස., පි.21 - 23. බ.ද., පි.725 - 736. -එම- පි.146 - 147, 534.

18 බු.ආ.වි.ස., පි.63. බ.ද., පි.887 -එම- පි.893. බු.ආ.වි.ස., පි.16 - 19. 64 - 70;

මිනිස් ගති දෙවියන්ට ආරූඪ කොට ඇදහිල්ල හා විශ්වාසය[19] නිසා තහවුරු කළ වත් පිළිවෙත්, මිනිසා යහපත සඳහා යොමු කරවනු ලැබූ තාක් ඒ පිළිබඳ ව වෙනසක් අවශ්‍ය වූ බව නොපෙනුණි. එහෙත් පසුකාලයේ දී දෙවියන් වෙනුවෙන් කරනු ලැබූ ඇතැම් වත් පිළිවෙත් කෲර වූවා පමණක් නො ව, සාධුශීලී යහපත් ගති මිනිසුන් තුළින් ඉවත් කරන සුලු ද විය. යහපත් මිනිස්සු දෙවියන්ගේ නාමයෙන් හෝ දෙවියන් නිසා අයහපත් ක්‍රියාවන්හි යෙදුණා හ. එය මිනිසාගේ නිදහස හා සමානත්වය වළලා දැමීමෙ තැනට පත් වූ පසු පැවත ආ ක්‍රමය ගැන නැවත සිතා බැලීමක් අවශ්‍ය විය. එසේ සිතා බැලීමෙන් පසු සම්මුතියක් හෝ ගිවිසුමක් මගින් නව චින්තනය ක්‍රියාත්මක කිරීමට මිනිසුන් පෙළඹවිය යුතු විය.[20]

ඉන්දියාවේ ක්‍රි.පූ. සවැනි ශත වර්ෂයේ බෞද්ධ දර්ශනයට පසුබිම් වූ වකවානුව ගැන සිතා බැලීමේ දී වේද ග්‍රන්ථ ලබා සිටි පූජනීය තත්ත්වය හා මනු නීතියෙහි දක් වූ සිරිත් විරිත් ක්‍රමයෙන් පිරිහීමට පත්වීම, විවිධ දෘෂ්ටීන්හි පිහිටා පැවති වාද විවාද හේතු කොට ගෙන අලුතින් සිතන්නට පුද්ගලයන් පෙළැඹීම යන කරුණු ගැන අවධානය යොමු කළ හැකි ය.

ඊශ්වරයාගේ ශ්‍රේෂ්ඨත්වය අවධාරණය කළ පුද්ගලයන්ගේ මත ඛණ්ඩනය කරමින් මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය ගැන කරුණු දක් වූ බුද්ධිමතුන්ගේ අදහස් වඩාත් පිළිගැනුණ මෙම අවධියේ දී, නිදහස් අදහස් අනුව යමින්, මරණින් මතු තත්ත්වය, ස්වච්ඡන්දතාව, ස්වාධීනත්වය හා සමානත්වය යන කරුණු කෙරෙහි මිනිස් අවධානය යොමු විය.

ග්‍රීසියේ ද මෙවැනි ම පිළිගැනීම් පැවති බවට, "**ඔබ මා වැනියකු මැරුවහොත් ඔබ මට කරන හානියට වඩා විශාල හානියක්, ඔබට ම කර ගනු ඇත. මට හානි කළ හැකි කිසිවෙක් නැත. නරක මිනිසකුට ඔහුට වඩා හොඳ අයකුට හානි කිරීමට**

19 බ.ද., පි.737. -එම- පි.731.

20 ඉ.ද. 1, පි.296; -එම- පි.298 - 303. -එම- පි.300.

**අවසර දී නැති බැවිනි. මැරීම, රටින් පිටුවහල් කිරීම, සිවිල් අයිතිවාසිකම් නැතිකර දැමීම ආදී යමක් කිරීමෙන් පුද්ගලයාට විශාල හානියක් කළේ යයි ඔබ සිතනු ඇත. අන්‍යයෝ ද එසේ සිතනු ඇත. එහෙත් මම එයට එකඟ නොවන්නේ; නරක කිරීම, අයුක්ති සහගත ලෙස අනිකකුගේ ජීවිතය විනාශ කිරීම, අති මහත් නරකක් හෙයිනි."[21] යනුවෙන් සොක්‍රටීස් පැවසූ වදන්වලින් සනාථ වේ. සොක්‍රටීස් ග්‍රීක් වැසියන්ගේ බුද්ධිමත්භාවයේ කාලීන සංකේතය විය.**

ඔහු දේශපාලනඥයකු නොවී ය. වරෙක ධනපතියන් පෙළූ ප්‍රජාතන්ත්‍රවාදයටත්, වරෙක දුගී ජනතාව පෙළූ ප්‍රජා පීඩනටයත් විරුද්ධ වූ අවස්ථා දෙකක් සිහිපත් කළ ඔහු අවංක පුද්ගලයන්ට දේශපාලන භූමියෙහි වැඩිකල් ජීවත් විය නොහැකි යයි දැක්වූයේ ඒ දෙක ම නිර්දෝෂී ආණ්ඩුක්‍රම නොවූ බැවිනි.

මිනිසුන් එකිනෙකා අතර පවතින තරගය වළක්වා හෝ පාලනය කොට එකිනෙකා අතර සහයෝගය හා සමඟිය වගා කරවීමට මිනිසා ගසාකෑම්වලින් බේරා ගත යුතු බවත්, නිදහස් සමාජයක, සියලු නියෝජනයන් නිදහස් විය යුතු බවත්,[22] සත්‍යග රූක චින්තකයෝ අවධාරණය කළ හ.

මිනිසුන් එකට එක් කරන බලවේගය අධ්‍යාසය හෙවත් අදහස බැවින් ඇතැම් විටෙක අදහස ධාතු ලෙස ද දක්වන ලද බව පෙනේ.

සංයුත්ත නිකායේ හීනාධිමුත්තක[23] සූත්‍රයට අනුව, ධාතු නම් වූ අදහස් වශයෙන් සත්ත්වයෝ එක්වෙත්, සමගි වෙත්. හීන අදහස් ඇත්තා වූ සත්ත්වයෝ හීන අදහස් ඇත්තා වූ සත්ත්වයන් හා සමඟ එක්වෙත්. සමඟි වෙත්. යහපත් අදහස් ඇත්තා වූ සත්ත්වයෝ යහපත් අදහස් ඇත්තා වූ සත්ත්වයන් හා සමඟ

21 බ.ද., පි.678.

22 ඉ.ද., 1. පි.298; බ.ද., පි.675.

23 බ.අ., පි.495 -එම- පි.500 -එම- පි.49 එම පි.49 ධ.ප. 1-8; යමක වග්ග.

එක්වෙත්, සමඟි වෙත්, යනුවෙන් දක්වන ලද ධර්මතාව අතීත, අනාගත හා වර්තමාන යන කාලත්‍රයට ම පොදු බව එම සූත්‍රයෙන් ම පැහැදලි කරනු ලබයි. එහි එන සගාථ සූත්‍රය[24] හීන අදහස් ඇත්තවුන්, හීන අදහස් ඇත්තවුන් සමඟ එක් වන්නේ කෙසේ ද යන්න ඉතා පිළිකුල් ලෙස දක්වීමටඃ

යම් සේ අසූචි, අසූචි සමඟ එක් වේ ද, සම වේ ද,

මුත්‍ර, මුත්‍රා සමඟ එක් වේ ද, සම වේ ද,

කෙළ, කෙළ සමඟ එක් වේ ද, සම වේ ද,

සැරව, සැරව සමඟ එක් වේ ද, සම වේ ද,

ලේ, ලේ සමඟ එක් වේ ද, සම වේ ද,

යනුවෙන් පිළිකුල් සිතෙන උදාහරණ ඉදිරිපත් කරන ලදි. ඉන් ගම්‍ය වන්නේ පිළිකුල් සහගත දෑ මෙන් ම හීන අදහස් ඇත්තවුන් ද සමාජයේ පිළිකුළට භාජන වන බව ය. එහි කාල භේදයක් නො වේ.

යහපත් අදහස් ඇත්තවුන්, අතීත, අනාගත හා වර්තමාන යන කාලත්‍රයට ම ඇතුළත් වන සේ කාල භේදයකින් තොර ව යහපත් අදහස් ඇත්තවුන් සමඟ එක් වූ බව, සමඟි වූ බවඃ

යම් සේ, කිරි, කිරි සමඟ එක් වේ ද, සම වේ ද,

තෙල්, තෙල් සමඟ එක් වේ ද, සම වේ ද,

ගිතෙල්, ගිතෙල් සමඟ එක් වේ ද, සම වේ ද,

මී, මී සමඟ එක් වේ ද, සම වේ ද,

පැණි, පැණි සමඟ එක් වේ ද, සම වේ ද

යනුවෙන් ප්‍රියජනක බව පෙන්වීමට සුදුසු උදාහරණ සහිතව පෙන්වා තිබේ.

---

24 ඉ.ද., පි.301 - 304. ඉ.ද., ප.1, පි.301.

එක්ව වාසය කිරීම නිසා කෙලෙස් වනය නම් වූ පාප අදහස් ඇති වේ. තනිව විසීමෙන් කෙලෙස් වනය සිඳේ.

පිරිසිදු ජීවිතයක් ගත කරන තැනැත්තා වුව ද, කුසීත පුද්ගලයන් හා එකතුවීමෙන්, කුඩා ලී කැබැල්ලකට නැගුණ මිනිසා මුහුදෙහි කිඳා බසින අයුරින් පාප අදහස් තුළ කිඳා බසින හෙයින් එවැනි පුද්ගල ඇසුරින් ඉවත් විය යුතු ය.

අදහස් වශයෙන් මිනිසුන් එක්වීමේ දීː

- "ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමඟ එක්වෙත්, සමඟි වෙත්.
- ලැජ්ජා නැත්තෝ ලැජ්ජාව[25] නැත්තන් හා සමඟ එක්වෙත්, සමඟි වෙත්.
- පව් කිරීමට බිය නැත්තෝ[26] පව් කිරීමට බිය නැත්තන් හා සමඟ එක්වෙත්, සමඟි වෙත්.
- අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන්[27] හා සමඟ එක්වෙත්, සමඟි වෙත්.
- කුසීතයෝ කුසීතයන්[28] හා සමග' එක්වෙත්, සමඟි වෙත්.
- සිහි මුලා වූවෝ සිහි මුලා වූවන් හා සමඟ එක්වෙත්, සමඟි වෙත්.
- ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමඟ එක්වෙත්, සමඟි වෙත්.'

යන කොටසින් ඒ ඒ පුද්ගලයන් ස්වකීය අදහස් අනුව ම කාලත්‍රයේ භේදයෙන් තොර ව හැසිරෙන බව උගත හැකි ය.

25 බ.ද., පි.104 - 105.

26 බ.ද., පි.905-906. බ.ද., පි.683.

27 ස.සො., 2, පි.859 - 860.

28 ස.සො., 2. පි.863 - 866.

අස්සද්ධ සූත්‍රයේ[29] දක්වෙන පරිදි අදහස් වශයෙන් එක්වීමේ දී ශ්‍රද්ධාව නැත්තන්, ශ්‍රද්ධාව නැත්තන් හා එකතු වූ අයුරින් ම ශ්‍රද්ධාව, ඇත්තන් ශ්‍රද්ධාව ඇත්තන් හා එකතුවන බව, සමඟි වන බව වටහා ගත හැකි ය.

ශ්‍රද්ධාව ඇත්තේ ශ්‍රද්ධාව ඇත්තන් හා සමඟ එකතු වෙත්, සමඟි වෙත්. පව් කිරීමට ලැජ්ජාව ඇත්තෝ පව් කිරීමට ලැජ්ජාව ඇත්තන් හා සමඟ එකතු වෙත්, සමඟි වෙත්.

පව් කිරීමට බිය ඇත්තේ පව් කිරීමට බිය ඇත්තන් හා

- සමඟ එකතු වෙත්, සමඟි වෙත්.
- බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමඟ එකතු වෙත්, සමඟි වෙත්.
- පටන් ගත් වීර්යය ඇත්තෝ පටන් ගත් වීර්යය ඇත්තන් හා සමඟ එකතු වෙත්, සමඟි වෙත්,
- එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තන් හා සමඟ එකතු වෙත්, සමඟි වෙත්.
- ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමඟ එකතුවෙත්, සමඟි වෙත්.

යනුවෙන් අසමාහිත සූත්‍රය[30] එහි ලා මිනිසුන් අදහස් වශයෙන් එකතු වන ආකාරය පැහැදිලි කරයි. පඤ්චසික්ඛාපද සූත්‍රය[31] පන්සිල් පද කඩන පුද්ගලයන්, පන්සිල් පද කඩන පුද්ගලයන් සමඟත්, පන්සිල් පද රකින පුද්ගලයන්, පන්සිල් පද රකින පුද්ගලයන් සමඟත්, එකතු වන ආකාරය දක්වන්නේ:

- ප්‍රාණඝාත කරන්නෝ, ප්‍රාණඝාත කරන්නන් හා සමඟ එකතු වෙත්, සමඟි වෙත්.

29 ස.සො., 2. පි.877 - 883.

30 -එම- පි.883 - 887.

31 -එම- පි.887 - 890.

- සොරකම් කරන්නෝ, සොරකම් කරන්නන් හා සමඟ එකතු වෙත්, සමඟි වෙත්.
- කාමයන්හි වරදවා හැසිරෙන්නෝ, කාමයන්හි වරදවා හැසිරෙන්නන් සමඟ එකතු වෙත්, සමඟි වෙත්.
- බොරු කියන්නෝ, බොරු කියන්නන් හා සමඟ එකතු වෙත්, සමඟි වෙත්.
- සුරාපානය කරන්නෝ, සුරාපානය කරන්නන් සමඟ එකතු වෙත්, සමඟි වෙත්.

යන ආකාරයෙනි. මේ හැසිරීම් ස්වභාවය[32] කාලත්‍රයට ම පොදු ය.

සත්තකම්මපථ සූත්‍රය[33] කය හා වචනය යන ද්වාර දෙකෙන් සිදුවන අකුශල කර්ම හත ගැන සලකා අකුශල කර්ම සතෙහි යෙදෙන්නේ අකුශල කර්ම සතෙහි යෙදෙන්නන් හා එකතුවන ආකාරයත්, අකුශල කර්ම සතෙන් වෙන් වූවන්, අකුශල කර්ම සතෙන් වෙන්වූවන් හා එකතුවන, සමඟි වන ආකාරයත් දක්වයි. දසකම්ම පථ සූත්‍රය[34] කය, වචන, සිත යන ද්වාර තුනෙන් සිදුවන දස අකුශල කර්ම කෙරෙහි ම අදහස් වශයෙන් එක් වන හා එක්නොවන මිනිසුන් පිළිබඳ ව කරුණු විග්‍රහ කර දක්වයි.

මිථ්‍යා දෘෂ්ටිකයන්, මිථ්‍යා දෘෂ්ටිකයන් සමඟත්, සම්‍යක් දෘෂ්ටිකයන්, සම්‍යක් දෘෂ්ටිකයන් සමඟත් අදහස් වශයෙන් එක් විය යුත්තාහ. ඒ ආකාරයෙන් අෂ්ටාංගික වූ සියලු තන්හි දී ඒ ඒ සමාන අදහස් ඇත්තවුන්, එක් විය යුත්තා හ. සමඟි විය යුත්තා හ. මිථ්‍යා කර්මාන්ත ඇත්තවුන්, මිථ්‍යා කර්මාන්ත ඇත්තවුන් සමඟත්, මිථ්‍යා ආජීව ඇත්තවුන්, මිථ්‍යා ආජීව ඇත්තවුන් සමඟත් එක්වීම බලාපොරොත්තු විය හැකි බව අට්ඨංගික සූත්‍රයෙන්

---

32 -එම- පි.890-892.

33 -එම- පි.866 - 878.

34 ස.සො., පි.893 - 895.

පැහැදිලි විය යුතු ය. දසංග සූත්‍රයේ[35] එන පරිදි කාල භේදයෙන් තොර වඃ

- මිථ්‍යා දෘෂ්ටිකයෝ, මිථ්‍යා දෘෂ්ටිකයන් හා එක්වෙති.
- මිථ්‍යා සංකල්පනා ඇත්තෝ, මිථ්‍යා සංකල්පනා ඇත්තන් හා එක්වෙති.
- මිථ්‍යා වචන ඇත්තෝ, මිථ්‍යා වචන ඇත්තන් හා එක්වෙති.
- මිථ්‍යා කර්මාන්ත ඇත්තන්, මිථ්‍යා කර්මාන්ත ඇත්තන් හා එක්වෙති.
- මිථ්‍යා ආජීව ඇත්තෝ, මිථ්‍යා ආජීව ඇත්තන් හා එක්වෙති.
- මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ, මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා එක්වෙති.
- මිථ්‍යා සිහිය ඇත්තෝ, මිථ්‍යා සිහි ඇත්තන් හා එක්වෙති.
- මිථ්‍යා සමාධිය ඇත්තෝ, මිථ්‍යා ඥානය ඇත්තන් හා සමඟ එක්වෙති.
- මිථ්‍යා ඥානය ඇත්තෝ, මිථ්‍යා ඥානය ඇත්තන් හා සමඟ එක්වෙති.
- මිථ්‍යා විමුක්තිය ඇත්තෝ, මිථ්‍යා විමුක්තිය ඇත්තන් හා සමඟ එක්වෙති.

ඉහත දැක්වූ අංග දහය සම්‍යයක් ලෙස ගෙන ක්‍රියා කරන්න වුන් ද එකට එකතු වන බව පෙනේ. ඒ අනුව සම්‍යක් විමුක්තිය ලැබූ ඇත්තෝ සම්‍යක් විමුක්තිය ලැබූවන් සමඟ එකට එක් වූ බව සංයුත්ත නිකායේ චඞ්කම සූත්‍රය[36] කරුණු හෙළි කරන ආකාරයෙන් වටහා ගත හැකි ය. මින් පැහැදිලි වන කරුණ නම් හොඳ හෝ නරක හෝ යම්කිසි අදහසක් මත පුද්ගලයන් එක් රැස්වන බව ධර්මතාවන් බව ය. යම්කිසි පිරිසක් හැඳින

35 -එම - පි.867 - 900. B.S., P.15. B.A.S. P.9

36 ස.සො., පි.900 - 904.

ගැනීමට මෙම ධර්මතාව බෙහෙවින් ප්‍රයෝජනවත් ය. සියල්ලන් ශ්‍රද්ධාවන්ත ජන සමූහයක් වේ නම්, ඒ සියලු දෙනාට ම නිදහස අත් වී තිබේ නම්, ඔවුන් පොදු යහපත වැඩි දියුණු කරනු ඇතැයි[37] සිතිය හැකි බව නිදහස්වාදී අදහස් පළ කරන 'ලොක්' පවසයි. එවිට එවැන්නකු හික්මවීමට දිව්‍යමය නීති ප්‍රමාණවත් වන නිසා මනුෂ්‍ය නීති අවශ්‍ය නො වේ.[38]

සත්පුරුෂ අදහස් ඇත්තකු සොරකමට පෙළැඹීමේ දී, "මට අපරාධ නීතියෙන් (මනුෂ්‍ය නීතියෙන්) බේරිය හැකි වුවත්, දිව්‍යමය විනිශ්චයකරුවා අතින් දඬුවම් හිමිවනු ඇතැයි' සිතීම නිසා තමන්ගේ වැරදිවලින් මිදීමට ඔහු උත්සාහ දරනු ඇත. ඔහුගේ බිය පහවීමෙන් නිදහස ස්ථාපිත වනු ඇත. ඒ දුකෙන් ඉවත්වීමෙකි. ස්වකීය ලබ්ධිය අනුව ම පිළිගත් පාප කර්මවලට සහභාගිවීමෙන් තමන් අපාගතවීමේ අනතුරට භාජන වන බව සැදැහැවත් බැතිමතුන් දැන සිටින නමුත් ආශාවෙන් පොළඹනු ලැබීම නිසා ඒවායේ බැඳෙන බව 'ලොක්' පිළිගත්තේ ය.

සැපත යනු සුඛ වේදනාව වැඩි කිරීමත්, දුක්ඛ වේදනාව අඩුකර ගැනීමත් හෙයින්, උපරිම සැපත සඳහා උපරිම සුඛ වේදනාව ලැබිය යුතු ය. සුචරිතයට වඩා දුශ්චරිතයට මිනිසුන් පෙළැඹීමට වැඩි කැමැත්තක් දක්වන්නේ යයි කීම එහෙයින් සාවද්‍ය විනිශ්චයක් විය යුතු ය.[39]

රාග දමනය කිරීම නිදහසෙහි නිසි දියුණුව වන්නේ යයි සලකන කල මිනිසුන් කෙරෙහි සද්ගුණවත් බවත්, විචක්ෂණ බවත් ඇති වේ. සත්ගුණවත් බව නැතිවන සෑම අවස්ථාවක දී ම විචක්ෂණ බව ද නැතිවන බැවින් ඒ දෙක ම වැදගත් ය. එහෙයින් විචක්ෂණ භාවය වූ කලී, ඉගැන්විය යුතු එක ම සද්ගුණය බවට 'ලොක්' අදහස් කරයි. ඔහුගේ නිදහස්වාදී අදහස්වල විචක්ෂණයට ප්‍රධාන තැනක් ලැබුණේ මේ නිසා යයි සැලකිය හැකි ය.

37 -එම- පි.904 - 908.

38 ස.සො. පි.908 - 912.

39 -එම- පි.912 - 916.

"නියම සැපත සොයා යාමේ අවශ්‍යතාව සහ අපගේ රාග මැඩ පවත්වා ගැනීම උඩ නිදහස පවතී.' යන්න 'ලොක්' අවධාරණය කළේ ය.[40]

**"යම්කිසි බලයකින් මඩිනු නො ලබන පුද්ගලයා ස්වාධීන පුද්ගලයෙකි. එවන් පුද්ගලයෙකුගේ අයිතිවාසිකම් හා පැවැත්ම ස්වාධීනත්වය නම් වේ."**

"සෑම පුද්ගලයා ම තම තමාට කැමති පරිදි කටයුතු කිරීමේ ආශාවෙන් යුක්ත වීමත්, සමාජයේ කටයුතුවලට සහභාගි වීමේ ආශාවෙන් යුක්ත වීමත් යන කරුණු දෙක පදනම් කොට දේශපාලන විද්‍යාව පුද්ගල ස්වාධීනත්වය හඳුන්වන බව සැලකිල්ලට ගත යුතු වේ. 1789 දී සම්මත කර ගන්නා ලද 'මනුෂ්‍ය අයිතිවාසිකම්[41] පිළිබඳ පනත ස්වාධීනත්වය යනු කුමක් දැයි අර්ථ දක්වන ලද්දේ, එක් එක් පුද්ගලයා විසින් අනුන්ට හානියක් නොවන ලෙස කටයුතු කිරීමේ අයිතිය පුද්ගලයා සතු විය හැකි උසස් ම ස්වාධීනත්වය වශයෙනි. ව්‍යවහාර ලෝකයේ නිදහස් පුද්ගලයා තමාගේත්, අන්‍යයාගේත් ස්වාධීනත්වය ගරු කරන්නේ දෙපසට ම හිරිහැර නොවන ලෙස ස්වකීය ජීවිතය පවත්වා ගැනීමෙනි. "තමා කැමති දෑ අන්‍යයන් ද කැමති වනු ඇත. තමා අකමැති දෑ අන්‍යයන් ද අකමැති වනු ඇතැ"යි දැක්වීම ප්‍රමාණවත් වනු ඇත. **මෙහි දී කැමති දෑ යනු, 'සැපත හා යහපත' බව තථාගතයන් වහන්සේ අවධාරණය කළ හ.[42] හොඳ නරක, යහපත අයහපත යන කරුණු පුද්ගලයාට ම ස්වකීය විනිශ්චයෙහි පිහිටා පිළිගත හැකි සිද්ධාන්තයක් ලෙස සුලභව දැක් වූ තථාගතයන් වහන්සේ, යම්කිසි වචනයක්, ක්‍රියාවක් හෝ සිතුවිල්ලක් යහපත් වන්නේ ඒ තමාටත්, අනුන්ටත්, තමා හා අනුන් යන දෙපසටමත්, වැඩදායි වන්නේ නම් පමණක් බව පැවසූ හ.** තමාට වැඩදායි වන ඇතැම් ක්‍රියා අනුන්ට අවැඩක්

40 ස.සො. 2, පි.860 - 862.

41 බ.ද., පි.684.

42 බ.ද., පි.674.

සිදු කරන්නේ නම් ඒ සුව කැමති, දුකට නොකැමති සත්ත්වයාට හිංසාවක් හෙයින් යහපතක් නොවේ. අනුන්ට වැඩක් වන නිසා ම, සුව කැමති, දුක් නො කැමති තමාට හිංසාවක් වන්නේ නම් ඒ ද යහපත් නො වේ. එහෙයින් ඒ දෙපසට ම වැඩදායි විය යුතු ය. තථාගතයන් වහන්සේ විවිධ සූත්‍රවල දී ඒ පිළිබඳ ව බාහිර පුද්ගලයන්ගේ අදහස් ද විමසා බැලූ බව මජ්ඣිම නිකායේ එන සොටමුබ, කන්දරක වැනි සූත්‍ර[43] උදාහරණ කොට දක්විය හැකි ය. එහි දී අත්තනත්ප පරන්තප නොවූ පුද්ගලයා අනෙක් පුද්ගලයන් තිදෙනාට ම වඩා තමන්ගේ සිත් ගන්නා බව තථාගතයන් වහන්සේට ඔවුහු දැන්වූහ. අත්තන්තප (තමා තවන), පරන්තප (මෙරමා තවන), අත්තන්තප හා පරන්තප (තමා හා මෙරමා තවන) අත්තන්තප (තමා හා මෙරමා නොතවන) නම් වූ පුද්ගල සතර දෙනෙකු එකී සූත්‍රවලින් මතුකොට දක්වා තිබේ. ඒ පුද්ගල සතර දෙනා පිළිබඳ කරුණු සවිස්තර ලෙස පුද්ගල ප්‍රඥප්තියෙන්[44] දැනගත හැකි ය. නිදහස්වාදී චින්තකයින්, 'ප්‍රජා පීඩකයින්' ලෙස සිය කෘති වලින් හැඳින්වූයේ පරන්තප නම් වූ අන්‍යයන්ට හිරිහැරදායි වූ පාලකයන් බව මෙයින් වටහා ගත හැකි ය. **යම් බසකින් තමාත් නොතවන්නේ නම්, මෙරමාත් නොතවන්නේ නම් ඒ සුභාෂිතයකි. එසේ සුභාෂිතයක්[45] විය හැක්කේ ලෝක ව්‍යවහාරයට අනුව පැවසීම, තුලනකොට පැවසීම, නුවණින් දැන පැවසීම, අර්ථ සහිත කොට පැවසීම යන කරුණු සතරිනි.** නිදහස්වාදී අදහස් ප්‍රකාශ කළ චින්තකයන් අතරින් 'ලොක්'[46] කැපී පෙනෙන තත්ත්වයක් ළඟාකර ගත්තේ යයි රසල් දක්වන්නේ ඔහු ස්වකීය අදහස්, ඉහත ලක්ෂණයන්ගෙන් යුතු ව මානව භක්තිය පෙරදැරි ව ඉදිරිපත් කළ නිසා යයි අපි කල්පනා කරමු.

---

43 බ.ද., පි.672.

44 බ.ද., පි.673 - 674.

45 ස.නි. 5 - 2, පි. 145 - 161; වේළුද්වාර සූත්‍රය. -එම- පි.156.

46 ම.නි. 2, පි.633 - 643; සොටමුබ සූත්‍රය. -එම- පි.7 - 19; කන්දරක සූත්‍රය.

තථාගතයන් වහන්සේ, නිදහස වශයෙන් දක් වූ 'විමුක්තිය' සඳහා මාර්ගය විරාගය ය. පටිසම්භිදා මග්ගප්ප කරණය[47] දක්වන විමුක්ති අදහස, මෙතැනට සුදුසු සේ ගළපා ගන්නේ නම්, ඒ වැරදි කල්පනාවන්ගෙන් ඉවත් ව, නිවැරදි කල්පනාවන් ගෙන් (සංකල්ප) යුක්තවීම ය. නිවැරදි වචන, නිවැරදි කර්මාන්ත, නිවැරදි ජීවිතය, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි තැන්පත් බව යන ඒවා ලැබී ම නිදහස ලෙස, ලෝකයාට වටහා දීම සඳහා වැරදි දෑ අවබෝධ කර විය යුතු ය. අවබෝධය දියුණු කිරීමෙන් හැම නිමිති කෙරෙන් ඉවත්වීම, විමුක්තිය නම් වූ නිවන ය. මෙහි ලා මෑත භාගයේ දාර්ශනිකයන් දුරු මානව හිතවාදී අදහස් හා අග්ගඤ්ඤ චක්කවත්ති සීහනාද[48] සූත්‍රවල දක්වූ අදහස් හා සසඳා බැලීම වර්තමාන දේශපාලන ක්ෂේත්‍රයට වැඩදායී වනු ඇත.

"දේශපාලන බලය නිසි සේ අවබෝධ කර ගැනීම හා එය එහි ප්‍රභවයෙන් ම ලබා ගැනීම සඳහා මිනිස්සු ස්වභාවික ව ම එකවර තත්ත්වයක සිටින්නේ දැයි අප විසින් සලකා බැලිය යුතු ය. ඒ තත්ත්වය නම් වෙන යම් කිසිවෙකුගෙන් අවසර ඉල්ලා නොසිටිමින් හෝ එවැනි කිසිවකුගේ අධිෂ්ඨානයට යටත් නොවෙමින් ස්වභාවික නීතියෙහි සීමාවන් ඇතුළත තමන්ට අභිමත පරිදි තම දේපළ හා වස්තුවලින් ප්‍රයෝජන ගැනීමෙහි හා තම ක්‍රියා හසුරුවා ගැනීමෙහි සම්පූර්ණ නිදහස පවත්නා තත්ත්වයකි.[49]"

"එහෙත් මෙය (ප්‍රකෘති තත්ත්වය) නිදහස පවත්නා තත්ත්වයක් වුව ද, නොනිසි නිදහසක් පවත්නා තත්ත්වයක් නොවේ.[50] ප්‍රකෘති තත්ත්වය පාලනය කිරීමට, ප්‍රකෘති (ස්වභාවික) නීතියක් වේ. මෙයින් කවුරුත් බැඳී සිටිති. ඒ නීතිය වන විචාර බුද්ධිය

47 පු.ප, පි.365 - 377; -එම- පි.253. අ.නි. 3, පි.25; අත්තහිත පරහිත.

48 සු.නි., පි.130 - 133 සුභාෂිත සූත්‍රය. අ.නි. 3, පි.393 සුභාෂිත වාචා සූත්‍රය.

49 බ.ද., පි.663.

50 පටි.ම.. පි.87 - 91.

මෙහෙයවා ගන්නා මුළු මහත් මනුෂ්‍ය වර්ගයාට, සියලු දෙනා ම එක සමාන හා නිදහස් වන බැවින් කිසිවෙකු තව කිසිවෙකුගේ ජීවිතයට, ශරීර සුවයට, නිදහසට හෝ දේපළ හා වස්තුවට ද හානි කළ යුතු නොවේ යයි ඒ නීතියෙන් උගන්වනු ලැබේ. මිනිසාට ම, තමන් හා තමන්ට හිමි දේ ආරක්ෂා කර ගත හැකි බවත්, එහෙත් ස්වකීය අයිතිවාසිකම් රැක ගැනීම සඳහා තමන්ට ම එහි විනිශ්චයකරු විය නොහැකි බවත් ය.[51] පුද්ගලයන්ගේ 'අයිතිවාසිකම්' රජය විසින් ආරක්ෂා කළයුතු යයි යන මතය මීට හේතු වශයෙන් දැක්විය හැකි ය. මිනිසුන් පොදු රාජ්‍යයන් වශයෙන් එක්වීම හා ආණ්ඩු යටතට පත්වීම නිසා ස්වකීය අයිතිවාසිකම් හා දේපළ රැක ගැනීමේ අරමුණ ඉටු වේ.[52]

'ස්වාධීනත්වය' නම් වූ නිදහස පිළිබඳ ව අප ඉහතින් සඳහන් කළ කරුණු අනුව පාලනයෙන් තොරවීමේ වැදගත්කම හා අවස්ථාවන් ලබාදීමේ වැදගත්කම යන දෙ අංශය ම පුද්ගල දියුණුව සඳහා අවශ්‍ය ය. ධනයෙන් හා බලයෙන් ආඪ්‍ය වූ අය පාලනයෙන් තොරවීම අපේක්ෂා කරති. පහසු ජීවන මාර්ගයක් නො ලැබූ අය, යහපත් ජීවිතයකට අවස්ථා ලබාදීමේ අවශ්‍යතාව අගය කරති. එහෙයින් නිදහස් අවශ්‍යතාවට අනුකූල විය යුතුය.[53]

පෞද්ගලික නිදහස, සිවිල් නිදහස හා දේශපාලන නිදහස යන අංග තුන පුද්ගලයා ගේ ස්වාධීනත්වය පිළිබඳ සීමාවන් ලෙස අර්ථ දැක්වීමට දේශපාලන විද්‍යාව කැමති වනු ඇත. පවුල, ආණ්ඩුව, ජාතිය රජය වැනි බැඳීම්වලින් පුද්ගල ස්වාධීනත්වය හඳුනා ගැනීමට දේශපාලන විද්‍යාව පිළිබඳ දැනුම අවශ්‍ය ය.

දේශපාලන විද්‍යාව යනු යම්කිසි නිශ්චිත ප්‍රදේශයක් තුළ වාසය කරන නීතිගරුක ජනකායකගේ අභිවෘද්ධිය සඳහා සංවිධානය වූ රාජ්‍යයක නොහොත් දේශපාලන ආයතනයක කටයුතුවලට අදාළ වූවකි. **එය දේශපාලන සිද්ධාන්ත හා දේශපාලන සංවිධාන**

51 දීඝ3, පි.157 - 161 දී.3, පි.121 - 123.

52 බ.ද., පි.656, -එම- පි.770, 746 - 747, 857 - 858. බ.ද., පි.821.

53 බ.ද., පි.685 - 687. C.E. 20, P.234 -එම- පි.182 - 191.

යනුවෙන් දෙකොටසකි. සමාජයේ අනෙකුත් යහපත් වැසියන් හා එක් ව වාසය කරන යහපත් වැසියකු තමාගේ යහපත සඳහා අවශ්‍යයයි සැලකෙන පරමාර්ථය හෝ පරමාර්ථයන් පිළිබඳ සියල්ල දේශපාලන සිද්ධාන්ත ලෙසත්, එකී පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා පවතින උපකරණ ආණ්ඩුව[54] නම් වූ දේශපාලන සංවිධානය ලෙසත් වටහා ගත යුතු වේ.

දේශපාලන සංවිධානයක පරමාර්ථය විය යුත්තේ කුමක් ද? ඒවා මුදුන් පත් කරවා ගැනීමේ මාර්ග කවරේ ද? එක් එක් පුද්ගලයාගේ යහපත සඳහා වූ හොඳ ම ක්‍රමය සෙවීම නම් වූ පුද්ගල අපේක්ෂාව හෙවත් ස්වභාවික පරිශ්‍රමයට, රාජ්‍යය කෙතෙක් දුරට උපකාරී වේ ද? රාජ්‍යයකට හිමි විය යුතු බලතල මොනවා ද?[55] එකී බලය එක් එක් පුද්ගලයාගේ සිතීම හා ක්‍රියා කිරීම පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් වන්නේ ද? නැතහොත් එම බලතලවල සීමාව කුමක් ද? පුද්ගලයාට රාජ්‍යයට විරුද්ධ ව බලය පාවිච්චි කළ හැකි ද? වැනි ප්‍රශ්න නගා ඒවාට පිළිතුරු සපයන්නට උත්සාහ කිරීමේ දී දේශපාලන සිද්ධාන්තයක තිබිය යුතු ලක්ෂණය, **'සමාජයට සැලසිය හැකි උත්කෘෂ්ට සේවය සලසමින් රාජ්‍යය එයට අයත් බලතල හා පුද්ගලයාගේ ස්වාධීනත්වය අතර එකඟ බවක් ඇතිකර ගැනීම'** ලෙස පෙනෙනු ඇත. පුද්ගලයා අයත් රාජ්‍යයේ පාලන ක්‍රමය හා එම රාජ්‍යය, අන් රාජ්‍යයන් හා ඇතිකර ගන්නා සම්බන්ධතාවන් ද, පුද්ගලයාගේ පෞද්ගලික නිදහස පිළිබඳ ව බොහෝ දුරට බල පවත්වන හෙයින් දේශපාලන සිද්ධාන්තයට රාජ්‍යතන්ත්‍ර හා අන්තර් රාජ්‍ය සම්බන්ධතා ද ඇතුළත් වන බව පෙනේ.

ඉතා පැරණි රාජාණ්ඩු ක්‍රමයේ පටන්, අපරිමිත විවිධත්වයෙන් යුත් නවීන ආණ්ඩුක්‍රම දක්වා වූ විවිධ ආණ්ඩු ක්‍රම පිළිබඳ ඉතිහාසය දේශපාලන විද්‍යාවට අදාළ වේ. ඒ සියලු ම ආණ්ඩු

54 බ.ද., පි.691.

55 බ.ද., පි.893.

ක්‍රම පිළිබඳ ව තේරුම් ගැනීමේ දී, "**කවර තරමේ බලයක් වුවත් හිමිවීම කෙනෙකු දූෂණය කිරීමට හේතුවන බවත්, සීමා රහිත බලය නිසා කෙනෙකු සීමාරහිත ව ම දූෂණය වන බවත්, එහෙයින් බලයෙන් බලය පාලනය කළ යුතු බවත් සනාථ වේ.**"[56] ව්‍යවස්ථා පැනවීම, විධානය කිරීම් හා අධිකරණ කටයුතු නම් වූ ප්‍රධාන කාර්යයන් තුළින් පුද්ගලයාට සිදුවන හොඳ නොහොඳ මත ආණ්ඩුවක සංවිධානය අගය කළ හැකි ය. එහෙයින් 'දේශපාලන විද්‍යාව' රාජ්‍යයත්, එහි පැවැත්ම හා වර්ධනයත් පිළිබඳ වූවක් බව වටහා ගෙන, එය සමාජ විද්‍යාත්මක වශයෙන් පුද්ගලයා හා සමාජය කෙරෙහි වූවක් ම ලෙස අර්ථ දැක්විය යුතු වේ. පුද්ගලයා ජීවත් වන රටෙහි පවත්නා ආණ්ඩු ක්‍රමයට අනුව පෞද්ගලික නිදහස[57] වෙනස් වේ. ඇතැම්විට ඒකාධිපති සමාජයක ජීවත් වන පුද්ගලයාට වඩා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවත් වන පුද්ගලයා ස්වාධීන යයි සැලකේ.

රාජාණ්ඩුව ඉතා ම පැරණි ආණ්ඩු ක්‍රමය වූ බව මෙකල පිළිගැනේ. යහපත් **රජෙක් නීතියට අනුව ඔහුගේ සියලු කාර්යයන් සකස් කර ගනියි. පාලිතයන්ට ආදර්ශයක් දැක්වීම[58] සඳහාත්, ඔවුන්ගේ යහපත[59] සඳහාත් එසේ කළ ඔහු, නීතියට කිසිසේත් යටත් නොවේ[60]** යන ප්‍රකාශයෙන් රජතුමාගේ තත්ත්වය පැහැදිලි ය. රාජාණ්ඩුවක් පවතින විටෙක විශේෂ ලක්ෂණය වන්නේ, " රාජ්‍යයෙහි ආධිපත්‍යය හා මහේශාක්‍ය භාවය එක ම පුද්ගලයෙකු කෙරෙහි පැවරීම යි," යන ප්‍රකාශයෙන් පුද්ගලයා වෙනුවෙන් පෙනී සිටින උසස් ම බලතල හිමි තැනැත්තා රාජ්‍යයේ නායකයා වන රජු බවත්, රාජ්‍යයේ පවතින උසස් ම 'තත්ත්වය' රජුගේ **'තත්ත්වය'** බවත්, අවධාරණය කරයි.

---

56 බ.දැ., පි.212. බ.දැ., පි.691,

57 බ.දැ., පි.205, 212 - 213. 602 -604. -එම- පි.857.

58 -එම- පි.213.

59 බ.දැ., පි.690 - 694, 601, 770.

60 බ.දැ, පි.606 - 608, 685. -එම- පි.606.

රාජාණ්ඩු ක්‍රම දෙකකි. ඉන් ඒකාංග බලවාදී රාජාණ්ඩුවක රජ නමින් හා ක්‍රියාවෙනුත් අධිපතියා බවට පත්වේ. ව්‍යවස්ථානුගත රාජාණ්ඩුවක ප්‍රධානියාගේ බලතල ව්‍යවස්ථා මගින් පාලනය කරනු ලැබේ. තෝරා පත්කර ගනු ලැබූ නියෝජිතයන් (පාර්ලිමේන්තුව) විසින් පනවනු ලබන නීතිරීති ක්‍රියාත්මක කිරීමට ඔහු බැඳී සිටින අතර, මහජනයාගේ කීකරුභාවය බලාපොරොත්තු විය යුත්තේ ව්‍යවස්ථාවට අනුකූලව ය.[61] ඔහු ද ව්‍යවස්ථාවට හා නීති රීතිවලට ද යටත් වන නිසාත්, ඒවාට ගෞරව කළ යුතු නිසාත්, රාජාණ්ඩුවක් වුව ද ඒ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් හා බෙහෙවින් සමාන ය.

පුද්ගලයා රජුට කීකරු වන්නේ, "දෙමාපියන්ට දරුවන් කීකරු වන ආකාරයෙන්"යි ඊට පක්ෂ වූවෝ පවසති. හදිසි අවස්ථාවක දී සිටින එක ම විධායකයා රජු හෙයින් තීරණ ක්‍රියාත්මක කරවීම පහසුවන අතර, මහජනයා ආරක්ෂා කර ගැනීම ද පහසු ය. තම තමන්ගේ කටයුතු තමන් ම පාලනය කර ගත නොහැකි සමාජයකට මේ ක්‍රමය වඩාත් ගැලපේ.

රාජාණ්ඩුවේ නායකයා නිරන්තරයෙන් ම ඉතා දක්ෂ, උත්සාහයෙන් කටයුතු කරන, මහජන යහපත සඳහා ම කැප වූවකු විය යුතු නමුත්, ඇතැම්විට තමන්ගේම බලය තහවුරු කර ගැනීම සඳහා නීති පනවා යටත් වැසියාගේ බලතල සීමාකොට, ඔවුන් දුකට පත්කිරීමට ද නායකයාට හැකි ය.[62] කෙසේ වෙතත් ශක්තිමත් පුද්ගලයකු යටතේ පාලනය වන රාජාණ්ඩුව, සමූහාණ්ඩුවකට වඩා සුදුසු යයි[63] සැලකෙන අවස්ථා තිබේ.

ඉතා ශ්‍රේෂ්ඨ පුද්ගලයන් විසින් විශිෂ්ට පරමාර්ථයන් ඇති ව පවත්වා ගනු ලබන ආණ්ඩුව 'රදළ ආණ්ඩුවක්' ලෙස අර්ථ දක්විය හැකි ය. එහි ප්‍රධාන පරමාර්ථ උසස් ගුණධර්ම මත රැඳී පවතී. රදළ ආණ්ඩුවක සාමාජිකත්වය සඳහා රදළ පවුලක ඉපදීම, සංස්කෘතිය හා අධ්‍යාපනය, වැඩිහිටි බව, පැරණි බව

61 බ.ද., පි.698 - 701. -එම- පි.907. -එම- පි.699.

62 බ.ද., පි.626.

63 ශිලා ලේඛ 4, අ.ලි.පි.3. ශිලාලේඛ 5. අ.ලි.පි.3.

හා යුද්ධයෙහි දක්ෂ බව, ඉඩම් හිමි අයිතිකරුවෙකු වීම වැනි ලක්ෂණ අවශ්‍ය ය.[64] **'පෞද්ගලික ප්‍රයෝජනය සඳහා කටයුතු නොකරන, මහජන යහපත සඳහා කැප වූ බුද්ධිමත් පිරිසක්'** ලෙස රදළ ආණ්ඩුවට කැපී පෙනිය හැක. කාරුණික ව හෝ බලහත්කාරයෙන් මෝඩයා පාලනය කිරීමේ අයිතිය රදළ ආණ්ඩුවක පවතී.

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක, පුද්ගලයාට ලැබී ඇති 'දේශපාලන සමතාව' හේතුවෙන් පාලකයා වෙනස් කිරීම සඳහා ඡන්ද බලය පාවිච්චි කළ හැකි ය.[65] ව්‍යවස්ථාවකට එකඟ ව ආණ්ඩුවේ තීරණයන් කෙරෙහි බලපෑම් ඇති කිරීමට පුද්ගලයාට හැකි වන්නේ දේශපාලන නිදහස අගය කරන හෙයිනි. කතා කිරීමට, අදහස් පළ කිරීමට හා රැස්වීම් පැවැත්වීමට ඇති අයිතිය නිසා අනෙක් තැනැත්තන් ගේ අදහස් වලට ගරු කිරීමටත්, ඇහුම්කන් දීමටත් පුරුද්දක් ඇති වේ. එක ම සමාජයකට අයත් පුද්ගලයන් ගේ අදහස් එක් කොට සාමූහික ජීවිතයට ගැළපෙන අයුරින් සකස් කර ගැනීමේ දී පොදු යහපත උදෙසා මතභේද දුරුකර ගැනීම අත්‍යවශ්‍ය වේ. 'පරම සමතාව'[66] බල පැවැත්වෙන විට අධ්‍යාපන පහසුකම් සැලසීම, රැකී රක්ෂා විරහිත භාවයෙන් පුද්ගලයා ආරක්ෂා කර ගැනීම, මහලු වයස හා රෝගී බවට සරිලන සේ වැටුප් ක්‍රම සැකසීම, වැඩ කරන ප්‍රමාණය සාධාරණ වීම, නිවාඩු හා විවේකය සඳහා වැඩපිළිවෙල යෙදීම ආදී සියල්ල, සියලු පුද්ගලයන්ට සමාන අවස්ථා ලැබෙන අයුරින් ක්‍රියාත්මක කළ යුතු වේ.

"පුද්ගලික දේපළ ඇති තැන යහපත පැතිරවීම අපහසු ය. පොදු භුක්තිය නොමැති තැන සමානත්වය පැවතිය නොහැකි ය," ප්ලේටෝගේ සමූහාණ්ඩුව හා මෝර්ගේ 'යුටෝපියාව' විශ්වාස කළ බව පෙනේ. එහෙයින් දේපළ පෞද්ගලික විය යුතු

64 බ.ද., පි.690 දී.3, පි.159. බ.ද., පි.677.

65 බ.ද., පි.564.

66 බ.ද., පි.549 - 552. -එම- පි.602.

නමුත් දේපළවල ප්‍රයෝජනය බෙහෙවින් ම පොදු ස්වභාවයට පත් කරවන තරම් තරමට මිනිසුන් ත්‍යාගවන්ත භාවයෙහි හා නිර්ලෝභී භාවයෙහි පුහුණු කරවිය යුතු වේ.[458]

දේශපාලන බලය;

1. පුද්ගලයන්ගේ පොදු යහපත සඳහා නීති සම්පාදනය කිරීම,
2. නීති ක්‍රියාත්මක කිරීම,
3. රාජ්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා පුද්ගලයන්ගේ බලය මෙහෙයවීමේ අයිතිය.

මෙතෙක් අප සාකච්ඡා කළ වියතුන් ගේ අදහස් අනුව යමින් අර්ථ දැක්විය හැකි ය.[67] රාජ්‍ය බලය කිසි විටෙකත් පොදු යහපත නො ඉක්මවන්නේ යයි සැලකෙන හෙයින් ද, සමාජගත සෑම පුද්ගලයාගේ ම අපේක්ෂාව පරම යහපත බැවින් ද, ඒ ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානයක් හා නායකත්වයක් අවශ්‍ය බව පිළිග ැනේ. 'සාර්ථකත්වය' නම් වූ විද්‍යාවක් වෙතොත්; සුදනන්ගේ සාමාර්ථ්‍යන් සම්බන්ධව එය හැදෑරිය හැකි තරමින් ම, දුදනන් ගේ සාමාර්ථයන් සම්බන්ධයෙන් ද එය හැදෑරිය හැකි ය.[68]

දේශපාලන අර්ථයක් ඉෂ්ට කර ගැනීම සඳහා කවර අන්දමක හෝ බලය අවශ්‍ය ය.

'ධර්මය ජය ගනී' හෝ 'පාපයෙහි ජයග්‍රහණය වැඩි කල් නො පවතී' යනා දී පාඨවලින් මේ ප්‍රත්‍යක්ෂ කාරණය යටපත් වේ.

ඔබ නිරවද්‍ය යයි සිතන පැත්ත බලපවත්වන්නේ නම් එසේ වනුයේ ඒ පැත්තට වැඩි බලයක් හිමිවන හෙයිනි. බොහෝ විට බලය; මතය උඩ ද, මතය ප්‍රචාරය උඩ ද රඳා පවතී. තමන්, තම ප්‍රතිවාදියාට වඩා සත්ගුණවත් ලෙස පෙනී සිටීම ප්‍රචාරයෙහි දී ප්‍රයෝජනවත් වන බව ද, සත්ගුණවත් ලෙස පෙනී සිටීමේ එක විධියක් නම් සද්ගුණවත් වීම බව ද සැබෑ ය.

---

67 බ.ද., පි.212. -එම- පි.602.

68 අ.නි. 3, පි.243 - 267.

රජෙකු ගෞරවය කැමති වන අතර, ප්‍රජා පීඩකයා කැමති වනුයේ වස්තුවට ය. එහෙයින් ජනතාව රැක ගැනීමට පොරොන්දු වී බලය අල්ලා ගැනීමට කැමති කපටි පුද්ගලයන් සාධාරණ විප්ලවකරුවන් ලෙස පෙනී සිටීමට ඉඩ තිබේ. එවැනි පුද්ගලයෙකු බලය අල්ලා ගැනීමෙන් අනතුරු ව බලයෙහි රැඳී සිටීම සඳහා විවිධ උපාය මාර්ග අනුගමනය කරනු ඇත. ඔහු අතිවිශේෂ දක්ෂතා සහිත විශේෂ පුද්ගලයන්ගේ නැගීම වළක්ව යි. විශේෂ දක්ෂතා ඇත්තන්ට මරණ දඬුවම දීමෙන් හෝ ඔවුන් කූට ලෙස මරණයට පත්කිරීමෙන් හෝ විනාශ කිරීම එවැන්නෙකු ගේ පිළිවෙත ය. ප්‍රජා පීඩකය පාලකයා තමන්ගේ පාලනයට විරුද්ධ අදහස් ජනිත කරවන අධ්‍යාපනය වළක්වාල යි. නිදහස් අදහස් දරන, සමාජ සමිති, සමාගම් හා රැස්වීම් තහනම් කිරීම, යෝධ කර්මාන්තයන්හි මිනිසුන් නිරර්ථක ලෙස යෙදවීම, ස්ත්‍රීන් හා වහලුන් ඔත්තුකරුවන් ලෙස යෙදවීමේ බලය පැවරීම, මිනිසුන් සේවයේ රඳවා තැබීම පිණිසත්, නායකයෙකු ගේ අවශ්‍යතාව දැනීම පිණිසත්, යුද්ධ ඇති කිරීම ආදිය බලයේ සිටින ප්‍රජා පීඩකයකුගේ උපාය මාර්ග වන්නේ ය.[69] ප්‍රජා පීඩකයා ස්වකීය බලය රඳවා ගැනීමට දරන තවත් උත්සාහයක් වන්නේ ආගම් ලැදි බව දැක්වීම ය. මෙවැනි ප්‍රජා පීඩකයන් බලයට පත්වන්නේ විප්ලව කිරීමෙනි. විප්ලවය වැළැක්වීම සඳහා ගත යුතු දේශපාලන උපාය මාර්ග තුනක් ලෙස; අධ්‍යාපනය පිළිබඳ රජයේ ප්‍රචාරය, සුළු කරුණෙහි දී පවා නීතිගරුක භාවය හා නීතියෙහිත් පරිපාලනයෙහිත් සාධාරණ යුක්තිය, දක්වා තිබේ. සාධාරණ යුක්තිය වීම සඳහා සමානුපාතික වීම වැදගත් බව එහි දී අවධාරණය කෙරේ.[70] අධිකාරියට විපක්ෂ වූ, හිස නොනමන ස්වභාවය දෙයාකාර වන බවත්, ඉන් සමාජ හිතකර වූ, හිස නොනමන ස්වභාවය සත්‍යවාදී වූ, බුද්ධිමය ස්වභාවය පළමුවැන්න බවත්, සමාජ හිතකර නො වූ, හැඟීම්වලට බර වූ ද්වේෂ සහගත ස්වභාවය, දෙවැන්න බවත් සඳහන් වේ.

---

69 දී.නි. 1, පි.265 - 267. අ.ලි., පි.24 - 27, ස්තම්භ ලෙබ7.

70 බ.ද., පි.208 - 210.

මේ අවස්ථා දෙකේ දී ම ඒ ඒ පුද්ගලයන් තුළ පවතින නිදහස හා සමානාත්මතාව පිළිබඳ අදහස් මතුකරළිය හැකි ය.

විද්‍යාඥයා අලුත් සිද්ධාන්තයක් සොයා ගත් කල, එකී සිද්ධාන්තය, හරි ද, වැරදි ද? යන්න තීරණය කළ යුතු වූයේ අධිකාරිය විසින් නොව, එහි පවතින නිරවද්‍ය බව නම් වූ සත්‍යය මත ය.[71] සාමාන්‍යයෙන් පිළිගත් පූර්ව සිද්ධාන්ත හා සත්‍යය මත පිහිටා තර්ක අනුසාරයෙන් අන්‍යයන්ට කරුණු වටහා දීමේ දී, අධිකාරිය පිළිබඳ සැලකිල්ලක් දැක්වීම අවශ්‍ය නොවේ. විවාදය හා විමර්ශනය මගින් සියලු පුද්ගලයන් එකඟත්වයකට ගෙන එන බැවින්, ඉන් සමාජ උන්නතියක් ම සිදුවේ.

සහනශීලී සමාජයේ ගැටුම්වලට තුඩුදෙන අන්දමින් හා සමානත්වය මතු කළ හැකි අවස්ථා එමටය. සාගින්නෙන් පෙළෙන්නවුන් හා නිතැතින් ම අපරාධයනට සම්බන්ධ වීමට කැමැත්තෙන් සිටින්නවුන්ට, සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා පෙළඹවීමට අමුතු විසිතුරු දර්ශනයක් අවශ්‍ය නො වේ.[72] ජාතිවාදය, ආගම, කුලය, ගම, රට ආදී හැඟීම් අවුස්සන ඕනෑ ම මාතෘකාවක්, 'මම', 'මගේ', 'අප', 'අපේ' ගතියෙන්, පුද්ගලයා අගතියට යොමු කරවනු ලබයි. එහි දී, 'නිදහස හා සමානාත්මතාව සඳහාය' යනුවෙන් ස්වකීය පක්ෂය මතු කරන දර්ශනය පුද්ගලයා අගය කරනු ලබයි. එහි ප්‍රකෘති ස්වභාවය ආහාර සුලභව ලබා ගැනීම, මංකොල්ලකෑම, කාම අපරාධ වැනි පුද්ගලයා තාවකාලික ව තෘප්තියට පත් කරන්නක් විය හැකි ය. නමුත් එය බලකාමී නායකයන්ට ස්වකීය පුද්ගල අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගත හැකි දිව්‍යමය මාර්ගයක් වනු නොඅනුමානය. පුළුල් අධ්‍යයනයක් කොට, ආණ්ඩු විපර්යාසයන්ගේ සාමාන්‍ය හේතුව, මිනිසා සමානත්වය ලැබීම කෙරෙහි පවතින තෘෂ්ණාව යයි ද, එය වැළැක්වීමට ඇති හොඳ ම පිළිවෙත මධ්‍යම ප්‍රතිපදාව යයි ද, ඇරිස්ටෝටල් පැවසූ බව කියති. ඒ ප්‍රකාශය විද්‍යාත්මක සත්‍යයක් ලෙස අද පිළිගැනේ.

71 බ.ද., පි.603. -එම- පි.766.

72 බ.ද., පි.604. -එම- පි.295, 159 - 160. 216 - 217 හා 601.

මිනිසාගේ අතෘප්තිකර ආශාවන් (වුවමනාකම්) සපුරාලීම සඳහා අවශ්‍ය සම්පත් සමාජය සතු නොවේ.

නොදියුණු සමාජයක අවශ්‍යතාව, එදිනෙදා වේල සපයා ගැනීම සඳහා ස්වභාව ධර්මයා සමඟ සටනක යෙදීම විය හැකි ය.[73] එහෙත් ධන කුවේරයන් එක් වුවමනාවක් පිරිමසාලීමත් සමඟ නොදුටු වෙනත් වුවමනාවක් හෝ වුවමනාකම් කීපයක් මෙසේ ඇති වේ. අතෘප්තිකර ස්වභාවය සංසිඳුවීමෙන් පමණක්, මෙකී වුවමනාවන් සීමාකර ගත හැකි වෙතැයි සලකන ආර්ථික විද්‍යාඥයා, සම්පත් හිඟකම, ලෝකයෙන් ඉවත් කළ නොහැකි සාධකයක් ලෙස හඳුන්වයි.

පවතින සම්පත්වලින් උපරිම ජනතා කොටසක් තෘප්තිමත් කිරීම හා සෙසු අවශ්‍යතා කල් දැමීම යන ක්‍රම දෙක සැලසුම් සම්පාදනයේ දී සැලකිල්ලට ගන්නා ආර්ථික විද්‍යාඥයා, සංවර්ධන සැලසුම් සඳහා ප්‍රමාණය වැඩි කිරීම හා වුවමනා සීමා කිරීම යන ක්‍රම දෙක අනුගමනය කරයි.

සම්පත් ප්‍රමාණය වර්ධනය නොවීම, වුවමනාකම් ශීඝ්‍රයෙන් වැඩිවීම යන කරුණු දෙක ආර්ථික ගැටලු ඉතා බැරෑරුම් ස්වභාවයකට පත් කරන බැවින්, ඒ ඒ පුද්ගල අවශ්‍යතා අවම කර ගැනීම වැදගත් වේ.[74]

පුද්ගල අවශ්‍යතා සංසිඳුවන ඕනෑ ම දෙයක් 'භාණ්ඩය' ලෙස අර්ථ දැක්වෙන අතර, අවශ්‍යතාව සංසිඳුවීමෙන් ලබන තෘප්තිය 'උපයෝගීතාව' යි කියති. අමූල්‍ය භාණ්ඩ හා ආර්ථික භාණ්ඩ ලෙස භාණ්ඩ වර්ග කිරීමේ දී මුදලක් නොගෙවා ලබා ගන්නා වාතය, හිරු එළිය, ජලය ආදිය අමූල්‍ය භාණ්ඩ යයි කියති. මිනිසාගේ අතෘප්තකර ආශාවන් සංසිඳුවා ගැනීමට පරිසරය දූෂණය කිරීමෙන්, බෙහෙවින් සුලභ අමූල්‍ය භාණ්ඩ පවා ආර්ථික භාණ්ඩ බවට පත්විය හැකි ය. ධනවාදී කාර්මික රටවල වාතය

73 බ.ද., පි.565, 872, 210. පි.767. -එම- පි.76.

74 බ.ද., පි.211, 766 - 772.

හා හිරු එළිය සඳහා මුදල් ගෙවීමට සිදුවීම නිසා පරිසරය රැක ගැනීමෙන් ඒවා නොමිලයේ ලබා ගත හැකි ක්‍රම, උපක්‍රම, පිළිබඳ ව මිනිසුන් ගේ අවධානය යොමු කරවීමට මෙකල පරිශ්‍රම දරන බව පෙනේ. ආර්ථික භාණ්ඩ ලබා ගැනීම සඳහා පවතින තරගය නිසා මිල ඉහළ යයි. භාණ්ඩ වලට මිල හට ගැනීම මෙන් ම, ශ්‍රමයට ද මිල හට ගනී.[75] විශේෂඥභාවයට වැඩි මිලක් ලැබෙන හෙයින් ශ්‍රම විභජනය වැදගත් සාධකයක් වේ. සමාජය සතු සම්පත් යොදවා ඕනෑම වුවමනාවක් සපුරා ගත හැකි බැවින් සම්පත් විකල්ප ප්‍රයෝජන ඇති දෑ ලෙස සලකනු ලැබේ. යම් අවස්ථාවක් වෙනුවෙන් කැප කරන ලද ඉතා ම හොඳ විකල්ප අවස්ථාව ආවස්ථික පිරිවැය ලෙස ආර්ථික විද්‍යාව සලකයි. වුවමනාවන් ගේ අසීමිත බවත්, සම්පත්වල සීමිත බවත් අතර පවතින ගැටුම, ආවස්ථික පිරිවැය පැවතීමේ මූලික හේතුව ය. විකල්ප ප්‍රයෝජන ඇති සීමාසහිත සම්පත්, සීමාරහිත වුවමනාවන් වෙනුවෙන් පරෙස්සමෙන් වැය කිරීම කළ හැක්කේ සමාජ සංවිධාන තුළිනි.

නිෂ්පාදන රටාව, රැකියා රටාව, ආදායම් බෙදී යන ආකාරය, මිල නියමය හා එහි ප්‍රතිඵල ආදී ක්‍රියාකාරීත්වයන් එකිනෙකට බැඳී පවතින හෙයින්, වුවමනාකම් අවම කර ගැනීම සඳහා පුද්ගලයන් හුරු කරවීම අත්‍යවශ්‍ය වේ. පුද්ගලයාගේ නිදහසත්, රටක නිවහල් බවත් සඳහා චාම් ජීවිත හුරු පුරුදු කරවීම නිදහස හා සමානාත්මතාවේ සංකේතය විය යුතු ය.[76]

පුද්ගලයා අපරාධයට පොළඹවන හේතූන් සමාජය තුළින් ම ඇති විය හැකි ආකාරය චක්කවත්ති සීහනාද සූත්‍රය මතු කරයි. දස සක්විතිවත් මොනවා දැයි විමසා බලා, කී පරිදි දැහැමි රකවළ යෙදූ රජ, දිළිඳු පුද්ගලයන්ට ධනය නොදීමේ හේතුවෙන් දිළිඳු බව ක්‍රම ක්‍රමයෙන් වැඩී ගිය බවත්, ඒ වැඩී යාම නිසා

75 දී.නි. 1, පි.261 - 279 කූටදන්ත සූත්‍රය. දී.නි. 1, පි.261 - 263. බ.ද., පි.871, 866. -එම- පි.799.

76 බ.ද., පි.692 - 693. බ.ද., පි.698 - 699.

එක්තරා පුරුෂයෙකු අනුන් සතු නොදුන් දැයි සොර සිතින් ගත් බවත් පවසයි.[77] මෙහි දී සොරකම් කළ පුද්ගලයා ජීවිතය රැකීම සඳහා සොරකම් කළ බව පැවසූ නිසා රජු ඔහුට ධනය දෙයි. පුද්ගලයෙකු ගේ එදිනෙදා ජීවත්වීම සඳහාත්, සමාජයීය යුතුකම් ඉටු කිරීම සඳහාත් ධනය අවශ්‍ය බව තේරුම් ගත් රජතුමා ඔහුට ධනය දුන් නමුත් ඒ අපරාධ වැළැක්විය හැකි පිළිවෙත නො වූ බව එම සූත්‍රය සඳහන් කරන විස්තරයෙන් පැහැදිලි වේ.

වෙනත් පුද්ගලයෙකු ද, මුලින් කී පුද්ගලයා මෙන් සොරකම් කොට අසුවූයෙන් ඔහුට ද ධනය ලබා දුන් නිසා ඔහු අනුගමනය කළ අන්‍ය පුරුෂයෝ ද ධනය සොරකම් කිරීමට පෙළඹුණහ.

මෙහි දී රජතුමා යොදනු ලබන දෙවන පිළියම වනුයේ සොරාගේ හිස ගසා දැමීමය. සොරුන්ගේ හිස් ගසා දමන බව ඇසූ මිනිසුන් තම තමන්, ආයුධ සකස් කරගෙන සොරුන්ට දඬුවම් පැමිණවීමෙන් රජතුමා අනුගමනය කළ හ.[78] සොරු ද පැහැර ගැනීම සඳහා ආයුධ සකස් කර ගත් හ. මෙහි ප්‍රතිඵලය වූයේ ආයුධ භාවිතය බෙහෙවින් පැතිර යාමය.

අවි ආයුධ බහුල වීමෙන් ප්‍රාණඝාතය වැඩී ගියේ ය. ප්‍රාණඝාතය වැඩී යාම නිසා සත්ත්වයන්ගේ ආයුෂ ද, වර්ණය ද පිරිහිණ.

දිළින්දන්ට නිසි කල කර්මාන්ත ව්‍යාපාර සඳහා ධනය ලබා නොදීමෙන් සොරකම හා ප්‍රාණඝාතය වැඩී ගිය බවත්, මිනිසුන්ගේ පිරිහීම එතැනින් නොනැවතුණ බවත්, මෙහි දී සැලකිල්ලට ගත යුතු ය. එහි අවසාන ප්‍රතිඵලය ලෙස එකින් එක වැඩී ගිය අකුසල් රාශියකගේ එක්තැන් වීම සිදු විය.

දිළින්දන්ට ධනය නොදුන් කල්හි දිළිඳු බව වැඩීමට ගියේ ය.

දිළිඳු බව වැඩී ගිය කල්හි අදත්තාදානය වැඩීමට ගියේ ය.

අදත්තාදානය වැඩීමට ගිය කල්හි ආයුධ වැඩීමට ගියේ ය.

77 බ.ද., පි.554.

78 බ.ද., පි.555 - 556.

ආයුධ වැඩීමට ගිය කල්හි ප්‍රාණඝාතය වැඩීමට ගියේ ය.

ප්‍රාණඝාතය වැඩීමට ගිය කල්හි මුසාවාදය වැඩීමට ගියේ ය.

මුසාවාදය වැඩීමට ගිය කල්හි පිසුනාවාචා (කේලම) වැඩීමට ගියේ ය.

පිසුනාවාචා වැඩීමට ගිය කල්හි කාම මිථ්‍යාචාරය වැඩීමට ගියේ ය.

කාම මිථ්‍යාචාරය වැඩීමට ගිය කල්හි පරුෂ වචනයත්, සම්පප්‍රලාපයත් යන දෙක වැඩීමට ගියේ ය.

එරුස වචන හා සම්පප්‍රලාපය වැඩීමට ගිය කල්හි අභිධ්‍යා, ව්‍යාපාදයන් වැඩීමට ගියේ ය.

අභිධ්‍යාවත්, ව්‍යාපාදයත් වැඩීමට ගිය කල්හි මිථ්‍යා දෘෂ්ටිය වැඩීමට ගියේ ය.

මිථ්‍යා දෘෂ්ටිය වැඩීමට ගිය කල්හි අධර්ම රාග, විෂම ලෝභ, මිථ්‍යා ධර්ම යන ලාමක ධර්ම තුන වැඩීමට ගියේ ය.[79]

ඒ ලාමක ධර්ම තුන වැඩීමට ගිය කල්හි මවට, පියාට සත්කාර නොකරන බව, මහණ බමුණන්ට ගරු නොකරන බව, වැඩිහිටියන්ට යටත් පැවතුම් නොමැති බව යන දුර්ගුණ වැඩීමට ගියේ ය.

ඒ සියලු දුර්ගුණ වැඩීමට යාමේ ප්‍රතිඵලය වූයේ මව, සුළු මව, නැන්දණිය, ඇඳුරු, බිරිඳ, සුළු පියා, දෙටු පියා, බිරිඳ ආදී හැඟීමෙන් තොර ව එළු, බැටළු, කුකුළු, බලු ආදීන් මෙන් කුල සීමාවන් බිඳ මිශ්‍ර භාවයට යාම යයි දක්වන එම සූත්‍රය, දිළිඳු බවෙන් පටන් ගත් ඵල විපාකවල අවසානය[80] එතෙකින් නොනැවතී යන ආකාරය පැහැදිලි කරයි. සිත ඉතා දැඩි වීමෙන්, මව-පුතා, පියා - පුතා, සහෝදර-සහෝදරියන් වශයෙන් පැවති

79 බ.ද., පි.214.

80 -එම- පි.213. බ.ද., පි.205 -එම- පි.213.

සබඳතා බිඳ දමමින් වධක සිතින් ඔවු නොවුන් කෙරෙහි මෘග සංඥාවෙන් යුක්ත ව එකිනෙකාගේ දිවි තොර කළ ආකාරය සංවේගදායි විය.

යම්කිසි රටක පවතින දිළිඳු බව උග්‍රවීමත් සමඟ සියලු යහගුණ නැති වන බව චක්කවත්ති සීහාද සූත්‍රය දක් වූ එම පුවතින් වටහා ගත යුතු අතර, ඇති නැති පරතරය අවම කිරීමත්, ඇත්තන්ගේ ධනය විවිධ කර්මාන්තවල ක්ෂේත්‍රවල යෙදවීමෙන් රැකියා සුලභ කිරීමත්, රාජ්‍ය පාලකයන්ට වටිනා උපදේශයක් වනු ඇත.[81] මිනිසුන්ගේ අධ්‍යාසයන් අනුව වැරදි ජීවත්වීමේ ක්‍රමයන්ට ඇබ්බැහිවූවන් සඳහා දඬුවම් පැමිණවීම වෙනුවට නිවැරදි ජීවන ක්‍රමයන්ට ඔවුන් හුරු කරවීමත්, ලැජ්ජාව සහ භය වර්ධනය කරවීමත් වැදගත් ය. **නීතිය ගරු නොකරන සමාජයක වසන මිනිසා ඉතා නපුරු ම සතා බව හැඳින, පවට, ලැජ්ජාව බිය ඇති කරවීම නීතිරීති ක්‍රියාත්මක කරවීමේ[82] පහසු ම මාර්ගය වනු ඇත.**

තථාගතයන් වහන්සේගේ දේශනාවට අනුව සියල්ල ජය ගත හැක්කේ තෘෂ්ණාව ක්ෂය කළ තැනැත්තාට ය යන්න බොහෝ තන්හි අප විසින් අවධාරණය කරනු ලැබී ය. එහෙයින් දේශපාලන භූමියෙහි දී ද යහපත් පාලකයකු විය හැක්කේ සියල්ලන්ගේ ම නිදහස ගරු කරන, සාධාරණත්වය ඉටු කරන, ආත්ම පාලනයෙන් යුත් පාලකයෙකුට ය.

තථාගත හා චක්‍රවර්ති රජ යන පුද්ගලයන් දෙදෙනා ගේ උපත බොහෝ දෙනාට හිතසුව පිණිස පවතී. ආශ්චර්යය මනුෂ්‍ය ව උපදින ඒ දෙදෙනාගේ කාලක්‍රියාව බොහෝ දෙනාට උපකාර පිණිස පවතී. සක්විති රජකු හට කවරකු රජ වන්නේ දැයි[83] ඇසූ පැනයට තථාගතයන් වහන්සේ දක්වූයේ, ධර්මය යන්න ය. **එහෙයින් සක්විති රජෙක් යන්නෙන් අදහස් කරන ලද්දේ ධර්මය**

81 බ.ද., පි.666 - 668.

82 -එම- පි. 657, 574, 576.

83 බ.ද., පි.824 -825.

ම ඇසුරු කොට, ධර්මයට සත්කාර කරන, ධර්මාධිපත්‍යය ඇති, ධාර්මික රැකවල් ඇතුළත් ජනයා වෙනුවෙන් යොදවන අසහාය පුද්ගලයෙකි. සක්විති රජ කෙනෙකුගේ ධර්ම චක්‍රය, පස මිතුරු වූ කිසිවකු විසින් වත් පෙරළිය නොහැකි වන්නේ, හේතු සංඛ්‍යාත අර්ථය දැනීම, ප්‍රාවේණි ධර්මය දැනීම, දඬුවම් ආදියෙහි මාත්‍රා දැකීම, රාජ්‍ය සුඛ, විනිශ්චය, චාරිකා ආදී කාලයන් පිළිබඳ දැනීම, ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ශ්‍රමණ ආදී පර්ෂද් දැනීම යන අංග පහෙන් යුක්ත වන හේතුවෙනි.[84] සක්විති රජුගේ දෙටු පුත් වුව ද, පියා පැවැත් වූ අණසක ම දැහැමින් පවත්වයි. අංගුත්තර නිකායේ ධම්මරාජ සූත්‍රය ද[85] සක්විති රජ කෙනෙකු ධර්මයට ගරු කරන ආකාරය පැහැදිලි ව දක්වයි. දීඝනිකායේ සීහනාද[86] සූත්‍රයෙහි සිය අණසක පැවැත්වීමෙහි සමත් සක්විති රජකු තුළ ඇති විය යුතු දස සක්විති වත්' දීර්ඝ විස්තර සහිතව සඳහන් කරන ලද හ.

1. තෙමේ දස කුසල දහම් හි යෙදී ඇතුළත ජනයා වූ අඹු දරුවන් ද දස කුසල ධර්මයෙහි යෙදවීම සහ ඔවුන්ගේ ධාර්මික රැකවරණය සැලැස්වීම.
2. බලකාය හෙවත් යුද්ධ සේනාව, ධර්මයෙහි පිහිටුවා දැහැමි රැකවරණය දීම.
3. ක්ෂත්‍රියයන්, දහම් හි යොදවා දැහැමි රැකවරණය සලසා දීම.
4. තමන් අනුගමනය කරන ස්වපාක්ෂිකයන්, ධර්මයෙහි පිහිටුවා රැකවරණය සලසා දීම.
5. බමුණු ගැහැවියන්, දහම් හි යොදවමින් දැහැමි රැකවරණය සැලසීම.
6. නියම් ගම් වැස්සන්, දහම් හි පිහිටුවීමෙන් දැහැමි රැකවරණය සැලසීම.

84 බ.ද. පි.207. C;E, 20. PP. 238 - 243.

85 බ.ද., පි.626. අ.නි. 2, පි.218 - 283. C.E. 20, P.236'

86 බ.ද., පි.622. බ.ද., පි.697 - 698.

7. මහණ බමුණන් කෙරෙහි ද, දැහැමි රැකවරණය ලබා දීම.

8. මෘග, පක්ෂි ආදී තිරිසනුන් ගත සතුන් කෙරෙහි ද, දැහැමි රැකවරණය සලසා දීම.

9. ස්වකීය විජිතයෙහි සිටින ධනය නැත්තවුන්ට ධනය දීම.

10. ස්වකීය විජිතයෙහි වෙසෙන සන්සුන් මහණ බමුණන් වෙත කලින් කල පැමිණ, කුසල්, අකුසල් විමසා, අකුසලින් තොර ව කුසල් දහම් හි යෙදීම,

එකී දහය ය.

**පාලකයකු අවශ්‍ය වන්නේ තෘෂ්ණාව බහුල වී සංයමය නැති ව[87] යන විට ඒ සඳහා නීති රීති පනවා පාලනය කිරීමට ය. ධර්මයෙන් පාලනය කිරීම** නිසා සැලසෙන යහපත හේතුවෙන් සක්විති රජුගේ ස්තූපය පවා මිනිසුන් පහදවති.[88] ත්‍රිපිටකයේ බොහෝ තැන්වල දසරාජ ධර්ම නමින් දැහැමි පාලකයකු තුළ තිබිය යුතු ගුණාංග දහයක් දක්වන ලදි. දානය, සීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, කෙලෙස් තැවීම, නොකිපීම, අවිහිංසාව, ඉවසීම (ඛන්ති) හා අනුන් හා නොගැටීම එකී දහය වේ. ධර්මයට අනුව යුක්තිගරුක සාධාරණ පාලකයන් සඳහා දැහැමි බව අත්‍යවශ්‍ය ය. දැහැමි බව ඇතැම් විට රාජ්‍ය පාලනයෙහි ලා පටහැනි වන්නේ දැයි සිතන්නට තරම්, සිදුවන අවස්ථා පැන නගී.[89] තථාගතයන් වහන්සේට ද එවැනි චිත්ත පරිවිතර්කයක් වූයේ දැයි සිතෙන ආකාරයේ පාඨයක් සංයුත්ත නිකායේ මාර සංයුත්ත රාජවග්ගයේ එයි. '**සක්කානු ඛො රජ්ජං කාරෙතං අහනං අඝාතය අජිනං අජපයං අසොචං අසෝචාපයං ධමෙනාති,**' නොනසමින්, නොනස්වමින්, ධන හානිය නොකරමින්, නොකරවමින්, දැහැමින් රජය කරවන්නට හැක්කේ දෝ යනුවෙනි.

87 මා.ද., පි.371 - 377 බ.ද., පි.215.

88 දී.නි. 3. පි.111.

89 -එම- පි.113 බ.ද., පි.357.

**ධාර්මික රජ කෙනෙකු සතු විය යුතු ගුණාංග කවරේ දැයි දක්වීමට රචනා කරන ලද, ආචාර්ය නාගාර්ජුන පාදයන්ගේ රත්නාවලි හා සුහෘලේලඛාව ථේරවාදී උගැන්වීම් ප්‍රකට කරවමින් ඉතා සරල ලෙස පාලකයන්ට අවශ්‍ය උපදෙස් සපයයි.**

"මහ රජ, සියලු කටයුතු විෂයයෙහි ධර්මය පෙරටු විය යුතු ය. ධර්මය මධ්‍ය විය යුතු ය. ධර්මය ම නිෂ්ඨාව ද විය යුතු ය. එයින් මොලොව පරලොව නො පිරිහේ.[90] ධර්මයෙන් කීර්තිය ද, සැපය ද මෙහි දී ලැබේ. පරලොව දී සැප සමෘද්ධිය වේ. එහෙයින් හැමදා ධර්මය භජනය කරන්න. ධර්මය ම ශ්‍රේෂ්ඨ නීතියයි. ධර්මයෙන් ලෝකයා අනුරඤ්ජනය කෙරේ. ධර්මයෙහි ඇලුණු ලෝකයා මෙලොව පරලොව දෙක් හි නොරැවටෙති.'

සතුරන් සමඟි කිරීම ඉතා දුෂ්කර ය. එහෙයින් සතුරාගේ පවා අප්‍රිය දේ නොකැමති ව දෝෂයන් හැර දා, ගුණයන් ආශ්‍රය කළ යුතු ය. ස්වහිතයෙහි යෙදෙනවුන්ට සතුරා පවා ප්‍රියවන බවත්, සතුරා පවසන සත්‍යය පවා අහිතවත් බැවින්, ඒ මුසාවක් ලෙස බැහැර කළ යුතු බවත් 'රත්නාවලී' දක්වයි.

"යහපත් මාර්ගය කියන්නෝ දුර්ලභය හ. හිතවත් වූ මාර්ගය අප්‍රිය විය හැකි ය. නිරෝගී බව සඳහා ඖෂධ ගත යුතු ම ය. අප්‍රිය දෑ ද එසේ ය. රාජ සේවකයන් අධර්මය අනුව යමින් රජුට ස්තුති කරනු ලබන හෙයින්, සුදුසු නුසුදුසු සේවකයන් අවබෝධ කර ගැනීම අපහසු ය. මරණය දක්නා හෙයින් මෙලොව සැප කැමැත්තෙන් වුව ද පාපය කිරීම නුසුදුසු ය. යම්කිසි ක්ෂණයක අගය ද, තවත් ක්ෂණයක භය ද වන බව දැක, එක් අවස්ථාවක දී හෝ බියක් නො වේ ද, සැනසීමක් ම ලැබේ ද, එහි යෙදිය යුතු ය. අනුභව කළ වස්තුවෙන් මෙලොව සැප පැමිණේ. දුන් වස්තුවෙන් පරලොව සැප පැමිණේ. අනුභව නොකළ, නොදුන් ධනය විනාශ වන බැවින් දුක්ම ය.

---

90 දී.නි. 3, පි.111 - 119. බ.ද., පි.882.

මරුගේ පැමිණීම කෙරෙහි සුළං හමන තැනක පහන මෙන් මැදිහත් විය යුතු ය. රාජ්‍යය ධර්මය පිණිස ය, කීර්තිය හෝ නාමය පිණිස නො වේ. ද්වේෂයෙන් හෝ ධනාශාවෙන් හෝ දඬුවම් නොකළ යුතු ය. අකීකරු පුත්‍රයින් සුදුස්සන් කරන අදහසින් දඬුවම් කරන්නාක් මෙන් දඬුවම් කළ යුතු ය. දාන, ශීල දෙක පරාර්ථය පිණිස ද, ක්ෂාන්ති වීර්යය දෙක ආත්මාර්ථය පිණිස ද, ධ්‍යාන ප්‍රඥා දෙක මෝක්ෂය පිණිස ද, සංග්‍රහ කරන ලද (මහායාන) ෂට් පාරමිතාවෝ ය.[91] ඉන් දානය, ශීලය, සත්‍යය, ක්ෂමාව යන ඒවා විශේෂයෙන් ගිහියන් සඳහා දේශනා කරන ලදි. ලෝකයාට විරුද්ධ වීමෙන් දැහැමෙන් රජය කිරීම දුෂ්කර හෙයින් ධර්මය හා යසස පිණිස පැවිදි විය යුතු ය."

යනුවෙන් රත්නාවලියේ එන උපදේශ ඉතා සිත්ගන්නාසුලුය. එකී උපදේශ නිදහස හා සමානත්වය මාතෘකාව යටතේ අප කිය වූ බොහෝ කරුණු ඉතා සංක්ෂේපයෙන් දක්වා ඇති බව පෙනේ. මහායානයේ එන අදහසට අනුව යමින් බුද්ධත්වය ලැබීමටත්, සියලු දෙනාට ම බුදුවරුන් වීමට මඟපෙන්වීමටත් අනුශාසනා කරන ''බව ද බයෙන් පෙළෙන සත්ත්වයන් සනසන්න" යයි ආයාචනා කරවයි. පාරමී ධර්මයන් ලෙස මෙහි ඉදිරිපත් කරන ලද්දේ ද පාරමී ධර්ම සයකි.

ථේරවාදී අදහස් වඩාත් ගැඹුරු හා සිත්ගන්නාසුලු ආකාරයෙන් ඉදිරිපත් කරන 'සුහෘලේඛා' ලෝවැඩ සඟරාවේ මෙන් සූත්‍රවල එන කරුණු ඉතා කෙටියෙන් සඳහන් කරන බව පෙනේ. 'හිස ගිනි ගත්තකු එගිනි නිවන ලෙස' යන ලෝවැඩ සඟරා පාඨය; මෙහි 'ඔබ හිස හෝ ඇඳුම ගිනි ගත්තොත් වහා එය නිවා ගන්නෙහිය,' යනුවෙන් සඳහන් ය.[92] සප්ත බොධ්‍යංග, පටිච්ච සමුප්පාද, ආර්ය අෂ්ටාංගික මාර්ගය, චතුරාර්ය සත්‍යය ආදීන් පිළිබඳ ව ද මෙහි සරල ලෙස විස්තර සැපයේ. අවලොකිතේශ්වර හා අමිතග ාමෙන් ලෝකාධිපති වන්නටත්, බුද්ධත්වයට විවරණ ලබන්නටත්

91 දී.නි. 3, පි.119 - 121. බ.ද., පි.824 - 825. බ.ද., පි.874.

92 දී.නි. 1, පි.263 කූටදන්ත සූත්‍රය.

'සුභෘලේලබාව' රජුට ආරාධනා කරයි. මෙම අදහස ම අපේ දීඝ නිකායේ එන මහා සුදස්සන සූත්‍රය. ජනවසග සූත්‍රය හා ලක්ඛණ සූත්‍රය යන සූත්‍රවලින් ද මතු කර ගත හැකි බව පෙනේ.

සක්විති රජ කෙනෙකුට දැහැමි පාලනයක් ගෙන යාමෙන් අනතුරු ව බ්‍රහ්ම ලෝකවල උපත ලබා පසු ව, බුද්ධත්වයට පත්වන බව එකී සූත්‍රවලට අනුව නිගමනය කළ හැකි ය.

මහා ගෝවින්ද සූත්‍රයේ එන පරිදි ආමගන්ධයක් දුරලනු පිණිස පැවිදි බිමට පත්වන මහා ගෝවින්ද බමුණා[93] සක්විති රජකු බඳු ය. අපේ තථාගතයන් වහන්සේ ම මහා සුදස්සන සක්විති රජු ලෙස උපන් බවත්, සවරක් ම එසේ පෙර ආත්මවල සක්විති රජ පදවි දරන ලද බවත්, ඒ සියලු සංස්කාරයන් ම අනිත්‍ය බැවින් ඒවායින් මිදීම යහපත් බවත් මහා සුදස්සන සූත්‍රය[94] අවධාරණය කරයි.

බෝධිසත්ත්ව යන වචනය මුලින් ම යොදන ලද්දේ බුද්ධ චරිතය පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇති තැන්වල ය යන්න, මලලසේකර මහතා ගේ අදහස වේ. බෝධිය ලබා ගැනීමට සුදුස්සා බෝධිසත්ත්ව[95] නම් වෙයි. බෝධිසත්ත්ව පරමාර්ථය නම් වූ බුද්ධත්වය කරා පිය නැගීමට ගුණධර්ම රාශියක් සම්පූර්ණ කළ යුතු වේ. ඒ ගුණධර්ම අතර පාරමිතාවන්ට ලැබෙනුයේ ඉතා උසස් තැනෙකි. පාරමිතා යනු පිරිය යුතු, පරතෙරට පැමිණි, පරම පවිත්‍ර වැනි තේරුම් දරන බව විචාරකයන්ගේ අදහස ය. පාරමිතාවන් පිළිබඳ ව ථේරවාද හා මහායාන අදහස් තරමක් වෙනස් ය.

ලලිත විස්තරය, ලංකාවතාර, සද්ධර්ම පුණ්ඩරික හා ප්‍රඥා පාරමිතාව වැනි මහායාන ග්‍රන්ථවල ප්‍රධාන වශයෙන් පාරමිතා ධර්ම හයක් දක්වේ. ඉතිරි හතර යන්තමින් දක්වන ලද හ. දාන, ශීල, ක්ෂාන්ති, වීර්යය, ධ්‍යාන, ප්‍රඥා එකී පාරමිතා හය ය.

93 බ.දා., පි.767 -768, 857. බ.දා., පි.673.

94 බ.දා., පි.138.

95 අ.නි. 1, පි.147 - 149; පුද්ගල වර්ගය.

මෙම පරිච්ඡේදයෙහි මුලින් සඳහන් වූ පරිදි තථාගතයන් වහන්සේ අර්ථචර්යා තුනක් දක්වූහ. පරාර්ථ චර්යාව, ආත්මාර්ථ චර්යාව හා ස්වාර්ථ චර්යාව එකී තුනය. මහායානිකයන් ඉන් වඩාත් අගය කරන්නේ පරාර්ථ චර්යාව ය. ඉන් ලෝකයාට සැලසෙන ඉමහත් සෙත හේතුවෙනි. පරාර්ථ චර්යාව[96] හෙවත් අනුන්ට හිත සුව පිණිස, හිතානුකම්පීව අනුන්ගේ, ප්‍රයෝජනය සඳහා ජීවත්වීම මෙකල සමාජ සේවය ලෙස සලකති.

අනුන්ගේ සේවය සඳහා කැප වූ චරිතයක මහා ගුණධර්ම සමුදායක් පහළ විය යුතු ය. ඉන් ප්‍රධාන ම තැන හිමිවන්නේ දානය හෙවත් පරිත්‍යාගශීලී භාවයට ය. කෑම බීම, ගෙවල් - දොරවල්, ඇඳුම්-පැළඳුම් ආදී දෑ දීමත්, ශ්‍රමය දීමත්, වැඩපළ හා ජීවිත සාර්ථක කර ගැනීම සඳහා උපදෙස් දීම හා මඟ පෙන්වීමත් පරිත්‍යාගශීලී පුද්ගලයකු තුළ තිබිය යුතු එක් ලක්ෂණයකි.

සෑම දෙයක් ම තමන් වෙත රැස්කර ගැනීමෙන් ලෝභවීම නො ව, පොදුවේ කාගේත් යහපත සැලසෙන සේ ක්‍රියා කිරීම දානය ය. ජාතක කථා අතර දාන පාරමිතාව මතු කරන කථා බොහෝ ය. සංඛ, කුරුධම්ම, මහා සුදස්සන, සිවිරාජ වෙස්සන්තර, සස හා අකිත්ති ජාතක කථා සිත්ගන්නාසුලු ය. දාන පාරමිතාව පිළිබඳ ව එන වෙස්සන්තර ජාතකය සංවේග දනවනසුලු කා අතරත් බෙහෙවින් ප්‍රචලිත කථාවකි. සියලු ධනය දී වංකගිරියට ගිය බෝසත් තුමා ස්වකීය දරු දෙදෙනා හා භාර්යාව ද දන් දී බුදු බව ප්‍රාර්ථනා කිරීම ඕනෑ ම උසස් විද්‍යාවක පසුබිමෙහි සිට අගය කළ හැකි ක්‍රියාවෙකි. ඇස්, ඉස්, මස්, ලේ ආදිය පරිත්‍යාග දානමය පුණ්‍ය කර්මයට ම අයත් ය. බෝසත්තුමන්ගේ ශීල පාරමිතාව දක්වන ජාතක කථා අතර භූරිදත්ත ජාතකය බෙහෙවින් ජනප්‍රිය වී පවතී.

මහිස රාජ, මාතාංග ආදී කථාවලින් ද ශීලය රැකීමට දුරු වෙහෙස දක් වේ. ශීලය පිළිබඳ ව බොහෝ කරුණු දක්වන ලද හෙයින් මෙහි දී විස්තර නො කෙරේ. ආසාව දුරු කොට, අනගාරික ජීවිතයට එළැඹී ම නෙක්ඛම්ම පාරමිතාවෙන් දක්

96 අ.නි. 1, පි.209 - 211. අ.නි. 3, පි.244; ධම්මරාජ සූත්‍රය.

වේ. සොණ පණ්ඩිත, මඛාදේව ආදී ජාතක කථාවලින් මෙම පාරමිතාව මතු කරන ලද ආකාරය වටහා ගත හැකි ය.

බෝසතුන්ගේ ප්‍රඥා පාරමිතාව දක්වීමෙහි ලා එන හොඳ ම කථාව මහෞෂධ පණ්ඩිත පිළිබඳ කථාව දක්වෙන උම්මග්ග ජාතකය ය. අධිෂ්ඨාන පාරමිතාව තේමිය ජාතකයෙන් ද, සත්‍ය පාරමිතාව සුතසෝම ජාතකයෙන් ද, ස්වර්ණහංස හා මහාලෝමහංස ජාතක කථාවලින් උපේක්ෂා පාරමිතාව ද අර්ථවත් කර තිබේ.

**පුද්ගලයාගේ නිදහසට ආණ්ඩුක්‍රමය නිසා පමණක් නොව, ඔහු ජීවත් වන රාජ්‍යය හා වෙනත් රාජ්‍යයන් අතර සම්බන්ධය නිසාත් බාධාවන් ඇති වේ. නූතන රාජ්‍යයෝ ස්වාධිපත්‍යයෙන් යුත් රාජ්‍යයෝ ය. අනෙක් රාජ්‍යයන්ගෙන් නිදහස් ව ක්‍රියා කිරීමේ අයිතිවාසිකම මත අනිත් රාජ්‍යයන්ගෙන් සිදුවන මැදිහත්වීම නොඉවසති.**

ජාතික හැඟීම්[97] පදනම් කොටගෙන සංවිධානය කරන ලද ජාතික හැඟීම් නිසා ම, ඒවා එක්සත් ව පවතී. අතීතය පිළිබඳ උසස් සිද්ධීන් සිහි කිරීමෙන් පොදු වශයෙන් උරුම කර ගත් ස්මාරකයන් ද, එක්සත් ව ජීවත්වීම සඳහා සම්මුතීන් ඇතිකර ගැනීමෙන්, වඩ වඩා කටයුතු කිරීමේ ආශාව ඇති කිරීමෙන් ද, ජාතික හැඟීම් ඇති කර විය හැකි ය. **'ජාතිවාදයේ'** හොඳ පැත්තක් මෙන් ම නරක පැත්තක් ද තිබෙන බව කරුණු පරීක්ෂා කිරීමෙන් අවබෝධ කළ හැකි ය. **ජාතිවාදය යනුවෙන් අදහස් කරන්නේ අන් කිසිවක් නො ව, ඒ ඒ රාජ්‍යයන් ඒවාට හිමි වූ විවිධ නීති හා ආණ්ඩු ක්‍රම ඇති ව මනුෂ්‍ය ස්වභාවයේ විශේෂ ලක්ෂණයන් සහිත ව පැවැත්ම ය.**[98]

එක් එක් ජාතිය එහි පෞද්ගලිකත්වය දියුණු කර ගැනීම පමණක් නො ව, ජාතීන්ගෙන් සමන්විත මුළු මනුෂ්‍ය සංහතියේ

97 අ.නි. 3, පි.243 - 245, දී.නි. 3, පි.237 - 287 ලක්ඛණ සූත්‍රය.

98 -එම- පි.245.

සංස්කෘතික වටිනාකම දියුණු කිරීම ද සිදු කරයි. සභ්‍යත්වය දියුණු වන්නේ වෙනස්කම් ඇතිවීමෙන් හා එක් එක් ජාතීන්ගේ විවිධ විශේෂතාවන්ගෙන් ආභාසය ලැබීමෙන් යයි ද බොහෝ දෙනා විශ්වාස කරති. සෑම කණ්ඩායමකට ම විශේෂ වූ ලක්ෂණ පවතින බව තේරුම් ගෙන, එකී ලක්ෂණ මනුෂ්‍ය සංහතිය විසින් ම ආරක්ෂා කිරීම යෝග්‍ය ය.[99] ඒ සඳහා විශේෂ ව්‍යවස්ථා හා ආයතන ඇතිකර ගැනීමට අවස්ථාවක් සපයා දිය යුතු වේ.

**පෞද්ගලිකත්වයට බාධා කිරීමෙන් උසස් පුද්ගලයන් බිහි කිරීම නතර වන්නාක් මෙන්**, සෑම පුද්ගලයා ම එක ම සමාජයකට අයත්, එක ම සිරිත් විරිත් අනුව ජීවත් වන පිරිසක් කිරීමට තැත් කිරීමෙන් සහනය හෝ ඥානය වැනි, කුඩා ජාතියක පවා ඇතිවන උසස් ගුණධර්ම වැඩීම හෝ නතර වන්නේ ය.

ස්වයං පාලනය පිළිබඳ සිද්ධාන්තයන් වඩා හොඳින් ක්‍රියාත්මක වන්නේ ජාතිවාදී රාජ්‍යයන්හි යයි පිළිගැනීමක් ඇත. ජාතික හැඟීම්වලින් හෙබියා වූ රාජ්‍යයෝ පොදු නිලධාරියකුට හෝ බලයකට යටත් වූ ජාතීන්ට වඩා ස්ථිර ය.

ජාතිවාදයේ ඉතා ම අනතුරුදායක ලක්ෂණය වන්නේ ඒ තුළ ම, එහි විනාශය සඳහා ද මග පාදාගෙන තිබී ම ය.[100] ජාතිවාදය නිසා ලෝකයේ ආර්ථික මාර්ගයන්ගෙන් ලබා ගත හැකි උසස් ම ප්‍රයෝජන ලබා ගැනීම අපහසු බව පවසති. වෙළෙඳ සීමාවන් හා අය බදු, සිරිත් විරිත් හා ප්‍රමාණ කිරීම් මගින් නිදහස් වෙළෙඳාමට බාධා පමුණුවන හෙයින් අන්තර් ජාතික සහයෝගිතාව ලැබිය යුතු ක්ෂේත්‍රයන්හි ඒවා නොලැබී යයි. කාර්මික විද්‍යා අංශය හා අර්ථ ශාස්ත්‍රයත්, සාමාන්‍ය ව්‍යවහාර ඥානයත්, ජාතීන් එක්සත් කිරීමට උත්සහ දරද්දී, දේශපාලන ශාස්ත්‍රය කලහකාමී බවට හා සමඟි බවට විරුද්ධව යන විවිධ ප්‍රතික්‍රියා මාර්ග දිරිගැන්වීමෙන් ඒ උත්සාහය සුණු විසුණු කරයි.[101] මෙහි ලා සුදුසු පාලනයක අවශ්‍යතාව ඉතා වැදගත් වේ.

99 දී.නි. 3, පි.101 - 103; චක්කවත්තී සීහනාද සූත්‍රය.

100 දී.නි. 3, පි.117 - 125.

101 දී.නි. 2, පි.225; පරිනිබ්බාන සූත්‍රය.

නූතන සමයේ ජාතීන් අතර පවතින විවිධ අසහනයන්ට ප්‍රධාන ම හේතුව ජාතිවාදය බව පිළිගන්නා වැඩිදෙනා ඉන් ලෝක සාමයට හා මනුෂ්‍ය සංහතියේ පැවැත්මට එල්ල කරන මාරාන්තික තර්ජනය ද කෙරෙහි අවධානය යොමු කරවති.

යටත් වූ ජාතීන් නිදහස සඳහා සටන් කරන අතර, ජයග්‍රාහක ජාතීහු ආධිපත්‍යය සඳහා සටන් කරති. සෑම ජාතියක් ම තම තමා කෙරෙහි ම උසස් ම සභ්‍යත්වයක් පවතී යයි. 'ආඩම්බරයක්' ඇතිකර ගැනීම නිසා අනෙක් ජාතීන්ගේ අයිතිවාසිකම්වලට ඇඟිලි ගැසීම, විරෝධය පළ කිරීම කරති.[102]

සභ්‍යත්වය යනු සාමූහික ව සමගි ධර්මයෙන් වඩාගත හැකි, සාක්ෂාත් කර ගත හැකි දෙයක් ය යන්න ජාතිවාදය කරපින්නා ගත් ජාතිවාදීන්ට සම්පූර්ණයෙන් ම අමතක වී ඇති බව පෙනේ.

ජාතිවාදී මිථ්‍යාමය අදහස් හේතුවෙන් සිදුවන මිනිස් ඝාතන, ලෝකයේ විවිධ විද්‍යාත්මක සොයා ගැනීම් හේතුවෙන් වඩාත් බියජනක ස්වරූපයක් ගනී. ලෝකය පුරා ම පැතිරී පවතින '**ත්‍රස්තවාදය**' හේතුවෙන් මිනිසාගේ මූලික මිනිස් අයිතිවාසිකම්වලට පවා එල්ල වී පවතින බියජනක ස්වරූපය මැඬලීමට සියලු ම ජාතීන් එකතු වී ක්‍රියා කළ යුතු ආකාරය ගැන මෙකල දැඩි සැලකිල්ල යොමු වී පවතී.

ජාතිවාදී අදහස් නිසා වර්තමානයේ එල්ල වී ඇති ප්‍රශ්න නිරාකරණයෙහි ලා ඒකායන විසඳුම, 'ජාතිවාදය හා යුතුකම' අතර සාම්‍යයක් ඇති කර ගැනීම බව ඇතැමෙක් සඳහන් කරති.[103] 1914-1918, පළමුවන ලෝක යුද්ධයත්, 1939-1945, දෙවන ලෝක යුද්ධයත් තුළින් උගත් පාඩම, 'ශක්තිය යුක්තියේ පදනම' නොවේය යන්න බැවින් සාමූහික ආරක්ෂාව සඳහා පදනමක් අවශ්‍ය ය.

---

102 දී.නි. 2. පි.313; චූ.ව., පි.277 - 279.

103 මා.ද., පි.366 - 340 රත්නාවලී සිංහලානුවාදය. අ.ලි., පි.13 - කාලිංග ලේඛ - 1.

යුද්ධය හටගන්නේ මිනිසුන්ගේ සිත් තුළ බැවින් සාමය පිළිබඳ ආරක්ෂක කඳවුරු පිහිටුවිය යුත්තේ ද මිනිසුන්ගේ සිත් තුළ ය.[104] ලෝකයේ ඒ ඒ මිනිසුන් පිළිබඳ ව පවතින අනවබෝධය නිසා ඒ ඒ මිනිසුන්ගේ සිරිත් විරිත් පිළිබඳ ව බියෙන් හා සැකයෙන් යුක්තව සිටිනතාක් යුද්ධය ඉවත් කළ නොහැකි ය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය[105] ගොඩනැංවීමට මුල් වූ දෙවන මහා ලෝක යුද්ධය පිළිබඳ කටුක අත්දැකීම් තුළින්; ඒ ඒ මිනිසුන්ගේ අභිමානය, සමානාත්මතාව හා අන්‍යෝන්‍ය ගෞරවය පිළිබඳ ව සැලකිල්ල යොමු වූ හෙයින් මිනිසුන් හා ජාතීන් අතර සමානාත්මතාව පිළිබඳ සංකල්පය ලෝක පූජිත වන්නට විය. එහි ලා එක්සත් ජාතීන්ගේ සංගමයට වැදගත් කාර්ය භාරයක් පැවරිණ. දේශපාලන හා ආර්ථික සංවිධානයක් තුළින් පමණක් සාමය උදාකරලිය හැකි යැයි තිබූ විශ්වාසය ප්‍රමාණවත් නොවන බව වටහා ගැනීමෙන් අනතුරු ව මිනිසුන්ගේ හද දිනීමට නම් බුද්ධිමත් වූත්, සදාචාරාත්මක වූත් පිළිවෙතක්[106] අවශ්‍ය බව අවධාරණය කෙරිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් යුනෙස්කෝ වැනි එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිත ආයතන[107] බිහි වූ බවත්, එකී ආයතනවල අරමුණු ඒකාබද්ධ කිරීමෙන් විශ්ව මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය ජාතීන්ගේ ඒකමතික එකඟත්වයෙන් සම්මුතියක් ලෙස පිළිගත් බවත් සැලකිය යුතු වේ.

මිනිස් වර්ගයාගේ ඉතිහාසය ඃහසිඑදරහ දෙ ඒබනසබා* නමින් යුනෙස්කෝව පළ කළ ග්‍රන්ථය ලෝකයේ විවිධ ජාතීන්ගේ ආර්ථික, සාමාජික හා ආගමික හා සංස්කෘතික විස්තර සපයන හෙයින් මිනිසා පිළිබඳ අවබෝධය පුළුල් විය. යුද්ධය හටගැනීමේ හේතූන් පිළිබඳ ව තේරුම් ගැනීමත් සමඟ සාමය උදාකරලීම පහසු බවට

104 මා.ද., පි.347 - 348. ගාථා අංක 100.

105 මා.ද., පි.349 - 409 සුභෘලේඛා සිංහල පරිවර්තනය.

106 -එම- පි.401. ගාථා අංක 104. (ස.5 - 2, පි.296) පි.295 - 305.

107 දී.නි. 2, පි.367 - 381 මහා ගෝවින්ද සූත්‍රය.

එක්සත් ජාතීන් විසින් වටහා ගෙන තිබේ. මානව අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියක්[500] එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ මූලධර්මවලට අනුකූලව සකස් කොට තිබේ.

එක ම මිනිස් පවුලක් ලෙස මුළු විශ්ව මානව සමාජය ම ගෙන ඒ ඒ ඒ පුද්ගලයන්ගේ අභිමානය හා අන්සතු කළ නොහැකි අයිතිවාසිකම් නිදහස යුක්තිය හා සාමය එහි පදනම වශයෙන් ගනු ලැබූ බව එකී සම්මුතියේ මූලික ඡේදයෙන් දැක් වේ.

නිදහස් මනුෂ්‍යයන් ලෙස බියෙන් හා අගහිඟකම්වලින් තොර ව සිටීමේ නිදහස භුක්ති විඳීමටත්, සෑම කෙනෙකුට ම ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් මෙන් ම, තම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳිය හැකි තත්ත්වයක් ඇතිකරලීමේ පරමාර්ථයෙන් තමා අයත් වන ජන කොට්ඨාසය පමණක් නො ව, අනෙක් පුද්ගලයන් සම්බන්ධයෙනුත් යුතුකම් ඉටුකරලීමටත්, පුද්ගලයා මෙම සම්මුතියෙන් එකඟතාව පළකර සිටී.

එකී සම්මුතියට වගන්ති 53ක් එකතු කරන ලද අතර, ඒවායේ ප්‍රධාන වගන්ති කීපයක් ගැන සලකා බැලීම මෙහි දී අනුචිත නොවනු ඇත.

**ඉන් පළමුවන වගන්තියෙහි**[108] දැක්වෙන්නේ ඒ ඒ ජාතීන්ගේ ස්වයං නිර්ණයනය පිළිබඳ ව ය.

ස්වකීය දේශපාලන තත්ත්වය නිදහසේ නිර්ණය කිරීමේ අයිතිය, ඒ ඒ ජාතීන්ට පැවරේ. ජාත්‍යන්තර නීතිය හා අන්‍යොන්‍ය ප්‍රයෝජනය පිළිබඳ මූලධර්මයට හානි සිදු නොවන පරිදි ස්වකීය ස්වභාවික ධන සම්පත් කැමති පරිදි යොදා ගත හැකි බවත්, කිසිම අවස්ථාවක දී ජාතියකට ස්වකීය යැපීම් මාර්ගය අහිමි නොකළ හැකි බවත් එම වගන්තියෙන් වැඩිදුරටත් ප්‍රකාශිත ය.

108 -එම- පි.301 - 305 මහා සුදස්සන සූත්‍රය.

**දෙවන වගන්තිය**[109] වර්ගය, වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම, දේශපාලන දර්ශන ආදී කවර භේදයකින් හෝ තොර ව සිය දේශ සීමාව ඇතුළත සිය අධිකරණ බල සීමාවට යටත් ව සියලු ම පුද්ගලයන්ට සිය අයිතිවාසිකම් හිමිවන බව දක්වයි.

එකී අයිතිවාසිකම් හෝ බහුවිධ නිදහස හෝ යම් පුද්ගලයකු සම්බන්ධයෙන් කඩ කරනු ලැබුවේ රාජකාරී තත්ත්වයෙන් වුව ද, ඒ සඳහා ප්‍රතිකර්ම යෙදිය යුතු ය.

**තුන්වන වගන්තියෙන්;** ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම එක සමාන අයිතිවාසිකම් ලැබෙන බවට වග බලා ගැනීමේ පොරොන්දුව දෙනු ලබයි.

**සතරවන වගන්තිය;**[110] මහජන හදිසි අවස්ථාවක දී, රටක ජාතීන්ගේ ජීවිතවලට තර්ජනයක් වන්නේ නම් මෙම සම්මුතියේ බැඳීම් තරමක් දුරට ලිහිල් කරගත හැකි බව දක්වයි. එහෙත් එය ජාත්‍යන්තර නීතියට පටහැනි නොවිය යුතු ය.

මූලික මානව අයිතිවාසිකම් කිසිවක් සීමා කිරීම හෝ හීන කිරීම හෝ නොකළ හැකි බව **පස්වන වගන්තිය** දක්වයි.

සෑම මනුෂ්‍යයෙකුට ම ජීවිතය කෙරෙහි නෛසර්ගික අයිතියක් ඇති බවත්, එය නීතියෙන් ආරක්ෂා කළ යුතු බවත් සඳහන් කරයි.

කිසිවකුගේ ජීවිතය බලහත්කාරයෙන් අහිමි නොකළ යුතු බවත් සඳහන් කරයි. **එම වගන්තියේ මරණ දඬුවම එම අපරාධය සිදුකළ අවස්ථාවෙහි පැවති නීතිය ප්‍රකාර ඉතා ම බරපතළ අපරාධ සඳහා පමණක් ක්‍රියාත්මක කළ යුතු බවත් දක්වයි. එම දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා නිසි අධිකරණයක් විසින් දෙනු ලබන අවසාන තීරණයක් විය යුතු ය. වර්ග විනාශ කිරීමට මෙම වගන්තියෙන් අවසර නැත.**

---

109 භි.බු., පි.3 - 29. ඉ.ද., 1. පි.525 - 529 මා.ද., පි.347. මා.ද., පි. 347, ගාථා අංක 80 - 82.

110 පු.පු.සං, පි.443. අ.නි. 3. පි.407 - 413.

මරණ දඬුවමට නියම වූ කවරකුට වුව ද සමාව ඉල්ලා සිටිය හැකි ය. සමාව දීම හෝ දණ්ඩන නියම ආදේශ කිරීම හෝ කළ හැකි ය. **මරණ දඬුවම වයස දහඅටට අඩුවූවන්ට හෝ ගර්භණී මව්වරුන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොකළ යුතු ය.**

**සත්ත්වන වගන්තියෙන්,** කිසිම පුද්ගලයකු වධ හිංසාවකට හෝ කෲර, අමානුෂික පහත් සැලකීමකට හෝ දඬුවමකට හෝ භාජන නොකළ යුතු බව දැක්වේ.

**කිසිවකුගේ ස්වාධීන අනුමැතිය නොමැතිව වෛද්‍ය හෝ විද්‍යානුකූල අත්හදා බැලීම්වලට භාජන නොකළ යුතු ය.**

**සෑම ආකාරයක ම වහල් වෙළෙඳාම හා වහල්භාවය අටවැනි වගන්තියෙන් තහනම් කරනු ලැබිණ.**[111]

කිසි ම පුද්ගලයකු දාස භාවයෙහි නොරැඳවිය යුතු ය. කිසිවකු බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩෙහි යෙදෙන ලෙස නියම කිරීම නොකළ යුතු ය.

එහි අනිවාර්යයෙන් කියන වචනය නොයෙදිය යුතු අවස්ථා හතරක් දක්වා තිබේ. ඉන් එකක් වනුයේ ප්‍රජාවගේ ජීවිතවලට හෝ යහපැවැත්මට තර්ජනයක් වන අවස්ථාව ය.

**නවවැනි වගන්තියෙන්**[112] පුද්ගල නිදහස හා සුරක්ෂිත භාවය අවධාරණය කෙරිණ. අත්තනෝමතික ලෙස සිර භාරයට ගැනීම හෝ රඳවා තැබීම ඉන් තහනම් කෙරේ. **සිරභාරයට ගන්නා අවස්ථාවේ දී සිරභාරයට ගැනීමට හේතු දැක්විය යුතු අතර, නොපමාව චෝදනා ඉදිරිපත් කළ යුතු බව ද දැක්වේ.**

සාපරාධී චෝදනාවක් මත සිරභාරයට ගනු ලබන පුද්ගලයකු විනිශ්චයකරුවකු හෝ එම බලතල පැවරුවකු හෝ වෙත ඉදිරිපත් කළ යුතු අතර, සාධාරණ කාලයක් ඇතුළත නඩු විභාග කරනු ලැබීමට හෝ නිදහස් කරනු ලැබීමට හෝ හිමිකම් ලබයි.

---

111 බ.ද., පි.694. අ.ලි., පි.14.

112 බ.ද., පි. 796 - 797. -එම- පි.793.

සිර භාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම නිසා හෝ සිය නිදහස අහිමි වූ ඕනෑම අයෙකුට අධිකරණයක් ඉදිරියේ නීති කෘත්‍යයක් ආරම්භ කිරීමේ නිදහස පවතී.

නීත්‍යනුකූල නොවන සිර භාරයකට ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ වෙනුවෙන් වන්දි ලබා ගැනීමට පුද්ගලයාට අයිතිවාසිකමක් ඇත.

නිදහස අහිමි කරනු ලැබූ සියලු ම තැනැත්තන්ට මනුෂ්‍ය දයාවෙන් හා මිනිසාට ස්වභාවයෙන් හිමි අභිමානය පිළිබඳ ගෞරවයෙන් යුක්ත ව සැලකිය යුතු ය. විශේෂ අවස්ථාවන්හි දී හැර චූදිත තැනැත්තන් වරදකරු කරනු නොලැබූ තැනැත්තන්ගෙන් වෙන් කොට තැබිය යුතු අතර, වරදකරු කරනු නොලැබූ තැනැත්තන් හැටියට ඔවුන්ගේ තත්ත්වයන්ට ගැළපෙන අන්දමට ඔවුන්ට සැලකිය යුතු ය.

චූදිත බාලයන්, වැඩිහිටියන්ගෙන් වෙන්කර තැබිය යුතු අතර, හැකිතාක් කඩිනමින් විනිශ්චයට භාජනය කළ යුතු ය. චරිත ශෝධනාගාර ක්‍රමය සිරකරුවන් යහමග ගැන්වීම හා පුනරුත්ථාපනය අරමුණු කොට ගත් ප්‍රතිකාර ක්‍රමයෙන් සමන්විත විය යුතු බව දහවැනි වගන්තියේ එයි. එකොළොස්වැනි වගන්තිය[113] ගිවිසුම්ගත වගකීමක් ඉටු කිරීමට නොහැකි වීමේ හේතුව මත, කිසිම කෙනෙකු බන්ධනාගාර ගත නොකළ යුතු යැයි දක්වයි.

දොළොස්වන වගන්තිය, රාජ්‍යයක දේශය ඇතුළත නීත්‍යනුකූල ව සිටින සෑම කෙනෙකුට ම දේශය ඇතුළත තැනින් තැන යාමටත්, සිය වාසස්ථානය තෝරා ගැනීමටත් නිදහස තිබිය යුතු යයි සඳහන් කරයි. ඕනෑම කෙනෙකුට සියරට ඇතුළු ව ඕනෑ ම රටක් හැර යාමේ නිදහස තහවුරු කෙරේ. ඉහත සඳහන් අයිතිවාසිකම්, ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය සහ වෙනත් අයගේ සදාචාරය හෝ අයිතිවාසිකම් ද, විවිධ නිදහස ද රැක ගැනීමට මෙම සම්මුතියෙන් පිළිගෙන ඇති

113 -එම- පි.755 - 754, -එම- පි.702.

අයිතිවාසිකම්වලට ගැළපෙන සේ නීති විධිවිධාන සලසා ඇති සීමා කිරීම්වලට හැර, වෙනත් කිසිම සීමා කිරීමකට යටත් නො කෙරේ. **සිය රටට ඇතුළුවීමට තිබෙන අයිතිය කිසිම කෙනෙකු අත්තනෝමතික ලෙස අහිමි නොකළ යුතු ය.**

**දහතුන්වන වගන්තිය,** විජාතිකයෙකු යම්කිසි රාජ්‍යයක දේශයෙහි නීත්‍යනුකූලව වෙසෙන්නෙකු රටින් නෙරපීම පිළිබඳ ව ය. **නීතියට අනුකූල ව එළැඹෙණ තීරණයක් හෝ ජාතික ආරක්ෂාව පිළිබඳ බල කෙරෙන හේතූන් අනුව මිස හෝ නොවන අවස්ථාවක දී නෙරපීමට විරුද්ධ ව හේතු දැක්වීමට පුද්ගලයාට නිදහස තිබිය යුතු ය.**

**දහහතරවන වගන්තිය,**[114] නීතිය ඉදිරියේ සමාන අයිතිවාසිකම් ඇති බව දක්වයි. **සෑම පුද්ගලයකුට ම ස්වාධීන සහ අපක්ෂපාත විනිශ්චයාධිකරණයක් ඉදිරියේ කරනු ලබන සාධාරණ**[115] **සහ ප්‍රසිද්ධ නඩු විභාගයකට හිමිකම් ඇත්තේ ය; යන්න පිළිගනියි.**

මහජන සාමය, ජාතික ආරක්ෂාව, පාර්ශ්වකරුවන්ගේ පෞද්ගලික ජීවිතය, යුක්ති ධර්මයේ යහපතට අගති සිදුවීම යන විශේෂ අවස්ථාවල දී අධිකරණයේ මතයේ හැටියට සම්පූර්ණ නඩු විභාගයේ දී හෝ ඉන් කොටසක දී හෝ ප්‍රවෘත්ති පත්‍ර හා මහජනයා බැහැර කළ හැකි ය. එහෙත් සාපරාධී නඩුවක දී හෝ නඩුවක දී දෙන ලද තීන්දුවක් ප්‍රසිද්ධියට පත් කළ යුතු ය. බාලයන්ගේ යහපත සඳහා වෙනත් ආකාරයකට කිරීම අවශ්‍ය වීම හෝ විවාහ අරගල හෝ ළමයින්ගේ භාරකාරත්වය හෝ සම්බන්ධ අවස්ථාවල දී නඩු විභාග ප්‍රසිද්ධියට පත් කිරීමෙන් වැළකී සිටිය හැකි ය. මෙම දහහතර වැනි වගන්තිය යටතේ පුද්ගලයා වෙත පැවතිය යුතු හිමිකමක් ලෙස "නීතිය අනුව වරදකරු බව ඔප්පු කරන තුරු තමා නිර්දෝෂය යන අනුමැතිය සඳහා හිමිකම ඇත්තේ ය." සෑම පුද්ගයකුට ම තමාට විරුද්ධ ව ඇති සාපරාධී චෝදනාව තීරණය කරනු ලැබීමේ දී[116]

114 -එම- පි. 658, 752. බ.ද., පි.818 - 849.

115 බ.ද., පි.770.

116 බ.ද., පි.772.

(i) තමන්ට නගා ඇති චෝදනාවේ ස්වභාවය සහ නිමිත්ත, ඔහුට වැටහෙන භාෂාවකින් නොපමාව සවිස්තර ලෙස දන්වනු ලැබීමට;

(ii) සිය විත්ති වාචනය සූදානම් කර ගැනීමට සහ තමා ම තෝරා ගනු ලබන නීතිඥයකු හා අදහස් හුවමාරු කර ගැනීමට ප්‍රමාණවත් කාලය සහ පහසුකම් ලැබීමට;

(iii) අනවශ්‍ය ප්‍රමාදයකින් තොර ව නඩුව ඇසීමට;

(iv) තමා ඉදිරිපිට දී නඩුව ඇසීමට, තමා විසින් ම හෝ තමා විසින් තෝරා ගනු ලබන නීතිඥයන්ගේ සහාය ඇති ව සිය නිදහසට කරුණු දැක්වීමට; නීතිඥ සහාය නොමැති නම් එම අයිතිවාසිකම් පිළිබඳ ව දන්වනු ලැබීමට; පුද්ගලයාට ගෙවීමට මාර්ගයක් නොමැති නම්, ගෙවීමකින් තොර ව ඔහුට සහාය වීමට නීතිඥයකු පත් කරනු ලැබීමට;

(v) ඔහුට විරුද්ධ ව සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට සහ කරවීමට සහ ඔහුට විරුද්ධ ව සාක්ෂිකරුවන් ලබන තත්ත්වයන් යටතේ ම ඔහුට පක්ෂව සාක්ෂිකරුවන් ගෙන්වා ගැනීමට හා ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමට;[117]

(vi) අධිකරණයේ භාවිත වන භාෂාව තේරුම් ගැනීමට හෝ කථා කිරීමට ඔහුට නොහැකි නම් නොමිලයේ භාෂා පරිවර්තකයෙකුගේ සහාය ලැබීමට;

(viii) තමාට විරුද්ධව සාක්ෂි දීමට හෝ තම වරද පිළිබඳ ව පාපෝච්චාරණයක් කිරීමට ඔහුට බල කරනු නොලැබීම; අවම සහතිකවීම් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

**ඉහත දහහතරවන වගන්තිය යටතේ සාපරාධී චෝදනා සම්බන්ධයෙන්[118] බාල තැනැත්තන් සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විය යුත්තේ, ඔවුන්ගේ වයස හා ඔවුන් පුනරුත්ථාපනය**

117 බ.ද., පි.702.

118 බ.ද., පි.828 - 829.

කිරීමේ යෝග්‍යතාව අනුව ය. මෙම කරුණ ඉහත පරිච්ඡේදයක දී සවිස්තර ලෙස පුද්ගලයාගේ නීතිමය අවශ්‍යතා යටතේ දක්වන ලදි.

වරදකරු කරනු ලැබූ සෑම පුද්ගලයකුට ම තමන් එකී අපරාධයට වරදකරු කරනු ලැබීම හා දෙන ලද දඬුවම නීතියට අනුකූල වීම යන කරුණු පිළිබඳ ව ඉහළ අධිකරණයක සමාලෝචනයට භාජනය කිරීමේ අයිතිවාසිකම් ඇත්තේ ය.

සාපරාධී වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ පසු ව, යුක්තිය ඉටු නොවී ඇති බව තීරණාත්මක ව ඔප්පු වී, ඔහු නිවැරදිකරු ලෙස ප්‍රකාශ කොට හෝ ක්ෂමාව දී ඇති විටක දී හෝ පසු ව හෙළි වූ කරුණු මත ඇති වූ එම තත්ත්වය පුද්ගලයාගේ වරදකින් සිදු නොවූයේ නම් පුද්ගලයාට වන්දි ලබා ගැනීමේ[119] අයිතිය ඇත.

යම් වරදක් සඳහා එවකටත් ඒ රටේ නීතිය හා දණ්ඩන කාර්ය පටිපාටිය යටතේ අවසාන වශයෙන් වරදකරු කරනු ලැබ සිටී නම් හෝ නිදහස් කරනු ලැබ ඇත්නම් හෝ එම චෝදනාව යටතේ ම නැවත නඩු විභාග කිරීමකට හෝ දඬුවමකට හෝ යටත් නොවිය යුතුය.

විශ්ව ප්‍රකාශනයේ පසළොස්වන[120] වගන්තියට අනුව දේශීය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ සාපරාධී වදරක් නොවූ කිසියම් ක්‍රියාවක් පිළිබඳ ඕනෑ ම සාපරාධී වරදකට කිසි ම කෙනෙකු වරදකරු හැටියට තීරණය නො කළ යුතු ය. සාපරාධී වරද කරන අවස්ථාවේ අදාළ ව තිබූ දඬුවමට වඩා බරපතළ දඬුවමක් ද නො පැනවිය යුතු ය. වරද කිරීමෙන් පසු අවස්ථාවෙක ලිහිල් දඬුවමක් පැනවීමට නීතියෙහි ලා විධිවිධාන සලසනු ලැබුවහොත්, වරදකරුට එහි වාසිය ලැබිය යුතු ය.

119 ජා.ස., පි.12.

120 ජා.ස., පි.13.

නීතිය ඉදිරියෙහි පුද්ගලයකු හැටියට සෑම තැනක ම පිළිගනු ලැබීමට සෑම කෙනෙකුට ම අයිතියක් තිබිය යුතු බව දහසය වැනි වගන්තිය දක්වයි.[121] දහහත්වැනි වගන්තිය පුද්ගලයාගේ රහස්භාවය, පවුල, නිවස, ලිපි ගනුදෙනු සම්බන්ධ ඇඟිලි ගැසීමකට භාජනය නො කළ යුතු බව සඳහන් කරයි. පුද්ගලයාගේ නම්බුව හෝ කීර්තිනාමය, නීති විරෝධී ප්‍රහාරයන්ට භාජනය නොකළ යුතු යයි ද, එවැනි අවස්ථාවන්හි දී නීතියේ ආ කවරණය ලැබීමට සෑම කෙනෙකුට ම හිමිකම් ඇත්තේ යයි ද එම වගන්තිය අවධාරණය කරයි.

විශ්ව ප්‍රකාශනයෙහි එන දහඅටවැනි[122] වගන්තිය සිතීමේ, හෘදය සාක්ෂිය දැරීමේ හා ආගම ඇදහීමේ නිදහස පුද්ගලයකුට තිබිය යුතු බව දන්වයි. තමාට කැමැති ආගමක් හෝ විශ්වාසයක් දැරීම, තනිව ම හෝ අන්‍යයන් සමඟ සමූහ වශයෙන් ප්‍රසිද්ධියේ තම ඇදහීම හා ආගම ප්‍රකට කිරීම, පිළිපැදීම, ඉගැන්වීම හා වන්දනා කිරීම සඳහා පුද්ගලයාට නිදහස ඇත. එකී නිදහසට බාධා පමුණුවන බල කිරීමක් නොවිය යුතු ය. මහජන ආරක්ෂාව, සාමය, සෞඛ්‍යය හෝ සදාචාරය වැනි අත්‍යවශ්‍ය අවශ්‍යතාවන්හි දී වුව ද ඉහත නිදහසට බාධා පැමිණවිය හැක්කේ ඉතා සීමිතව ය. සිය දරුවන්ගේ ආගමික හා සදාචාරාත්මක අධ්‍යාපනය ගැන දෙමාපියන්ට ඇති නිදහස සියලු දෙනා විසින් ම ගරු කරනු ඇත.

පුද්ගලයාට ස්වකීය මතය දැරීමට ඇති අයිතිවාසිකමට බාධා නොපැමිණවිය යුතු බවට දහනවවැනි වගන්තිය123 කරුණු දක්වයි. සෑම කෙනෙකුට ම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇත. දේශ සීමාවන්ගෙන් තොර ව, තොරතුරු සෑම අන්දමක ම අදහස් වාචික ව, ලිඛිත ව, මුද්‍රිත ව, චිත්‍ර හෝ වෙනත් තමන් කැමති මාධ්‍යයකින් සොයා ගැනීමට, ලැබීමට, දැන්වීමට නිදහස මෙම

121 ජා.ස., පි.14.

122 ජා.ස., පි.15.

123 අ.ලි., පි.12 - 15. අ.ලි., පි.12.

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යටතේ දැක්විය හැකි ය. ඉහත දැක්වෙන නිදහස සීමා කෙරෙන අවස්ථා දෙකක් එම වගන්තිය යටතේ ම දක්වා තිබේ.

සෙසු අයගේ අයිතිවාසිකම් හා කීර්තිනාමයන්ට ගරු කිරීම සඳහාත්, ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය හා සදාචාරය රැකීම සඳහාත්, නීතියෙහි ලා විධි විධාන සලසා ඇති අවස්ථාවන්හි දී ඉහත අයිතිය සීමා කෙරෙනු ඇත.

යුද්ධය සඳහා කෙරෙන සෑම ප්‍රචාරයක් ම නීතියෙන් තහනම් කළ යුතු බව විසිවන වගන්තිය[124] අවධාරණය කරයි. වෙනස්කමකට, වෛරයකට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීමක් සිදුවන ජාතික, වාර්ගික හෝ ආගමික ද්වේෂය පැතිරවීමේ ක්‍රියා මාර්ග නීතියෙන් තහනම් කළ යුතු ය.

සාමකාමී ව රැස්වීමේ අයිතිය පිළිගත යුතු ය. මහජන ආරක්ෂාව, සාමය, සෞඛ්‍ය, සදාචාරය ආදී අත්‍යවශ්‍ය නිදහස ආරක්ෂා කළ යුතු යයි හැඟෙන අවස්ථාවන්හි දී හැර මෙම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිම සීමා කිරීමක් නොපැනවිය හැකි ය. එම රැස්වීම් පිළිබඳ නිදහස දැක්වෙන්නේ 'විසිඑක්වැනි වගන්තියෙනි.'

'විසිදෙවැනි වගන්තියෙන්'[125] වෘත්තීය සමිති පිහිටුවා ගැනීම සඳහා පවතින අයිතිවාසිකම් අවධාරණය කරයි. අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා වෘත්තීය සමිති පිහිටුවා ගැනීමේ අයිතිය සීමා කළ හැක්කේ ඉහතින් දැක් වූ මහජන ආරක්ෂාව, සාමය, සෞඛ්‍යය, සදාචාරය වැනි අත්‍යවශ්‍ය අවස්ථාවල දී පමණි. 1948 දී ඇතිකර ගන්නා ලද ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතියේ විධිවිධාන සලසා ඇති සහතිකවීම්වලට අගති සහගත පියවර ගැනීමට බලය නොලැබිය යුතු බවට ද මෙම වගන්තිය යටතේ කරුණු දක්වා තිබේ.

124 ජා.ස., පි.17.

125 -එම- පි.17.

විශ්ව ප්‍රකාශනයේ විසිතුන්වැනි වගන්තිය[126] **අවධාරණය කරනු ලබන්නේ පවුල හා විවාහය පිළිබඳ නිදහස ය.** පවුල, සමාජයේ ස්වභාවික හා මූලික ඒකකය ලෙස පිළිගෙන සමාජයේ ද, රාජ්‍යයේ ද රැකවරණය ලැබීමට පවුලට හිමිකම් ඇති බව සඳහන් කරයි. විවාහ වන වයසේ සිටින ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට විවාහ වීමටත්, පවුලක් පිහිටුවා ගැනීමටත් තිබෙන අයිතිය පිළිගත යුතු යයි සඳහන් වන අතර, විවාහයට ඇතුළත් වීමට අදහස් කරන කලත්‍රයන්ගේ නිදහස් හා සම්පූර්ණ කැමැත්ත නොමැති ව කිසි ම විවාහයක් සිදු නොකළ යුතු බව ද, අවධාරණය කරනු ලබයි. විවාහය සම්බන්ධයෙන් එය පවත්නා කල්හි මෙන් ම, එය විසුරුවා හැරීමේ දී ද කලත්‍රයන්ට ස්ව අයිතිවාසිකම් හා සම වගකීම් තිබීම පිළිබඳ ව සහතික විය යුතු ය. විවාහය විසුරුවා හැරීමේ දී දරුවන් සඳහා තිබිය යුතු ආරක්ෂාව සඳහා විධි විධාන සැලසිය යුතු බවට ද එකී විසිතුන්වන වගන්තියේ කරුණු සටහන් කර ඇත.

සෑම ළමයෙකුට ම[127] සිය වර්ගය, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, ජාතිය හෝ සාමාජික සම්භවය පිළිබඳ ප්‍රබෝධයකින් තොර ව ස්වකීය පවුලෙන්, සමාජයෙන් සහ රාජ්‍යයෙන් බාල වයස්කාරයකු වශයෙන් තමාට ලැබිය යුතු රැකවරණය සඳහා අයිතිය[128] ඇති බව විසිහතරවැනි වගන්තිය අවධාරණය කරයි. **ළමයකු ඉපදුන විගස ලියාපදිංචි කිරීම හා නමක් තැබීම[129] අත්‍යවශ්‍ය වේ. සෑම ළමයකුට ම ජාතියකට අයත් වීමට අයිතියක් ඇතැයි එම වගන්තිය වැඩිදුරටත් සඳහන් කරයි.**

විශ්ව ප්‍රකාශනයෙහි විසිපස්වැනි වගන්තිය[130] සෑම පුරවැසියකුට ම ඇති අයිතිවාසිකම් අවධාරණය කරයි. රාජ්‍ය

126 ජා.ස., පි.18.

127 -එම- පි.18.

128 ජා.ස., පි.19.

129 බ.ද. පි.694.

130 ජා.ස., පි.19.

සේවයට සමානාත්මතාව හා පොදු නියමයන් යටතේ සෑම පුරවැසියකුට ම අයිතියක් තිබේ. මහජන කටයුතු විෂයයෙහි ලා කෙළින් ම හෝ නිදහස් ව තෝරා ගනු ලබන නියෝජිතයන් මගින් හෝ සහභාගි විය හැකි ය. නිදහස් හා සමාන ඡන්දයෙන් සිදු කළ යුතු, තෝරන තැනැත්තන්ගේ නිදහස් කැමැත්ත ප්‍රකාශ කිරීම සහතික කෙරෙමින් රහස් ඡන්දයෙන් පැවැත්විය යුතු, නිර්ව්‍යාජ වාර මැතිවරණවල දී ඡන්දය දීමට සහ තෝරා ගනු ලැබීමට පුද්ගලයාට නිදහස තිබේ.

**සියලු ම තැනැත්තෝ නීතිය ඉදිරියෙහි එක සමාන වන්නා හ. කිසි ම ප්‍රභේදයකින් තොර ව නීතියේ සමාන රැකවරණය ලැබීමට හිමිකම් ඇත්තෝ ය.**[131] මේ සම්බන්ධයෙන් ඕනෑ ම වෙනස්කමක් නීතියෙන් තහනම් විය යුතු අතර; වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත, ජාතික හෝ සාමාජීය සම්භවය, දේපළ, උත්පත්තිය හෝ වෙනත් තත්ත්වයන්, යන යම් හේතුවක් මත වෙනස්කම් කිරීමට විරුද්ධව, සමාන සහ කාර්ය සාධක රැකවරණය නීතියෙන් සහතික කළ යුතුය යන්න, විශ්ව ප්‍රකාශනයෙහි විසිහයවැනි වගන්තිය අවධාරණය කරනු ලබයි.

මානව වංශය, ආගම, භාෂාව පදනම් වූ **සුළු ජන කොටස් සිටින රාජ්‍යයන්හි, එම සුළු ජන කොටස්වලට අයත් තැනැත්තන්ට සිය සමූහයේ අනිකුත් සාමාජිකයන් සමඟ හවුලේ සිය සංස්කෘතිය භුක්ති විඳීමට, සිය ආගම ප්‍රකාශ කිරීමට සහ ඇදහීමට හෝ සිය භාෂාව භාවිත කිරීමට ඇති අයිතිය ප්‍රතික්ෂේප නොකළ යුතු යයි** විසිහත්වන වගන්තිය[132] සුළු ජන අයිතිවාසිකම් පිළිබඳ සැලකිල්ල යොමු කරවයි.

ස්වාධීන රාජ්‍යයන්හි වෙසෙන මිනිසුන්ගේ නිදහස හා සමානාත්මතාව රැකදීම සඳහා විශ්ව ප්‍රකාශනයේ සම්මුති ඇති කර ගනු ලැබූ බවට සැකයක් නැත. එක් එක් රාජ්‍යයක්

131 -එම- පි.19.

132 ජා.ස. පි.20.

නිදහස් පුද්ගලයන් සේ සලකා විශ්ව රාජ්‍යයක් ගොඩනැගීමේ හැකියාව සොයා බැලීමට, ඒ මඟ විවෘත වී පවතින ආකාරය දැන් පැහැදිලි ය.[133]

ලෝක සාමය හා සංවර්ධනය අරමුණු කොට ගත් එක්සත් ජාතීන්ගේ සම්මුතිය සලකා බැලීමෙන් අනතුරු ව, ඒ සියලු පූර්ණ ස්වාධීන රටවල් එක් කොට ලෝක ආණ්ඩුවක් පිහිටුවා ගත නොහැකි දැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. පණිවුඩ හුවමාරු ක්‍රම හා ප්‍රවාහන දියුණුව ආදී නවීන විද්‍යාත්මක හා තාක්ෂණික ශිල්ප ක්‍රම නිසා වඩාත් පුළුල් දේශපාලන සංවිධානයක් පිහිටුවා ගැනීම අපහසු නොවන බවට දැන් බොහෝ උගතුන්ගෙන් මත පළවෙමින් පවතී. ලෝක ආණ්ඩු ක්‍රමයක් පිළිබඳ ව සංකල්පය දහසය වන සියවසේ සිට ක්‍රමයෙන් අවධානයට හසුවෙමින් පවතින්නේ වුව ද, **ඒ අදහස යුරෝපයට සීමා වූවක් නොවූ බව සක්විති රජ පිළිබඳ සංකල්පයෙන් පැහැදිලි විය යුතු ය. ලෝකයේ සියලු අපරාධයන් වළකාලීමට සමත් ධර්මය අධිපති කොට ගත් සක්විති රජු විශ්ව පාලකයකු වන්නේ ධර්ම විජය[134] ප්‍රතිපත්තිය ව්‍යාප්ත කරවීමෙනි.**

**ධර්මාශෝක රජතුමා පිළිබඳ ව එන ප්‍රවෘත්තිවලින් මේ ධර්ම විජය[135] ව්‍යාපාරය එතුමා විසින් ක්‍රියාත්මක කිරීමට දරන ලද උත්සාහය වටහා ගත හැකි ය.[136]** දහහත්වන සියවසේ යුරෝපයේ ශුද්ධ රෝම අධිරාජ්‍යය සංකල්පය ද ලෝක ආණ්ඩු ක්‍රමයක්[137] පිළිබඳ ව අදහස් ව්‍යාප්ත කරවී ය. මේ අවස්ථා දෙකේ දී ම වර්තමානයේ පවතින විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය මිනිසාට නොවූ බව අප විසින් පිළිගත යුතු ය. ආධ්‍යාත්මික දියුණුව මගින් සක්වල තරණය කළ හැකි වූ **ආර්ය පුද්ගලයන්ට සක්විති රජකම**

133 ජා.ස., පි.20.

134 -එම- පි.20.

135 -එම- පි.21.

136 ජා.ස., පි.21.

137 ජා.ස., පි.21.

**අවශ්‍ය නොවී ය.** එහෙයින් ලෝකයේ යථා ස්වභාවය අවබෝධ කළ ඒ උතුමෝ පරාර්ථචර්යාවෙහි යෙදුණෝ, තමන් ලැබූ ආර්ය භාවය අන්‍යයන්ට ද කියා දීමට මිස, **සක්විති රජකම ලබා දීම සඳහා නොවේ.**[138] ලෝකයේ එක්වර සක්විති රජවරුන් දෙදෙනකු පහළ නොවිය හැකි බැවින් ඒ ධර්මය ම ශ්‍රේෂ්ඨ කොට සලකන පුද්ගලයා කෙරෙහි බලාපොරොත්තු සහගත වීම, අඥාන (මෝඩ) බවක් ලෙස කල්පනා නොකළ යුත්තේ තථාගතයන් වහන්සේ නමකගේ (මුනිවරයකුගේ) පහළවීම අපේක්ෂාවෙන් පැරණි දඹදිව සියලු දෙනා ම ඇප කැපවීමකින් යුක්ත ව ක්‍රියා කළ ආකාරය අප හමුවේ ඇති බැවිනි. නවීන විද්‍යාත්මක උපකරණ දිවා රෑ හසුරුවමින් වෙනත් ග්‍රහ ලෝකවලින් එන සංඥා කෙරෙහි අවධානය යොමු කරන විද්‍යාඥයන් වෙනත් ග්‍රහ ලෝකවල සිටිය හැකි දියුණු මනුෂ්‍යයන් පිළිබඳ ව විමසිලිමත් වන බව අපි දනිමු.[139] වෙනත් ග්‍රහ ලෝකවලින් ලැබී ඇති ඇතැම් සංඥා සටහන් කරගෙන ඇතත්, ඒවා තේරුම් ගැනීමට මෙතෙක් දරන ලද ප්‍රයත්න සාර්ථක නොවූ බව පවසන වර්තමාන නවීන විද්‍යාඥයෝ ස්වකීය උත්සාහය අත් නොහරිති. තථාගත දේශනාවේ එන බොහෝ කරුණු විද්‍යාත්මක තොරතුරු හා ගැළපෙන බවට විද්‍යාඥයන් පළකරන අදහස් අනුව සක්විති රජ පිළිබඳ සංකල්පය ද, නවීන පර්යේෂණයන්ට හසු කිරීම අනුචිත නො වේ. අනාගතයේ දී මිනිසාට මුහුණ පෑමට සිදුවිය හැකි ප්‍රශ්නවලින් බේරීම සඳහා[140] චක්කවත්ති රජ කෙනෙකුගේ ධාර්මික රාජ්‍යය පහළ විය යුතු ම ය. ඒ සඳහා මග හෙළි කිරීමක් වශයෙන් දනට ලෝකයේ සියලු මිනිසුන් එළැඹී ඇති විශ්ව සම්මුතිය අග්ගඤ්ඤ සූත්‍රයෙන් අප සාකච්ඡා කළ සම්මුතියට බාහිර වූවක් නොවේ. දිළිඳු බව ලෝකයෙන් තුරන් කොට ධර්මය රජ කරවන **චක්කවත්තී සීහනාද සූත්‍රය දක්වන** සක්විති රජ, 'ලෝක ආණ්ඩු සංකල්පය' ප්‍රායෝගික ව ක්‍රියාත්මක කරවනු

138 බලන්න, පු.පු.සං., පි.441.

139 පු.පු.සං. පි.433 - 435.

140 ජා.ස., පි.22.

ලබන දිනය, මීළඟ සියවසේ ජීවත් වන්නවුන්ට සැබැවින් ම ළඟාවනු ඇත.[141] සියලු දේ ම හුවමාරු කළ යුතු එක් සැබෑ කාසියක් ඇත. ඒ වූකලී, ප්‍රඥාවය.[142] **ප්‍රඥාවන්තභාවය නිසා ම සක්විති සැපත පවා අත්හැර පැවිදි බව ලබන මිනිසා විමුක්තිකාමී වනුයේ, මිදීම ම සුවය වන හෙයිනි.**[143]

මෙතෙක් කෙරුණු සාකච්ඡාවෙන් පැහැදිලි වනුයේ පරමාදර්ශී මනෝභාවයන් පවත්නා බෞද්ධ පුරුෂාර්ථයනට සමස්ත මිහිතලය තුළ වසන සෑම සත්ත්වයාම එකම නිවසක් තුළ වෙසෙන සහෘද කැලක් මෙන් පෙනෙන බවයි.

141 -එම- පි.22.

142 ජා.ස., පි.22.

143 බ.ද., පි. 817 - 818.

## සිව්වන පරිච්ඡේදය

# බෞද්ධ ආචාර විද්‍යාවේ ආවසානික ආධ්‍යාත්මික සමෘද්ධිය හෙවත් පරම නිෂ්ඨාව

බුදුන් වහන්සේගේ දේශනාව අනුව වෘද්ධීන් තුනෙකි. ශ්‍රද්ධා වෘද්ධිය, ශීල වෘද්ධිය හා ප්‍රඥා වෘද්ධිය වශයෙන් එකී වෘද්ධීන් අංගුත්තර නිකායේ තික නිපාතය[1] සඳහන් කරයි.

වෘද්ධීන් වශයෙන් එහි දැක්වූයේ, 'පුද්ගල සංවර්ධනය' සඳහා අවශ්‍යතම පියවර තුනෙකි.[2] 'වෘද්ධි' යනු දියුණුව ය.[3] දියුණුවක් ලෙස දැක්විය හැක්කේ පවතින තත්ත්වයෙන් ඉහළ යාමෙකි,[4] උසස් වීමෙකි. එය සංවර්ධනය බවට පිළිගෙන තිබේ. පවතින යමක් සංවර්ධනය කළ හැකි ය. එහි සංවර්ධනය කිරීමට යමක් පවතින හෙයිනි. එසේ නම්, නොපවතින්නක් සංවර්ධනය කළ නොහැකි ය. නොපවතින්නක් පවතින ස්වභාවයකට පත්කර ගත හැකි වුවහොත්, එය ද සංවර්ධනය කර ගැනීමේ හැකියාවක් පැවතිය යුතු ය. මේ සඳහා ඒ එකිනෙකෙහි පෞද්ගලික ලක්ෂණ හඳුනා ගැනීමට හැකි විය යුතු ය.[5] එහි ලා පර්යේෂණය වැදගත් වේ.

---

1 අ.නි. 1, පි. 519, තිත නිපාත. අ.නි. 1, පි.518 අ.නි. 1, පි.29, අ.නි. 1, පි.29.

2 අ.නි. 1, පි.183.

3 අ.නි. 1, පි.276 අ.නි. 1, පි.516.

4 අ.නි. 1, පි.277 අ.නි. 1, පි.276, අ.නි. 2, පි.231. අ.නි. 1, පි.277 අ.නි. 3, පි.69.

5 අ.නි. 1, පි.197 - 203. අ.නි. 1, පි.227 - 243. අ.නි. 1, පි.198, ථෙර, පි.33, ගාථා අංක 75. ම.නි. 1, පි.533 - 555. ස.නි. 4, පි.473 අ.නි. 2, පි.485.

මේ පිළිබඳ ව විවිධ චින්තකයින් හා පර්යේෂකයන් විසින් දරන ලද උත්සාහයන් තුළ, තථාගතයන් වහන්සේගේ පර්යේෂණය, ආර්ය පර්යේෂණයක් ලෙස කැපී පෙනිණ. මිනිසුන්, සත්සුන් භාවයට පත් කළ හැකි වූ[6] ඒ ආර්ය පර්යේෂණය; කාලීනව පැවති බොහෝ දාර්ශනික ගැටලුවලට පිළිතුරු සැපයූ හෙයින් මිනිසාගේ දියුණුවට හා විමුක්තියට දරූ උත්සාහයේ[7] මල්ඵල ගැන්වීමකි. ප්‍රථම ධර්ම දේශනාව සඳහා පිටත්වෙමින් සිටි තථාගතයන් වහන්සේ උපක ආජීවක හමුයෙහි, තමන් වහන්සේට ඇදුරෙකු නැති බව ප්‍රකාශ කළ හ. සම වූවෙක් ද නොවී ය. සදේවක ලෝකයෙහි උන්වහන්සේට සදෘස පුද්ගලයෙකු ද නොවී ය. එහෙයින් උන්වහන්සේ 'සියලු පාප ධර්මයෝ දිනන ලදහ'යි ප්‍රතිඥා කළ හ. ආශ්‍රව ක්ෂය කරනු ලැබූ තමන් වහන්සේ, "ඒකාන්තයෙන් 'ජින' වෙති," යනුවෙන් උන්වහන්සේ දැක්වූ හ.

තථාගතයන් වහන්සේගේ ආර්ය පර්යේෂණයෙහි වටිනාතම ප්‍රතිඵලය ලෙස, එකල ධර්ම පිපාසාවෙන් පෙලුන සමාජයට ඉදිරිපත් කළ හැකි වූ විශිෂ්ටතම දායාදය, මෙකී 'ජින' නම් වූ සංකල්පය ය.[8] මුනිවරයකුගේ පහළවීම අපේක්ෂා කළ ජනතාවට මුනිවරයකු ලැබිණ. එහෙත් උපක ආජීවක 'එසේත් විය හැකැ'යි හිස සලා අන් මගක් ගත්තේ මුනිවරයකුගේ[9] පහළවීම ඉතා දුර්ලභ කරුණක් ලෙස ඔහු දැන සිටි හෙයිනි. අංගුත්තර නිකායේ තික නිපාතයට අනුව, මුනි වරයෝ තිදෙනෙකි.[10] කායද්වාර මුනිභාවය, වාග්ද්වාර මුනිභාවය හා මනෝද්වාර මුනිභාවය වශයෙනි. සතුන් මැරීම, සොරකම් කිරීම, අබ්‍රහ්මචාරී වීම යන ඒවායින් දුරුවීම කායද්වාර මුනිභාවය ය. බොරු කීම, කේළාම් කීම, පරුෂ

6 ම.නි. 1, පි.397 - 401; අ.නි. 2, පි. 475 - 477. ථෙර, පි.35, ගාථා අංක 79. ස.නි. 4, පි.415.

7 ම.නි. 1, පි.425. ස.නි. 4, පි.537. අ.නි. 1, පි.411.

8 ම.නි. 2, පි.507; ම.නි. 1, පි.415. ම.නි. 1, පි.414; ම.ව.1, පි.16.

9 සු.නි., පි.62 - 67; මුනි සූත්‍රය. අ.නි. 1, පි.45; අ.නි. 1, පි.474. පු.පු.සං.පි. අ.නි. 3, පි.275, 387 පු.පු.සං.පි. 889.

10 අ.නි. 1, පි.493. අ.නි. 1, පි.492.

වචන කීම, හිස් වචන කීම යන වැරදිවලින් දුරුවීම, වාග්ද්වාර මුනිභාවය ය. අභිධ්‍යාව නම් වූ අධික තෘෂ්ණාව, ව්‍යාපාද නම් වූ අධික කෝපය හා මිථ්‍යා දෘෂ්ටි නම් වූ වැරදි දැකීම හේතුවෙන් දුරුවීමෙන් ලබන්නා වූ චෙතො විමුක්තිය හා ප්‍රඥා විමුක්තිය මනෝ ද්වාරයෙහි මුනිභාවය වේ. **එසේ මුනිභාවයෙන් යුක්ත වූයේ රහතන් වහන්සේ ය.**[11]

ත්‍රිවිධ මුනිභාවයන්ගෙන් යුත් පුද්ගල පවිත්‍ර වූ හෙයින් 'ධෞත පාප' යයි කියති.[12] මෙහි පවිත්‍රවීම යනු නීවරණ ධර්ම පහෙන් ඉවත්වීම ය. ථෙර ගාථා හි, සුයාම ස්ථවිර 'බාහිත පාපී' යයි දක්වනු ලබන්නේ ද කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා නම් වූ නීවරණයන්ගෙන් පිරිසිදුවීම ය.[13] පුද්ගල සංවර්ධනය සඳහා පවතින ඉමහත් බාධකය මේ නීවරණ ධර්ම බැවින් නීවරණ ධර්ම ප්‍රහාණය පිළිබඳ ව සුදුසු උපදෙස් ආරම්භයේ දීම පුද්ගලයාට ලබා දිය යුතු ය. එහි දී නීවරණ ප්‍රහාණ වර්ගයදක්ව[14] න අදහස් වැදගත් වේ.

කාමච්ඡන්ද නම් වූ ප්‍රථම නීවරණය උපදින්නේත්, නැවත නැවත උපදිමින් වැඩී ලියලන්නේත් ශුභ නිමිති නුනුවණින් ගැනීමේ හේතුවෙනි. **අශුභ නිමිති නුවණින් නැවත නැවත මෙනෙහි කිරීමෙන් කාමච්ඡන්දය නූපදී. උපදින්නා වූ කාමච්ඡන්දයක් වේ නම් එය ද ප්‍රහාණය වේ.**

එහෙයින් ශුභ නිමිති නුනුවණින් ගැනීම වෙනුවට, අශුභ නිමිති නුවණින් දැකීම පුද්ගල දියුණුවට හේතු වේ.

ප්‍රඥාව දියුණු කිරීමට කැමති පුද්ගලයා රූපාදී අරමුණු ශුභ වශයෙන් නොගනියි. ඒ ඒ තන්හි පවතින, යථා ස්වභාවය ම

---

11 අ.නි. 1, පි.492.

12 අ.නි. 1, පි.491 - 493.

13 ථෙර, පි.33; ගාථා අංක 74. අ.නි. 3, පි.101 - 103.

14 අ.නි. නි. 1, පි. 7 - 9, නීවරණ ප්‍රහාණ වර්ගය. ථෙරී, පි.43, ගාථා අංක 165 - 167.

නුවණින් සැලකීමෙන් චක්ඛු, සොත වැනි ඉන්ද්‍රියයන්ගෙන් සංවරයත්[15] එයින් සිතෙහි ඇති විය යුතු පැහැදිලි බවත් ලබයි.

දෙවන නීවරණය ලෙස සලකනු ලබන ව්‍යාපාදය උපදින්නේත්, උපදින ව්‍යාපාද නීවරණය වැඩී යන්නේත්, අනිෂ්ට අරමුණු නම් වූ ප්‍රතීඝ නිමිත්ත හේතුවෙනි. පුද්ගලයා අකමැති අරමුණු ඉදිරිපත්වීමත්, එකී අරමුණු දෙස නුවණින් බැලීමත් නිසා ව්‍යාපාදය උපදී. ව්‍යාපාදය නැවත නැවත ඇති වී වැඩී යයි.

ව්‍යාපාද ප්‍රහාණය සඳහා පුද්ගලයා මෛත්‍රී චිත්ත විමුක්තිය වැඩිය යුතු ය. මෛත්‍රී සහගත සිතුවිලි නුවණින් මෙනෙහි කරමින් ව්‍යාපාදය නොඉපදවීමත්, ඒ වැඩි දියුණු නොවන සේ වළක්වාලීමත් කළ යුතු වේ.[16]

චිත්ත චෛතසිකයන් හකුළුවාලන, ථීන මිද්ධය නම් වූ තුන්වන නීවරණය සඳහා හේතු වන්නේ අධි කුසල ධර්මයන්හි ඇලීමට පවතින අකමැති බව නම් වූ අරතිය ය. ඒ කෙරෙහි පවතින අලස බව නම් වූ තන්දිය, ඇඟමැලි කැඩීම නම් වූ විජම්භිතාව, බත්මත නම් වූ **භත්ත සම්මදය**, චිත්තයාගේ හැකුළුන බව නම් වූ **ලීනත්වය** ද යන ඒවා ය.[17] හැකිලුණු සිත් ඇත්තාට ථීන මිද්ධය උපදියි. මහත් බවට පත්වීමෙන් දියුණුව වැසෙයි.

දියුණු වන පුද්ගලයා විසින් ථීන මිද්ධය ප්‍රහාණය සඳහා ආරම්භක වීර්යය නම් වූ ආරම්භ ධාතු කුසීත බවින් නික්මුණ හෙයින් ඊට වඩා බලවත් බාධා මැඩපවත්වාලන පරක්කම ධාතු නම් වූ ත්‍රිවිධ වීර්යය හේතුවෙන් ථීනමිද්ධ ප්‍රහාණය කළ යුතු ය.[18]

සිතෙහි පවතින නොසන්සුන් බව හෙවත් කළ නොකළ දෑ ගැන සිතමින් ඒ පිළිබඳ ව පසුතැවීම හේතුවෙන් උද්ධච්ච කුක්කුච්චය ඇති වේ. ඒ නැවත නැවත ඇතිවීමෙන් මහත් සේ වැඩී යේ.

---

15 ස.නි. 4, පි.349, 365. ස.නි. 4, පි.369 අ.නි. 2, පි.242 ස.නි. 4, පි.383.

16 ථෙර, පි.213, ගාථා අංක 874 - 876.

17 ථෙර, පි.11, 45. ථෙර, පි.103. දී.නි. 1, පි. 7 - 9.

18 ථෙර, පි.90. අ.නි. 2, පි.127; ථෙර., පි.67, ගාථා 171.

සිත සන්සුන් කර ගැනීමෙන් උද්ධච්ච කුක්කුච්ච ප්‍රහාණය කළ හැකි ය. කෙලෙස් දූවිලි ලෙස උඩට නගින්නේ සන්සුන් සිතකින් නොවේ. නැවත නොනගින ලෙස යටපත් කිරීම ම උද්ධච්ච කුක්කුච්ච ප්‍රහාණය ය.

බුද්ධාදී අටතන්හි පවතින සැකය විචිකිච්ඡා නම් වූ පස්වැනි නීවරණය ය. සැකය හේතුවෙන් උපදින විචිකිච්ඡාව මහත් ව වැඩී යයි.

නුවණින් මෙනෙහි කිරීම් හේතුවෙන්, විචිකිච්ඡාව උපදින හෙයින්, ඊට ප්‍රතිවිරුද්ධ වූ නුවණින් මෙනෙහි කිරීම් හේතුවෙන් විචිකිච්ඡාව නූපදී. ප්‍රහාණය වේ. වැඩි දියුණු නො වේ.[19]

ඉහතින් සඳහන් කරන ලද නීවරණ ධර්ම වළක්වාලීම, සිත සන්සුන් කර ගැනීමේ මාර්ගය ය. ඒ සඳහා සිත නම් වූ එක ම ධර්මය වැඩිය යුතු ය. භාවනා වශයෙන් විදර්ශනා මාර්ග ඵල, නිර්වාණය අරමුණු කොට පහළ කරන සිත, මහත් අර්ථය පිණිස පවතින බව සලකා බහුල වශයෙන් වැඩිය යුතු ය. එසේ බහුල ව වැඩීමෙන් සුව ඵලවන බව[20] සලකා සිත රැකගත යුතු වේ. සංවර කර ගත යුතු වේ.

සංවර වූ අන්තේවාසික මහණ සුව සේ පහසු ලෙස වසයි.[21] ඔහු කිසියම් කලෙක, සිහි මුළා වීමකින් සර සංකප්ප නම් වූ සංයෝජනයන්ට හිත වූ ලාමක අකුසල් දහම් උපදිත් නම්, සිහිය උපදවා ගනියි. උපන් ලාමක අදහස් වහා ම දුරු කරයි. නැවත නොහට ගන්නා බවට පමුණුවා ගනියි.[22] "යම්කිසි මහණකගේ දර්ශනය සුවිශුද්ධ වන්නේ" නම් ඔහු ස්පර්ශායතනයන්ගේ සමුදයයත්, අසතංගමයත් තතු සේ දැන ගනී. පඤ්චෝපාදානස්කන්ධයන්ගේ සමුදයයත්, අසතංගමයත්

19 ස.නි. 4, පි.165.

20 අ.නි.1,පි.465.අ.නි.2,පි.344.අ.නි.1,පි.11-23;අ.නි.2,පි.233.ස.නි.4,පි.159,එම - පි.205.

21 ස.නි. 4, පි.273; අන්තේවාසික සූත්‍රය.

22 ස.නි. 4, පි.367. ථෙර, පි.55; රාධ ස්ථවිර ගාථා. ථෙර. පි.53.

තතු සේ දන ගනී. සතර මහා භූතයන්ගේ සමුදයයත්, අසතංග මයත් තතු සේ දැන ගනී. යම් කිසිවක් හට ගැනීම ස්වභාව කොට ඇත්තේ නම් ඒ සියල්ල නැසීම ස්වභාව කොට ඇත්තේ යයි තතු සේ දන ගනී." මේ ආකාරයෙන් ඒ මහණහුගේ දර්ශනය සුවිශුද්ධ යයි කියති.[23] එවන් මහණ යථා කාලයේ දී ක්ෂීණාස්‍රව ද වෙති. පුරුෂාර්ථය ද ලබා මහා ප්‍රඥා හා මහා පුරුෂ බවට ද පත්වෙති. ඔහු සිහි ඇත්තේ මනා දනුම ඇත්තේ කාලය අපේක්ෂා කරයි.

භික්ෂුවකගේ සිහිය කෙබඳු විය යුතු ද යන්න අග්ගඤ්ඤ සූත්‍රය පැහැදිලි කරයි. කයෙහි කය අනුව බැලීම, වේදනාවන්හි වේදනා අනුව බැලීම, සිතෙහි සිත අනුව බැලීම හා දහම්හි දහම් අනුව බැලීම යන, සිව් ආකාර බැලීම සඳහා කෙළෙස් තවන වීර්යය ඇති ව මනා නුවණින් හා සිහියෙන් යුතු ව දැඩි ලෝභය හා දොම්නස් පහ කොට විසිය යුතු බව එහි සඳහන් ය.

සතර සතිපට්ඨානයන්හි පිහිටීම, විසුද්ධිය සඳහා එකම මඟ[24] ලෙස තථාගතයන් වහන්සේ නිතර සඳහන් කළහ. ඉදිරි ගමන, ආපසු ගමන, ඉදිරි බැලීම, අවට බැලීම,.... යෑම, සිටීම, හිඳීම, නිදීම ආදී සියලු ඉරියව් සිහියෙන් යුක්ත ව ම කරන මහණ සියලු දුක් වේදනා, සුව වේදනා, නොදුක් නොසුව වේදනාවන්හි නුවණින් ම සලකා බලයි. සුව, දුක් හා මැදහත් ලෙස වේදනා තුන් ආකාරයකින් බොහෝ තන්හි දේශනා කරන ලද නමුත් ඇතැම් තැනක සවිස්තර ලෙසත්, තවත් තැනක වේදනාව එකසිය, අටක්[25] ලෙසත් විස්තර කරන ලද බවත් අමතක නොකළ යුතු ය. වේදනාව තුන් ආකාර වේ යයි සංයුත්ත නිකායේ භික්ඛු සූත්‍රය සඳහන් කරයි.

චතුස්සත්‍යාවබෝධය නොකළ බෝසත් වේදනා පිළිබඳ ව පර්යේෂණය කළ බව පුබ්බේ සූත්‍රය[26] සඳහන් කරයි. "වේදනා

23 ස.නි. 4, පි.369 - 371. ම.නි. 1, පි.761 - 763.

24 ම.නි. 1, පි.134. ම.නි. 1, පි.195 - 197.

25 ස.නි. 4, පි.441.

26 ස.නි. 4, පි.437, 439.

කවරහු ද, වේදනා සමුදය කවරේ ද, වේදනා සමුදය ගාමිණී පටිපදාව කවර ද, වේදනා නිරෝධය කවරේ ද, වේදනා නිරෝධ ගාමිණී පටිපදාව කවර ද, වේදනා ආස්වාදය, ආදීනවය, නිස්සරණය කිමෙක් ද?" යනුවෙන් විමසූ එතුමන්ට එහි ලා නුවණැස පහළ විය.[27]

සුව වේදනා, දුක් වේදනා, මැදහත් වේදනා වශයෙන් වේදනා තුනෙකි. ඵස්ස සමුදයයෙන් වේදනා සමුදය වන බව; තණ්හාව, වේදනා සමුදය ගාමිණී පටිපදාව බව අවබෝධ කළ තථාගතයන් වහන්සේ, ඵස්ස නිරෝධයෙන් වේදනා නිරෝධයත්, වේදනාවෙහි වන ඡන්ද රාගය දුරලීම වේදනාවේ නිස්සරණය බවත් සඳහන් කළ හ.[28]

එක් එක් අවස්ථාවේ දී නුවණින් වේදනාවන් පිළිබඳ ව සිතා බලන මහණ, වේදනාවන්ගෙන් නිස්සරණය කෙරෙහි ද සිත යොමු කරයි. කයෙහි ඇති වූ සුව වේදනාවන් අනිත්‍යය යි ද, ව්‍යය යයි ද, විරාගයයි ද, නිරෝධයයි ද සලකා බැලීමේ දී කයෙහි හා සුව වේදනාවෙහි වන්නා වූ රාගානුසයෙක් වේ නම් ඒ ප්‍රහීණ වේ. කය නිසාවෙන් දුක් වේදනාවක් ඇතිවන විට, දුක් වේදනා ඇති වූයේ කය නිසාය, කය අනිත්‍යය, සංඛතය, පටිච්චසමුප්පන්නය; එහෙයින් කය නිසා උපන් දුක් වේදනා අනිත්‍යයයි... ආදී ලෙසින් සලකා බැලීමේ දී, යම් පටීඝානුසසයෙක් වේ නම් එය ප්‍රහීණ වේ. ඉහත ආකාරයෙන් නොදුක්, නොසුව වේදනා ගැන සිතීමේ දී අවිද්‍යානුසයෙක් වේ නම් එය ද ප්‍රහීණ වේ.[29]

සුව වේදනා, දුක් වේදනා හා මැදහත් වේදනා අනිත්‍ය යයි සලකා නොපිළිගැනීම නිසා සියලු වේදනාවන් සිහිල් වන්නාහ යි සංවර වූ මහණ දැනගනී. ඇස පිළිගැනීම නිසා, දුක පිළිගත්තේය' ය යි සලකන මහණ, කන, නහය ආදී ඒ ඒ ඉන්ද්‍රියයන් පිළිබඳ ව මෙනෙහි කිරීමෙන්, ඇස, කන, නහය ආදීන් පිළිගැනීමට

---

27 ස.නි. 4, පි.441; පුබ්බෙ සූත්‍රය.

28 ස.නි. 4, පි.417; සන්තක සූත්‍රය.

29 -එම- පි.401 - 403; ගෙලඤ්ඤ සූත්‍රය. ස.නි. 4, පි.417.

මැළිවෙයි. එසේ ඒවා නොපිළිගැනීම ම දුක නොපිළිගැනීමට හේතු ප්‍රත්‍යය වන බව ඔහු අවබෝධ කරයි.[30] ඇස; ඉපදීම, පැවැත්ම, නිපැදීම, පහළවීම දුකෙහි ඉපදීම ය. රූප; ඉපදීම, පැවැත්ම, නිපැදීම, පහළවීම දුකෙහි ඉපදීමය, ආදී වශයෙන් සැලකීමෙන් සියල්ල ප්‍රහාණය සඳහාත්, දුක් ක්ෂය කිරීම සඳහාත් උත්සුකවීමෙන් දුක් ක්ෂය කිරීමෙහි සංවර වූ සුදුස්සකු වේ.[31]

ඉහතින් සඳහන් කළ වේදනාවන්හි නොඇලීම, කලකිරීම නිවනට මඟ යයි කියන ලද හෙයින්, නිවන කවරේ දැයි සෙවීම සංවර වූ මහණ හට වැඩදායි වේ.[32]

නිවන[33] යනු රාගය, දොසය, මෝහය දුරලීම බව නිබ්බාන සූත්‍රය සඳහන් කරයි. ඒ සඳහා පිළිවෙතක් ඇද්දැයි විමසීමේ දී, එකී සූත්‍රයට අනුව අරිඅටගී මග නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම ඊට පිළිවෙත බව අවබෝධ කර ගත හැකි ය.

1. සම්මා දිට්ඨි
2. සම්මා සංකප්ප
3. සම්මා වාචා
4. සම්මා කම්මන්ත
5. සම්මා ආජීව
6. සම්මා වායම
7. සම්මා සති
8. සම්මා සමාධි යනුවෙන් දැක් වූ එම එකී මාර්ගගෙ යි.

රහත් බව ලැබීමට ද ඒ මඟ ය.[34] ධර්මවාදී, සුපටිපන්න, සුගත නම් වූ පිරිස අනුගමනය කළ මඟක් වී ද, ඒ අරිඅටඟි මගම

30 ස.නි. 4, පි.27. ස.නි. 4, පි.119.

31 ස.නි. 4, පි.29. ස.නි. 4, පි.259 - 261.

32 ස.නි. 4, පි.37. ස.නි. 4, පි.31 - 55. -ස.නි. 4, පි.145.

33 ස.නි. 4, පි.475; නිබ්බාන සූත්‍රය.

34 ස.නි. 4, පි.475 - 487; ජම්බුඛාදක සංයුත්තයේ දැක්වෙන සූත්‍ර.

විය. දුක පිරිසිඳ දත හැකි මඟ බැවින් එහි නොපමා විය යුතු ය. අස්වැසීම සඳහාත්, වේදනා පිරිසිඳ දැනීම සඳහාත්, ආස්‍රව ප්‍රහාණය සඳහාත්, අවිද්‍යාව ප්‍රහාණය සඳහාත් පිළිවෙත අරි අටඟි මඟය. තණ්හා, ඔඝ, උපාදාන ප්‍රහාණය කරනුයේ අරි අටඟි මගිනි. ත්‍රිවිධ භවය, ත්‍රිවිධ දුක හා සත්කාය පිරිසිඳ දැනගැනීම සඳහා පිහිට වනුයේ ද අරි අටඟි මඟ ය. තණ්හා, ඔඝ, උපාදාන ප්‍රහාණය කරනුයේ අරි අටඟි මගිනි. ත්‍රිවිධ භවය, ත්‍රිවිධ දුක හා සත්කාය පිරිසිඳ දැනගැනීම සඳහා පිහිට වනුයේ ද අරි අටඟි මඟ ය.[35] පැවිද්ද දුෂ්කර යයි දක්වන දුක්කර සූත්‍රය[36] පැවිද්දෙහි ඇල්ම වඩාත් දුෂ්කර බව දක්වයි. පැවිද්දෙහි ඇලුණ පැවිද්දාට වඩාත් දුෂ්කර වන්නේ ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි පිහිටීම ය.

ධර්මානු ධර්ම ප්‍රතිපන්න මහණ රහත් වන්නේ නොබෝ කලකිනි. එහෙයින් විසුද්ධිය සඳහා අරි අටඟි මඟට වැටිය යුතු ය. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ[37] පළමුවැන්න සම්මා දිට්ඨිය බැවින් සම්මා දිට්ඨිය, සමඟ එකට යෙදෙන්නේ යයි සැලකෙන සද්ධා ඉන්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන ඉන්ද්‍රිය දෙක ද, සද්ධාබල හා පඤ්ඤාබල යන බල දෙක ද, කවරේ දැයි තේරුම් ගත යුතු ය. එසේ පිරිසිඳ දැනගත් කල දිට්ඨි විසුද්ධිය අවබෝධ කිරීම පහසු ය. මජ්ඣිම නිකායේ සම්මා දිට්ඨි සූත්‍රය[38] සම්‍යක් දෘෂ්ටිකයාගේ ලක්ෂණ ලෙස දෘෂ්ටිය ඍජුවීම, ධර්මය දැනගැනීම හා එසේ දැනගැනීමෙන් නිර්වාණ ධර්මයට පැමිණීම යන ලක්ෂණ දක්වයි. සංයුත්ත නිකායේ සාකේත සූත්‍රයේ දී[39] යම්කිසි කයකට පැමිණි පසිඳුරෝ, පස් බලයෝ වෙද්ද, යම් පස් බලයෝ වෙත් නම් ඒ පසිඳුරෝ වෙද්ද; යනුවෙන් සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය හා පඤ්ඤින්ද්‍රිය යයි දැක්වූ පහ; සද්ධා බලය, විරිය බලය, සති බලය,

35 ස.නි. 4, පි.345; නිබ්බාන සූත්‍රය.

36 එම- පි.487, ම.නි. 1, පි.133.

37 ස.නි. 5 -1, පි. 15 - 17; විභඞ්ග සූත්‍රය. අ.නි. 3, පි.33; අනුග්ගහීත සූත්‍රය. -ස.නි. 5 -1, පි.11.

38 ම.නි. 1, පි.111 - 133; සම්මාදිට්ඨි සූත්‍රය.

39 -එම- පි.111. අ.නි. 1, පි.63, -එම- පි.483.

සමාධි බලය හා පඤ්ඤා බලය යනුවෙන් නිවනට ඇතුළත් ව, නිවන පිහිට කොට, නිවන කෙළවර කොට ඇතැයි සඳහන් කරන ලදි. ඉන් 'පඤ්ඤින්ද්‍රිය', ඉතා වැදගත් බව පුබ්බාරාම සූත්‍රය[40] දක්වයි.

පඤ්ඤින්ද්‍රිය අනුව, ආර්ය ශ්‍රාවකයාහට ශ්‍රද්ධාව පිහිටයි. වීර්යය, සිහිය, සමාධිය යන ඒවාට පිහිට වන්නේ ද, විශේෂයෙන් බහුල කොට වැඩූ පඤ්චින්ද්‍රිය ය. අර්හත්වය ප්‍රකාශ කරන මහණ, ආර්ය වූ ප්‍රභාවත්, ආර්ය වූ විමුක්තියත් වැඩූ බැවින් එසේ කරන්නේ යයි දුතිය පුබ්බාරාම සූත්‍රයේ දක්වේ. එහි දක්වූ ආර්ය වූ ප්‍රඥාව, පඤ්ඤින්ද්‍රිය ය. ආර්ය වූ විමුක්තිය සමාධින්ද්‍රිය ය. ඉන්ද්‍රිය තුනක් හෝ සතරක් හෝ පහක් හෝ වැඩීමෙන් ද, රහත් බව ප්‍රකාශ කළ හැකි ආකාරය පිණ්ඩෝල සූත්‍රය, තතිය පුබ්බාරාම චතුත්ථ පුබ්බාරාම යන සූත්‍රවලට[41] අනුව පැවසිය හැකි ය.

**සිතීමේ නිවැරදි පදනම ලෙස සම්මා දිට්ඨිය සැලකිය යුතු බව මෙයින් වටහා ගත හැකි ය.** ඒ 'දර්ශනය' යයි කීම ද නිවැරදි ය. තමා ම විග්‍රහ කොට ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙන් ඍජුකම වේ. ඵලය දකීමෙන් හේතුව සෙවීමට පුද්ගලයා තුළ කැමැත්තක් ඇති වෙයි. හේතුව නොපෙනෙන විට, ඒ සොයා ගන්නා තුරු උත්සාහය අත් නොහැර පර්යේෂණය සඳහා උත්සාහවත් වෙයි. **මේ හේතුඵල සම්බන්ධය අනුව සිතීමෙන් දෘෂ්ටිය ඍජු වේ.**[42]

සම්‍යක් දෘෂ්ටිකයා අනෙකෙකුගේ කීමට වහල් නොවේ. එහෙත් ඔහු මේ මාර්ගයට පැමිණෙන තුරු ශ්‍රද්ධාවත්, ශාස්තෘවරයෙකුගේ හෝ කල්‍යාණ මිත්‍රයකුගේ හෝ උපකාරය ලබයි. ඒ කුසල මූලය හා අකුසල මූලය කුමක්දැයි තේරුම් ගැනීම සඳහා ය. ඔහු ඉන් ඒ කුසල අකුසල දැනගනී.[43] මේ කම්ම පථ වාරය ය. අනතුරුව ආහාර, සච්ච, ජරා මරණ, ජාති, උත්පත්ති

40 ස.නි. 5 -1, පි.387 - 389. -එම- පි.435.

41 -එම- පි. 435. -එම- පි.393. ස.නි. 5 -1, පි.417.

42 ස.නි. 5 -1, පි.395 - 397.

43 සු.නි., පි.249 - 255. ස.නි. 5-2, පි.293; ගවම්පතී සූත්‍රය.

භව, උපාදාන, තණ්හා, වේදනා, ඵස්ස, සළායතන, නාමරූප, විඤ්ඤාණ, සංඛාර, අවිජ්ජා ආදී වූ ගැඹුරු ධර්මයන් කරා යමින් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි හැසිරෙමින් අවසාන වශයෙන් දෘෂ්ටිය ඍජු කරයි.

කුශල මූල හැඳින ගත් අවධියෙන් පසු, වඩ වඩා ඉහළ යාමට ඔහුට සද්ධා, පඤ්ඤා දෙක; ඉන්ද්‍රිය හා බල ලෙස උදව් කරයි.[44] සද්ධා යනු තථාගතයන් වහන්සේ ලැබූ අවබෝධය නම් බුද්ධත්වය කෙරෙහි පැහැදීම ය. 'සද්ද හති තථාගතස්ස බෝධිං' යන පාඨයේ දක්වෙන පරිදි ඒ 'බෝධි' ය පිළිබඳ ශ්‍රද්ධාව මිස 'ඉද මෙව සච්චං මොඝ මඤ්ඤත්ති'[45] යන්නෙන් දක්වූ පරිදි, 'මෙය ම සත්‍යය, සෙස්ස හිස් ය,' යන ආකාරයේ පැහැදීමක් නොවේ. 'මෙය ම සත්‍යය, සෙස්ස හිස්ය' යි නොපිළිගත් ශාස්තෘවරයකු කෙරෙහි ශ්‍රද්ධාව ඇති කර ගැනීම පුද්ගල ගරුත්වය නිසා කළ යුතු නොවේ.

සම්මා දිට්ඨියෙහි දියුණු අවස්ථාව ප්‍රඥාව (පඤ්ඤා) ලෙස දක් වේ.[46] ශ්‍රැතමය, චින්තාමය, භාවනාමය වශයෙන් ප්‍රඥාව තුන් ආකාර වේ.

1. බුද්ධිමතුන් විසින් දෙනු ලබන උපදෙස් ශ්‍රැතමය ප්‍රඥාව වේ.
2. අනුමානය ආශ්‍රය කොට තර්කානුකූල ව බැස ගන්නා නිගමනය චින්තාමය ප්‍රඥාව වේ.
3. ප්‍රත්‍යක්ෂය අනුව වඩනා ලද ආර්යයන් සතු ප්‍රඥාව, භාවනාමය ප්‍රඥාව වේ.

බුද්ධ ධර්මය අතක්කාවචරය'යි පවසන සමහරු තර්කණයට එහි ඉඩක් නැතැයි පවසති. ඒ සාවද්‍යය, ලෞකික සත්‍යයක් පැහැදිලි කිරීමෙහි ලා තර්කය අවශ්‍ය ය. ඒ තථාගතයන්

44 ස.නි. 5-1, පි.55. ම.නි. 1, පි.111 - 133; සම්මාදිට්ඨි සූත්‍රය.

45 ස.නි. 5-1, පි.391; පුබ්බ කොට්ඨක සූත්‍රය. -එම- පි.391.

46 සු.නි., පි.266, ගාථා අංක 843 -847. මහාපදෙස දේසනා සූත්‍රය. - අ.2, පි.327 -331; පුග්ගලප්පසාද සූත්‍රය - අ.3, පි.443.

වහන්සේ විසින් ද අනුගමනය කළ හ. එහෙත් නිවන තර්කය මත අවබෝධ කළ හැක්කක් නො වේ. නිවන අතක්කාවචරය[47] නිවනට පැමිණීමේ මාර්ගයට පිවිසීම සඳහා විමසමින්, තර්ක කරමින් කරුණු අවබෝධ කළ යුතු වේ. මාර්ගයට පැමිණි පසු ඒ, තම තමා විසින් ම (පච්චත්තං වේදිතබ්බො) තර්කයෙන් තොරව අවබෝධ කළ යුතු ය.

ඉහතින් දැක් වූ දිට්ඨි විසුද්ධිය[48] විසුද්ධි සතෙහි (අනුපිළිවෙළින්) දැක්වූ තුන්වැන්න ය, දිට්ඨි විසුද්ධියෙන් කෙරෙන පිරිසිදු වීමක් නොමැති ව, ආත්ම දෘෂ්ටිය සහිතව ම වුවත්, රූප, අරූප, ධ්‍යාන ලැබිය හැකි ය යන්න වැදගත් වේ. ඒ තාවකාලික ලෙස කෙලෙස් යටපත් කිරීමෙනි. එහෙත් සමුච්ඡේද වශයෙන් කෙලෙස් සඳහට ම ප්‍රහාණය වන්නේ දිට්ඨි විසුද්ධියෙන් පිරිසිදු වීමෙනි. සත්ත්ව පුද්ගල සංඥාව, සිතින් ඉවත් කිරීම, නිවන පතන පුද්ගලයා පිරිසිදු වන ආකාරය ලෙස කලින් සාකච්ඡා විය. ඒ සඳහා සද්ධා, පඤ්ඤා දෙක අවශ්‍ය ය. එසේ සත්ත්ව සංඥාව[49] දුරු කිරීම දිට්ඨි විසුද්ධි ය. දිට්ඨි විසුද්ධියෙන් ස්වකීය පිළිගැනීම යහපත් මඟට යොමු කළ පසු, කල්පනා කිරීමේ ක්‍රමය ද යහපත් විය යුතු ය. ඒ සම්මා සංකප්ප ලෙස දැක් වේ. ආර්ය අෂ්ටාංගික[50] මාර්ගයෙහි දෙවැන්න සම්මා සංකල්පය යි.

ඉන් නෙක්ඛම්ම, අව්‍යාපාද හා අවිහිංසා සංකල්ප අදහස් කෙරේ. කාම සංකල්පනා යටපත් කිරීම, ව්‍යාපාද සංකල්පනා යටපත් කිරීම හා විහිංසා සංකල්පනා යටපත් කිරීම එහි කාර්යය වේ.

තමා මෙන් අනුන් ද සමානත්වයෙන් සැලකීමෙන් දයාව හා අනුකම්පාව වැඩේ. සතර බ්‍රහ්ම විහරණවලින් භාවනාවක්

47 අ.නි. 3, පි.17, ප -අ.නි. 3, පි.16. බෞ.ද., පි.150 - 159.

48 ම.නි. 1, පි.409; අරිය පරියෙසන සූත්‍රය. අ.නි. 2, පි.369. -ම.නි. 1, පි.408.

49 ස.නි. 4, පි.120 - 122. බලන්න, ස.වි.ධ, පි.101 - 110. ස.නි. 4, පි.120. -ස.නි. 4, පි.122.

50 ස.නි. 5 -1, පි.15; විභඞ්ග සූත්‍රය. -එම- පි.115; ආකාස සූත්‍රය.

ලෙස සම්මා සංකප්පය වැඩීමට අනුබලය ලැබෙන හෙයින් සම්මා සංකප්පයට උදව් කරන ධර්ම ලෙස මෙත්තා, කරුණා, මුදිතා, උපේකඛා යන සතර වැදගත් වේ. එසේ ම ධම්මවිචය සම්බොඣංග ඒ හා බැඳෙන ධර්ම ලෙස තේරුම් කළ යුතු ය.[51]

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර, බ්‍රහ්ම ලෝකවල පවා ඉපදීමට හේතුවන බැවින්, සිව් බඹවිහරණ හෙවත් සතර බ්‍රහ්ම විහාර නම් වෙයි. මෙත්තා, කරුණා, මුදිතා යන තුන තෘතිය හා චතුර්ථ ධ්‍යාන ලබා ගැනීමට පවා පිහිට වෙයි.[52] උපේක්ඛාව චතුර්ථ ධ්‍යානය ලබා ගැනීම සඳහා ම පිහිට වෙයි. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා සමඟ යෙදෙන ධම්මවිචය සම්බොජ්ඣංගය, සම්මා සංකප්පයට ආධාර වේ. සෑම ධර්මයක් ම පරීක්ෂා කොට, එම තතු අවබෝධ කොට තම සිතෙහි තැන්පත් කර ගැනීම ධම්මවිචය සම්බෝජ්ඣංගයේ ස්වරූපය යි. ඒ සත්ත්වයා හා ලෝකය පිළිබඳ නිස්සාර භාවය සම්පූර්ණ වීම, අර්හත්වය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් ම ලැබෙන හෙයින්, අර්හත්වය සාක්ෂාත් කිරීමේ අත්තිවාරම ලෙස ද ධම්මවිජය සම්බොජ්ඣංග ය[53] සැලකිය හැකි ය.

අතීතයෙහි පහළ වී නිරුද්ධ වූ නාමරූප ධර්ම, අතීත භවය වශයෙන් ද, අතීත කර්ම හේතුවෙන් මෙකල පහළ වී ඇති නාමරූප ධර්ම[54] වර්තමාන භවය වශයෙන් ද, වර්තමාන කර්ම නිසා මතු පහළ වන නාමරූප ධර්ම අනාගත භවය වශයෙන් ද පිළිගනී.

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග තුන හේතුවෙන් වන පිරිසිදුවීම, සීල

51 ස.නි. 5 -1, පි.225; අ.නි. 3, පි.366. පටි.ම.2, පි.64 -එම- පි.65 - 81. -එම- පි.71.

52 ස.නි. 5 -1, පි.147 - 157. ස.නි. 5-1, පි.165 - 209. ස.නි. 5 -1, පි.215.

53 අ.නි. 2, පි.247 - 249; තතිය පුග්ගල සූත්‍රය.

54 පටි.ම.2, පි.39 - 63; බෞධ්‍යඞ්ග කථා.

විසුද්ධිය[55] ලෙස දැක්විය හැකි ය.[56] වචනයත්, ක්‍රියාවත්, ජීවත් වීමත් යන තුන නිවැරදි වීම මේ මාර්ග තුනෙන් බලාපොරොත්තු වෙයි. දිට්ඨිය හා සංකප්ප නිවැරදිවීමෙන් පුද්ගලයා සිල්වත් වෙයි.

සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන්න විරති චෛතසික ලෙස හඳුන්වනු ලබන්නේ ද, පිරිසිදුවීම සඳහා වැරදිවලින් ඉවත් වන අදහසිනි. බොරු කීම, කේළාම් කීම, පරුෂ වචන කීම හා හිස්බස් යන ඒවායින් ඉවත්ව, තමන්ටත් අනුන්ටත් හිරිහැරයක් නොවන ලෙස වචනය හික්මවා ගැනීම සම්මා වාචා නම් වේ. දෙතිස් කථා[57] ආදියෙන් ඉවත් වී දැහැමි කතාව[58] හෝ ආර්ය තුණ්හීභාවයෙන් යුක්තවීම හෝ නිබ්බාණග ාමී පුද්ගලයාගෙන් ඉටුවිය යුතු ය. සම්මා කම්මන්ත යන්න ප්‍රාණඝාත, අදත්තාදාන හා කාමමිථ්‍යාචාර (මෛථුන) යන්ගෙ න් වැළකීම බව කලින් සඳහන් කරන ලදි. මුළු මහත් සමාජය ම අරමුණු කොට යම්කිසි පුද්ගලයකුට කළ හැකි යහපත මේ යයි දැක්වීම පහසු නොවන හෙයින් රාග, ද්වේෂ, මෝහයන්ගෙ න් ඈත් වී ඉටු කරන ක්‍රියා සම්මා කම්මන්ත ලෙස දැක්වීම පහසු ය. ධර්මිෂ්ට ලෙස ධනය උපයා ගැනීමට වෙහෙසෙන ගිහියා බොහෝ විට දිළින්දෙකි. පරාජය වූවෙකි. එහෙත් සත්‍යය ලෝකයේ ඔහු නොපැරදුණු පුද්ගලයෙකි. අධාර්මික ව ධනය ඉපැයූ තැනැත්තා තමා ධනය ඉපැයූ ආකාරය දන්නා බැවින්, අභ්‍යන්තරයෙන් දුක, තැවුල හා බිය ඇතිකර ගත්තෙකි. ව්‍යවහාර ලෝකයේ සත්‍යය ලෙසින් පෙනෙන දෙය, සත්‍ය ලෝකයේ දී එසේ නොවීම ඊට හේතුව ය.

චූල ශීල, මජ්ඣිම ශීල හා මහා ශීල පිළිබඳ ව කරුණු දැක්වූ තන්හි භික්ෂු ජීවිතයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන්න විස්තර ලෙස දැක්විණ.

---

55 ස.නි. 4, පි.267, කම්ම සූත්‍රය.

56 ම.නි. 1, පි.367, රථ විනීත සූත්‍රය. ස.නි. 5 -1, පි. 147, 307, 337. ස.නි. 5 -1, පි.147 - 151. වි.භා., පි.57 - 65.

57 ස.නි. 5 - 2, පි.269; තිරච්ඡානකථා සූත්‍රය. -එම- පි.267; විග්ගාහික කථා සූත්‍රය. අ.නි. 2, පි.191 - 195.

58 අ.නි. 2, පි.100. ස.නි. 2, පි.432.

චතුපාරිසුද්ධි[59] ශීලය නම් වූ පාතිමොක්ඛ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීව පාරිසුද්ධි ශීලය හා පච්චය සන්නිශ්‍රිතශීලය යන ඒවා ඉහත මාර්ග තුන හා සම්බන්ධ ඒවාය. අංගුත්තර නිකායේ තික නිපාතය මහණ කෙනකු විසින් ලැබිය හැකි පවිවේක තුනක් පැහැදිලි කරයි.

1. මහණ සිල්වත් වෙයි. පස් ආකාර දුශ්ශීල බවෙන් ඈත් වෙයි.
2. මහණ සම්‍යක් දෘෂ්ටික වෙයි. මිථ්‍යා දෘෂ්ටි ස්වභාවයෙන් ඈත් වෙයි.
3. මහණ ක්ෂීණාස්‍රව වෙයි. ආස්‍රවයන්ගෙන් ඈත් වෙයි.

යන ත්‍රිවිධ ලක්ෂණයන්ගෙන් යුක්ත මහණ ශීලයෙන් අගතැන් පත් වූවකු, ශීල සාරය ලැබූවකු යයි කියති. ශීල පාරිසුද්ධිපධානියංගය අර්ථ දක්වන සාපුගිය සූත්‍රයට[60] අනුව යම්කිසි භික්ෂුවක් සිල්වත් වී ශික්ෂා පදයන්හි හික්මීමේ දී, එම භික්ෂුව, ශීල පාරිසුද්ධි යන නම ලබයි. එසේ ශීල පාරිශුද්ධිය සම්පූර්ණ කොට විදර්ශනා ප්‍රඥායෙන් ඒ ගැනීමෙන් එහි යම්කිසි ඡන්දයක් හා උත්සාහයක් හා සම්‍යක් ප්‍රඥාවක් වේ නම් එය ශීල පාරිශුද්ධිපධානියංග නම් වේ. ඉහතින් දක්වන ලද ආකාරයෙන් සිල්වත් වී ශීල විශුද්ධිය[61] ලැබිය හැකි වුව ද, ඊට බාධා කළ හැකි මානසික වශයෙන් ශීලය අපිරිසිදු වන ක්‍රම හතක් පවතී.[62]

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මීළඟ අවස්ථාව, ‘සම්මාවායම’ පිළිබඳ ව ය. ‘සම්මාවායාම’ යනු යහපත් උත්සාහය ය. උත්සාහය නිර්වාණගාමී ප්‍රතිපදාව සාර්ථක කර ගැනීම සඳහා වේ නම්, ඒ උත්සාහය යහපත් ය, නිවැරදි ය. සම්මාවායාම[63] හා

59 අ.නි. 1, පි.431.

60 අ.නි. 2, පි.377. අ.නි. 3, පි.183.

61 අ.නි.3,පි.183;ස.නි.4,පි.105-107.ස.නි.4,පි.107.අ.නි.1,පි.484 අ.නි.3,පි.325, අ.නි. 3, පි.409, -එම- පි.183.

62 ම.නි. 1, පි.263.

63 බෞ.ද., පි.181; ස.5 -3, පි.15.

සම්බන්ධ වන අනෙකුත් අංග වනුයේ විරියින්‍ද්‍රිය, විරිය බල, විරිය සම්බොජ්ඣංග, චතුසම්මප්පධාන, චතුරිද්ධිපාද හා මග්ගා මග්ග ඤාණ දස්සන විසුද්ධි යන ඒවා ය. සම්මා වායාම; නූපන් අකුසල් නොඉපදීම, උපන් අකුසල් නැති කිරීම, නූපන් කුසල් ඉපදීම, උපන් කුසල් වැඩි කිරීම යනුවෙන්[64] සතර වැදෑරුම් බව ඉහතින් සඳහන් කරන ලදි.

ඇස, කන, නහය ආදී ඉන්ද්‍රියයන් නිසා විෂභාගී අරමුණ පහළවන බැවින් ඉන් ආරක්ෂා වීමට නිර්වාණගාමී පුද්ගලයා උත්සාහ දරයි. සිය සිතට නැගෙන අරමුණු විෂභාගී අරමුණු වේ නම්, ඒ අරමුණු නොඉවසීමට (භාවනානුයෝගී) පුද්ගලයා උත්සාහ කළ යුතු ය.[65] හිඳගෙන සිටින විට විෂභාගී අරමුණු වේ නම්, ඒ අරමුණු නොඉවසීමට (භාවනානුයෝගී) පුද්ගලයා උත්සාහ කළ යුතු ය.[66] සක්මන් කරන විටත් එසේ විෂභාගී අරමුණු සිහි වෙතොත්, ඒ ඉරියව්ව වුව ද මාරු කළ යුතු වේ. එසේ කොටත් නොහැකි වෙතොත් විහාර, ප්‍රතිමා ගෘහ ආදිය මෙනෙහි කොට විෂභාගී අරමුණු යටපත් කළ හැකි ය.[67] එසේ සිත එකඟ කර ගත් කල්හි විෂභාගී අරමුණු යටපත් වූ කල, ඒ රැක ගැනීමට වඩ වඩාත් උත්සාහ කළ යුතු ය. මේ සංවර ක්‍රමය සඳහා දරන වීර්යය, සතරාකාර බව ප්‍රධාන[68] සූත්‍රය දක්වයි.

1. සංවරප්පධාන - ඉන්ද්‍රියයන්ට හමුවන අරමුණු වැළැක්වීම.
2. පහානප්පධාන - මානසික ව එන විෂභාගී අරමුණු වැළැක්වීම.
3. භාවනප්පධාන - විෂභාගී අරමුණු යටපත් කෙරෙන බෝජ්ඣංග ධර්ම සිහි කිරීම.

---

64 අ.නි. 2, පි.495; චතුසම්මප්පධාන සූත්‍රය.

65 ස.නි. 4, පි.375 - 379; විණොපම සූත්‍රය. -එම- පි.367.

66 ම.නි.2,පි.289-299;දෙව්ධාවිතක්කසූත්‍රය-එම-පි.301-307;විතක්කසණ්ඨාන සූත්‍රය.

67 අ.නි. 2, පි.139 - 141; පධාන සූත්‍රය.

68 අ.නි.2,පි.495;චතුරිද්ධිපාදසූත්‍රය.ස.නි.5-2,පි.39-45.-එම-පි.47-49.-එම-පි.51 - 57.

4. අනුරක්ඛනප්පධාන - තමා තුළ පහළ වූ ඒකාග්‍රතාව පිරිහෙන්නට නොදී ආරක්ෂා කිරීම.

සතර ඉද්ධිපාද[69] නම් වන්නේ ඡන්ද, චිත්ත, වීරිය, විමංසා යන ඒවා ය. අධිගමය ලබා ගැනීම සඳහා පවතින බලවත් අධිෂ්ඨානය යි. වීරිය නම් ඒ සඳහා පවතින බලවත් වීර්යය යි. විමංසා නම් අධිගමය ලැබීම සඳහා විමසීමයි. මේ ඉද්ධිපාද භාවනාව අනාගාමී ඵලය ලැබූ පුද්ගලයා සතු භාවනාවකි. ඔහු විසින් රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන උද්ධම්භාගීය (ඉහළ) සංයෝජන පහ ප්‍රහාණය කළ යුතු ය.[70]

මෙහි දී පුද්ගලයාට ලැබෙන විසුද්ධිය මග්ගා මග්ග ඤාණදස්සන[71] විසුද්ධිය යි. යෝගාවචරයා විසින් දත යුතු මග නොමග, ඉන් පැහැදිලි කෙරේ. ශරීරයෙහි රූප කලාප පිළිබඳ ව කරන මේ මෙනෙහි කිරීම තුන් ආකාර වේ.

1. රූපය විනාශ වන ස්වභාවය, වේදනාව විඳීම් ස්වභාවය ආදී ලෙසින් ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවය අවබෝධ කිරීම ඥාන පරිඤ්ඤා නමි.
2. ඒ රූප වේදනාදී ධර්මයන් අනිච්ච, දුක්ඛ, අනත්ත වශයෙන් ත්‍රිලක්ෂණයට නඟා සැලකිය හැකි නුවණ තීරණ පරිඤ්ඤා නමි.
3. ධර්මයන් ආත්ම ස්වරූපයෙන් නොගෙන ඒවා කෙරෙහි කලකිරී ආලයන් නොකොට අතහැර දැමීමේ හැඟීම් පහළ කරවන නුවණ පහාන පරිඤ්ඤා නමි.

මග්ගා මග්ග ඤාණදස්සන විසුද්ධියේ ඵලය ලෙස නිබ්බාණගාමී පුද්ගලයා ස්කන්ධ පඤ්චකය අනිත්‍ය වශයෙන් ගෙන නිත්‍ය සංඥාව දුරු කෙරෙයි. දුක් වශයෙන් ගෙන සුඛ සංඥාව දුරු

69 ස.නි. 5 -1, පි.425; උද්ධම්භාගීය සූත්‍රය. ස.නි. 5 -2, පි.60 - 61. ස.නි. 4, පි.327.

70 බෞ.ද., පි.189, - එම- පි.214. -එම- පි.147 - 228. ස.වි.ධ., පි.115 - 127.

71 ම.නි. 1, පි.703 - 705. ස.නි. 4, පි.409.

කෙරෙයි. අනාත්ම වශයෙන් ගෙන ආත්ම සංඥාව දුරු කෙරෙයි. ශරීරය පිළිබඳ ව ඔහු තුළ පහළ වන අවබෝධය ව්‍යය ඥාන දර්ශනයට[72] නැඹුරු වෙයි.

මේ අවස්ථාවේ දී ඔහුට දස විධ විපස්සනොපක්කි ලෙස[73] නම් වූ විදර්ශනාව කිළිටි කර දමන ධර්ම පහළ වෙයි.

1. ඕභාස - විදර්ශනා සිතෙන් ම පහළ වූ ආලෝකය,
2. පීති - ඒ ආලෝකය ලැබෙන විට පහළ වන සතුට,
3. පස්සද්ධි - සතුට සමඟ කය හා සිත සැහැල්ලු බව,
4. අධිමොක්ඛ - ඒ පිළිබඳව ශ්‍රද්ධාව ඇසුරු කළ විශ්වාසය,
5. පග්ගහ - දැඩි උත්සාහය,
6. සුඛ - ඒ අවස්ථාවේ සිරුරට දැනෙන සැපය,
7. ඤාණ - අවස්ථානුකූල ව තියුණු වී ඇති බුද්ධිය,
8. උපට්ඨාන - සමෘති ශක්තිය,
9. උපේක්ඛා - සිත සුව දුක් දෙකෙහි සම තත්ත්වයක තැබීම,
10. නිඛන්ති - ධ්‍යාන ලෝකය කෙරෙහි ඇති බලවත් ඇලීම නිඛන්තිය වේ.[74]

ලෞකික බවට නැමෙන හුරු බැවින් අයහපත් පක්ෂයට නැඹුරු විය හැකි ය. සෙසු උපක්ලේශ ධර්මයන්හි එබඳු ස්වරූපයක් නැත.

මග නොමග දැන ගැනීම නම් වූ මේ අවස්ථාවේ දී නිබ්බාණග ාමී පුද්ගලයා විදර්ශනා ලෝකය ලැබීම නිසා මත් නොවී, ආචාර්ය උපදෙස් අනුව මග නොමග තේරුම් ගෙන ඉදිරියට යා

72 බෞ.ද., පි.190 - 191.

73 පටි.ම.2 පි.20.

74 ස.නි. 5 - 1, පි.261; සතො සූත්‍රය. -එම- පි.339. -එම- පි.355. -එම- පි.333.

යුතු ය. පාර වරදින්නට ඉඩ ඇති බැවින් මේ විසුද්ධිය, මග්ගා මග්ග ඤාණදස්සන විසුද්ධි නම් වේ. සත්ත්වයා පිරිසිදුවීම සඳහා අනුගමනය කරන පිළිවෙත නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මීළඟ අවස්ථාව සම්මාසතිය ය. එහි දී; ආර්ය අෂ්ටාංගික මාර්ගය හා ගැළපිය හැකි ධර්ම වනුයේ සතර සතිපට්ඨාන, සතින්ද්‍රිය, සතිබල, සති සම්බොජ්ඣංග හා පටිපදාඤාණදස්සන විසුද්ධිය යන ඒවා ය. නිබ්බාණගාමී පටිපදාවේ හතරෙන් තුන් කොටසක් පමණ මග ගෙවූ යෝගාවචරයා ස්වකීය ස්මෘති ශක්තිය[75] ඉතා උසස් තත්ත්වයකින් රැකගත යුතු ය. නිච්ච සඤ්ඤා, සුබ සඤ්ඤා, අත්ත සඤ්ඤා යන මාර්ග විරෝධී සඤ්ඤාවන් පහළ වීමට නොදී රැක ගත යුතු සිහියක් මේ අවස්ථාවෙහි පවතී.[76] සම්මා සති මාර්ගයෙන් අදහස් කෙරෙන්නේ ඒ ස්වරූපය යි.

සිහිය තබා ගැනීම සඳහා සතිපට්ඨානයෙහි එන, කායානුපස්සනා,[77] වේදනානුපස්සනා, චිත්තානුපස්සනා හා ධම්මානුපස්සනා භාවනා ක්‍රම වැදගත් වේ.

සති ඉන්ද්‍රිය (සතින්ද්‍රිය) සති බල[78] හා සති සම්බොජ්ඣංග[79] විස්තර සතිපට්ඨානයේ එන සිහිය පිළිබඳ විස්තරවලට අනුව දත හැකි ය. නුවණින් මෙනෙහි කිරීම එහි ලා අවශ්‍ය ය.

'සමාධි' යන වචනය ඇතැම් විට ලෞකික චිත්ත සමථයට ද ව්‍යවහාර[80] වේ. එය තාවකාලික තැන්පත් බවකි. කෙලෙස් බිඳීමක් හෝ නොවී, කෙලෙස් එබීමක් ලෙස අර්ථ දැක්විය හැකි එය, කෙලෙසුන්ගේ ඉපදීමට හේතු වූ ලෝභ, දෝෂ, මෝහ යන මූලද්‍රව්‍යයන්ගේ විකෘතියක් උඩ ගොඩනැගුණක් නොවේ.

75 ස.නි. 5 - 1, පි.331. -එම- පි.331. -එම- පි.389 - 391. -එම- පි.435. ස.5 - 2, පි.123.

76 ස.නි. 4, පි.305.

77 දී.නි. 2, පි.437.

78 ස.5 -1, පි.387 - 389; සාකෙත සූත්‍රය. -ස.නි. 5 -1, පි.401 - 417.

79 -එම- පි.203. ස.නි. 5 - 2, පි.123. ථෙර, පි.65, ගාථා අංක 161, 162.

80 අ.නි. 1, පි.373 - 375, දී.නි. 3, පි.369. ස.නි. 4, පි.286. -එම- පි.391.

ඒ කිළිටි මූලධර්ම එසේ ම තිබිය දී මඩ ගොහොරුවක් උඩින් පස් හෝ වැලි දැමීමක් වැනි තාවකාලික චිත්ත සමථයකි. එහි ප්‍රතිඵලය ද තාවකාලික ය. එක්තරා බඹතලයක තාවකාලික ව කල් ගත කර නැවතත් සසර සැරීම තාවකාලික ලෞකික චිත්ත සමථය නිසා සිදු වේ. මේ පිළිබඳ ව ඉහතින් සඳහන් කළෙමි.

ප්‍රහාණය පස් ආකාරය. ඉන් ලෞකික චිත්ත සමථය ඉතා සුළු කාලයක් වූ බුදුන් වැඳීම ආදී බුද්ධානුස්සති යහපත් ක්‍රියාවන්හි දී සිත පිහිටුවා ගැනීම ය. ඒ විනාඩි කිහිපයක් වැනි සුළු වේලාවකින් නැති වේ. ඉන්පසු නැවතත් සිත වික්ෂිප්ත ස්වභාවයට පත් වේ. ඒ තදංග ප්‍රහාණය යි.

වික්ඛම්භන ප්‍රහාණය, ලෞකික ධ්‍යාන වඩා බඹලොව උපදින්නහුගේ දීර්ඝකාලීන චිත්ත සමථය යි, එය ද තාවකාලික ය.

සමුච්ඡේද ප්‍රහාණය කෙලෙස් මුල් සිඳ දැමීමෙන් නැවත නොඋපදිනසේ කරන සමූලඝාතනය ය. එය නිර්වාණගාමී මාර්ග යේ අවසාන ප්‍රතිඵලය යි. එහෙයින් සම්මා සමාධිය, තාවකාලික චිත්ත සමථයක් නො වේ. සමුච්ඡේද ප්‍රහාණයකි.[81] ඉතිරි ප්‍රහාණ දෙක පටිප්පස්සද්ධි හා නිස්සරණ යනුවෙන් හැඳින් වේ. පටිප්පස්සද්ධි යනු කෙලෙස් වාසනාව සංසිඳවීම යි. නිස්සරණ නම් මෝක්ෂය නම් වූ නිර්වාණය යි.[82]

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා සමාධිය, අටවැන්න ලෙස දක්වන ලද්දේ ද ඒ නිර්වාණගාමී ප්‍රතිපදාවේ අවසාන පියවර හෙයිනි. ඒ හා ගැළපිය යුතු වන්නේ සමාධින්ද්‍රිය, සමාධිබල පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බෝජ්ඣංගය හා චිත්ත විසුද්ධිය යන ඒවා ය. සමාධි ඉන්ද්‍රිය හා සමාධි බලය යනු දෙපැත්තෙන් පැමිණෙන ජල ධාරාවන් දෙකක් එක් තැනක දී එකට එක් වී කරන ගමනක් වැනි ක්‍රියාවලියකි. ජල ධාරාව නැඹුරු වී ඇත්තේ

81 අ.නි. 3, පි.223. ම.නි. 1, පි.707.

82 බෞ.ද., පි.202.

සමාධිය නම් වූ නිර්වාණ මාර්ගයට ය. සිත එකඟ කර ගැනීමේ දී ඉන්ද්‍රිය බලය මෙන් ද, බලය ඉන්ද්‍රිය මෙන් ද (සමාධියට) පිහිට වේ.[83] පීති සම්බොජ්ඣංගය නිසා නිරාමිස ප්‍රීතිය ඇති වේ. එයින් සිත හා කය සංසිඳෙයි.

මහණහුගේ කයත් සංසිඳේ ද, සිතත් සංසිඳේ ද, එවිට පස්සද්ධි සම්බොජ්ඣංගය අරඹන ලද්දේ යයි කියති.[84]

සිත හැකිලුණු අවස්ථාවක දී වැඩිය යුතු ධර්ම වශයෙන් ධම්මවිචය, වීරිය, පීති සම්බොජ්ඣංගය යන තුනත්, සිත පමණට වඩා උද්‍යෝගවත් වූ විට පස්සද්ධි, සමාධි, උපේක්ඛා යන සම්බෝජ්ඣංග තුන වැඩිය යුතු බවත් දැක් වේ. චිත්ත විසුද්ධිය යනු කවරේ දැයි ඉතා කෙටියෙන් මෙහි දී හඳුන්වතොත් ඒ 'උපචාර සහිත අෂ්ට සමාපත්තිය'යි දැක්වෙන විසුද්ධිමග්ග විවරණයට අනුව යමින් අෂ්ට සමාපත්ති විග්‍රහය යයි දැක්විය යුතු ය.

අෂ්ට සමාපත්තීන් ලෙස දැක්විය යුතු රූපාවචර ධ්‍යාන සතර හා අරූපාවචර ධ්‍යාන සතර තාවකාලික ව[85] පඤ්ච නීවරණ යටපත් කිරීම චිත්ත විසුද්ධිය ය. 'සමාධි' යන වචනයෙන් ද අප අදහස් කරන්නේ ලෞකික චිත්ත සමථයන් හෙයින් ඒවා අතර සමානත්වයක් ද ඇත. සම්මා සමාධිය ඊට සමාන කළ නොහැකි බව ඉහතින් සඳහන් කරුණු අනුව පැහැදිලි ය. සිද්ධාර්ථ කුමාරයා රූපාවචර ධ්‍යාන ලැබූ අවස්ථාවක් ලෙස වප් මඟුල් දින විස්තරයෙන් කියැවේ. ආලාරකාලාම තුමා වෙත ඉගෙනීම ලැබීමේ දී ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ලබා ගන්නා ආකාරයත්, උද්දකරාමපුත්ත තාපස තුමා වෙත ඉගෙනීම ලබද්දී නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය ලබා ගන්නා ආකාරයත්

---

83 ස.නි. 5 -1, පි.389. ථෙර., පි.110. ස.නි. 5 - 2, පි.265. ස.නි. 5 - 2, පි.37. අ.නි. 2, පි.89.

84 ස.නි. 5 - 2, පි.133 - 135; දුතිය භික්ඛු සූත්‍රය. ස.නි. 5 -1, පි. 147 - 151.

85 ස.නි. 5-2, පි.101-103; දීප සූත්‍රය. දී.නි. 2, පි.107. ස.නි. 5-2, පි.105-111. ස.නි. 5 -2, පි.113. එම- පි.137. -එම- පි.136.

සිද්ධාර්ථ තාපස තුමා දැන සිටියේ ය.[86] එකී ආයතන දෙකෙන් ම ඉවත් වූයේ ඒ ධ්‍යාන තාවකාලික බව දැන සිටි හෙයිනි. නිබ්බාණගාමී පටිපදාවේ අවසානයේ එන සම්මා සමාධි එසේ තාවකාලික ධ්‍යාන නොවන්නේ එහි ද කෙලෙස් යටපත් කිරීම ස්ථිර වශයෙන් ම කෙරෙන හෙයිනි.

රූපාවචර ධ්‍යාන සතර හා අරූපාවචර ධ්‍යාන සතර ගැන ඉහතින් නිතර නිතර සඳහන් වූ නමුත් ඒවා ලබා ගන්නා ආකාරය ගැන සඳහන් නොවුණි. දැන් ඒ ලබා ගන්නා ආකාරය ඉතා කෙටියෙන් සලකා බලමු.

විතක්ක, විචාර, පීති, සුඛ ඒකග්ගතා යන ධ්‍යානාංග[87] පහෙන් යුත් ප්‍රථම ධ්‍යානය ඉන් පළමුවැන්න ය. කසිණාරම්මණය කෙරෙහි ම අවධානය රඳවමින් සිත වෙන අරමුණක නොයවා කල්පනා කිරීම විතක්ක ය. සිතට ආරම්මණය කාවැදුණ පසු ඇස පියාගෙන ආරම්මණය සිතින් මෙනෙහි කිරීම විචාරය යි. විතක්කයෙන් විචාරයට සිත නංවා ගැනීම ඒ ඒ යෝගාවචරයාගේ ගති ලක්ෂණ අනුව ඉතා ඉක්මනින් හෝ ප්‍රමාදවීමෙන් හෝ සිදුවිය හැකි ය. සිතේ වික්ෂිප්ත බව අඩු නම් විචාරයට පැමිණීම ක්ෂණිකව සිදු වේ. මේ විචාරාරම්මණය උග්ගහ නිමිත්ත ලෙස හඳුන්වති. උග්ගහ නිමිත්ත පවතී නම් ඉවත් කළ හැකි ය. එය දුර්වල වුවහොත් නැවත කසිණය අරමුණු කොට මුල සිට පටන් ගත යුතු ය.

උග්ගහ නිමිත්ත මත භාවනා කිරීමෙන් ලැබෙන්නේ පටිභාග නිමිත්ත ය. පටිභාග නිමිත්ත වැඩූ මුල් අවස්ථාවේ දී ම අර්පණා සමාධිය ලැබේ. සමාධිය, උපචාර හා අර්පණා වශයෙන් දෙආකාර[88] හෙයින් උග්ගහ නිමිත්ත ලැබීමේ දී ලැබෙන්නේ උපචාර සමාධිය මෙන් දුර්වල නොවේ. එසේ ලැබූ ප්‍රථම ධ්‍යානය හේතුවෙන් පඤ්චනීවරණ ධර්ම යටපත් වේ. පඤ්චනීවරණ ධර්ම

86 සං.නි. 5 -2, පි.115.

87 ම.නි. 1, පි.569 - 571; මහා සච්චක සූත්‍රය. ම.නි. 2, පි.487 - 489.

88 ම.නි. 1, පි.691 - 693; මහා වෙදල්ල සූත්‍රය.

යටපත් කිරීම මීට ඉහතින් විස්තර කරන ලදි. ද්විතීය ධ්‍යානය ලබන විට විතක්ක, විචාර දෙක ප්‍රහීණ ය. ප්‍රීතිය හා සැපය විඳී. පළමුවන ධ්‍යානයේ දී වචී සංඛාර නිරුද්ධ වූ අතර, මෙම දෙවන ධ්‍යානයේ දී විතර්ක, විචාර නිරුද්ධ වෙයි. එනම්, කාය සංඛාර නිරුද්ධ වන බව යි.[89]

තෘතීය ධ්‍යානය[90] ලැබීමේ දී ප්‍රීතියක් පහළ වීමට තරම් ප්‍රබුද්ධ තත්ත්වයක නොවන හෙයින් ප්‍රීති සහිත බව පහ වී යයි. එහෙයින් තුන්වන දෑහැනට සම වන්නහුට ප්‍රීතිය නිරුද්ධ වේ. චතුර්ථ ධ්‍යාන අංගසම්පූර්ණ සමාධිය ය. මේ වන විට සොම්නස්, දොම්නස් නැති කිරීමෙන්, දුක් නැති, සුව නැති උපේක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදුබව ඇති ව චතුර්ථ ධ්‍යාන (සිව්වන දෑහැනට සම වැදුණ) ලැබූ පුද්ගලයා වාසය කරයි. එසේ චතුර්ථ ධ්‍යානයට සමවන් පුද්ගලයා තථාගත පද, තථාගත නිසේවිත, තථාගත රඤ්ජිත යයි කියනු ලබන නමුත් එතෙකින් උත්සාහය නොනවත්ව යි.[91] මෙහි දී පිරිසිදු වූ, ප්‍රභාස්වර වූ, අංගණ රහිත වූ ස්ථිතිප්‍රපාත නොසැලෙන බවට පත් වූ සමාහිත සිතින් පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ පිණිස සිත නැඹුරු කළ හැකි ය. එහි දී සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහි ම විදසුන් නුවණින් රහත් බව පසක් කිරීමට හැකියාවක් ලැබෙයි.

එසේ නොමැති වුවහොත් ආනෙඤ්ජ[92] සමාපත්තිය නම් වූ චතුර්ථ ධ්‍යානයට සමවදී. මේ අවස්ථාවේ දී ආශ්වාස ප්‍රාශ්වාස නොමැති වීම නිසා චිත්ත සංඛාර නිරුද්ධ ය.[93] කසිණා ලෝකය අරමුණු කොට ලබන මෙම ධ්‍යාන සතර චිත්ත සමාධි හෙවත් රූපාවචර ධ්‍යාන යයි කියනු ලැබේ.

---

89 බෞ.ද., පි.204.

90 ම.නි.1,පි.391;නිවාපසූත්‍රය.-එම-පි.443.ස.නි.4,පි.435.ස.නි.4,පි.425-431. ස.නි. 4, පි.39 - 411. ස.නි. 5 - 2, පි.229 - 231. පු.පු.සං, පි.676 - 680.

91 ස.නි. 4, පි.413 - 409. ස.නි. 4, පි.413. -එම- පි. 539.

92 ම.නි. 1, පි.443 - 447; චූළහත්ථිපදෝම සූත්‍රය.

93 ම.නි. 3, පි.82 - 89. ආනෙඤ්ජසප්පාය සූත්‍රය.

අරූපාවචර චිත්ත සමාධිය ලැබීමට කැමති යෝගාවචරයා කසිණ, ලෝක අරමුණු සිතෙන් ඉවත් කරයි. අරූපී වූ ආකාරය අරමුණු කොට රූප විරාග භාවනාව දියුණු කරයි. අරූපී තත්ත්වය රුචි කිරීමේ හේතුවෙන් භාවනාව දියුණු වී සියුම් සංඥාවක් පහළ වේ. මේ අවස්ථාව, අරූපාවචර ප්‍රථම ධ්‍යානය[94] නම් වූ ආකාසානඤ්චායතන සමාධිය යයි කියනු ලැබේ.

සංඥාව තවදුරටත් සියුම් කර ගැනීමට කැමැත්තෙහි නම් යෝගාවචරයා විසින් ඒ ආකාස ආරම්මණය ඉවත් කොට තමාගේ ම විඤ්ඤාණය තමා ම අරමුණු කර ගත යුතු ය. ආකාස අරමුණ ගොරෝසු වැඩි නිසාත්, තමා කලින් ඉවත් කළ කසිණා ලෝකය, ආකාස අරමුණ තුළින් මතුවිය හැකි නිසාත්, ඉක්මනින් වඩාත් සියුම් අරමුණකට වැටීම සඳහා ආකාසය අනන්ත යයි වැටහුණේ, මගේ විඤ්ඤාණය අනන්ත හෙයිනැ'යි විඤ්ඤාණය අරමුණු කරයි. එසේ විඤ්ඤාණය අරමුණු කර භාවනා වැඩීමෙන් විඤ්ඤාණඤ්චායතනය[95] ලබයි. ඒ වඩාත් සියුම් සංඥාවකි.[96]

ස්වකීය සංඥාව වඩාත් සියුම් කිරීමෙන් 'කිසිවක් නැත' යන අභාවදාර්ථය අරමුණු කොට ආකිඤ්චඤ්ඤායතනයට පත්වෙයි. පොට්ඨපාද සූත්‍රයේ දී, පුහුණු කිරීමෙන් 'සඤ්ඤග්ගය' කරා යන අයුරු තථාගතයන් වහන්සේ පැහැදිලි කරන ලද්දේ, 'සංඥාව ඇත්තෙක් ව එතැන් පටන් එකින් එකට, එයින් අනෙකට වශයෙන් මාරුවීම් වශයෙන්, පිළිවෙළින් සඤ්ඤග්ගය[97] ස්පර්ශ කරන බව ය. සඤ්ඤග්ගය ලෙස දක්වන ලද්දේ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය යි. සිතන්නට ඉඩක් හද්දජී[98] සූත්‍රයෙන් ලැබේ. සඤ්ඤග්ගයෙහි සිටි යෝගාවචරයා, "මට සිතීම වරදකි, නොසිතීම යහපතකි, මම සිතන්නෙමි නම් මගේ මේ සියුම් සංඥාවෝ නැති වී ඕළාරික

94 ම.නි. 1, පි.707 - 109 චූල වෙදල්ල සූත්‍රය. ස.නි. 4, පි.537 - 541.

95 ම.නි. 1, පි.393; නිවාප සූත්‍රය.

96 අ.නි. 1, පි.479. දී.නි. 3, පි.367.

97 දී.නි. 3, පි.413.

98 දී.නි. 1, පි.427 - 435; පොට්ඨපාද සූත්‍රය.

සංඥා පහළ වේ," යයි නො සිතීම අගය යි. එසේ නොසිතන්නා වූ ඔහුගේ ඒ සංඥාවෝ නිරුද්ධ වෙති. හෙතෙම සඤ්ඤා නිරෝධ ස්පර්ශ කරයි.

මජ්ඣිම නිකායේ ආනෙඤ්ජ සූත්‍රය[99] ආනෙඤ්ජ සප්පාය (චතුර්ථ ධ්‍යානයට හිත වූ) ප්‍රතිපදාව විස්තර කරන ආකාරයට ආනෙඤ්ජ සප්පාය ප්‍රතිපදා තුනකි. කාම ගුණ ලෝකය මැඩපියා දැහැන් අරමුණු සිතින් ඉටා, විපුල වූ මහද්ගත වූ සිතින් යුක්ත ව අභිධ්‍යා, ව්‍යාපාද, සාරම්භ යනාදී ළාමක අකුශල නොවන්නේ ය'යි සලකා, "සිත මහද්ගත ද, අප්‍රමාණ ද, සුභාවිත ද වන්නේ"ය, යන පිළිවෙතෙහි පිහිටීමෙන් සිත අර්හත්වාදී කාරණයෙහි පිහිටයි. එයින් ම ඔහුට රහත් බව පසක් කළ හැකි ය. එසේ නොහැකි වුවහොත් ආනෙඤ්ජ සමාපත්තියට හෝ සමවදී. ඒ පළමුවැනි අනෙඤ්ජ සප්පාය ප්‍රතිපදාවය. "දෘෂ්ට ධාර්මික හෝ සාම්පරායික, කාම සංඥාදීන් හා රූපාදීන් වන්නේ නම් ඒ සියල්ල සතර මහා භූත හා සතර මහා භූතයන් නිසා පවත්නා රූපයන් වන්නේ ය," යන පිළිවෙතෙහි පිහිටීමෙන් ඉහතාත්මයෙහි ම රහත් බව පසක් කිරීම හෝ ආනෙඤ්ජ සමාපත්තියට සම වැදීම හෝ කළ හැකි ය. ඒ දෙවැනි ආනෙඤ්ජ සප්පාය ප්‍රතිපදාව ය. ඉහතින් සඳහන් කළ "දෘෂ්ට ධාර්මික හා සම්පරායික සියලු රූප සංඥාවන් අනිත්‍යය" ආදී ලෙසින් සලකා එම පිළිවෙතෙහි බහුලව පිහිටීමෙන් රහත් බව පසක් කිරීම හෝ විඤ්ඤාණඤ්චායතන සංඛ්‍යාත ආනෙඤ්ජයට හෝ සමවදී. ඒ තුන්වැනි ආනෙඤ්ජ සප්පාය පටිපදාව ය.

එම ආනෙඤ්ජ සූත්‍රයට අනුව, ආකිඤ්චඤ්ඤායතන සප්පාය ප්‍රතිපදා තුනක් ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සප්පාය එකක් ද වේ. කලින් අරමුණු කළ රූප සංඥාවන් හා විඤ්ඤාණඤ්චායතන සංඛ්‍යාත ආනෙඤ්ජ සංඥාවත්, ආකිඤ්චඤ්ඤායතනය ප්‍රණීත යයි ද යන පිළිවෙත අනුගමනය කිරීමෙන් ඉහතාත්මෙයහි ම රහත් බව පසක් කිරීම හෝ ආකිඤ්චඤ්ඤායතන සප්පාය

99 අ.නි. 3, පි.329; භද්දජී සූත්‍රය.

ප්‍රතිපදාව යයි කියති. මේ පඤ්චස්කන්ධය 'මමය, මාගේය' යන ආත්මයෙන් ද, ආත්මනීය භාවයෙන් ද ශූන්‍ය වේ යයි සලකා එම පිළිවෙතෙහි බහුලව පිහිටීමෙන් ඉහතාත්මයෙහි රහත් බව පසක් කිරීම හෝ ආකිඤ්චඤ්ඤායතන සමවතට හේ සමවැදීම දෙවැනි ආකිඤ්චඤ්ඤායතනය සප්පාය ප්‍රතිපදා යයි කියති.

"මම කිසි තැනෙක්හි ආත්මය ඇතියෙම් නොවෙමි. අනෙකෙක් හට පළිබෝධ ඇතියෙම් නොවෙමි. කිසි තැනෙක්හි මෙරමාගෙ ආත්මය නො ද දක්මි, කිසි තැනෙක්හි මාගේ පළිබෝධ බවෙක් නැත," යනුවෙන් චතුස්කෝටික ශූන්‍යතාව[100] බහුල කොට වෙසෙන ඔහුගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි පහදී. ඉහතාත්මයෙහි රහත් බව පසක් කිරීම හෝ ආකිඤ්චඤ්ඤායතන සමවතට හෝ සමවැදීම තුන්වැනි ආකිඤ්චඤ්ඤායතන සප්පාය ප්‍රතිපදා යයි කියති. නෙවසඤ්ඤානාදඤ්ඤායතන සප්පාය ප්‍රතිපදාව නිසා ඉහතාත්මයෙහි ම රහත් බව ලැබීම හෝ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට හෝ සමවැදීම සිදුවේ. ඒ සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත වන්නේ, කලින් සඳහන් කරන ලද රූප සංඥාවන් ද ඇතුළු ව ආකිඤ්චඤ්ඤායතන සංඥාවකුත් වන්නේ නම් එය ද නිරුද්ධ වන බවත්, නෙවසඤ්ඤානාසඤ්ඤා ශාන්තය, ප්‍රණීතය යනුවෙන් සැලකීම ය.[101]

ඉහත සඳහන් කරන ලද ආකාරයෙන් ඇතැම් කෙනෙකු පිරිනිවන්පාන බවත්, ඇතැම් කෙනෙකු එසේ නොවන බවත් ආනන්ද හිමියන්ගේ පැනයකට පිළිතුරු දෙමින් තථාගතයන් වහන්සේ සඳහන් කළ හ. එසේ නොවීමට හේතු ප්‍රත්‍ය වන ආකාරය සඳහන් කරන තථාගතයන් වහන්සේ, ඇතැම් කෙනෙකු විදර්ශනාපේක්ෂක ව ඒ තෘෂ්ණා දෘෂ්ටි අභිනන්දනයෙන් අභිනන්දනය කිරීමේ හේතුව දක්වති.[102] අභිනන්දනා කරන, එහි

100 ම.නි. 3, පි.83 - 89; ආනෙඤ්ජ සප්පාය සූත්‍රය. ස.නි. 4, පි.205 කාමගුණ සූත්‍රය, -එම-පි.213.

101 අ.නි. 2, පි.343 - 345; චතුකොටික සුඤ්ඤතා සූත්‍රය. ශූන්‍යතා දර්ශනය, පි.130 - 136.

102 ම.නි. 3, පි.87. අ.2, පි.309 - 311.

බැසගෙන සිටින නිකාන්ති විඥානය විදර්ශනාව අසුරු කරන හෙයින්, එය ඔහුට උපාදාන වන බවත්, උපාදාන සහිත වූ මහණ නොපිරිනිවෙන බවත් තථාගතයන් වහන්සේ සඳහන් කළ හ. එසේ නොපිරිනිවෙන මහණ ශ්‍රේෂ්ඨ වූ භවය ලෙස සැලකෙන නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි[103] ඉපිද එම භවය උපාදාන කරන බව සැලකිය යුතු ය. මෙයින් අවබෝධ කර ගත යුතු වැදගත් ම කරුණ වන්නේ විදර්ශනාපේක්ෂක මහණ අභිනන්දනය නොකිරීමෙන් (නිකන්ති විඥානය උපාදානයක් බවට පත්කර ගැනීමෙන් වැළකී සිටීමෙන්) උපාදාන රහිත වී පිරිනිවන්පෑමේ භාග්‍යය උදාකර ගන්නා බව ය. රූප සංඥා, ආනෙඤ්ජ සංඥා, ආකිඤ්චඤ්ඤායතන සංඥා, නෙවසඤ්ඤායතන සංඥා යනාදී සියලු සත්කායයන් සත්කාය[104] යයි සැලකීමෙන් අනුපාද විමෝක්ෂය නම් වූ අමෘතය ලැබිය හැකි බව ය.

නිබ්බාණගාමී පටිපදාවෙහි මග්ග සච්ච සංඛ්‍යාත හේතු වැඩීම නිසා නිබ්බාණ සංඛ්‍යාත ඵලය හෙවත් නිරෝධ සච්චය ලැබිය යුතු ය. ධම්මචක්ක සූත්‍ර[105] දේශනාවෙහි එම ඵලය ලැබූ ආකාරය, "ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදී, අකුප්පා මේ චේතෝ විමුත්ති, අයමන්ති මා ජාති නත්ථිදානිපුනබ්භවො," යනුවෙන් අවස්ථා තුනක් ලෙස දක්වන ලද හ.

1. මට ඥාන දර්ශනයක් පහළ විය - ඤාණඤ්ච මේ දස්සනං;
2. මගෙ අර්හත් ඵල සමාධිය අකෝප්‍යය - අකුප්පාචෙතො විමුත්ති;
3. මේ අන්තිම ජාතියය (පුනර්භවයක් නැත) - අයමන්ති මා ජාතී.[106]

---

103 අ.නි. 1, පි.509.

104 අ.නි. 3, පි.329 ම.නි. 3, පි.89 අ.නි. 2, පි.357. ම.නි. 3, පි.87 - 89. ස.නි. 4, පි.213 -217.

105 ස.නි. 5 -2, පි.253, ගිලාන සූත්‍රය. ස.නි. 5 - 1, පි.415. ස.නි. 4, පි.293 - 295.

106 ස.නි. 5 - 2, පි.272. අ.නි. 1, පි.481.

එම අවස්ථා තුනට[107] අයත් අංග මෙසේ යඃ

| | | |
|---|---|---|
| ඤාණක්ඛපන | අකුප්පා | අයමන්තිමා |
| මේ දස්සනං | විමුත්ති | ජාති |
| ධම්මට්ඨිත ඤාණ | සුඤ්ඤතානු පස්සන | අවිජ්ජා නිරෝධ |
| ඛයෙ ඤාණං | චෙතො විමුත්ති | සංඛාර නිරෝධ |
| පඤ්ඤා විමුත්ති | රූපා රූපඤාණ | විඤ්ඤාණ නිරෝධ |
| අනත්ත දිට්ඨි | ඉද්ධිවිධ ඤාණ | නාමරූප නිරෝධ |
| සක්කාය දිට්ඨි නිරෝධ | දිබ්බසෝත ඤාණ | සළායතන නිරෝධ |
| විචිකිච්ඡා නිරෝධ | පරචිත්ත විජානන | ඵස්ස නිරෝධ |
| සීලබ්බත පරාමාස නිරෝධ | පුබ්බේනිවාසානුස්සති | වේදනා නිරෝධ |
| කාමරාග නිරෝධ | දිබ්බචක්ඛු | තණ්හා නිරෝධ |
| ව්‍යාපාද නිරෝධ | ආසවක්ඛය | උපාදාන නිරෝධ |
| රූපරාග නිරෝධ | භව නිරෝධ | ජාති නිරෝධ |
| අරූපරාග නිරෝධ | ජරා මරණ නිරෝධ | මාන නිරෝධ |
| උද්ධච්ච නිරෝධ | අවිජ්ජා නිරෝධ | ඤාණ දස්සන විසුද්ධි |

සත්ත විසුද්ධීන් දැක් වූ තන්හි, අපි ඤාණදස්සන විසුද්ධිය පැහැදිලි කිරීම පසුවට තැබීමු. මේ අවස්ථාවේ දී ඒ සාකච්ඡා කිරීම සුදුසු වනු ඇත. 'ඛයෙ ඤාණ', 'ධම්මට්ඨිත ඤාණ' ආදී ලෙස දක්වන ලද අනාත්මතා ස්වභාවය ඤාණදස්සන විසුද්ධියෙන් ස්ථාවර විය යුතු ය. පටිච්ච සමුප්පාද ඤාණ යන්න ද එකී අනාත්ම ස්වභාවය වටහා ගැනීම ම වේ. මීට ඉහතින්

107 ථෙර., පි.107, සුමන ස්ථවිර ගාථා සහ -එම- පි.129. නභාතකමුනි ස්ථවිර ගාථා සංසන්දනාත්මකව. ගාථා අංක 330 - 334 සහ 435 - 44. ගාථා අංක 331 හා 438 -ථෙර., පි.106. -එම- පි.128.

විස්තර කළ පරිදි රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ඒවායේ ආත්මය පවතී යයි ගැනීම සක්කාය දිට්ඨිය ය.

ඒ ආත්ම වශයෙන් නොගෙන දුක් ආදී වශයෙන් ගැනීමෙන් සක්කාය දිට්ඨිප්පහාන වේ. "ඒ ඒ වේදනා අනාත්ම විසින් දන්නහුගේ ආත්මානු දෘෂ්ටිය[108] ප්‍රහීණ වේ," යයි අත්තානු දිට්ඨිප්පහානි සූත්‍රයෙන් දෙන ලද අදහස මීට ඉහතින් සාකච්ඡා කෙරිණ.

මේ අවබෝධය ලැබී, අර්හත්වය සාක්ෂාත් කළ පුද්ගලයා 'පඤ්ඤා විමුත්ත' නම් වේ. ඔහු ලබන ඥාන දර්ශනය, 'ඤාණඤ්චපන මේ දස්සනං උදපාදී' යන්නෙන් දැක්වේ. පඤ්ඤා විමුක්ත අර්හත් පුද්ගලයාගේ ස්වභාවය දැනගැනීම සඳහා සුසීම[109] (පරිබ්‍රාජකයා) භික්ෂුව පිළිබඳ පුවත දැක්විය හැකි ය. එක්තරා භික්ෂු පිරිසක් අර්හත් බව තථාගතයන් වහන්සේ ඉදිරියේ ප්‍රකාශ කරනු[110] අසා සිටි සුසීම භික්ෂුව පසු ව ඔවුන් වෙත ගොස් මෙසේ ඇසී ය.

"ඔබ වහන්සේලා තථාගතයන් වහන්සේ ඉදිරිපිට දී අර්හත්වය ප්‍රකාශ කළාහු ද?"

"එසේය."

"ඔබ වහන්සේලාට ඉද්ධිවිධ දැක්විය හැකි ද?"

"නොහැකි ය"

"පුබ්බේනිවාසානුස්සතිය තිබේ ද?"

"නැත."

"දිබ්බසොතය තිබේ ද?"

"නැත."

108 බෞ.ද., පි.216. බෞ.ද., පි. 15 - 16.

109 ම.ද., පි.703 - 705. ස.නි. 4, පි.485, 275, 293, 531.

110 ස.නි. 2, පි.189 - 199, සුසීම සූත්‍රය.

"දිබ්බචක්ඛුව තිබේ ද?"

"නැත."

"අරූපාවචර සමාධි ලැබුවාහු ද?"

"නැත."

"එසේ නම් ඔබ වහන්සේලා රහත් යයි කෙසේ ප්‍රකාශ කළාහු ද?"

"ආයුෂ්මත් සුසීමය, අපි පඤ්ඤාවිමුත්ත පුද්ගලයෝ වෙමු."

"ඔබ වහන්සේලා ලුහුඬින් කී දෙයෙහි අදහස මම නොදනිමි."

"ඔබ එහි අදහස දැනගත්තා හෝ නොදැන ගත්තා හෝ වේවා අපි පඤ්ඤාවිමුත්තයෝ වෙමු."

(සුසීම භික්ෂුව තථාගතයන් වහන්සේට මේ කාරණය දැන්වූ පසු)

"සුසීමය, ධම්මට්ඨිත ඥානය (විදර්ශනා ඥානය) පළමුව ලැබේ. නිබ්බාණය (මාර්ග ඤාණය) පසුව ලැබේ."[111]

"ස්වාමීනි, ඒ ලුහුඬින් වදාළ කරුණු මම අවබෝධ නොකරමි."

"සුසීමය, රූපය නිත්‍ය ද?"

"අනිත්‍යය."

"අනිත්‍යය වේ නම් ඒ දුක ද, සැප ද?"

"දුකය."

"යමක් අනිත්‍ය ද, දුක ද, පෙරළෙන ස්වරූප ද, එය ආත්ම වශයෙන් ගැනීම සුදුසු ද?"

"නුසුදුසුය."

(වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන සෙසු ස්කන්ධ ගැන ද මේ අයුරින් ම ඇසූ හ. සුසීම භික්ෂුව ද, පෙර සේ ම පිළිතුරු දුන් පසු) "සුසීමය, එසේ නම් අතීත වූ හෝ අනාගත

111 අ.නි. .2, පි.305; අරහත්තතප්පත්ති සූත්‍රය. පටි.ම.නි. 2, පි.3 - 21; සුගන්ධ කථා බලන්න. දී.නි. 2, පි.103.

වූ හෝ වර්තමාන වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඕලාරික වූ හෝ සුඛුම වූ හෝ හීන වූ හේ ප්‍රණීත වූ හෝ දුරෙහි වූ හෝ ළඟ වූ හෝ යම් රූපයක් වේ ද, එය මගේ නොවේ. මම එය නොවෙමි. එය මගේ ආත්මය නොවේ යයි මනා නුවණින් සැලකිය යුතු ය. වේදනාදී.... සෙසු ස්කන්ධ පිළිබඳ ව ද එසේ ම සැලකිය යුතු ය."

ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක මෙසේ දුන රූපයෙහි කලකිරෙයි. වේදනා, සංඥා, සංඛාර, විඥානයන් හි ද කලකිරෙයි. කලකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුණු කල 'මිදුණෙමි' යන දැනීම ඇති වෙයි. "ජාතිය ක්ෂය විය. බඹසර වැස නිම විය. කළ යුතු දේ කළෙමි. මෙලොව දී තව කළ යුත්තක් නැත," යනුවෙන් දැනීම වෙයි. ඒ පඤ්ඤා විමුක්තිය පිළිබඳ ව ය.[112]

චෙතො විමුක්තිය ලැබූ අර්හත් ශ්‍රාවකයා එය ලබනුයේ කෙසේ දැයි යන්න විමසිය යුතු ය. රාග, දෝස, මෝහ යන අකුසල් මුල් තුන නැති කිරීමෙන් 'අකුප්පා මෙ චෙතොවිමුත්ති' යයි දක් වූ පරිදි මාගේ චිත්ත විමුත්තිය නැවත කිසි විටෙකත් කොප්‍ය නොවේ යයි ආර්ය ශ්‍රාවකයා දැන ගනියි. එය ආපසු ගමන් නොකරයි. මේ සමථ ක්‍රමයෙන් ලබන්නකි.

චෙතො විමුත්තිය සතරාකාර වේ.[113]

1. අප්පමාණ චෙතො විමුත්තිය
2. ආකිඤ්චඤ්ඤා චෙතො විමුත්තිය
3. සුඤ්ඤත චෙතො විමුත්තිය
4. අනිමිත්ත චෙතො විමුක්තිය

යනුවෙනි.

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන බ්‍රහ්ම විහාර සතර අප්‍රමාණ සත්ත්වයින් අරමුණු කොට පතුරුවන භාවනාවක්

112 ස.නි. 2, පි.195 සුසීම සූත්‍රය. ස.නි. 2, පි.194.

113 අ.නි. 1, පි.453 - 459, 245 - 247 ම.නි. 1, පි.609 -623. දී.නි. 2, පි.107.

හෙයින් ඒ භාවනාව අනුව යමින් රූපාවචර, අරූපාවචර ධ්‍යානයන් ලබා කෙලෙසුන්ගෙන් මිදීම ය.

ආකිඤ්චඤ්ඤා චෙතෝ විමුත්තිය නම් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ආකිඤ්චායතනය ලබා සිට රාග, දෝස, මෝහයන් නැති කර ලබන චිත්ත විමුත්තිය යි.

සුඤ්ඤතා චෙතෝ විමුත්තිය නම් ස්කන්ධ පඤ්චකය ආත්ම තත්ත්වයෙන් ද ශූන්‍යය ය, ආත්මීය තත්ත්වයෙන් ද ශූන්‍යය, යන අනාත්ම භාවනාව වඩා රාග, දෝස මෝහයන් නැති කිරීම ය.

අනිමිත්ත චෙතෝ විමුත්තිය නම් සියලු ම නිමිති ඉවත් කොට, කිසි ම සංඥාවක් මෙනෙහි නොකර, පොට්ඨපාද සූත්‍රයෙහි එන පරිදි සංඥා නිරෝධයෙන් රාග, දෝස, මෝහයන් නැති කිරී ම ය.

මෙහි දැක් වූ චෙතෝ විමුත්ති සතර ලෞකික වශයෙන් වැඩිය හැකි නමුත් එම ලෞකික සමාධි තත්ත්වයෙහි නොසිට රාග, දෝස, මෝහ සමූල ඝාතනයෙන් ක්ෂීණාස්‍රව තත්ත්වයට ගෙනා යුතු ය.

මේ සෑම චෙතෝ විමුත්තියක් ම අවසාන වනුයේ සුඤ්ඤතානුපස්සනාවෙන්[114] බැවින් ඵල සමාධි ලැබේ. එහි පඤ්චාභිඤ්ඤා[115] හා අසාවක්ඛය ඤාණය ද පවතී.

1. ඉද්ධිවිධ
2. දිබ්බසොත
3. පරචිත්තවිජානන
4. පුබ්බේනිවාසානුස්සති
5. දිබ්බචක්ඛු

යනු එකී පඤ්චාභිඤ්ඤාවන් ය.

---

114 ස.නි. 4, පි.541 - 545; ගොදත්ත සූත්‍රය. ම.නි. 1, පි.699. ම.නි. 1, පි.701, ස.නි. 4, පි.543, අ.නි. 2, පි.321; චෙතෝ විමුත්ති සූත්‍රය.

115 ම.නි. 3, පි.267 - 272; චූල සුඤ්ඤත සූත්‍රය. ම.නි. 1, පි.83, 701. ම.නි. 3, පි.270.

මීළඟට 'අයමන්තිමා ජාති' නම් වූ තෙවන අවස්ථාව සලකා බලමු. එහි දී වනුයේ පටිච්ච සමුප්පාද නිරෝධය යි. පටිච්චසමුප්පාද නිරෝධය කලින් සාකච්ඡා කෙරිණ. තථාගතයන් වහන්සේ තුළ පහළ වූ දුක්ඛ නිරෝධය ශ්‍රාවකයන් වහන්සේලා තුළ ද එසේ ම පහළ වෙයි. එහිලා තථාගත හා ක්‍ෂීණාස්‍රව[116] දෙපක්ෂය ම සමාන ස්වරූප ගත යුතු ය. එනම්, ක්ලේශ ක්‍ෂය කිරීම අනුව තථාගතයන් වහන්සේ හා පඤ්ඤාවිමුත්ත භික්ෂුව අතර වෙනස් නොවන බව ය.

තථාගතයන් වහන්සේ, "නොදුක්, නොසුව වේදනා විඳින ඇතැම් පුද්ගලයන්හට අකුසල දහම් පිරිහෙති, කුසල් දහම් වැඩෙතැ"යි, දක්වනුයේ ප්‍රඥාවෙන් අවබෝධ කිරීමෙනි. එහෙයින් ම නොදුක්, නොසුව, වේදනාව උපදවා වාසය කරව යි උන්වහන්සේ දේශනා කරන්නාහ. එහෙත් තථාගතයන් වහන්සේ හැම මහණුන් විසින් ම "ප්‍රමාද කෘත්‍යය කටයුතු" යයි නොකියන සේක.[117] හැම මහණුන් විසින් අප්‍රමාදයෙන් කෘත්‍යය කටයුතු යයි නොකියන්නේ මන්ද, යන්න විමතියට කරුණක් විය යුතු නැත. හේතුව උන්වහන්සේ, "හැම මහණුන් විසින් ම අප්‍රමාදයෙන් නොකටයුතු"යි නොකියන හේතුවෙනි. අර්හත් වූ ක්‍ෂීණාස්‍රව වූ, වාසය නිම වූ මහ බඹසර ඇති සිව්මඟින් කරන ලද කෘත්‍යය හේතුවෙන් ස්කන්ධාදී බර බහා තබා ක්ෂය වූ භව සංයෝජන ඇති ව කෙලෙසුන් කෙරෙන් මිදී, රහත් බවට පැමිණියා වූ යම්කිසි පුද්ගලයකු වෙතොත් ඒ රහතන් වහන්සේට අප්‍රමාදයෙන් කෘත්‍යය කටයුතු යයි කීමේ අවශ්‍යතාවක් ඇති නොවේ. අප්‍රමාදයෙන් කටයුතු කොට, ප්‍රමාද වීමේ හේතුව[118] ඉවත් කරන ලද හෙයිනි.

එසේ නම් තථාගතයන් වහන්සේ අප්‍රමාදව කටයුතු කළ යුතු යයි උපදෙස් දෙනු ලබන්නේ, ශෛක්‍ෂ නම් වූ අර්හත්වයට

116 ම.නි. 1, පි.79 - 83; ආකඞ්ඛෙය්‍ය සූත්‍රය.

117 ස.නි. 5 - 2, පි.9 භික්ඛු සූත්‍රය.

118 ම.නි. 2, පි.243; කීටාගිරි සූත්‍රය. ස.නි. 4, පි.252; දෙවදහ සූත්‍රය.

නොපැමිණි සිත් ඇති අනුත්තර ඒ යෝගක්ෂෙම ප්‍රාර්ථනා කරමින් වාසය කරන්නවුන්ටය.

එසේ තථාගතයන් වහන්සේ දක්වන්නේ හේතු සහිත ව ම ය. "මේ ආයුෂ්මත්හු, අනුලෝම වූ සෙනෙසුන් සේවනය කරන්නාහු, කල්‍යාණ මිත්‍රයන් භජනය කරන්නා වූ, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් සම කෙරෙමින් යමක් පිණිස කුල පුත්‍රයෝ මනාව ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි බව ලබද්ද, ඒ අනුත්තර වූ බ්‍රහ්ම චර්යය (බඹසර වස්) වාසය කෙළවර කොට ආර්යය ඵලය මේ ආත්මය නම් වූ ඉහතාත්මයෙහි ම ප්‍රඥායෙන් ප්‍රත්‍යක්ෂ කළ යුතු" බැවිනි. එවන් මහණභට අප්‍රමාද ව කටයුතු කිරීම දියුණුවට මගය.[119]

කල්‍යාණ මිත්‍රයන් වශයෙන් මෙහි දැක්වෙන්නේ තථාගතයන් වහන්සේ ඇතුළු පුද්ගල දියුණුවට මගපෙන්වන්නා වූ රහතන් වහන්සේලා ප්‍රමුඛ පිරිස ය.[120] විශේෂයෙන් මෙහි ලා සැරියුත් මුගලන් ආදී පරපුර සිහියට එයි.

මෙම පාඨයේ සඳහන් කරනු ලැබූ සම කළ යුතු ශ්‍රද්ධා දී ඉන්ද්‍රියයන් යනුවෙන් අදහස් කෙරෙන්නේ සද්ධා සති ඉන්ද්‍රියාදී ඉන්ද්‍රිය හා බල පිළිබඳවය. කුල පුත්‍රයන් යමක් පිණිස ගිහිගෙ යින් නික්ම සස්නෙහි පැවිද්ද ලබද්ද යන්නෙන් වටහා ගත යුතු වන්නේ ආර්ය ඵලය ලැබීම ය. එකී ආර්ය ඵලය වන්නේ, සෝවාන්, සකදාගාමී ආදී වශයෙන් දැක්වෙන මාර්ගවලට පැමිණීම ය. ආර්යය භාවයට පැමිණීමේ දී ලබන ආර්යය ඵළය අනුව පුද්ගලයෝ පන්ති අටකට වැටෙති. අට්ඨපුරිස පුග්ගලො[121] යන්නේ දැක්වෙන්නේ ඒ අටදෙනා පිළිබඳ ව ය. ආර්ය පුද්ගලයන් අටදෙනා අතරින් මුල් සත්දෙනා සේඛ නම් වෙති. ඒ අටවැන්නා අසේඛ නම් වූ රහතන් වහන්සේ ය. කළ යුතු කිසිවක් උන්වහන්සේට ඉතිරි වී නොමැත. පෘථග්ජන භූමියෙන් ආර්ය

119 ම.නි. 2, පි.243 කීටාගිරි සූත්‍රය. ස.නි. 5 - 1, පි.387. ස.නි. 5 - 2, පි.71.

120 අ.නි. 2, පි.175 - 181; සමාධි සූත්‍රය. ස.නි. 5- 2, පි.99. ම.නි. 2, පි.243 - 247.

121 අ.නි. 2, පි.415 - 429. ස.නි. 5 -1, පි.7. සාරිපුත්ත සූත්‍රය සහ -එම- පි.51.

භූමියට සංක්‍රමණය වූ සේඛ පුද්ගලයෝ ස්වකීය ඉලක්කය වූ අර්හත්භාවය කරා ම ගමන් කරති. සේඛ පුද්ගලයින් මාර්ගලාභී වීමත් සමඟ ම ඵලය ලබන්නේ දැයි සැක නොසිතිය යුතු ය. ඒ අවස්ථා දෙක අතර පරතරයක් පවතී. අනලස් ව ක්‍රියා කිරීම හා මරණය නිසා අප්‍රමාද විය යුතු බවට පවතින ධෛර්යය හේතුවෙන් මාර්ගලාභී පුද්ගලයා ඉතා ඉක්මනින් ඵල ලාභියකු වන්නේ යයි පැහැදිලි විය යුතු ය.[122]

මජ්ඣිම නිකායේ කීටාගිරි සූත්‍රයට අනුව ලෝකයෙහි විද්‍යමාන වූ පුද්ගලයන් සත් දෙනෙකු දක්වා ඇත.[123] ඒ සත්දෙනා වනුයේඃ

1. උභතොභාග විමුත්ත අසේඛ
2. ප්‍රඥා විමුත්ත
3. කාය සාක්ෂි -
4. දෘෂ්ටි ප්‍රාප්ත
5. ශ්‍රද්ධා විමුක්ති
6. ධර්මානුසාරී
7. ශ්‍රද්ධානුසාරී - සේඛ

මෙතැන් සිට ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ වෙනස්කම් සලකා බැලේ.

ඇතැම් පුද්ගලයන් රූප සමාපත්තීන් ඉක්මවා අරූප්‍ය වූ යම් ශාන්ත විමෝක්ෂ කෙනෙක් වෙත් නම් ඒ විමෝක්ෂයෙන්[124] නාමකයින් ස්පර්ශය කොට වෙසෙයි. ඔහු විසින් ප්‍රඥායෙනුදු ආර්යය සත්‍යයන් දැන ආස්‍රව හෝ ක්‍ෂය කරන ලද හ. මේ දෙඅංශයෙන් ම අප්‍රමාදයෙන් කෘත්‍යය කරන ලද හෙයින් උභතෝභාග විමුක්ත පුද්ගල යයි කියති.

122 අ.1, පි.371. ස.4, පි.505. අ.නි. 1, පි.370.

123 ස. නි. 5 -2, පි.287 - 293; කේටිගාම වර්ගය, දී.නි. 3, පි.435 - 441.

124 ම.නි. 2, පි.243 - 247. දී.නි. 3, පි.433 පු.ප.පි.401 - 403.

ප්‍රඥා විමුක්ත[125] පුද්ගලයා කවරෙක්දැයි හඳුනා ගැනීම සඳහා ලක්ෂණ දෙකක් වේ. ඇතැම් පුද්ගලයන් රූප සම්පත්තීන් ඉක්මවා අරූප්‍ය වූ යම් ශාන්ත විමෝක්ෂ කෙනෙක් වේ ද, ඒ නාමකයින් ස්පර්ශ කොට නොවෙසෙයි. මේ අසමාන ලක්ෂණය (වෙසෙන බව) උභතෝභාග විමුක්තයා තුළ පවතින බැවින් දෙදෙනා අතර පවතින වෙනස තේරුම් ගත හැකි ය. ප්‍රඥා විමුක්තයාට, උභතෝභාග විමුක්තයාට මෙන් සමාන ලක්ෂණ වන්නේ ප්‍රඥායෙන් ආර්යය සත්‍යයන් දැක්වූ ආස්‍රවයන් (ක්‍ෂය) කරන ලද බව ය. රහත් බව ලැබූ පුද්ගලයන් දෙදෙනෙකු, ඒ රහත් බව ලැබූ ආකාරය අනුව හැඳින ගත හැකි බව මෙයින් පැහැදිලි වේ. උභතෝභාග විමුක්ත හා ප්‍රඥා විමුක්තය යන අසේඛ දෙදෙනා හට කළ යුතු කිසිවක් නැති හේතුවෙන් අප්‍රමාද විය යුතු යයි තථාගතයන් වහන්සේ උපදෙස් නොදුන්නේ යයි අර්ථවත් විය යුතු ය.

කාය සාක්ෂි[126] නම් වූ පුද්ගල රූප සමාපත්තීන් ඉක්මවා අරූප්‍ය වූ මේ යම් ශාන්ත විමෝක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකායෙන් ස්පර්ශ කොට වෙසෙයි. ඔහු විසින් ප්‍රඥායෙන් ආර්ය සත්‍යයන් දැක, ඇතැම් ආස්‍රවයන් (ආස්‍රවක්‍ෂය නොව) පමණක් ක්‍ෂය කරන ලද හ.

උභතෝභෝග විමුක්ත අසේඛ හා කාර්ය සාක්ෂි සේඛ අතර පවතින වෙනස්කම, ආස්‍රව සියල්ල ක්ෂය වූ හා ක්ෂය නොවූ බව ය. කායසාක්ෂි හට ඇතැම් ආස්‍රව ක්‍ෂය නොවී පවතී. එහෙයින් තථාගතයන් වහන්සේ ඔහුට අප්‍රමාදයෙන් කෘත්‍යය කළ යුතු යයි උපදෙස් දෙනු ලබයි.

දෘෂ්ටි ප්‍රාප්ත[127] පුද්ගලයා යනු කවරේ දැයි දක්වන කීටාගිරි සූත්‍රය, දෘෂ්ටි ප්‍රාප්ත පුද්ගල රූප සමාපත්තීන් ඉක්මවා අරූප්‍ය වූ යම් ශාන්ත විමෝක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකයින්

125 ම.නි. 2, පි.243 කීටාගිරි සූත්‍රය. ම.නි. නි. 2, පි.249.

126 ම.නි. නි. 2, පි.245 කීටාගිරි සූත්‍රය. දී.නි. නි. 2, පි.109.

127 ම.නි. නි. 2, පි.245; කීටාගිරි සූත්‍රය.

ස්පර්ශ කොට නොවෙසෙනා බව සඳහන් කරයි. එහෙත් ඔහු විසින් ප්‍රඥායෙන් ආර්යය සත්‍යයන් දක්නා ලද අතර, ඉන් ඇතැම් ආස්‍රව පමණක් ක්‍ෂය කරන ලද හ.

කාය සාක්ෂි හා දෘෂ්ටි ප්‍රාප්ත (කාය සක්ඛි, දිට්ඨපත්ත) යන දෙදෙනා අතර වෙනස ශාන්ත විමෝක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකයින් ස්පර්ශ කොට වෙසෙන බව හා ස්පර්ශ කොට නොවෙසෙන බව ය. ඒ දෙදෙනා අතර සමානත්වය වන්නේ, ප්‍රඥායෙන් ආර්ය සත්‍යයන් දැක ආස්‍රව සියල්ල ක්‍ෂය නොකළ හේතු ව ය.

ශ්‍රද්ධා විමුක්ත පුද්ගල රූප සමාපත්තීන් ඉක්මවා අරූප්‍ය වූ ශාන්ත විමෝක්ෂ කෙනෙකු ඇද්ද, ඒ සමාපත්තීන් නාමකයින් ස්පර්ශ කොට වාසය කෙරෙයි. ඔහු ප්‍රඥායෙන් සිවුසස් දැක, ඇතැම් ආස්‍රව ක්‍ෂය කරන ලද හ. තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාව බැස ගත්තේ ය. ශ්‍රද්ධාව මුල්හටගත් සේ පිහිටියේ ය. මේ ශ්‍රද්ධා විමුක්ත පුද්ගලයා ද අප්‍රමාද ව කෘත්‍ය කටයුතු' ය යි තථාගතයන් වහන්සේ දක්වති.

ධර්මානුසාරී පුද්ගලයා,[128] රූප සමාපත්තීන් ඉක්මවා අරූප්‍ය වූ යම් ශාන්ත විමෝක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකයින් ස්පර්ශ කොට වාසය කරයි. ඔහු ප්‍රඥායෙන් සතර සත්‍යය දැක ආස්‍රව ක්‍ෂය නොකරන ලද්දේ ය. තථාගත ප්‍රවිදිත වූ ධර්මයෝ ද ප්‍රඥායෙන් අවධි වශයෙන් වටහා ගනී. ඔහුට ශ්‍රද්ධේන්ද්‍රියය, වීර්යේන්ද්‍රිය, ස්මෘති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥෙන්ද්‍රිය නම් වූ ඉන්ද්‍රියයන් සමව පවත්වා ගත හැකි වෙයි. එහෙත් ඔහුට ද අප්‍රමාද ව කෘත්‍යය කටයුතු'ය යි කිව යුතු ය.

ශ්‍රද්ධානුසාරී පුද්ගල,[129] රූප සමාපත්තීන් ඉක්මවා අරූප්‍ය වූ යම් ශාන්ත විමෝක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් හා නාමකයින් අරමුණු කොට නොවෙසෙයි. ඔහු විසින් ප්‍රඥායෙන්

---

128 අ.නි. 1. පි.223 -225. දී.නි. 2, පි.109. ම.නි. 2, පි.245. පු.පු.සං, පි.837.

129 ම.නි. 2, පි.247; කීටාගිරි සූත්‍රය. පු.ප., පි.259, පි.401 - 403.

සිව්සස් නම් වූ සතර සත්‍ය දැක, ආස්‍රවයෝ ක්‍ෂය කරන ලද්දේ නොවේ. තථාගත ධර්මය කෙරෙහිත්, තථාගතයන් වහන්සේ කෙරෙහිත්, ඔහුගේ ශ්‍රද්ධා මාත්‍රයක් හා ප්‍රේම මාත්‍රයක් පවතී. ඔහුට ශ්‍රද්ධා, වීර්යය, ස්මෘති, සමාධි, ප්‍රඥා නම් වූ ඉන්ද්‍රිය පහ පිළිබඳ ධර්මයෝ ද පවතී. මේ ශ්‍රද්ධානුසාරී පුද්ගලයා ද අප්‍රමාදව කටයුතු කළ යුතු බවට තථාගතයන් වහන්සේ අනුශාසනා කරති. ඔහු විසින් ද ආස්‍රව ක්‍ෂය කොට අර්හත් ඵලයට පැමිණිය යුතු හෙයිනි.

පුග්ගල පඤ්ඤත්තියෙහි එන පුද්ගල බෙදීම් අතර ෂට්ක නිර්දේශ[130] එකකි. සප්තක නිර්දේශ දෙකකි.[131] සප්තක නිර්දේශවල දක් වූ හතේ කණ්ඩායම් විස්තරයට අනුව පුද්ගලයන් සත්දෙනා කුශල ධර්මයන් කෙරෙහි දක්වනු ලබන ශ්‍රද්ධාව, හිරි, ඔතප්, වීර්යය, ප්‍රඥාව නමැති අංගයන්ගේ වැඩීම හා නොවැඩීම[132] අනුව හඳුනා ගත හැකි ය.

**පළමුවැන්නා** වරක් ගිලුණේ ගිලුණේ ම ය. ඔහු කුමන ආකාරයෙන්වත් උඩට නොඑයි. නොඉපිළෙයි. (නෛල්පෙයි)

**දෙවැන්නා** ඉහත අංගයන් පහ මැනවැයි පිළිගත් හෙයින් ඉපිළෙයි. එහෙත් ඉහත අංග පහ නොසිටියි. නොවැඩෙයි. පිරිහෙයි. ඒ පුද්ගල ඉල්පී ගිලුණු අයෙකි.

**තුන්වැන්නා** ඉහත ශ්‍රද්ධාව, හිරි, ඔතප්, වීර්යය හා ප්‍රඥාව යන අංග පහ නොමපිරිහෙයි. නොවැටෙයි. සිටියි. එහෙයින් තුන්වන පුද්ගල නොගිලී, ඉල්පී සිටින්නේ ය. වැඩීමක් නොවන බව සැලකිල්ලට ගත යුතු ය.

**හතරවැන්නා** කුශල ධර්මයන්හි, ශ්‍රද්ධාව, හිරි, ඔතප්, වීර්යය හා ප්‍රඥාව මැනවැයි පිළිගෙන ඉල්පෙයි. තුන් සංයෝජන ක්ෂයවීමෙන් සෝවාන් වෙයි. මේ තුන් සංයෝජන වනුයේ

130 -එම- පි.247. පු.පු.සං., පි.838.

131 පු.ප., පි.399; ෂට්ක නිර්දේශය.

132 -එම- පි.401 - 403 සප්තක නිර්දේශය. ථෙර., පි.39.

සක්කායදෘෂ්ටි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස නම් වූ ඒවා ය. මේ පුද්ගල ඉල්පී සිටිමින් ජලයේ වටපිට බලයි.

**පස්වැන්නා** ඉහත, ශ්‍රද්ධා, හිරි, ඔතප්, වීර්යය හා ප්‍රඥා යන අංග වැඩීම් හේතුවෙන් ඉල්පෙයි. මුල් සංයෝජන තුන ක්ෂය කරන ලද්දේ ය. රාග, ද්වේෂ, මෝහ තුනී කරන ලද හ. සකෘදාග ාමී නම් වූ ඔහු ජලයේ ඉල්පී ජලය තරණය කෙරේ.

**සයවැන්නා** ශ්‍රද්ධා, හිරි, ඔතප්, වීර්යය හා ප්‍රඥා යන අංශ වැඩීම් හෙතුවෙන් ඉල්පෙයි. පස් වැදෑරුම් ඕරම්භාගීය සංයෝජන නම් වූ සක්කාය දෘෂ්ටි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග, ව්‍යාපාද නම් වූ මුල් සංයෝජන ධර්ම (යටින් පැවති තේරුම් ඇති) ක්ෂය කරන ලද හේතුවෙන් ඉල්පෙමින්, තරණය කරමින්, නොග ැඹුරු දියට පැමිණියේ වෙයි. අනාගාමී පුද්ගල ඒ සයවැන්නා ය.

**සත්වැන්නා** ගොඩබිම සිටින බ්‍රාහ්මණ නම් වූ රහතන් වහන්සේ ය. (රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන සංයෝජන ප්‍රහාණය කරන ලද හ.[133] භව (සංසාර) නම් වූ ගැඹුරු මුහුදට වැටුණ ඇතැමෙක් ගිලෙති. ඇතැමෙක් ඉල්පී සිටිති. මේ පෘථග්ජනයෝ ය.

භව සයුරේ වැටී ඇතත් ඉල්පී අවට බලන අයෙකි. අයෙක් එසේ ඉල්පී අවට බලා (ගොඩබිම දැන) පිහිනයි. අයෙක් නොගැඹුරු මුහුද නම් වූ වෙරළට පැමිණියේ ය. මේ තිදෙනා සේඛ

පුද්ගලයෝ ය. ගොඩබිමට පැමිණ, වැල්ලේ පොළොව මත අඩිය තබා ගත් පුද්ගලයා අසේඛ පුද්ගලයා ය. අසේඛ පුද්ගල නැවත පිහිනිය යුතු නොවේ. කරන්නට තිබූ දෑ කරන ලදි. බර බහා තබන ලදි. මතුවට කළ යුතු කිසිත් තීරණයක් නැත. ඒ පරතෙරට පැමිණි රහතන් වහන්සේ ය.

පුග්ගල පඤ්ඤත්තියේ ෂට්ක නිර්දේශයේ දී[134] සත්‍යය අවබෝධ කිරීම හා දුක් කෙළවර කිරීම යනු කරුණු අවධාරණය කරමින් පුද්ගල සය දෙනෙකු දක්වා ඇත.

133 ස.4, පි.473. පු.ප., පි.259 -එම- පි.269 - 273. ම.2, පි.243 - 247.

134 පි.259, 401.

1. සම්මා සම්බුදුන් වහන්සේ,
2. පච්චේක බුදුන් වහන්සේ,
3. ශ්‍රාවක ඥානය ලැබූ සැරියුත් මුගලන් රහතන් වහන්සේ,
4. ශ්‍රාවක ඥානය නොලැබූ (සෙසු) අසේඛ පුද්ගල රහතන් වහන්සේ.
5. අනාගාමී ඥානයෙන් මෙලොවට නොඑන සේඛ පුද්ගල
6. අනාගාමී හෙයින් මොලොවට එන සේඛ පුද්ගල යනුවෙනි.

එම ෂට්ක නිර්දේශයෙහි දී, අසේඛ පුද්ගල දෙදෙනා ශ්‍රාවක ඥානය ලැබූ නොලැබූ ලෙස දැක්විණ. පුග්ගල පඤ්ඤත්තියේ අෂ්ටක නිර්දේශයේ[135] දැක්වෙන ආර්ය පුද්ගලයන් අටදෙනා ලැබිය හැක්කේ මෙම ශාසනයේ පමණකැයි දැකවේ.

යනුවෙන් ඉහතින් දැක් වූ අටදෙනා අතරින් පළමු සත්දෙනා ම රහත් භාවයට නොපැමිණි අය වෙත්. ඉහත සඳහන් වූ ආර්යය පුද්ගලයන් අටදෙනා යුගල හතක් ලෙස ද දක්වන ලද බව පෙනේ.[136]

පුග්ගල පඤ්ඤත්ති නවක නිර්දේශය[137] පුද්ගලයන් නවදෙනා දක්වනුයේ සප්තක නිර්දේශයේ දී දක්වන ලද උභතොභාග විමුක්ත, ප්‍රඥා විමුක්ත යන අසේඛ පුද්ගලයන් දෙදෙනාත් කායසාක්ෂි, දෘෂ්ටිප්‍රාප්ත ශ්‍රද්ධා විමුක්ත, ධර්මානුසාරී යන සේඛ පස්දෙනා අතරට සම්මා සම්බුද්ධ හා පච්චෙක බුද්ධ යන බුදුවරුන් ද ඇතුළත් කිරීමෙනි. පුග්ගල පඤ්ඤත්තිය දක්වන ලද දශක නිර්දේශය[138] (කාමාවචර භූමියෙහි නිෂ්ටාවලත්)

---

135 පු.ප., පි.399; ෂට්ක නිර්දේශය.

136 -එම- පි.405.

137 අ.2, පි.70, 110.

138 පු.ප., පි.407; නවක නිර්දේශය.

1. ඉහනිට්ඨා නම් වූ පස් දෙනෙක් හා
2. ඉහවිහායනිට්ඨා නම් වූ (කාමාවචර භූමියේ නොවන) පස්දෙනෙක් ද දක්වන ලද හ.

සංයෝජන ධර්ම දහය බිඳීමේ හේතුවෙන් ඉහත පුද්ගල වෙනස පෙනෙන හෙයින් සංයෝජන ධර්ම බිඳිය හැක්කේ කෙසේ දැයි වැටහීමක් අවශ්‍ය ය. චක්ෂුස..., රූපය...., චක්ෂුර් විඥානය, චක්ෂුස් සංස්පර්ශය... චක්ෂුස් සංස්පර්ශය නිසා..., මනස් සංස්පර්ශය නිසා.... සුව හෝ දුක් වූ හෝ නොදුක්, නොසුව වූ හෝ යම් වේදනාවක් උපදී නම්, ඒ සියලු ම අවස්ථාවන්හි දී අනිත්‍ය වශයෙන් බලන්නහුගේ සංයෝජන ප්‍රහීණ වන බව සඤ්ඤොජන සූත්‍රය දක්වයි.[139] ඉහතින් සඳහන් වූ චක්ෂුස්, රූපය ආදී දෑ අනාත්ම වශයෙන් දකින්නහුගේ සංයෝජන සහමුලින් නැසෙන බව සංඤ්ඤොජන සමූලඝාත [140]සූත්‍රය සඳහන් කරයි.

සංයෝජන හා සංයෝජන ධර්ම යන වචන දෙකෙහි අර්ථ හා ව්‍යඤ්ජන වෙනස් බවට සංයුත්ත නිකායේ චිත්ත සංයුත්ත, සංයෝජන සූත්‍රයේ[141] එන කරුණුවලින් වටහා ගත හැකි ය. කළු ගොනෙක් හා සුදු ගොනෙකුත් එක් යොතකින් බැඳ සිටින විට, 'කළු ගොනා, සුදු ගොනාගේ බැඳුමය හෝ සුදු ගොනා, කළු ගොනාගේ බැඳුමය', හෝ කීමෙහි අර්ථයක් නොපෙනේ. බඳින ලද යොතම බැඳුම ලෙස ගත යුතු ය. ඒ අයුරින් ම කන ශබ්දයට හෝ ශබ්දය කනට හෝ සංයෝජනය නොවේ. ඉටු කැමැති මනවඩන, ප්‍රිය වූ දෑ නම් වූ 'ඡන්දරාගය' සංයෝජනය නම් වේ. රූපයෝ ඇසටත්, ඇස රූපයටත් සංයෝජනය නොවේ. ඇස හා රූපය නිසා ඇතිවන ඡන්දරාගය ම සංයෝජනය නම් වේ. මනවඩන, ප්‍රිය වූ කාම ඇලුම් කටයුතු සිතින්, "දතයුතු දහම්" සංයෝජන ධර්මයෝ ය. එහි ම, උපාදාන අර්ථ දක්වන උපාදාන

139 පු.ප., පි.411; දශක නිර්දේශය.

140 ප.4, පි.71; සඤොදාජන සූත්‍රය.

141 -එම- පි.71; සඤ්ඤෝජන සමූලඝාත සූත්‍රය.

සූත්‍රයට අනුව සංයෝජන හා උපාදාන[142] සම අර්ථයෙන් ගෙන ඇති බව දැකිය හැකි ය. උපාදාන නම් වූ ඡන්දරාගයෙන් ඈත්වීම, සංයෝජන ප්‍රහාණය ය.

කෙතක වැපුරූ සැණින් අස්වැන්න ලැබිය නොහැකි වුව ද, ඒ ක්‍රියා පිළිවෙතෙහි වහ වහා අනලස් ව ක්‍රියා කරන්නහුට ඉතා ඉක්මනින් ප්‍රතිඵලය නම් වූ ධාන්‍ය ලැබිය[143] හැකි ය. තථාගත ශ්‍රාවක සිව් පිරිසිදු ශීලයෙන් සිල්වත් ව, සම්‍යග්දෘෂ්ටික ව, ක්ෂීණාස්‍රව වන්නේ නම් එම ශ්‍රාවකයා සමාධි ප්‍රඥා සාරයෙහි පිහිටි පුද්ගලයකු වේ.[144] එකී සාරය ක්‍රමයෙන් ඉහළට යන අනුපූර්ව ක්‍රියා පද්ධතියකි. එහි පළමු පියවර සෝවාන්[145] බව ලබා ගැනීම ය. සෝවාන් මගින් පහව යන සංයෝජන ධර්ම තුන සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස ලෙස කලින් දක්විණ. සෝවාන් මාර්ග සිතට අනතුර ව, සෝවාන් ඵල සිත ලැබෙන හෙයින් ඒ සෝවාන් පුද්ගල නම් වූ පළමුවන යුගලය ලෙස සැලකිය යුතු ය. සෝවාන් පුද්ගලයා පිළිබඳ ව පැනෙන අවස්ථා තුනක් පුග්ගල පඤ්ඤත්ති ඒකක නිර්දේශයේ දී හඳුනා ගත හැකි. අංගුත්තර නිකායේ තික නිපාතයේ ද එය සඳහන් ය.[146]

1. සත්තක්ඛත්තු පරම - සත් වරක් දෙව් මිනිස් භවයන්හි උත්පත්තිය ලබන්නා
2. කොලං කොල - දෙව් මිනිස් භවයන් දෙකක් හෝ උත්පත්ති වශයෙන් ලබන්නා
3. ඒකබීජී - එක ම මිනිස් භවයක් ලබන්නා

ඉහත තුන්දෙනා කිසි විටෙකත් දුගතීන් හි උත්පත්තිය නොලබන බව අවධාරණය කළ යුතු අතර, සත්ත්වරක්, දෙවරක්

142 ස.නි. 4, පි.521 - 523; සංඤ්ඤෝජන සූත්‍රය.

143 ස.නි. 4, පි.225.

144 අ.නි. 1, පි.431.

145 -එම- පි.429.

146 -එම- පි.431.

(තුන්වරක්) හෝ එක් වරක් පුනර්භවය ලබා ක්ෂීණාස්‍රව බවට පත්වන බව දැක්විය යුතු ය.

ආර්යය පුද්ගලයන් පිළිබඳ, දෙවන යුගලය වන්නේ සකෘදාගාමී වන හේතුවෙනි. සකෘදාගාමී වන්නේ තුන් සංයෝජන ප්‍රහීණ කොට අනතුරු ව, ඉදිරියෙහි පවතින රාග, ද්වේෂ යන සංයෝජන ධර්ම දෙක තුනී කිරීමේ හේතුවෙනි. සකෘදාගාමී මාර්ගස්ථයා හා පලස්ථයා යන දෙදෙනා මෙලොවට එන්නේ එක්වරක්[147] බව පෙනේ. ඉහනිට්ඨා පුද්ගලයන් පස්දෙනා පිළිබඳ ව දැක් වූ තොරතුරු වලට අනුව සත්තඛත්තු පරම, කොලංකොල, ඒකබීජී හා සකෘදාගාමී යන සතර දෙනා දන් පැහැදිලි විය යුතු ය. රහතන් වහන්සේ[148] පිළිබඳ ව මතුවට කරුණු දක්වෙන නිසා මෙතැන දී යමක් සඳහන් නොකෙරේ. එහෙයින් අනාගාමී පුද්ගල නම් වූ තුන්වැනි යුගලය ගැන යමක් කිව යුතු ය. ඉහවිහායනිට්ඨා නම් වූ පස්දෙනා පිළිබඳ ව තොරතුරු පරීක්ෂා කළ යුතු ය. දස සංයෝජන ධර්මවල මුල් පහ ඔරම්භාගීය ලෙසත්, අවසාන පහ උද්ධම්භාගීය ලෙසත් ඉහතින් සඳහන් කෙරිණ. සක්ඛායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, රාග, ද්වේෂ නම් වූ ඕරම්භාගීය පහ සම්පූර්ණ ලෙස ප්‍රහාණය කිරීමෙන් පුද්ගලයා ඕපපාතික උත්පත්තිය ලබන අනාගාමිකයෙකු[149] වෙයි. මෙම අනාගාමිකයා කිසි විටෙකත් මිනිස් ලොවට උත්පත්තිය වශයෙන් නොපැමිණේ. බඹලොව ඕපපාතික ව එහි ම ක්ෂීණාස්‍රව ව පිරිනිවන් පාන්නේය.

පස් වැදෑරුම් ඕරම්භාගීය සංයෝජනයන්ගේ පරීක්ෂණය හේතුවෙන් පුද්ගලයන් පස් දෙනකු හඳුනාගත හැකි බව අංගුත්තර නිකායේ තික නිපාතයේ[150] දක්වෙයි. මේ පස්දෙනා ඉහවිහායනිට්ඨා වශයෙන් දැක් වූ පුද්ගල පස්දෙනා බව පෙනේ. එකී පස්දෙනා අන්තරා පරිනිබ්බායි, උපහච්ච පරිනිබ්බායි,

147 පු.ප., පි.273; අ.1, පි.413 - 415.

148 අ.1, පි.410. පු.පු.සං., පි.738.

149 -එම- පි.415.

150 පු.ප., පි. 275; අ.1, පි.421.

අසංඛාර පරිනිබ්බායි, සංඛාර පරිනිබ්බායි, උද්ධංසොත අකනිට්ඨාගාමී ලෙස පුග්ගල පඤ්ඤත්තියෙහි[151] ද සඳහන් වේ. එකී පස්දෙනා පිළිබඳ ව වූ පොදු ලක්ෂණ අනුව සමානයන් ලෙස සැලකුවේ වුව ද, පස්දෙනා අතර වෙනස්කම් පවතී. ඉන් මුල් දෙදෙනා, ආර්ය මාර්ගයට පිවිසෙන වයස අනුව තීරණය කළ හැකි ය. ඉතිරි සංයෝජන නම් වූ උද්ධම්භාගීය සංයෝජන පහ (ක්‍ෂය) කිරීම මුල් කාලයේ දී හෝ මැදි වියට පෙර කරන්නේ නම් හෝ ඒ අන්තරා පරිනිබ්බායි වේ. මැදි වියේ දී හෝ ඉන් පසුව ඉතිරි සංයෝජනය බිඳින්නේ නම් ඒ පුද්ගලයා උපහච්ච පරිනිබ්බායි නම් වේ. උද්ධම්භාගීය සංයෝජන බිඳ ආර්ය මාර්ග යට පිවිසෙන්නේ බලවත් උත්සාහයකින් තොර ව නිදුකින් නම් ඒ පුද්ගලයා **අසංඛාර පරිනිබ්බායි** නම් වේ. බලවත් උත්සාහයකින් හා දුකින් ආර්ය මාර්ගයට පිවිසෙන්නේ නම්, එම පුද්ගලයා සසංඛාර පරිනිබ්බායි නම් වේ. පස්වැනි ඉහවිහායනිට්ඨා පුද්ගලයා අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සි ආදී වශයෙන් ඉහළ ඉහළ බ්‍රහ්ම ලෝකවල ඉපදෙන හෙයින් උද්ධංසොත නම් වන අතර, අකනිට්ඨා බ්‍රහ්ම ලෝකයේ දී ආර්ය මාර්ගය උපදවා පිරිනිවෙන හෙයින් උද්ධංසොත අකනිට්ඨා යයි කිව හැකි වේ. ඉහත විස්තර කළ පුද්ගලයන් දහදෙනා පිළිබඳ ව සංක්ෂිප්ත විස්තරයක් කරතොත් මතකයට නංවා ගැනීම පහසු ය. එහෙයින් මෙතැන දී, එම දහදෙනා[152] නැවත සඳහන් කරනුයේ පුද්ගල සංවර්ධනයේ විවිධ අවස්ථා හැඳිනීමේ පහසුව සඳහා ය.

1. **ඉහනිට්ඨා** - 5

1. සත්තක්ඛත්තු පරම - සත්වරක් දෙව් මිනිස් ලොවට එන සෝවාන් පුද්ගලයා
2. කොලංකොල - දෙවරක් හෝ තුන්වරක් දෙව් මිනිස් ලොවට එන සෝවාන් පුද්ගලයා

151 දී.3, පි.403, පු.ප., පි.411.

152 ම.1, පි.660; ම.2, පි.708.

3. ඒකබීජී - එක ම මිනිස් භවයක මෙලොවට එන සෝවාන් පුද්ගලයා
4. අර්හත් - ක්ෂීණාස්‍රව පුද්ගලයා

**2. ඉහවිහායනිට්ඨා - 5**

1. අන්තරා පරිනිබ්බායි - ඕපපාතික අනාගාමියා ඉතිරි සංයෝජන මැදි වියට පෙර සිඳියි.
2. උපහච්ච පරිනිබ්බායි- මධ්‍ය වියේ දී සංයෝජන සිඳියි. (බලවත් උත්සාහයකින් තොර)
3. අසංකාර පරිනිබ්බායි - නිදුකින් ඉතිරි සංයෝජන සිඳියි.
4. සසංඛාර පරිනිබ්බායි - දුකින් (බලවත් උත්සාහයකින්) ඉතිරි සංයෝජන සිඳියි.
5. උද්ධංසොත අකනිට්ඨගාමී- අවිහ, අතප්ප ආදී ඉහළ බ්‍රහ්ම ලෝකවලට ගොස් අකනිට්ඨාවේ දී ආර්යය මාර්ගය උපදවයි.

මේ අනාගාමියාගේ ප්‍රභේද වේ. ආස්‍රව පහකිරීමේ හේතුවෙන් සමණ[153] හෝ බ්‍රාහ්මණ හෝ රහත් හෝ වන බව මීට ඉහතින් බොහෝ අවස්ථාවල අප සඳහන් කළෙමු. රහතන් වහන්සේගේ පිරිනිවීම පෘථග්ජන ව්‍යවහාරයේ පවතින මරණය හා සමානත්වයෙන් ගෙන, රහතන් වහන්සේගේ පිරිනිවීමෙන් අනතුරු ව උපදින්නේ කොහේ ද? යන්න බොහෝ දෙනා ඇසූ හ. රහතන් වහන්සේ හෙවත් විමුක්ත මහණ 'නූපදී' යනුවෙන් තථාගතයන් වහන්සේ දුන් පිළිතුර ඔවුනට පැහැදිලි නොවී ය.[154] 'නූපදී' යන්නෙන් 'සදාකාලික ව ජීවත්වන' පුද්ගලයකු පිළිබඳ ව ඔවුන්ගේ මනසෙහි සංකල්ප බිහි වූවා විය හැකි ය. රහතන් වහන්සේ[155] සදාකාලික ව ම දුකින් හා මරණයෙන් මිදුණේය' යි බොහෝ සූත්‍රවල දේශනා කරන ලද හෙයින් සදාකාලික ව ජීවත්

153 දී.2, පි.103.

154 දී.3, පි.463.

155 ම.2, පි.263 - 265; අග්ගිවච්ඡගොත්ත සූත්‍රය. ප.නි. 4, පි.317 - 321.

වන පුද්ගලයන් පිළිබඳ අදහස ආරූඪ කර ගත්තා ද විය හැකි ය. කෙසේ හෝ විමුක්ත මහණහුගේ[156] මරණයෙන් මතු තත්ත්වය පිළිබඳ කරුණු වරදවා ගැනීම නිසා බොහෝ විට තථාගතයන් වහන්සේ හමුවට පැමිණි පුද්ගලයන් වෙහෙසට පත් වූ බව පෙනේ. විමුක්ත වූ සිත් ඇති පුද්ගලයන් කොහි උපදනේ ද යන පැනය,[157] ඇසූ අග්ගිවච්ඡ පරිබ්‍රාජකයා ද ඉන් කෙනෙකි. පසු ව, "භවත් ගෞතමයෙනි, මෙහි ලා මම නොදැනීමට පැමිණියෙමි. මෙහි ලා සම්මෝහයට පැමිණියෙමි.... භවත් ගෞතමයන්ගේ පූර්ව කථා සංලාපයෙන් මාගේ යම් ප්‍රසාද මාත්‍රයෙක් වී නම් දැන් එය ද අතුරුදහන් වී," යයි තථාගතයන් වහන්සේට ඔහු තුළ වූ ස්වභාවය පැහැදිලි කළේ, තථාගතයන් වහන්සේ ඔහුට ඒ පිළිබඳ ව දුන් පිළිතුර අවබෝධ නොවූ හෙයිනි.

"වත්සය, ඔබගේ නොදැනීම, මුලාව පැහැදිලි ය. මෙම ධර්මය ගැඹුරු ය. එහෙයින් අවබෝධ කළ නොහැකි ය. ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් වටහාගත නොහැකි ය. නුවණැත්තන් විසින් ම වටහාගත යුතු ය. අන්‍ය දෘෂ්ටික, අන්‍ය මතයෙක පිහිටි, වෙනත් දහමක් රුචි කරන, අන්‍ය ආචාර්යවරයන් කෙරෙහි විශ්වාසය තැබූ ඔබ වැන්නකුට දැකිය නොහැකි ය," යනුවෙන් තථාගතයන් වහන්සේ ඔහු වෙහෙස කර වූ, අනවබෝධය වටහා ගෙන ඔහුට තේරෙන ආකාරයෙන්, 'රහතන් වහන්සේ නූපදී' යයි පැහැදිලි කළ හ.[158] ඒ පිළිගැනීම පිළිබඳ ව වූ වෙනස අවබෝධ කිරීමකි.

රහතන් වහන්සේ 'මරණය ජයගත් පුද්ගලයෙකු' හෝ 'දුකින් මිදුණු පුද්ගලයෙකු' ලෙස හැඳින්වීමේ දී[159] ඒ වෙනත් වෙනත් දෘෂ්ටීන් හා සමානත්වයෙන් සලකා 'සදාකල්හි ම ජීවත් වන පුද්ගලයෙකු යන සංකල්පයට වැටෙති. ආශ්‍රැතවත් පෘථග්ජන

156 ම.2, පි.275 - 265 අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, ස.නි. 4, පි.708. ම.නි. 2, පි.263.

157 -එම- පි.263.

158 ස.නි. 2, පි.175 සම්මසන සූත්‍රය.

159 ම.නි. 1, පි.449 - 459; මහා හත්ථිපදෝපම සූත්‍රය.

පුද්ගලයන් එසේ විශ්වාස කරන්නේ හුදෙක් තමන් අසන ලද දේ දෘෂ්ටි ග්‍රාහකත්වයෙන් ගැනීම නිසා මිස, අප අත්දැකීම් ලබන ලෝකයේ සදාකල්හි ම ජීවත් වූ, ජීවත් වන හෝ ජීවත් විය හැකි යයි අනුමාන කළ හැකි පුද්ගලයන් නොමැති, නිසාවෙනි. වර්තමාන නවීන විද්‍යාවන් විසින් සොයා ගනු ලබන කරුණු අනුව වුව ද, ඒ අසුවල් දින විය හැකි යයි සිතීමට පවා නොහැකි උමතු සිතුවිල්ලක් පමණක් බව පෙනේ. සියලු ග්‍රහලෝක පවා හටගෙන, විනාශ වී යන බව[160] අපේ දැනීම බැවින් 'සදාතනික' පුද්ගලයන් ගැන විශ්වාස කිරීම උමතු විශ්වාසයක් පමණක් විය යුතු ය.

අප අත්දැකීමකට හසු වී පවතින පුද්ගලයා හා ලෝකය පිළිබඳවත්, ආර්යයා නම් වූ රහතන් වහන්සේගේ අත්දැකීමට හසුවී පවතින පුද්ගලයා හා ලෝකය[161] පිළිබඳවත් යම්කිසි පිළිග ැනීමේ වෙනස්කමක් පවතී. ඒ සඳහා එක්තරා ආකාරයක මානසික හැඩගැස්මක් ද[162] අවශ්‍ය ය. අන්‍ය දෘෂ්ටීන් පිළිගෙන, එහි ඉගැන් වූ කරුණු හා ගළපා තථාගත ධර්මය අවබෝධ කිරීමට උත්සාහ කළ වච්ඡගොත්තට මුලින් කරුණු අවබෝධ නොවූයේත්, පසු ව තමන්ට ම වැටහුණු පරිදි ඉතා සරල ලෙස ගින්න උදාහරණ කොට රහතන් වහන්සේ පිළිබඳ කරුණු අවබෝධ කර ගත්තේත්, දෘෂ්ටිවලින් බැහැර වී පෙනෙන්නට, දකින්නට තිබුණු දෑ ගැන සිහිය හා නුවණ යෙදවීමෙනි.

මිනිසා හා ලෝකය යන්නත්, ඒ පිළිබඳ ව වූ සියල්ලත්[163] තථාගතයන් වහන්සේ අර්ථ දක්වූයේ ඇස, කන, නහය නම් වූ අභ්‍යන්තර ඉන්ද්‍රිය ලෙසත්, ඒ ඉන්ද්‍රියයන්ට ගොදුරු වන රූප, ශබ්ද, ගන්ධ, රස ආදී බාහිර අරමුණු ලෙසත් ය. "සියල්ල

---

160 ස.නි. 4, පි.87 - 89, සමිද්ධි සත්ත පඤ්හ සමිද්ධි ලොක පඤ්හ සූත්‍ර. -එම- 117 - 119; ලෝක සූත්‍රය.

161 ස.නි. 4, පි.257, සු.නි., පි.237 - 241 සහ ස.2, පි.181 - 187. සු.නි., පි.238, ගාථා අංක 765.

162 ස.නි. 4, පි.31 - 61; ස.4, පි.145.

163 -එම- පි.267; කම්ම සූත්‍රය.

දෙසමි. සියල්ල පිළිකෙව් කොට අන් සියල්ලක් පනවමි. සියල්ල නොදැන දුක් පහ කළ නොහැකි ය," යනාදී දේශනාවන් රහතන් වහන්සේට සියල්ල බැහැර කිරීමට උපකාරී විය.

පුද්ගලයාගේ උපත සිදුවන්නේ අතීත භවයේ මානසික ශක්තිය පදනම් කොට ගෙන නව භවයේ නාමරූප ශක්තීන් පහළවීම නිසාවෙනි.[164] එහි චිත්ත ශක්තීන්ගේත්, රූප ශක්තීන්ගේත් අභේද්‍ය සම්බන්ධතාවක් ඇතිවීම නිසා චිත්ත ශක්තිය සියලු ඉන්ද්‍රියයන්හි පැතිර පවතී. බාහිර අරමුණු ඉන්ද්‍රියයන්ට හමුවීමේ දී කිසියම් උත්තේජනයක් ඇති වී මානසික ක්‍රියාවලියක් හට ගනී. එහි ලා මජ්ඣිම නිකායේ මධුපිණ්ඩික සූත්‍රයේ[165] දක් වූ අනුභූතිය පිළිබඳ අවස්ථා කීපය නැවත සලකා බලමු.[166] අනෙක් සූත්‍රවල[167] ද එම පිළිවෙළ ම විස්තර සහිත ව දක් වේ.

1. ඇසට රූපය අරමුණු වේ. ඉන් ඇස නිසා වූ දැනීම පහළ වේ.
2. ඇසේත්, රූපයේත්, ඇස නිසා වූ දැනීමේත් එක්වීම ඵස්ස වේ.
3. ඵස්ස නම් වූ ගැටීම නිසා විඳීමක් ඇති වේ.
4. යමක් විඳී ද එය හැඳින ගනී.

හැඳින ගැනීම සඳහා වූ සංඥාවන්, වේදනාව නම් වූ විඳීම නිසා වූ බව දන් පැහැදිලි විය යුතු ය. ඊට පෙර වූ අවස්ථා තුන ම පුද්ගල භාවයෙන් තොර ව සිදු වූ ක්‍රියා හැටියට සැලකීමට හැකි වුව ද, විඳීමත් සමග පුද්ගලභාවය හෙවත් පුද්ගලත්වය 'මම විඳිමි' යන අර්ථයෙන් පුද්ගලයාගේ සිතට ඇතුළු වේ. එහෙයින් එහි එන පාඨයේ 'යං වෙදෙති, තං සඤ්ජානාති'[168] යන්නෙන් ඒ බව දක්වා තිබේ. එම පාඨයේ දක් වූ ඊළඟ කොටස්වලින් දක්වෙන

164 -එම- පි.259 - 265.

165 ම.නි. 1, පි.280.

166 ස.නි. 4, පි.149 දුතිය ද්වය සූත්‍රය.

167 ස.නි. 4, පි.27 -එම- පි.47, 407. -එම- පි.401 - 403.

168 සනි. .4, පි.319 - 321. -එම- පි.341 - 345. -එම- පි.313 -එම- පි.315 - 317. ස.නි. 4, පි.149. ස.නි. 4, පි.407 - 409.

1. යමක් හැඳින ගත් පසු ඒ ගැන (පුද්ගලයා) සිතන්නට වීම,
2. යළි යළි සිතීමෙන් (පුද්ගලයා) විවිධාකාර අදහස් පහළ වීම,
3. විවිධාකාර අදහස් නිසා අතීත, අනාගත, වර්තමාන රූපයන් පිළිබඳ ව හටගන්නා මනෝරූප හා මනෝභාවයන් (පුද්ගලයා) වෙලා ගැනීමෙන් අභිභවනය කිරීම, යන ඒවා පුද්ගලත්වයෙන් ම කෙරෙන ඒවා බව පැහැදිලි වේ. ඇසට රූපයක් හමු වූ කල සිදුවන මානසික ක්‍රියාවලිය ඉහතින් දැක්විණ.

ඒ අයුරින් ම කනට ශබ්දයක්, නැහැයට ගන්ධයක්, දිවට රසයක්, සිරුරට ස්පර්ශයක්, මනසට ධර්මාරමණයක් හමු වූ කල ඇතිවන ක්‍රියාකාරීත්වය ද තේරුම් ගත යුතු වේ. පුද්ගලත්වයෙන් තොර ව ඇරඹෙන ක්‍රියාකාරීත්වය තුළින් පුද්ගලයකු මතු වී, එම පුද්ගලයා විසින් ම මවා ගත් සිතුවිලි තුළින් එම (මතු වූ) පුද්ගලයා අසරණ බවට පත්වන ආකාරය මින් පැහැදිලි වේ. අභ්‍යන්තරික ඉන්ද්‍රියයන් බාහිර ලෝකය නම් වූ අරමුණු හා ගැටීමෙන් ඇතිවන මානසික ක්‍රියාකාරීත්වය ගලා යන වේගවත් ප්‍රවාහයක් බවට පත් වේ. සුදුසු සුදුසු ප්‍රත්‍යයෙන් ඊට රුකුල් ලැබෙන නිසා නොනැවතී ගලා යන්නේ යයි සිතෙන නමුත් සෑම මොහොතක දී ම බිඳි බිඳී පලුදු වී ශූන්‍යත්වය ම පළ කරයි. මෙය කලින් සාකච්ඡා කෙරිණ.

වේගවත් ලෙස බිඳි බිඳී ගලා යන ප්‍රවාහය ගින්නකි. එයට යම් යම් තෘණ හා දැව එකතු කිරීමෙන් ම පවත්වා ගත හැකි ය. සුදුසු තෘණ හා දැව නොලැබීමෙන් ම ඒ ක්‍ෂය වේ. කිරි වැගිරෙන[169] තරුණ ගසක මෙන් වේගවත් සිතුවිලි ඇති වන්නේ රාග, දෝස, මෝහ පහ නො වූ විට ය. ඒවා පහ වූ කල වියළී ගිය කොළ හැලුණු ගසක මෙන් වැගිරීමෙන් වළකී.

වධකයන් පස්දෙනකුත්, කඩු ගත් මිනිසෙකුත් වළක්වා ශූන්‍ය වූ පාළු ගෙයකට වදින මිනිසෙකු සොරුන්ගෙන් බේරීමට

169 ම.නි. 2, පි.263; අග්ගිවච්ඡගොත්ත සූත්‍රය.

නැවතත් දුව යන්නේ ගඟක් දකී. පහුරක් සාදාගෙන ඉන් එතෙර වේ. ඒ තරණය කිරීම ඇස්, කන්, නාසාදී ෂඩායතනයන් තරණය කිරීමකි. 'සියල්ල' අර්ථ දක් වූ සෑම තැනක දී ම ඒ ඇස, කන, නහය, දිව, කය, සිත යනුවෙන් ද රූපය, ශබ්දය, ගන්ධය, රසය, ඵස්සය, ධර්ම යනුවෙන් ද දක්වූයේ මන්දැයි මෙහි දී වඩාත් හොඳින් පැහැදිලි වනු ඇත. ලෝකය, මිනිසා, දුක සියල්ල ඇස, කන, ආදීන් වශයෙන් වටහා ගත් රහතන් වහන්සේට නාමරූප ධර්මයන්ගේ සම්බන්ධතාවත්, අග්නි ප්‍රවාහයේ ගලා යාමත් අවබෝධ වේ. සිහිය හා ප්‍රඥාව යොදා ගැනීමෙන් එසේ ඇවිලෙමින් පැවති ගින්න නිවා දැමීමට රහතන් වහන්සේට හැකි වේ.

ගින්නට සුදුසු ප්‍රත්‍යයක් ලැබීමේ හේතුවෙන් ගින්න පවතී. ප්‍රත්‍යයන් නොලැබීම හේතුවෙන් ගින්න නිවේ. නිවුණු ගින්නක් නිවුණු බව දැනගත හැකි වුව ද, ඒ නිවුණු ගින්න කුමන දිශාවකට ගියේ ද යන්න විමසූ විට පිළිතුරු නොදිය හැකි බවට පත්වේ.[170]

රහතන් වහන්සේ පිළිබඳ ව ද කිව යුත්තේ උපාදාන ක්‍ෂය වීමෙන්, අන්‍ය උපාදානයක් නොමැති වීමෙන් අප්‍රත්‍යය වීමෙන්, නිවුණු බව ය. එසේ නිවීම නිසා පෘථග්ජන ව්‍යවහාරයේ එන 'මම දකිමි', 'මම විඳිමි' යන පිළිගැනීම් රහතන් වහන්සේට ඇති නොවේ.[171] ඒ මානසික පරිවර්තනයේ ස්වරූපය ය. රහතහන් වහන්සේට 'මම', 'මගේ' ආදී වශයෙන් පවතින දෘෂ්ටි නොපවතින ආකාරය සංයුත්ත නිකායේ යවකලාපී සූත්‍රයෙන්[172] පැහැදිලි කරයි. 'මම වෙමි', 'මම වන්නෙමි', 'මම නොවන්නෙමි' යන සියලු මඤ්ඤනාවන්ගෙන් ඈත්වන රහතන් වහන්සේ ඒවා දකින්නේ රෝග, ගණ්ඩ, සල්ල වශයෙනි. උන්වහන්සේ සියලු මඤ්ඤනා, ඉඤ්ජිත, ඵන්දිත, පපඤ්චිත, මාන, තෘෂ්ණා, දෘෂ්ටි

170 සං. නි. 4, පි.277 - 281. -එම- පි.91. ස.නි. 4, පි.279 අත්‍ථිනුබොපරියාය සූත්‍රය.

171 -එමච පි.385 - 389; යවකලාපි සූත්‍රය.

172 ස.නි. 4, පි.369 - 375. -එම- පි.125 - 133.

ආදීන්ගෙන් ඉවත් වූ හෙයින් එක්තරා ආකාරයක මානසික හැඬග ැසීමකින් යුක්ත වී සිටින්නාහ. ව්‍යවහාර ලෝකයේ දී අන්‍යයන් මෙන් 'මම', 'මගේ' යන වචන භාවිත කරන උන්වහන්සේ ආර්යය ව්‍යවහාරයේ දී එසේ භාවිත නොකරයි.[173]

සර්පයකු ඇඟ වැටුණු උපසේන[174] රහතන් වහන්සේ පිළිබඳ පුවතින් රහතන් වහන්සේගේ ජීවිතය, කයෙහි බිඳීමෙන් කෙළවර වන ආකාරය ඉහතින් ද සාකච්ඡා කෙරිණ. රහතන් වහන්සේට මරණය හෝ මරණින් මතු (පරම්මණ) කුමක් වේ ද යන්න ගැන හෝ ප්‍රශ්නයක් නොවේ. ඉපදීමේ හේතු දුරු කළ රහතන් වහන්සේ මාගේ පැවැත්ම නැත්තෙකි. ප්‍රත්‍යයෙන් උපන් හා ප්‍රත්‍යයන්ගෙන් නූපන් ධර්මතාවන්ගෙන් වෙනස්කම් පිළිබඳ ව සඞ්ඛත හා අසඞ්ඛත[175] යනුවෙන් සාකච්ඡා කළ අවස්ථාවේ දී ප්‍රත්‍යය සමවායෙන් උපන් සඞ්ඛත ධර්මයන්ගේ ලක්ෂණ ලෙස ඉපදීම, බිඳීම හා වෙනස්වීම පවතින බවත්, ප්‍රත්‍යය සමවායෙන් නූපන් අසඞ්ඛතය. උපාදානයන්ගෙන් මිදුණු රහතන් වහන්සේ ප්‍රත්‍යය සමවායෙන් උපන් ධර්මයන්ගෙන් මිදුණු යන අර්ථයෙන් ඉපදීම, බිඳීම, වෙනස්වීම යන ලක්ෂණයන්ගෙන් තොර වී සිටිති. එහෙයින් උන්වහන්සේ අරහයා 'උපදී, නූපදී' යන ව්‍යවහාරය[176] නුසුදුසු ය.

රහතන් වහන්සේට ආගමන (ප්‍රතිසන්ධි) නොවේ නම් ගමන (ච්‍යුති) ද නොවේ.[177] එහෙයින් උන්වහන්සේ ගමන කෙළවර කරන ලදහ.[178] ගමන කෙළවර කළ පසු මරණය හෝ මරණින් මතු තත්ත්වයක් ද පැන නොනගී. රහතන් වහන්සේ, ඇස දකින විට 'මම දකිමි', 'මම විඳිමි' යනුවෙන් පුද්ගලත්වයෙන් ඒවා

173 ස.නි. 4, පි.91 - 93; උපසේන සූත්‍රය.

174 අ.නි. 1, පි.275; තික නිපාත. කථා, පි.165 -169.

175 ස.නි. 2, පි.339 ස.4, පි.707 දී.නි. 2, පි.102; ස.නි. 4, පි.693, 695.

176 ස.නි. 4, පි.131; ඡන්න සූත්‍රය.

177 ස.නි. 4, පි.197 - 205.

178 ස.නි. 4, පි.293; සක්කායදිට්ඨිප්පහාන සූත්‍රය.

නොගන්නා බැවින්, 'කෙනෙකු' (සත්කායයෙක්)[179] ලෙස අදහස් නොවේ. එහෙයින් රහත් බව යනු යම්කිසි 'සජීවී අත්දැකීමක්' ලෙස නුවණැත්තන් විසින් තම තමා විසින් ම ලබන, අවබෝධ කරන අත්දැකීමක් ලෙස[180] සඳහන් කළ යුතු වේ. ඒ උපාදාන සහිත වූ තත්ත්වයෙන් මිදී, උපාදාන රහිත වූ තත්ත්වය කරා පැමිණීමෙකි. මේ පැමිණීම, යහපත් පැමිණීමක් යයි රහතන් වහන්සේලා පැවසූ හ.[181]

සංයුත්ත නිකායේ ආඛ්‍යාත සංයුක්තයට අයත් සූත්‍රවල සඳහන් වන ඇතැම් අධිභෞතික ප්‍රශ්න සඳහා තථාගතයන් වහන්සේගේ පිළිතුරු[182] මොනවා දැයි කලින් සඳහන් විය. ඒවා නැවත සලකා බලමු.

"කාශ්‍යපයෙනි, කිමෙක් ද තථාගත (සත්ත්ව) තෙමේ මරණින් මතු[183] වේ ද?"

ඇවැත්නි, 'සත්ත්ව තෙමේ මරණින් මතුවෙයි' යන මෙය නොවදාරණ ලදි.

කිමෙක් ද, සත්ත්ව තෙමේ මරණින් මතු නොවේ ද?

'මරණින් මතු නොවෙයි,' යන මෙය නොවදාරණ ලදි.

සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේත්, නොවන්නේත් වේ ද?

මරණින් මතු වන්නේත්, නොවන්නෙත් මෙය නොවදාරණ ලදි.

සත්ත්ව තෙමේ මරණින් මතු නොම වන්නේත්, නොම නොවන්නේත් වේ ද?

'මරණින් මතු නොම වන්නේත්, නොම නොවන්නේත් වෙයි' යන මෙය නොවදාරණ ලදි.

---

179 -එම- පි.95. ස.4, පි.279. පි.153 - 162.

180 ථේර, පි.313 - 214, ගාථා අංක 885 - 891 සු.නි., පි.178.

181 ස.නි. 4, පි.681.

182 ස.නි. 2, පි.337; ස.නි. 4, පි.705 - 709; සභිය සූත්‍රය.

183 ස.නි. 4, පි.671; ඛේමා සූත්‍රය. ස.නි. 4, පි.670.

කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් එය නොවදාරණ ලද්දේ ද?

අර්ථ සහිත නොවන නිසාත්, සම්බෝධිය හා නිවන පිණිස නොපවතින නිසාත් එසේ නොවදාරණ ලදි.

සංයුත්ත නිකායේ ඛේමා[184] සූත්‍රයෙහි දී ද ඉහත සතරාකාර පැනවීම් රහතන් වහන්සේ හා තථාගතයන් වහන්සේ අරහයා නොපනවන හේතුව සඳහන් කර ඇත.

යම් රූපයකින් සත්ත්වයා පනවන්නේ නම් ඒ රූපය තථාගතයන් වහන්සේට ප්‍රහීණය. එහෙයින් මරණින් මතුවේ යයි පැනවීම නොයෙදේ. මරණින් මතු නොවේ යයි පැනවීම ද නොයෙදේ, එහෙයින් මරණින් මතු වෙයි, නොවේ යයි පැනවීමට ද නොපැමිණෙති. එසේ ම වේදනා, සඤ්ඤා, සංඛාර, විඥානාදී කරුණු අනුව, සත්ත්වයා පනවන්නේ නම්, මරණින් මතුවෙයි, නොවෙයි ආදී සතර වැදෑරුම් පැනවීම් කරවීම ද නොහැකි වන්නේ තථාගතයන් වහන්සේ එකී තත්ත්වයන් ප්‍රහාණය කරන ලද හෙයිනි.

උත්තම පුරුෂ, පරම පුරුෂ නම් වූ ශ්‍රේෂ්ඨ ප්‍රාප්තියට පත් සත්ත්වයන් (රහතන් වහන්සේ) වේ නම් ඔහු පනවන තථාගතයන් වහන්සේ, "සත්ත්වයා මරණින් මතුවේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නොවේ" යයි හෝ සත්ත්වයා මරණින් මතු වේ, නොවේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නොම වේ, නොම නොවේ යයි හෝ යන මේ සිව් කරුණින් වෙන් ව පනවන සේක", යනුවෙන් අනුරාධ තෙරණුවෝ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයන්හට දූන් වූ විට, ඔවුහු අනුරාධ තෙරණුවෝ අලුත පැවිදි වී නවකයෙකැයි අවමන් කළ බව සංයුත්ත නිකායේ අනුරාධ සූත්‍රය[185] සඳහන් කරයි. අනුරාධ තෙරණුවෝ තමන් දුන් පිළිතුර නිවැරදි දැයි විමසීමට තථාගතයන් වහන්සේ හමුවූහ.

184 ස.නි. 4, පි.677 - 681; අනුරාධ සූත්‍රය.

185 -එම- පි.679.

රූපය නැත්තෙක්, වේදනා නැත්තෙක්, සඤ්ඤා, සංඛාර, .... විඥාන නැත්තෙක් සත්‍ය වශයෙන්, ස්ථිර වශයෙන් 'සත්ත්වයා' යයි නොපැනවේ නම් ඒ සියල්ල ප්‍රහීණ කොට උත්තම පුරුෂ, පරම පුරුෂ[186] ශ්‍රේෂ්ඨ ප්‍රාප්තියට පත් වූවකු මරණින් මතුවේ, නොවේ ආදී සතර කරුණින් පැනවීම කළ නොහැකි බව තථාගතයන් වහන්සේ අනුරුද්ධ තෙරණුවන්ට දැන්වූහ. ශාස්තෘ හා ශ්‍රාවක අදහස් සමාන විය. ගැළපිණ.

1. සත්ත්වයා මරණින් මතු වේ යන්න රූප මාත්‍රයකි.
2. සත්ත්වයා මරණින් මතු නොවේ යන්න ද රූප මාත්‍රයකි.
3. සත්ත්වයා මරණින් මතු වේ, නොවේ යන්න ද රූප මාත්‍රයෙකි.
4. සත්ත්වයා මරණින් මතු නොම වේ, නොම නොවේ යන්න ද රූප මාත්‍රයකි.

ආදී වශයෙන් සතරාකාර පැනවීම් රූප මාත්‍ර, වේදනා මාත්‍ර, සඤ්ඤා මාත්‍ර, සංඛාර මාත්‍ර, විඥාන මාත්‍ර වශයෙන් උපගත සූත්‍රයේ[187] දක්වන්නේ හේතු ප්‍රත්‍යය වශයෙනි.

කුතුහලශාලා සූත්‍රයේ එන පරිදි, වච්ඡට තථාගතයන් වහන්සේ කරුණු පැහැදිලි කරමින් "උපාදාන ඇත්තහුගේ උපත පනවමි. උපාදාන රහිත වූවහුගේ උපත නොපනවමි", යනුවෙන් උපත පිළිබඳ පැනවීම් දැක්වූහ. එහි දී දැක් වූ උපමාව ගින්න ය. ගිනි සිළ සුළඟින් මෙහෙයවන්නේ නම් එය වාතුපදාන යයි ද, එහි ද සුළඟ උපාදාන වන්නේ යයි ද දැක්වූහ.[188] දැඩි ලෙස අල්ලා ගැනීමෙන්, මාධ්‍යයක් ලෙස ක්‍රියා කොට උපකාර කිරීම නිසා සුළඟ ගින්නෙහි පැවැත්මට ආධාර විය.

186 ස.නි. 4, පි.683 - 685; උපගත සූත්‍රය.

187 ස.නි. 4, පි.703; කුතුහලශාලා සූත්‍රය.

188 ස.නි. 4, පි.702. පු.ප. පි.277.

මේ කය බහා තබා අන් කයකට නොපැමිණි කෙනකු වේ නම් ඔහු ද උපාදාන සහිත වේ.[189] ඒ 'තණ්හුපාදාන' හේතුවෙනි. එහෙත් රහතන් වහන්සේ උපාදාන රහිත වූවෙකු හෙයින් එසේ පැනවීම් නොකෙරේ.

ආත්මීයභාවය මුළුමනින් නසා දැමුවාට පසුව ද, යම් කලක් තිස්සේ පවත්නා වූ ජීවිතය රහතන් වහන්සේගේ ජීවිතය යි. 'උපාදිශේෂ', 'ඉතිරි වී ඇත්තා වූ දේ' වශයෙන් මෙය හැඳින් වේ. රහතන් වහන්සේගේ ආයු කාලය අවසන් වී කය බිඳී යෑමෙන් මෙය ද අවසන් වෙයි. රහතන් වහන්සේගේ මේ ජීවිතාවසානය 'මරණය' නොවේ. මරණය යන වචනය, 'ව්‍යවහාර ලෝකයේ' සම්මුතියට අනුව මෙලොවින් වෙන්වීමකි. එහෙත් ආර්යයන්ගේ දැකීමට අනුව ඒ මරණය නම් වූ වෙන්වීම (නැවත උපදින හෙයින්) තාවකාලික ය. රහතන් වහන්සේගේ පිරිනිවීම (මරණය) එවන් තාවකාලික ස්වභාවයක් නොවේ. ඒ අනුපාදිශේෂ නම් වූ ඉතිරියක් නැති[190] (නැවත උපතක් නැති මරණය) පිරිනිවීමකි. පුද්ගලයා හා ආත්මය පිළිබඳ ව තථාගතයන් වහන්සේගේ දේශනාව ඉතා පැහැදිලි වූවකි. ඒ දේශනාව ගැඹුරු වූ නමුත්, මානසික හැඩගැස්මක් සහිත වූවන්ට ඒ පහසුවෙන් වටහා ගත හැකි විය. මානසික හැඩගැස්මකින් තොරව, එම දේශනාව වටහා ගැනීමට තැත් කිරීමේ දී නැති අවුල් පටලවා ගත් පිරිස් වූහ. වර්තමානයේ දී ද ඇතැම් වියතුන්ගේ පොත්පත්වල එවැනි කරුණු සඳහන් වන බව අපගේ අවධානයට හසුවේ.

අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේ දී තථාගතයන් වහන්සේ නොදැනීමට හේතුව ප්‍රකාශ කළ හෙයින් අප ද එවැනි තන්හි දී නිහඬ විය යුතු වෙමු.

---

189 ස.නි. 4, පි.93; උපසේන සූත්‍රය. -එම- පි.133; ඡන්න සූත්‍රය. දී.නි. 1, පි.81; බ්‍රහ්මජාල සූත්‍රය.

190 ස.නි. 4, පි.691 - 697, -එම- පි.697.

තථාගතයන් වහන්සේ ඇතැමුන්ගේ ප්‍රශ්නවලට නිහඬ වූයේ[191] උන්වහන්සේ එය නොදන සිටි නිසාවත් දැයි ඇතැමුන් මතු කරන ලද බැවින් එහි ලා සුදුසු පිළිතුරු සැපයිය යුතු වේ. අව්‍යාකෘත ප්‍රශ්න සඳහා තථාගතයන් වහන්සේගේ දේශනා ඇතුළත් අබ්‍යාකත සංයුත්තයේ එන අදහස් මෙහි දී කෙටියෙන් සාකච්ඡා කිරීම අනුචිත නොවනු ඇත. වච්ඡගොත්ත පරිබ්‍රාජකයා[192] තථාගතයන් වහන්සේ වෙත පැමිණ සතුටු විය යුතු, සිහි කටයුතු කථා නිමවීමෙන් පසු ආත්මය ඇද්දැයි තථාගතයන් වහන්සේගෙන් විමසී ය. තථාගතයන් වහන්සේ නිශ්ශබ්ද වූහ. නැවතත් වච්ඡගොත්ත තථාගතයන් වහන්සේගෙන් ආත්මය නැද්දැයි විමසී ය. එහි දී ද තථාගතයන් වහන්සේ නිශ්ශබ්ද වූහ. මඳ වේලාවකින් වච්ඡගොත්ත හුනස්නෙන් නැගිට පිටත්ව ගියේ ය. වච්ඡගොත්ත නැගිට ගිය පසු ඔහුගේ පැනයන්ට පිළිතුරු නොදුන්නේ මන්දැයි ආනන්ද හිමියෝ තථාගතයන් වහන්සේගෙන් විමසූ හ.

"ආනන්දය, ආත්මය ඇද්දැයි මගෙන් විමසූ විට මම ද ආත්මය ඇතැයි කීවේ නම් ඒ ශාස්වතවාදයට වැටෙන්නේ ය. මෙය ඔවුන්ගේ ලබ්ධිය ය. ආත්මය නැද්දැයි විමසූ විට, ආත්මය නැතැයි කීවේ නම් උච්ඡේදවාදී බමුණන්ගේ ලබ්ධියට වැටෙන්නේ ය. ආත්මය ඇතැයි වච්ඡගොත්තයන්ට පැවසූයේ නම්, සියලු ධර්මයන් අනාත්මය යි පවසා නුවණින් ඒ සැලකිය යුතුය යි දක්වන ස්වභාවයට නොගැළපේ. ආත්මය නැතැයි කීවේ නම් වච්ඡගොත්ත කලින් තමන්ට ආත්මය පැවති නමුත් දැන් ඒ නැතැයි මුළා විය හැකි ය."යි තථාගතයන් වහන්සේ පැවසූ හ.

තථාගතයන් වහන්සේගේ අනාත්ම දේශනාව අත්ථත්ත' හෝ 'නත්ථත්ත' හෝ නොවේය යන්න වච්ඡගොත්ත හා සම්බන්ධ ඉහත පුවතින් පෙනේ.[193] එහි දී නුවණින් දැකිය යුතු '**සබ්බෙ**

191 ස.නි. 4, පි.705; අත්ථත්ත සූත්‍රය.

192 ස.නි. 4, පි.704.

193 ථෙර., පි.180. -එම- පි.181 -එම- පි. 704.

**ධම්මා අන්තතාති'** යන්න[194] අත්ථත්ත නම් වූ ආත්ම ස්වභාවය පැවතීම හෝ නත්ථත්ත නම් වූ ආත්ම ස්වභාවය නොපැවතීම හෝ නොවේ.

සියලු ධර්මයන් කෙරෙහි පවතින අනාත්ම ස්වභාවය[195] වන්නේ ආත්මයන් කෙරෙහි පවතින්නේ යයි ආත්මවාදීන් ප්‍රකාශ කළ නිත්‍ය, ශුභ, සුඛ නම් වූ ලක්ෂණ නොමැතිවීම ය. එහෙයින් 'අත්‍ථත්ත' හා 'නත්‍ථත්ත', අනත්ත යන්නෙන් වෙන් කොට හඳුනා ගත යුතු ය. මෙහි 'අනත්ත' යන්නෙන්[196] පැවසෙන්නේ ඇසය, රූපයය, චක්ඛු විඤ්ඤාණයය, චක්ඛු සම්ඵස්සය නම් වූ ඇස් පහසය, යන සතරය. එහි ඇස නිසා ඇතිවන පුද්ගල ස්වභාවය 'අනත්ත' යයි ගැනීමෙන් දුක හා අනිත්‍යය ද හඳුනා ගත හැකි ය.

සංයුත්ත නිකායේ අඤ්ඤතිත්‍ථිය[197] පෙය්‍යාලයයේ එන බොහෝ සූත්‍රවලින් තථාගතයන් වහන්සේ වෙත බඹසර රකින්නේ මන්ද යන්න පැහැදිලි කළ යුතු ආකාරය දක්වා තිබේ. එහි දී රාගය දුරලීම, සංයෝජන ප්‍රහාණය, ආසුව ක්ෂය කිරීම මාර්ග හා ඵල පසක් කිරීම, ඥාන දර්ශනය, උපාදාන රහිත ව පිරිනිවීම යනාදී සෑම දෙයකට ම මගක් ඇති බවත්, ඒ මග අරි අටඟි මඟ (ආර්යය අෂ්ටාංගික මාර්ගය) බවත් තථාගත ශ්‍රාවකයන් විසින් පැවසිය යුතු විය.

ඒ අරි අටඟි මඟ සඳහා කළණ මිතුරන් ඇති බවත්, ශීලය, ඡන්දය, චිත්ත සමෘද්ධිය, අප්‍රමාදය හා යොනිසො මනසිකාරය යන ඒවා පෙරනිමිති වන බවත් ය.

මෙම පරිච්ඡේදය නිම කිරීමට මත්තෙන් ප්‍රශ්න දෙකකට ඉතා සංක්ෂිප්ත ව පිළිතුරු සැපයිය යුතු වේ. මේ කය හැරපීම සඳහා කොතෙක් ධර්මයන් උපකාරී වේ ද යන්න ඉන් පළමුවැන්න ය.

---

194 ස.4, පි.111 - 113; අනත්ත සූත්‍රය.

195 ස.නි. 5 -1, පි.44 - 49. ස.නි. 4, පි.255. ස.නි. 5 - 1, පි.99.

196 ම.නි. 1, පි.695; මහා වෙදල්ල සූත්‍රය. -එම- පි.694.

197 -එම - පි. 695, 708 - 711. -එම- පි.709, ම.නි. 1, පි.708.

ඊට පිළිතුරු වශයෙන් විය යුත්තේ ආයුෂය, උස්ම හා විඥානය යන තුන ය. උස්ම ආයු නිසාත්, ආයු උස්ම නිසාත් පවතින බව මහා වෙදල්ල සූත්‍රයේ[198] සඳහන් වේ. 'විඥානය නොමැති කය වියළී කාෂ්ටයක් සේ බිම පතිත වේ' යන්න අනුව මිනිස් ජීවිතයේ පැවැත්ම වටහා ගත යුතු ය.

සඤ්ඤාවෙදයිත නිරෝධයට පත් වූවහුගේ හා මළහුගේ වෙනස දත හැකි ද යන්න දෙවන පැනය ය.[199] යම් කිසිවකු (මළ විට) කළුරිය කිරීමේ දී ආශ්වාස ප්‍රශ්වාස කිරීම නතර වෙයි. නිරුද්ධ වෙයි. විතර්ක, විචාර ද නවතී. සංඥා වේදනාදීන් ද නොවේ. ආයු ක්ෂීණ වෙයි. උස්ම සන්සිඳෙයි, ඉඳුරන් ද නැසුණේ වෙයි.

එහෙත් සඤ්ඤාවේදයිත නිරෝධයට සමවැදීමේ දී කාය සංසකාර, වචී සංසකාර, චිත්ත සංස්කාර නිරුද්ධ වුව ද, ආයු අපරික්ෂණ වෙයි. උස්ම අව්‍යුපශාන්ත වෙයි. ඉන්ද්‍රියයෝ ද විප්‍රසන්න වෙති. මළා සේ පෙනුණේ වී නමුත් නොමළේ ය. සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියට සමවදින රහතන් වහන්සේ විඳින සුවය, සුව වේදනාවක් ම නොවේ. එය, 'යමක් සුව ද, ඒ සුවය බව' තථාගතයන් වහන්සේ පඤ්චකඬ්ග සූත්‍රයේ දී[200] වදාළ හ.

සංයුත්ත නිකායේ නිරාමිස සූත්‍රය;[201] ප්‍රීතිය, සුවය, උපේක්ෂාව හා විමෝක්ෂය යනුවෙන්, අප නොයෙකුත් අවස්ථාවල දී සාකච්ඡා කළ පිරිසිදු පුද්ගලයින් අත්දැකීම් ලබන සුවය පිළිබඳ විග්‍රහයක් කරයි. එහි දී ප්‍රීතිය, සුවය, උපේක්ෂාව හා විමෝක්ෂය යන ඒ එක් එක් කරුණ සාමිස, නිරාමිස හා නිරාමිස්තර යනුවෙන් නැවතත් බෙදා දක්වන ලදි.

---

198 ස.නි. 4, පි.639 - 541.

199 ස.නි. 4, පි.431. ස.නි. 4, පි.430. ස.නි. 4, පි.251.

200 ස.නි. 4, පි.445 - 449; නිරාමිස සූත්‍රය.

201 ස.නි. 4, පි.399.

සාමිස ප්‍රීතිය නිරාමිස ප්‍රීතිය, නිරාමිස්තර ප්‍රීතිය;

සාමිස සුවය, නිරාමිස සුවය, නිරාමිස්තර සුවය;

සාමිස උපේක්ෂාව, නිරාමිස උපේක්ෂාව, නිරාමිස්තර උපේක්ෂාව;

සාමිස විමෝක්ෂය, නිරාමිස විමෝක්ෂය, නිරාමිස්තර විමෝක්ෂය;

යනුවෙන් දොළොස් ආකාර කොට පනවනු ලැබී ය. එහි දී නිරාමිස්තර ප්‍රීතිය, නිරාමිස්තර සුවය, නිරාමිස්තර උපේක්ෂාව, නිරාමිස්තර විමෝක්ෂය යන සුවයන් රාග, දෝස, මෝහයන් ගෙන් මිදුණු, එනම්; නිවන් සුවය ලද රහතන් වහන්සේට ම පමණක් ලද හැකි සුවයන් ය. රහතන් වහන්සේ සුව, දුක් හා නොදුක්, නොසුව (මැදහත්) වේදනා විඳින්නේ කෙලසුන්ගෙන් වෙන් ව ම විඳී.[202] ඒවා අනිස, නොබැස ගන්නා ලද, නොපිළිග න්නා ලද දෑ බව දනගනී.[203] සිහි ඇතිව වෙසෙන රහත් මහණ කාලය ම අපේක්ෂා කරමින් නව විධ මානයෙහි නොසැලී සිටී.[204] ප්‍රඥායෙහි පරතෙරට පැමිණි, මහත් බුද්ධිමත් සැරියුත් හිමි බුද්ධි හීන නොවූයේ මැ බුද්ධි හීනයකු බඳුව හැසිරුණේ බැලයට මෙහෙ කරන කාලය අපේක්ෂා කළ සේවකයකු මෙනි.[205]

රහත් මහණ තෙමේ, යමක් දකිමින් තථාගතයන් කෙරෙහි හෝ තථාගත සස්නෙහි හෝ ඉතා යටහත්ව පවත්නේ, පවතී නම් මේ ඒ අනුත්තර වූ රහත් බව ය. "රහත් මහණ, ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත ව, වැඩිහිටියෙකු සහිත ව වෙසෙති. ධර්මය කෙරෙහි ගෞරව සහිත ව වැඩිහිටියකු සහිත ව වෙසෙති. සංඝයා කෙරෙහි ගෞරව සහිත ව, වැඩිහිටියකු

202 -එම- පි.403.

203 -එම- පි.399, ථෙර., පි.247.

204 ථෙර., පි.233 -එම- පි.237, 247.

205 ස.නි. 5 - 1, පි.411; සූකරඛත සූත්‍රය. ථෙර., පි.107, සුමන ස්ථවිර ගාථා. බ.ද., පි.534 - 537.

සහිත ව වෙසෙති. සමාධියෙහි ගෞරව සහිත ව, වැඩිහිටියෙකු සහිත ව වෙසෙති,"

යනුවෙන් සැරියුත් හිමි, රහත් හිමි නමක් තුළ පැවතිය යුතු යටහත් බව පැහැදිලි කළ විට තථාගතයන් වහන්සේ ඒ යටහත් බව ඉතා යටහත් බව ලෙස අනුමත කළ හ.[206]

මුගලන් හිමියෝ මහත් ඍද්ධි සම්පන්න වූහ. උඩඟු රළු වදන් සහිත දොඩමලු භික්ෂූන් හික්මවීම සඳහා තථාගතයන් වහන්සේගේ ඉල්ලීමෙන් දිනක් උන්වහන්සේ මුවරමාපාය මහපටැඟිල්ලෙන් සොලවා එකී භික්ෂූන් සංවේගයට පත් කළ හ.[207]

උන්වහන්සේගේ ඍද්ධි බලය නිසා කෝටි ලක්ෂයක් ආත්ම භාවයන් ඇසිල්ලෙන් මැවිය හැකි විය.[208] බඹලොවට පැමිණිය හැකි කිසියම් මහණ බමුණු කෙනෙක් නැතැයි පැවති මහ බඹුගේ දෘෂ්ටිය බිඳ හෙළීමට බඹලොව සැරිසැරූ තථාගතයන් වහන්සේ හා ශ්‍රාවක සංඝයා ද සමත් වූ හෙයින් මුගලන් හිමියෝ ද ඔහුට එහි ලා අභියෝග කළ හ.

සහශ්‍රී ලෝක ධාතුව ඇසිල්ලකින් සාක්ෂාත් කොට බ්‍රහ්මයා හා සදෘශ විය. ඍද්ධිමත් මුගලන් හිමි, "මම බාලයකු දවමැ යි ගින්න නොසිතන නමුත් බාලයා ගින්න ගටා දැවේ", යයි මරුට ද තර්ජනය කළ හ.[209] රසකිඳ වැලක් බිඳින ඇතෙකු සේ කෙලෙස් සුවසේ බිඳ දැමූ උන්වහන්සේ ද, ඉතා යටහත් බුද්ධ ශ්‍රාවකයෙක් වූහ.

'මම' ය, 'මගේ' ය, 'මගේ පැවැත්මය' ලෙස දැක්විය හැකි යම් දෙයක් ඇතොත් ඒ (භාවෙකුගේ) හා අඟක් (ශශවිෂාණ) වැනි

206 ථෙර., පි.265; ගාථා අංක 1175; ස.නි. 5-2, පි.27 - 29.

207 -එම- පි.269; ගාථා අංක 1191 - 1195; -එම- පි.271, ගාථා අංක 1200 - 1211.

208 ථෙර., පි.272, ගාථා අංක 1215.

209 අ.නි. 2, පි.76.

නැති දෙයක් පිළිබඳ ව්‍යවහාරයකි. මහා පුරුෂ,[210] උත්තම පුරුෂ වශයෙන් අප සඳහන් කරන පුද්ගලයන් පිළිබඳ ව ද එසේ ම ය.

මෙම පරිච්ඡේදයේ දී අප ඉදිරිපත් කළ සංවර්ධිත පුද්ගලයා පිළිබඳ සංකල්පයෙන් පැහැදිලි විය යුත්තේ ව්‍යවහාරයේ දී පවතින නමුත් සත්‍ය වශයෙන්, පරමාර්ථ වශයෙන් දැක්විය නොහැකි[211] සංවර්ධිත පුද්ගලයෙකි.

සංවර්ධිත පුද්ගලයෙක් සිටී. එහෙත් ඒ සංවර්ධිත පුද්ගලයා 'මම', 'මාගේ', හා 'මාගේ පැවැත්ම' යන ව්‍යවහාරයන්ගෙන් ඈත් වූ,[212] කිසිම මිනුමකට හසු නොවන,[213] හසුකර ගත නොහැකි මහා පුරුෂ[214] නම් වූ පිරිසිදු ස්කන්ධ පොදියක් පමණි.

210 කථා, පි.189; මි.ප., පි.33 - 35. කථා., පි.188.

211 ස.නි. 5 - 1, පි.127; විධා සූත්‍රය. ස.නි. 4, පි.389.

212 ස.නි. 5 - 2, පි.25. ථෙර., පි.245 - 247, 259 - 261.

213 ස.නි. 5 -1, පි.287; දී.2, පි. 102. ථෙර., පි.262.

214 ස.නි. 5 -1, පි.288.

# නිගමනය

පුද්ගලයා සදාචාරමය වශයෙන් කෙලෙසීමට හේතුවන මූලික ධර්ම තුනෙකි. ලෝභ, ද්වේශ, මෝහ යන හේතු තුන යි. එසේ ම පිරිසිදුවීමට හේතුවන ධර්ම තුනෙකි. එනම් අලෝභ, අදෝස, අමෝහ යන ධර්ම තුන යි. ලෝභය, රාගය, නන්දිය, තණ්හාව, ආශා පිපාසා ආදී සිය දහස් ගණන් නම්වලින් ඒ ඒ අවස්ථාව අනුව හැඳින් වේ. එසේ ම කුශල ධර්ම ද ඒ ඒ අවස්ථා අනුව විවිධ නම්වලින් හැඳින්වෙයි.

පුද්ගලයා පිළිබඳ ප්‍රශ්නයේ දී ක්‍රියාකාරී වන ධර්මතා භෞතික ලෝකයෙහි ධර්මයන් ගේ ක්‍රියාකාරීත්වයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. ඒ වෙනස වූ කලී පුද්ගලයා ගේ නාම ධර්මයන්හි ප්‍රමුඛත්වය දරන 'චිත්ත මනෝ, විඤ්ඤාණ නමින් හැඳින්වෙන මානසික ක්‍රියාකාරීත්වය යි. එකී මානසික ක්‍රියාකාරීත්වයට එම ක්‍රියාකාරීත්වයත් හසුරුවා ගැනීමේ ශක්තියක් ද ස්වභාවික ව හිමි වී ඇත. එයට බටහිර දර්ශනයේ 'ස්වච්ඡන්දතාව' යැයි කියනු ලැබේ. ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ජීවිතේන්ද්‍රිය, මනසිකාර යන ධර්මයන් ගේ එකතුව නිසා මෙකී සජීවී ලක්ෂණය පහළ වේ යැයි සිතිය හැකි ය. සත්ත්වයෙක්, පුද්ගලයෙක් වූකලී අහේතුක ව ගලා යන ධර්මතා සන්තතියක් නො වේ. සත්ත්වයකු පුද්ගලයකු තුළ ඇති ධර්මතා හැසිරවීමේ මානසික ශක්තියක් එකී ධර්මතාවන්ට හිමි ව පවතී.

පුද්ගලයා ගේ චර්යා ධර්මයන් යනුවෙන් මෙකී ශක්තියෙහි ක්‍රියාකාරීත්වය හැඳින්විය හැකි ය. එම ධර්මයන් නිසි මඟට

ගැනීම කල්‍යාණ මිත්‍රයන් නිසා සිදු වේ. එසේ නැති තැන ඒවා අසංඛාරිකව ඒ ධර්ම සමූහයට අයත් පුද්ගලයා ගේ ස්වච්ඡන්දතා තීරණයන් අනුව සිදු වේ. ඒ වූකලී ආත්මදමන, ශීලය, සංවරය ආදී නම්වලින් හැඳින්වෙන ක්‍රියාකාරීත්වය යි.

දඬුවම හා වරප්‍රසාදය පිළිබඳ සංකල්පය බුදුසමයෙහි නැත. ඒ වෙනුවට කර්මය හා විපාකය පවතී. කර්මය ශෝභන වූ විට කුශලයක් වේ. එය පිනකි. එකී ප්‍රතිඵලය පුද්ගල ඒකකයෙහි කිසියම් ප්‍රගතියක් සලසා දෙයි. එයට ප්‍රතිවිරුද්ධ වූ පුද්ගලයා ගේ පරිහානිය සිදුකරනු ලබන කර්ම හෙවත් 'සංඛාර' අකුසල වශයෙන් හැඳින් වේ. අකුශලයන් ගේ ස්වභාවය, පුද්ගල ඒකකයේ ඉදිරි ගමන වළකාලීම යි. පුද්ගල ඒකකයක් තුළ පවත්නා මේ ස්වභාවය වටහා ගැනීම 'නිස්සත්ත නිජ්ජීව ධර්මය' වටහා ගැනීමකි. ආධ්‍යාත්මික, මානසික ධර්මයන් ගේ සහජතාවන්, භෞතික ධර්මයන් ගේ භෞතික ධර්මයන් ගේ සහජතාවන්ට වෙනස් වුව ද ඒවායේ ද පාරම්පරික ලක්ෂණ පවතී. සත්ත්වයකු ගේ සසර ගමන ඔහුගේ කුශල අකුශල ධර්ම විමුක්ති පරිපාචිනීය ධර්ම හා පාරමිතා යනුවෙන් හැඳින්වෙන්නේ පුද්ගලයා තුළ ගමන් කරන මානසික ධර්ම සන්තතියක ය.

බෞද්ධ සංකල්පය හා ආචාර ධර්ම අතර ගැටුමක් ඇතැයි බැලූ බැල්මට පෙනී යයි. එහෙත් බුදුන්වහන්සේ ස්වකීය ධර්මය දාර්ශනික ලෝකයට නොව, සදාචාර ධර්මයන් වැදගත් කොට සලකන සත්පුරුෂ සමාජයකට උචිත වන ආකාරයෙන් දේශනා කළ හෙයින් එහි දී ගැටලුව ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ගිහි සමාජයට අවශ්‍ය පුද්ගලික හා සාමූහික ආචාරධර්ම මංගල, පරාභව, ව්‍යග්ගපජ්ජ, සිගාලෝවාද වැනි සූත්‍රවලිනුත්, අග්ගඤ්ඤ චක්කවත්තිසීහනාද වැනි සූත්‍රයන්ගෙනුත් හෙළිකර දී ඇත. නිස්සත්ත, නිජ්ජීව හා අනාත්ම ධර්මයන් පිළිබඳ ඉගැන්වීම්වලට පටහැනි නොවන ආචාර ධර්ම සන්තතියක් ඒ මගින් ඇති කොට ඇත. කවර වර්ගයක පුද්ගලයකුට වුව ද හානියක්, බාධාවක්,

ගැහැටක්, චිත්ත පීඩාවක් සිදුවේ නම් එය බෞද්ධ ආචාර ධර්ම අනුව වරදකි.

කවර සත්ත්ව ඒකකයකට වුව ද ජීවත්වීමට මඟක්, සැපවත් වීමට මඟක්, දියුණුවීමට මඟක්, ප්‍රීතියට, ආරක්ෂාවට මඟක් සැලසේ නම් එය පිළිගත හැකි ආචාර ධර්මයකි. ආචාර ධර්මයන් මේ මේ යයි තීරණය කිරීම සඳහා විශේෂ බලධාරියෙකු බුදුසමය නොපිළිගනී. කිසිවකු විසින් පනවන ලද නීතියක් හෝ ප්‍රතිපත්තියක් නිසා පුද්ගලයකුට හානියක් වන කරුණක් නිවැරැද්දක් බවට පත් නොවේ. එසේ ම පුද්ගලයකු ගේ ප්‍රීතියට හා යහපතට හේතුවන කරුණක් වරදක් වශයෙන් කිසිවකුටත් සම්මත කිරීමට බලයක් ඇතැයි බුදුසමයෙහි එන ආචාර ධර්ම අනුව පිළිගත හැකි නොවේ. ආචාර ධර්මයන් පනවන කෙනෙකු නැත. ආචාර ධර්ම අවලංගු කළ හැකි කෙනෙකු ද නැත. ඒවා ස්වභාවික ව, ඒවාට අයත් ස්වභාවික ලක්ෂණයන් අනුව හඳුනා ගත යුතු ය. හඳුනා ගෙන පවත්වාගෙන යා යුතු ය.

බුදුන්වහන්සේ ආචාර ධර්ම හෝ වෙනත් ධර්ම විශේෂයක් ඇති කරවන්නෙකු නොවේ. නැති කරන්නෙකු ද නො වේ. උන්වහන්සේ ඒවා ප්‍රකාශ කරන්නෙකු පමණෙකි. බුදුවරයෙකු පහළ වුවත්, නැතත් ආචාර ධර්මයන් ගේ පැවැත්ම සිදු වේ. ආචාර ධර්මයන් නිවැරදි ව වටහා ගැනීමේ ශක්තිය බුදුවරයන් වහන්සේලාට විශේෂයෙන් ඇත. උන්වහන්සේලාට පමණක් නොව, එය සියලු ම මිනිසුන්ට ද පොදුවේ පිහිටා ඇත. සමාජයට ආචාර ධර්ම මේ මේවා යැයි තීරණය කරන විශේෂ බලධාරියෙකු ද නැත. මිනිස් මොළය වූකලී ආචාරධර්ම තීරණය කිරීමේ ප්‍රධාන උපකරණය යි. මිනිස් බුද්ධියට ඇති විශේෂ ශක්තිය වූකලී, හොඳ නරක, කළයුතු, නොකළ යුතු දේ හා යුක්තිය, අයුක්තිය මැනීමේ ශක්තිය යි. ඒ නිසා ආචාරධර්මයන් ගේ සම්භව ස්ථානය වශයෙන් මිනිස් සමාජය පෙන්වා දීම වඩා සුදුසු ය.

මිනිස් හැසිරීම් පාලනය වන්නේ ආචාර ධර්මයන් මගිනි. බුදුදහම පෙන්වා දෙන පරිදි 'ධම්ම' යන වචනයට සමාන

අර්ථවත් තවත් වචන බොහෝ සූත්‍රවල දක්නට ලැබේ. ඒ වූකලී 'සමධම්ම චරියා' යන්නෙන් ද 'සමචරියා' යන්නෙන් ද ප්‍රකාශ වේ. එහි විරුද්ධාර්ථ වචන අධර්මචරියා, විෂම චරියා යන දෙක ය. අධර්ම චර්යාවක් නම් එය විෂම චර්යාවක් වේ. විෂම චර්යාවක් නම් එය සමබරකම නැති කරන හැසිරීමකි. සමාජයේ සමබරතාව පවතින්නේ ඒ සමාජයට අයත් පුද්ගලයන් අන්‍යෝන්‍යයන්ගේ පැවැත්මට බාධක වන ක්‍රියාවලින් වළකින අතර ම, අන්‍යෝන්‍යයන් ගේ යහපැවැත්මට උපකාරී වන පැවතුම්වලින් යුක්තවීමෙනි. සමචර්යාව යන්න පැත්තකට බර නො වී, සමබර ව තිබීම කිසියම් දෙයක් මහ පොළොව මත කඩා නො වැටී පැවතීමට නම් එය සමබර ව තිබිය යුතු ය. මිනිසෙකුට හෝ සතෙකුට ගමන් කළ හැක්කේ ශරීරයෙහි සමබරතා පවත්වා ගනිමින් ඔහුගේ අවයව :ඛසපතී* සමබර ව සිටින්නා සේ, ශරීරය හසුරුවා ගන්නේ නම් පමණි. ගමන් කරන කෙනෙකු අත් පා සොළවන්නේ සමබර බව රැක ගැනීමට ය. සතුන් පමණක් නො ව මහ පොළොව පවා ග්‍රහ මණ්ඩලයෙහි නියමිත මාර්ගයෙහි :ධරඉසඑ* ගමන් කරනුයේ එයට අයත් සමබරතාව පවත්වා ගැනීමෙනි. මේ නිසා සමබරතාවෙහි ඇති ආධ්‍යාත්මික හා භෞතික වැදගත්කම පෙනී යයි.

බොහෝ දෙනෙකු ආචාර ධර්ම දෙස බලන්නේ පාලකයින්ට ස්වකීය ජනතාව පාලනය කර ගැනීම සඳහා ආගමික නායකයින්ගේ මගින් ඇති කරගත් නීති පද්ධතියක් වශයෙනි. බෞද්ධ ආචාර ධර්ම සම්බන්ධයෙන් මේ අර්ථවිවරණය සම්පූර්ණයෙන් ම වැරදි ය. බෞද්ධ ආචාර ධර්මහන්හි සැකැස්ම හා පැවැත්ම පිළිබඳ ස්වභාවික සිද්ධාන්තයන්ට අනුරූප ව සනාතනික ලෝක ධර්මයකට අනුව සකස් වූවකි. එය කිසිවකු විසින් සකස් කරන ලද්දක් නො වේ.

ආචාර ධර්මයන් හඳුනා ගැනීමේ දී හා ඒවා ක්‍රියාත්මක කිරීමේ දී 'හිරි-ඔත්තප්ප' නමින් හඳුන්වන ලජ්ජාව හා භය දෙක පෙන්වා දීම සුදුසු ය. ඒවාට ලෝක පාලක ධර්ම යැයි කියනු ලැබේ.

ලෝක පාලක ධර්ම මිස ලෝක පාලක දෙවි කෙනෙකු පිළිබඳ මතයත් බුදුසමය ඉදිරිපත් නොකර යි. ධර්මය යනු ලොව පවතින ස්වභාවික නීතිය යි. එය හඳුනා ගැනීම මිස, ධර්මයක් ඇති කිරීම කිසිවකුටත් කළ හැක්කක් නො වේ. බෞද්ධ ආචාර ධර්ම මගින් සිදුකර ඇත්තේ මිනිස් සමාජයේ හා සත්ත්ව සමාජයේ පැවැත්මට අනුකූල වන චර්යා ධර්ම පද්ධතියක් පෙන්වා දීමයි. එහෙත් අනිශ්වරවාදී සංකල්පය බෞද්ධ දර්ශනයෙහි පමණක් එන්නකි. බෞද්ධ චර්යා ධර්මවලට අනුව වරදක් කළ විට එයින් කිළුටට පත්වන්නේ පළමු කොට ම තමා ය. (අත්තනාව කතං පාපං අත්තානං සංකිලිස්සති) දෙවනු ව, කිසියම් ක්‍රියාවක් වරදක් වූ විට එම ක්‍රියාව සමාජ දූෂණයට ද තුඩු දෙයි. පැවැත්ම පිළිබඳ නීතිය ධර්මය වශයෙන් (ආචාර ධර්ම සම්බන්ධයෙන් ධර්ම ශබ්දය භාවිත කිරීමේ දී වටහා ගැනීම) ගත යුතු ය.

'ධම්ම' යන වචනයට දී ඇති අර්ථයන් අතර, 'දරා සිටීමේ ශක්තිය' යන අර්ථය ද ඇත. පළමු කොට ම පුද්ගලයකු ගේ යහපත් පැවැත්ම ධර්මය මගින් සිදුකෙරේ. එසේ ම පුද්ගලයා ගේ ආරක්ෂාව ධර්මය මගින් ම සිදු වේ. පුද්ගලයා පමණක් නො ව පවුල ද, සමාජය ද, රට ද, ලෝකය ද මැනවින් පැවතීමට නම් ධර්මයක් අවශ්‍ය ය. එහි දී ධර්මය යනුවෙන් හැඳින්වෙන්නේ ආචාර ධර්ම යි. පුද්ගලික යුතුකම් හා අයිතිවාසිකම් ද රජය සතු අයිතිවාසිකම් ද මැනවින් බෙදා දැක්වීමට අනාත්මවාදී දර්ශනය බාධාවක් වී නැත.

එසේ ම භික්ෂු සංඝයා උදෙසා ඇති කළ සංඝ සමාජය වැඩිදුරටත් ස්වකීය අනාත්මවාදී දර්ශනයට හා නික්ලේශීත්වය හා පිළිබඳ චර්යා ධර්මයන්ට අනුරූප වන ලෙසින් සකස් කොට ඇත. අභිනිෂ්ක්‍රමණයෙන් පැවිදි ජීවිතයට පත් භික්ෂුවක් ආශාවන් නැති කරන පෞද්ගලිකත්වය ලිහිල් කරන, ආර්ථික හා සාමාජික ලක්ෂණයන්ගෙන් යුත්, සංඝ සංවිධානයට ඇතුළත් කොට ඇත. මෙම සංවිධානය පිළිබඳ ආශාවන් වර්ධනය වීමට ඉඩ සලසා නැත. එසේ ම තරගයෙන් අන්‍යෝන්‍යයන් පරදවා යාමේ විෂම

ලෝභයට එහි ඉඩක් නැත. භික්ෂු ජීවිතයට ආවේණික සමථ විදර්ශනා භාවනා හා ප්‍රත්‍යවේක්ෂා මගින් ආත්මවාදී මූලාවට ඇති ඉඩ එහි අවුරා ඇත.

'මම', 'මගේ' වශයෙන් පෙනී සිටින සත්ත්ව පුද්ගලයන් තුළ ඇති එකී, 'මම', 'මගේ' බව දියකර හැරීමෙන් 'පුද්ගලත්වයෙන්' තොර 'සංවර්ධිතයෙක්' හා 'සංවර්ධිත සමාජයක්' බිහි කළ හැකි බව ය. එහිලා බුදුසමයෙහි එන ක්‍රියාමාර්ගය සම්පූර්ණයෙන් ම බෞද්ධ ආචාර ධර්ම පිළිබඳ සංග්‍රහයකි. පස් පව් හෙවත් පංච ශීලය, දස අකුසල්, ආර්ය අෂ්ටාංගික මාර්ගය, සතර සංග්‍රහ වස්තු, දස පින්කිරියවත්, දස රාජ ධර්ම, දස පාරමිතා, දස චක්‍රවර්තිවත් යන මේ සියල්ලට ම පදනම් වී ඇත්තේ බෞද්ධ ආචාර ධර්ම යි.

චූල රාහුලෝවාද සූත්‍රය, සාලෙය්‍යක හා කාලාම සූත්‍රය යන සූත්‍රවල දී බෞද්ධ ආචාර ධර්මයන් ගේ පදනම කුමක් ද යන්න කොටස් හතරකින් පැහැදිලි කර දී ඇත.

i. යම් ක්‍රියාවක් තමා නමැති පුද්ගල ඒකකයට හානි පමුණුවන්නේ නම් එය නොකළ යුතු ය.

ii. යම් ක්‍රියාවක් අනුන් නමැති පුද්ගල ඒකකයට හානි පමුණුවන්නේ නම්, එය නොකළ යුතු ය.

iii. යම් ක්‍රියාවක් තමා නමැති පුද්ගල ඒකකයේ යහපත පිණිස පවතී නම් ඒ කළ යුතු ය.

iv. යම් ක්‍රියාවක් අනුන් නමැති පුද්ගල ඒකකයේ යහපත පිණිස පවතී නම්, එය කළ යුතු ය.

කළ යුතු නොකළ යුතු ක්‍රියාවන් වෙන් කොට හඳුනා ගැනීමක් මෙකී ආචාර ධර්ම පිළිබඳ නීතිය යටතේ තීරණය වෙයි. සංවර්ධිතයන්ගෙන් පිරුණු සංවර්ධිත සමාජය කෙබඳු දැයි චක්‍රවර්ති රජෙකුගේ රාජ්‍යය අර්ථ දැක් වූ සූත්‍රවලින් වටහා ගත හැකි ය. එහි මිනිසුන් පමණක් නො ව මෘග පක්ෂීන්ට පවා අභය දානය ලැබුණ ආකාරය සඳහන් වේ. ධර්මයට අධිපති ධම්මරාජන්

වූ රජතුමා නිසා රජ පවුලේ පටන් සියල්ලෝ ම ධාර්මික වෙති. කලට වැසි වැස ධාන්‍ය සුලබ වෙති. ජීවිකාව පහසු වෙති. සුඛිත මුදිත ජනයා ප්‍රීති ප්‍රමෝදිත වෙති.

මහා සම්මත රජ පිළිබඳ පුරාවෘත්තියේ දී සමාජයේ පැවැත්ම තර්ජනයට භාජන වූ විට නීති සහ ආචාර ධර්ම මිනිසුන් අතරින් ම පැන නැගුණ බැවින් ඒවා ගැන සොයා බැලීමට අවශ්‍ය පුද්ගලයකු මිනිසුන් විසින් ම පත් කළ හැටි පෙන්වා දී ඇත. ඒ නිසා බෞද්ධ ආචාර ධර්ම දෙස බැලිය යුත්තේ ස්වයංක්‍රීය ව, ස්වයං සිද්ධ ව පවතින ලෝකයෙහි, සත්ත්ව ප්‍රජාව ගේ හා විශේෂයෙන් මනුෂ්‍ය ප්‍රජාව ගේ සුඛිත - මුදිත පැවැත්මට අවශ්‍ය වන හැසිරීම් පද්ධතියක් වශයෙනි. එසේ සකස් වූ බෞද්ධ ආචාර ධර්ම අරමුණ බොහෝ දෙනාට සැප පිණිස ය. බොහෝ දෙනාට හිත පිණිස ය. අර්ථය හා ධර්මය පිණිස ය.

පුද්ගලයා පිළිබඳ බෞද්ධ සංකල්පය මෙබඳු යැයි නිශ්චිත ව හඳුනා ගෙන විග්‍රහ කිරීම වූ කලී මහත් වූ අසීරු කරුණෙකි. මේ පිළිබඳ මෙතෙක් කර ඇති පර්යේෂණ තුළින් ද කිසියම් උත්සාහයක් කිසිවකු විසින් දරා ඇති බවක් ද අවිද්‍යමාන ය. මෙවැනි සංකල්ප විග්‍රහයේ දී නිෂ්ටප්‍රාප්තියක් හෙවත් පරම නිෂ්ටාවක් අපේක්ෂා කරන්නේ නම් එය ද එතරම් ප්‍රඥා සම්පන්න නොවන බව අපගේ හැඟීම යි. කෙසේ වෙතත් මෙවැනි ප්‍රස්තුතයක ආවසානික නිගමනයක් අපේක්ෂා කරනවාට වඩා අදාළ ප්‍රස්තුතය කිසියම් දුරකට නිරවුල් ව සාකච්ඡා කර තිබේදැයි සලකා බැලීම පමණක් මෙහි දී අවධානයට යොමු කිරීම සෑහේ යයි අවධාරණය කිරීම වඩාත් උචිත බව නිගමනය කරනු කැමැත්තෙමි.

මෙම පර්යේෂණයේ පිණ්ඩාර්ථය නාතිවිස්තරාත්මකව මෙසේ ගොනු කළ හැකිය. පුද්ගල සංකල්පය වූකලී බෞද්ධ සාහිත්‍යයේ එන සෙසු අචින්තනීය ධර්මයන් මෙන් ලෞකික භාෂා මාධ්‍යයෙන් මෙබඳු යැයි ප්‍රකාශනයට පත් කළ නොහැකි හුදෙක් අවබෝධය හා සබැඳෙන අනිර්වචනීය අවාච්‍යත්වයක් විද්‍යමාන

වන බව පමණක් සඳහන් කළ හැකිය. ඒ වූකලී ථේරවාද ධර්ම සාහිත්‍යය තුළ පරමාර්ථ වශයෙන් නොව සම්මුති වශයෙන් එන පදාර්ථ සමූහයක සංයුතියකි. එකී සම්මුති පුද්ගලයා හේතුඵල සමවායයෙන් දීර්ඝ සංසාරයක ගමන් කරන්නා වූ කිසියම් ආචාර ධර්ම සම්මුතියකට යටත් කරගනු ලබයි. ථේරවාද ආචාර ධර්ම අනුව ඔහුගේ සාංසාරික ගමන් මග කෙසේ තීරණය වන්නේදැයි පරීක්ෂා කිරීමත්, සදාචාර සම්මුතීන් තුළ ඔහුගේ ආධ්‍යාත්මික ගමන් මග කෙබඳුදැයි තීරණය කිරීමත් මේ තුළින් නිගමනය කොට ඇත. එසේ නම් ථේරවාද ආචාර විද්‍යාවේ මූලික පදනම වූකලී සම්මුති පුද්ගලයාගේ සසර ගමන නවතන නිර්වාණය නමැති පරමාර්ථ සත්‍යය අධිගමය උදෙසා පෙළ ගැන්වූවක් බව අවසානිත වශයෙන් නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

## (ප්‍රාථමික මූලාශ්‍ර)


1. අංගුත්තර නිකාය, ප්‍රථම භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 18, බුද්ධ ජයන්ති මුද්‍රණය, කොළඹ 1960.
2. අංගුත්තර නිකාය, ද්විතීය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 19, බුද්ධ ජයන්ති මුද්‍රණය, කොළඹ; 1962.
3. අංගුත්තර නිකාය, තෘතීය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 20, බුද්ධ ජයන්ති මුද්‍රණය, කොළඹ; 1968.
4. අපදාන පාළි, ත්‍රිපිටක ග්‍රන්ථ මාලා : 37-(2), බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1983.
5. කථාවත්ථුප්පකරණය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 44, බුද්ධ ජයන්ති මුද්‍රණය, කොළඹ; 1967
6. චුල්ලවග්ග පාළි, ප්‍රථම භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 5, බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1977.
7. චුල්ලවග්ගපාළි, ද්විතීය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 5-(2), බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1983.
8. ථෙර ගාථා පාළි, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 28, බුද්ධ ජයන්ති මුද්‍රණය, කොළඹ; 1972.
9. ථෙර ගාථා පාළි, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 29, බුද්ධ ජයන්ති මුද්‍රණය, ලංකාණ්ඩුවේ ප්‍රකාශන; 1962.
10. දීඝ නිකාය, ප්‍රථම භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 7, බුද්ධ ජයන්ති මුද්‍රණය, ලංකාණ්ඩුවේ ප්‍රකාශන; 1962.

11. දීඝ නිකාය, ද්වීතිය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 8, බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල, 1976.

12. දීඝ නිකාය, තෘතීය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 9, බුද්ධ ජයන්ති මුද්‍රණය, ලංකාණ්ඩුවේ ප්‍රකාශන; 1976.

13. පාරාජිකා පාළි, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 1, බුද්ධ ජයන්ති මුද්‍රණය, ලංකාණ්ඩුවේ ප්‍රකාශන; 1959.

14. පාචිත්තිය පාළි, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 2-(1), බුද්ධ ජයන්ති මුද්‍රණය, ලංකාණ්ඩුවේ ප්‍රකාශන; 1981.

15. පටිසම්භිදාමග්ගප්පකරණ, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 35, බුද්ධ ජයන්ති මුද්‍රණය, ස්වදේශීය, කොළඹ; 1971.

16. පරිවාර පාළි, ප්‍රථම භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 6, බුද්ධ ජයන්ති මුද්‍රණය, ලංකාණ්ඩුවේ ප්‍රකාශන; 1977.

17. පුග්ගල පඤ්ඤත්ති, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 47, බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1976.

18. පේතවත්ථු පාළි, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 27, බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1982.

19. මජ්ඣිම නිකාය, ප්‍රථම භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 10, බුද්ධ ජයන්ති මුද්‍රණය, මහාබෝධි, කොළඹ; 1964.

20. මජ්ඣිම නිකාය, ද්විතීය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 11, බුද්ධ ජයන්ති මුද්‍රණය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව; 1974.

21. මජ්ඣිම නිකාය, තෘතීය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 12, බුද්ධ ජයන්ති මුද්‍රණය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව; 1974.

22. මහාවග්ග පාළි, ප්‍රථම භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 3, බුද්ධ ජයන්ති මුද්‍රණය, මහාබෝධි, කොළඹ; 1957.

23. මහාවග්ග පාළි, ද්විතීය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 4, බුද්ධ ජයන්ති මුද්‍රණය, මහාබෝධි, කොළඹ; 1957.

24. විමානවත්ථු පාළි, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 26, බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1982.

25. සංයුත්ත නිකාය, ද්විතීය භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 14, බුද්ධ ජයන්ති මුද්‍රණය, කොළඹ; 1962.

26. සංයුත්ත නිකාය, චතුත්ථ භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 16, බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1981.

27. සංයුත්ත නිකාය, පඤ්චම භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 17-(1), බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1982.

28. සංයුත්ත නිකාය, පඤ්චම භාගය, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 17-(2), බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1976.

29. සුත්ත නිපාත, ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 25, බුද්ධ ජයන්ති මුද්‍රණය, තිසර, දෙහිවල; 1977.

## ත්‍රිපිටක ග්‍රන්ථ - සොයිසා පරිවර්තන

1. සංයුත්ත නිකාය, ද්විතීය භාගය (2) ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 10, සොයිසා පරිවර්තන මුද්‍රණය, ධර්මසමය, කොළඹ; 1954.

2. සංයුත්ත නිකාය, තෘතීය භාගය (3), ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 11, සොයිසා පරිවර්තන මුද්‍රණය, ධර්මසමය, කොළඹ; 1954.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය - ද්විතීයික මූලාශ්‍ර

1. අදිකාරම්, ඊ.ඩබ්. - අශෝක ලිපි, ප්‍රකාශන ඩී.එල්.එෆ්. පේද්‍රික්, දිනමිණ මුද්‍රණාලය, ලේක්හවුස්, කොළඹ. 1963.

2. ආනන්ද සාගර හිමි, කළල්ඇල්ලේ - ධම්ම පදය, සිංහල දම්පියා අටුවා සාරය, ප්‍රකාශක, පී.කේ.ඩබ්. සිර්වර්ධන, මරදාන; 1969.

3. ඒකනායක මහතා, යූ.පී. - මිලින්ද ප්‍රශ්නය (සංස්කරණය), ශ්‍රී භාරතී යන්ත්‍රාලය, කොළඹ ; 1928.

4. එලියට් මහතා, චාල්ස් - හින්දූසමය හා බුදුසමය 2, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ආණ්ඩුවේ මුද්‍රණාලයය, කොළඹ; 1967.

5. කලන්සූරිය මහතා, ඒ.ඩී.පී. - ග්‍රීක දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ. 1974.

6. කළුපහන මහතා, ජිනදාස - භාරතීය දර්ශන ඉතිහාසය, වෛදික උපනිෂද් යුගය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු ප්‍රකාශනය, ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ; 1963.

7. ගුණාලංකාර ස්ථවිර, මීගොඩ - පාතිමොක්ඛ දීපිකා, සමයවර්ධන ප්‍රකාශකයෝ, මරදාන, කොළඹ; 1968.

8. චන්දරතන හිමි, ලබුහේන්ගොඩ - පාළි අට්ඨකථා සාහිත්‍යය, සමයවර්ධන ප්‍රකාශකයෝ, මරදාන, කොළඹ; 1968.

9. චන්දවිමල ස්ථවිර, රේරුකානේ - පටිච්චසමුප්පාද විවරණය, අනුලා මුද්‍රණාලය, කොළඹ 10; 1957.

10. චන්දවිමල ස්ථවිර, රේරුකානේ - විදර්ශනා භාවනා ක්‍රමය, ඩයමන්ඩ් ප්‍රින්ටර්ස් ප්‍රකාශනය, කොල්ලුපිටිය, කොළඹ; 1975.

11. ජාත්‍යන්තර සම්මුති, ශ්‍රී ලංකා පදනම, මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනමාලා අංක 3, ලේක්හවුස්, කොළඹ; 1980.

12. ජිනසිරි ස්ථවිර, පල්ලිමුල්ලේ - හේතුඵලවාදය, අනුලා මුද්‍රණාලය, මරදාන, කොළඹ. 1997.

13. ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර - බෞද්ධ දර්ශනය, අනුලා මුද්‍රණාලය, කොළඹ 10; 1967.

14. ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර - සිත හා සිත නැති කිරීම, අනුලා මුද්‍රණාලය, කොළඹ 10; 1969.

15. ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර - ශූන්‍යතා දර්ශනය, අනුලා මුද්‍රණාලය, කොළඹ 10; 1969.

16. ඤාණවාස ස්ථවිර, හේන්පිටගෙදර - ඛන්ධක විනය, රත්න ප්‍රකාශකයෝ, මරදාන, කොළඹ, 1971.

17. තෝමස් මහතා, ඊ.ජේ. - බුද්ධ චරිතය (සිංහල පරිවර්තනය) ඇම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, කොළඹ; 1966.

18. දළුවත්ත මහතා, චන්ද්‍රසේන - ලංකාවේ නීති - පුද්ගලයා පිළිබඳ, දළුවත්ත ප්‍රින්ටර්ස් ප්‍රකාශනය, කොළඹ 12; 1978.

19. ධම්මානන්ද ස්ථවිර, තලල්ලේ - ත්‍රිපිටකයෙහි සංස්කෘතික ලක්ෂණ, සමයවර්ධන ප්‍රකාශකයෝ, මරදාන, කොළඹ; 1980.

20. ප්‍රජාතාන්ත්‍රික ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - රජයේ ප්‍රකාශනය, රජයේ මුද්‍රණාලය, කොළඹ; 1978.

21. ප්‍රඥා ප්‍රභා - මඩිහේ පඤ්ඤාසීහ ආශිර්වාද ග්‍රන්ථය, ත්‍රිකුණාමලේ ආනන්ද භික්ෂු, මහරගම සිරි වජිරඤාණ සාසන සේවක සමිති ප්‍රකාශනය, රුවන් පහරුව, මහරගම; 1983.

22. ප්‍රඥාසාර ප්‍රශස්ති - ශ්‍රී ප්‍රඥාසාර උපහාර ග්‍රන්ථය, මහාචාර්ය සිරි සීවලී හිමි, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනය, කැලණිය; 1966.

23. බුද්ධදත්ත ස්ථිවර, පොල්වත්තේ - ථේරවාද බෞද්ධ දර්ශනය 1, ආනන්ද ප්‍රකාශකයෝ, අනුලා මුද්‍රණාලය, කොළඹ 10; 1962.

24. මාක්ස්වාදී දර්ශනයේ මූලධර්ම - දයලෙක්තික භෞතික වාදය, අපනාසියෙව් මහතා, මොස්කව් ප්‍රගති ප්‍රකාශන මුද්‍රණය, 1978.

25. මූර්ති මනෝවිද්‍යා, ශබ්දකෝෂය, සීමාසහිත කරුණාරත්න සහෝදර ප්‍රකාශනය, කොළඹ - 10. 1971.

26. රතනසාර ස්ථවිර, මාරඹ - ලලිත විස්තරය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනය, කැලණිය; 1961.

27. රසල් මහතා, බට්‍රන්ඩ් - බටහිර දර්ශන ඉතිහාසය (සිංහල පරිවර්තනය) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ආණ්ඩුවේ මුද්‍රණාලයය, කොළඹ; 1970.

28. රාධාක්‍රිෂ්ණන් මහතා, එස්. - බටහිර දර්ශන ඉතිහාසය (සිංහල පරිවර්තනය) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ; 1970.

29. ලංකා ඉතිහාසය - 1 කාණ්ඩය - 1 භාගය, මහාචාර්ය රායි සංස්කරණය, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයීය ප්‍රකාශනය, කැලණිය; 1964.

30. වීරකෝන් මහතා, මුනිදාස - සප්ත විශුද්ධි ධර්මය, අනුල මුද්‍රණාලය, කොළඹ 10; 1967.

31. වෙත්තමුනි මහතා, ආර්.ජී. ද එස්. - බුදුදහම සහ එය ආගමටත්, විද්‍යාවටත් සම විසම වන අයුරු, එම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, මෙට්‍රෝ මුද්‍රණාලය, බොරැල්ල; 1967.

32. ශ්‍රී භාගීන්ද්‍ර, බලංගොඩ - සංක්ෂිප්ත ජාතක පොත (ප්‍රථම භාගය) ඇම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, කොළඹ; 1955.

33. සරණංකර හිමි, ගණේගම - බුදුහාමුදුරුවෝ, ඇම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, කොළඹ; 1974.

34. සාසනරතන හිමි, මොරටුවේ, මූල මාධ්‍යමක කාරිකාව, අනුලා මුද්‍රණාලය, කොළඹ 10; 1970.

35. සාසනරතන හිමි, මොරටුවේ, මූල මාධ්‍යමක කාරිකාව, අනුලා මුද්‍රණාලය, කොළඹ 10; 1963.

35. සාසනරතන හිමි, මොරටුවේ, ලක්දිව මහායාන අදහස්, ඇම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, කොළඹ; 1962.

36. සාසනරතන හිමි, මොරටුවේ, ලක්දිව මහායන අදහස්, ඇම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, කොළඹ; 1962.

37. සිංහල විශ්ව කෝෂය - 2, සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය, කොළඹ; 1965.

38. සිංහල විශ්ව කෝෂය - 5, සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය, කොළඹ; 1974.

39. සිංහ සහ බැනර්ජි - ඉන්දීය ඉතිහාසය, 1 කාණ්ඩය (සිංහල පරිවර්තනය) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය, ආණ්ඩුවේ මුද්‍රණාලය; 1958.

40. සොයිසා මහතා, ඒ.පී. ද - විශුද්ධි මාර්ගය, ධර්මසමය යන්ත්‍රාලය, මරදාන, කොළඹ; 1960.

## LIST OF ENGLISH LITERARY SOURCES

1. BARCA, B.m - A History of Pre-Buddhistic Indian Philosophy, Publisher Motilal Banarsidass, Delhi, 1970.

2. Buddhism and the age of science - by Htoon, U. Chan, The Buddhist Publication Society, Kandy, Ceylon, 1967.

3. Buddhist and science - Collected Essays, By Jayatilleke, K.N. The Buddhist Publication Society, Kandy, Ceylon, 1970.

4. Comptions Encyclopaedia and fact indes - Vol. 20, Edited by William Benton, Printed in U.S.A., 1969.

5. Curle, A Man - Educational Strategy for Developing Socities, Tavistock Publication Ltd., London, 1970.

6. Deussen Paul - The Philosophy of the Upanishads, Educational Enterprises, Calcatta, 1967.

7. Encyclopaedia Britannica - Vol. 14., Macroaedia, Edited by William Benton, 15th Edition.

8. Gorkom Nina van Buddhism in Daily Life, Felix Printers, Maradana, 1980.

9. Kalupahana, David J. - Causality, The Central Philosophy of Buddhism, University Press, Hawaii, Honolulu, 1975.

10. LIFE THE GREAT ADVENTURE - A Practical Guide to the Art of Living, The Home Library Club, Times of India.

11. MARTIN, T.R.V. - The Central Philosophy of Buddhism Bradford Dickens, London, N.C.I.

12. OTTAWAY, A.K.C., Education and Society, London Routledge and Kegan Paul, New York, Humanities Press, 1962.

13. PEIRIS, G.L. - The Law of Evidence in Sri Lanka, Lake House Investments Ltd., Colombo 2, 1972.

14. PERVIN, LAWRENCE A. - Personality, Theory Assesment and Research, John Viley & Sons, Inco, New York, 1970.

15. PARTNERS FOR PEACE - Unesco and the United Nations, Unesco, Switzerland, 1970.

16. SCIENCE AND THE NEW NATIONS - Edited by Ruth Gruber, Pyround Books, New York, U.S.A., 1961.

17. THAMBIAH, H.W. - Principles of Ceylon Law, H.W. Cave & Co., Ltd., Colombo, Ceylon, 1972.

18. THE BASIC FACTS OF EXISTENCE - Impermanence, Published by the Buddhist Publication Society, Kandy, Ceylon, 1973.

19. THE SEA - Life Nature Library, Leonard Engel and the Editors of Life, Nederland (NC), 1963.

20. THE UNIVERSE - Life Nature Library, David Bergamani and the Editors of Life, Nederland (NV), 1964.

# බෞද්ධ ආචාරවිද්‍යාවේ පදනම

## ආචාර්ය ගාමිණී රත්න ශ්‍රී

ආචාරවිද්‍යාව යනුවෙන් බුදුසමය අන්වර්ථ කර ඇත්තේ සැකෙවින් කියතොත් චරණ විද්‍යාව හෙවත් විද්‍යාචරණයයි. එවැනි අර්ථ පූර්ණ ආචාර විද්‍යාවක් වෙන කිසිදු ආගමක දර්ශනයක අවිද්‍යමානය. බෞද්ධ ආචාරවිද්‍යාවෙහි නිරුත්තර චරණයෙහි මූලික ප්‍රතිපදාව ආර්ය ශීලයත්, ආර්ය ඉන්ද්‍රිය සංවරයත්, ආර්ය ප්‍රතිසම්ප්‍රජන්‍යයත් ආර්ය සංතෘෂ්ටියත් දැක්වේ. මෙයින් සමන්වාගත උතුමන් වහන්සේ ලොව කෙරෙහි ඇල්ම හැර ව්‍යාපාදය දුරලා සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරමින් පඤ්චනීවරණ දුරලා හටගත් ප්‍රමෝදයෙන් නාමකාය සන්සිඳවමින් පඤ්චමධ්‍යාන උපදවා ගනිති. එහි කෝටිප්‍රාප්තිය වන නිර්වාණය තෙක් චරිත සංවර්ධනය කරගත යුතු පිළිවෙත විද්‍යාචරණය හෙවත් ආචාරවිද්‍යාව මගින් බුදුසමය අවධාරණය කරයි.

යථෝක්ත අනුසාරය සුගමව ප්‍රසාරණය කරමින් ඉතා සංයමයෙන් රැසැයුණු කෘතියක් ලෙසින් ආචාර්ය ගාමිණී රත්න ශ්‍රී සහෘදයාණන්ගේ "බෞද්ධ ආචාර විද්‍යාවේ පදනම" නමැති නව්‍ය කෘතිය හඳුන්වා දෙනු කැමැත්තෙමි. ආචාර්ය ගාමිණී රත්න ශ්‍රී විසින් මෙමගින් සිදු කොට ඇත්තේ බෞද්ධ ආචාර විද්‍යාවට නවමු අදහස් රැසක් අදාළ ධර්ම සාහිත්‍ය මූලාශ්‍රයාශ්‍රයෙන් පාඨකයා වෙත විද්‍යාත්මකව සම්ප්‍රදානය කිරීමකී. ඔහුගේ සත් ප්‍රයත්නයට නොවක් සන්තුෂ්ටියෙන් ධර්ම සාහිත්‍යකාමී සමස්ත පාඨකයා වෙනුවෙන් අපිදු ආශිංසනය කරන්නෙමු.

මහාචාර්ය කේ.ඒ. වීරසේන, (PhD)
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

ISBN 978-955-85998-0-8

මිල රු.550